

# الطريق إلى الإسلام

# ඉස්ලාම් දහමට මගක්

باللغة السنهالية

# ඉස්ලාම් දහමට මගක්

කර්තෘ
මුහම්මද් ඉබ්රාහීම් අල් හමද්

සිංහලෙන්
අබ්දුල් හකීම් මුහියිද්දීන්

නිරීක්ෂණය
මුහම්මදු නාසිම්

HOUSE OF THE PROPER KNOWLEDGE
FOR PUBLISHING & DISTRIBUTION
Riyadh- 11438 P.O.Box 32659 Tel 4228837 Fax 2933407

ح دار الورقات العلمية للنشر والتوزيع ، ١٤٢٥هـ

فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر

الحمد، محمد إبراهيم
الطريق إلى الإسلام. / محمد إبراهيم الحمد، عبدالحكيم محي الدين.- الرياض، ١٤٢٥هـ
١٥٠ ص، ١٢ × ١٧ سم
ردمك: ٥ - ٤ - ٩٥٨٣ - ٩٩٦٠
(النص باللغة السنهالية)
١- اعتناق الإسلام أ. محي دين، عبدالحكيم (مترجم) ب. العنوان
ديوي ٢١٣ ١٤٢٥/٥٦٨٠

رقم الإيداع: ١٤٢٥/٥٦٨٠
ردمك: ٥ - ٤ - ٩٥٨٣ - ٩٩٦٠

حقوق الطبع محفوظة

الطبعة الأولى

١٤٢٥هـ - ٢٠٠٤م

بسم الله الرحمن الرحيم

## පෙරවදන

මහා කාරුනික අති දයාන්විත අල්ලාහ්ගේ නාමයෙන්, පැසසුම් සියල්ල සර්වඥාන අල්ලාහ්ට අයත්වේ. මහු ප්‍රශංසා කර මහුගෙන්ම සහාය පතා අපගේ පාපයන් හට මහුගෙන්ම පව්සමා අයදිමු. පව් සහ නිත් දින ක්‍රියාවන් හට ලක් නොවී සිටීමටද මහුගෙන්ම සහාය පතමු. අල්ලාහ් පෙන්වන යහමග කවරෙකුට ලැබෙන්නේද, හෙතෙම නොමග යැවීමට කිසිවෙකුට කළ නොහැකිය. අල්ලාහ්ගේ යහමග කවරෙකුට නොලැබෙන්නේද, මහු යහමග කිරීමට කිසිවෙකුට කළ නොහැකිය. නවද වැඳීමට සුදුසු එකම දෙවියා අල්ලාහ් හැර අන් කිසිවෙකු නැති බවත්, මුහම්මද් තුමා අල්ලාහ්ගේ කීකරු අතවැසියා සහ අවසාන වක්තෘවරයා බවත් මම සාක්ෂි දරමි.

ඇත්තෙන්ම මිනිස් ජීවිතයේ ඉලක්කය, බලාපොරොත්තුව සමෘධිමත් ජීවන මගක් යන්නෙහි දෙවැනි අදහසක නැත. මිහිපිට ජීවත්වන සියලු දනන් තම ජීවිත කාලය තුලතම දුක් ගැහැට සහ කරදර පළවා හැර පරිසමාප්ත සෘජු ජීවිතයක් ගතකිරීමට දරන උත්සාහය කෙසේ කියා නිම කරන්නද? ජීවත්වීමට මබලා මෙතරම් පරිශ්‍රමයක යෙදෙන්නේ මන්දැයි යමෙකුගෙන් ප්‍රශ්න කළ විට මවුන්ගෙන් මුවින් ගිලිහෙන එකම වදන දුක්කරදරවලින් මිදුනු සමෘධිමත් ජීවිතය යන්නයි. මහු විඳින දුස වදද, මහු ජීවත්වන මනෝමය අවස්ථාවද මහුගේ පරිශ්‍රමයද ඒ අසහාය ජීවනමග ලබාගැනීමේ එකම ඉලක්කයයි. ඒ අසහාය ජීවිතය ලබාගනු වස් කාලය ප්‍රස්ථාව, දිවා රෑය, අව්ව, වැස්ස, කුසගින්න සහ පිපාසය ගැන අමතක කර නිදිමරා නිදිවරා කටයුතු කරන්නේ පුදුම ලෙසයි.

සැබැවින්ම භූදිජනයා සේම මහුට වඩා දැනුමෙන්, තනතුරෙන්, ශිෂ්ටාචාරයෙන් ධනධාන්‍යාදියෙන් අනෙකුත් උසස් තත්ත්වයක

පත්ව සිටින අයද ඒ උසස් සතුටෙන් පිරුණු ජීවිතය ලබා ගන්නට උත්සාහය දරය. හුදෙක් සාමාන්‍ය මිනිසා පමණක් නොව, ඒය ලබාගැනීමට උත්සාහ නොකරන කෙනෙකු මේ මිහිපිට සිටීමට නොහැකිය. ඒමැයෙන් බලන කළ අනෙකුත් විශුද්ධ කතෘන්ද, බුද්ධිකයන්ද, දර්ශණවාදීන්ද, වෛද්‍යවරුන්ද කවියන් ද තම දුක්කරදර පළවා හැර මහත් සතුට සමෘධිය ලබාදෙන ජීවිතයක් ලෙස පරිවර්ථනය කර ගන්නේ කෙසේද යන තම සමීක්ෂණයට පරීක්ෂණයට හසුවුනු චින්තන සහ අදහස් විසුරුවා හැරීමට වෙර දරති. ඔවුන්ගේ ඒ අදහස් කෙරෙහි අපගේ සිත යොමු කරන විට වැටහී යන්නේ ඔවුන් ගේ අදහස් තවත් කෙනෙකුගේ මතවලට හාත්පසින්ම පරස් පර විරෝධී එකක් ලෙසය. තවත් සමහර කරුණු මිනිසාට පහසුවෙන් ලඟා විය නොහැකි මිනිසාගේ එදිනෙදා ජීවනයෙන් ගව ගාණක් පමණ ඈතින් පසුවන ඒවායැයි කිව හැකිය.

වත්මන් ජනයා, භුක්ති විඳින සතුට දෙස බලන විට එය අතෘප්තියෙන් නොවන්නට ඌන එකක් යන්න එදි නෙදා ජනජීවනයේ කඩාවැටීම තුලින් වැටහී යන්නේය. නිදසුනක් ලෙස මත්ද්‍රව්‍ය තුලින් තම සැනසුම ලඟාකර ගත හැකියැයි සිතන කෙනෙකු එයට නැඹුරු වෙයි. නමුදු ඒ සැනසුම ලබන්නේ සුළු කාලයක් තුල පමණකි. මත්ගතිය සිඳී ඔහු පියවී තත්ත්වයට පත්වන විට ඔහු හගින්නේ පෙරසේම වූ පාළුවෙන් කාන්සියෙන් සහ දුකෙන් පිරුණු අවස්ථාවකි.

එසේම තමා සතුටක් අත්විඳිනවායැයි පවසන අයද කල කිරී මෙන් පිරුණු ජීවිතයක් තුල පසුවන්නේ සතුට ගෙන දිය හැකි සත්‍යය කුමක් තුල තිබෙනවාදැයි මනාව වටහා ගැනීමට නොවූ නිසා විය හැකිය. නමුදු තම ජීවිතයේ ස්ථිර උසස් සන්තෘෂ්ටියක් භුක්ති විඳින්නේ කවරෙක්ද යනුවෙන් සොයා බලන කළ වැටහී යන්නේ තම නිර්මාතෘ වරයා වන

අල්ලාහ් මනා ලෙස වටහා ගෙන ඔහු පමණක් විශ්වාස කර ඔහුගේ ආඥා සහ අණ පනත්වලට කීකරුවී එයට අනුගතව කටයුතු කරන්නන් මිස අන් කිසිවෙකු නොවේ. නියම සතුට භුක්ති විඳිමින්නේ තම මැවුම්කරුවා හඳුනා ගෙන ඔහුට සම්පූර්ණයෙන්ම කීකරු වී කටයුතු කරන්නන් පමණි.

ඔබ දෝතෙහි ඇති මේ පොත් පිංච ඔබ සන්තෘෂ්ටිමත් ජීවිතයක් කරා කැඳවන වැදගත් සමහර කරුණු ගැන පහදයි. එය ඔබ මැවූ ඔබගේ මැවුම්කරුවා විශ්වාස කරන ලෙස පැහැදිලිව මග පෙන්වයි. එසේම පහසුවෙන් තෝරා වටහා ගත හැකි සෘජු ප්‍රතිපත්තිය කුමක්ද යන්න වටහා දෙන අතර මිනිසාගේ මූල සහ අවසානය, මිනිසා කුමන හේතුවක් උදෙසා නිර්මාණය වීද වැනි අනේකවිධ කරුණුවලට මනා පිළිවදන් දෙයි. එමතු නොව, තම මැවුම්කරුවා වන දෙවිඳු ගැන සාකල්‍යව වටහා ගෙන ඒ යහමගෙහි අනෙක් අයද එක්රොක්වන ලෙස මිනිස් සමාජය අමතා එය අනුමත කරන අසහාය ප්‍රතිපදාව මනාව ලෙස පහදා දෙන අතර, මේ තුලින් ඉස්ලාම් දහමේ උතුම් භාවයද, ඒහි අද්විතීය සෘජුතාවය, එය කවදත් සියලු දෙනාටම කවදත් සුදුසු දහමක් බවද ඔබ නිසැකවම වටහා ගනු ඇත.

මෙම පොතෙන් දැනුමක් ලබාගන්නා ඔබ ඒ පිළිබඳ තවත් කරුණු දැන ගන්නට කැමැති වන්නේ නම් හෝ මෙහි ඉදිරිපත් කළ කරුණු ගැන යම්යම් සැකසංකා ඔබ තුල වේ නම් තවතවත් ඒ යහමග ගැන අධ්‍යයන කිරීමේදී ඒ තුලින් මනා දැනුමක් ලබා ගත හැකිය. එසේම ඒ අසහාය දහම මනාව අධ්‍යයනය කරන්නාට එහි යථාර්ථය සොයන්නාට එහි දොරටු විවෘත කර තබා ඇත. ඒ දහමේ කිසිවක් ඔබගෙන් සඟවා ඔබ ලඟා විය නොහැකි තැනක ඇත්කර තබා හෝ නැත. ඔබ කුමණ මාදිලියේ ප්‍රශ්ණයක් ගැටළුවක් මතු කළද, ඉස්ලාම්

දහම ඒවාට පිළිවදන් දෙන්නේ බුද්ධිගෝචර අන්දමින් බව වටහා ගැනීමට ඔබට දීර්ඝ කාල පාරායනයක් උවමනා නැත.

සියල්ලන්ට පිටිවහල් වන්නේ අල්ලාහ්ය. වක්තෘ මුහම්මද් තුමා කෙරෙහි ශාන්තිය සහ සමාදානය සැමදා පැවතේවා!

## මිනිසාගේ සම්භවය

මිනිස් සම්භවයේ ප්‍රාරම්භය ආදම්ගේ නිර්මාණය සමග පටන් ගත්තේය. අල්ලාහ් දෙවිඳු මුල්ම මිනිසා වන ආදම් මැටියෙන් මනාපය පරිදි තම දෑතෙන්ම නිර්මාණය කළේය. එහි ඔහුගේ ආත්මයෙන් පිඹිය. එසේම අල්ලාහ් පක්ෂීන්, සිව්පාවුන් ඇතුලු සියල්ල මවා ඒවායේ නම් ඔහුට ඉගැන්විය. පසුව ආදම්ට ශාෂ්ඨාංක කර සම්භාවණයට පත් කරන ලෙස තමා විසින් මවන ලද දේවදූතයන්ට අණ කළේය. ඉබ්ලීස් හෙවත් සාතන් හැර අන් සියලු දේවදූතයන් ඔහුට ශාෂ්ඨාංක කළහ. එහෙයින් ඉබ්ලීස්ට අහස් ලොවේ වූ ආධිපත්‍ය විනාශ වී සාප කර ඔහු එයින් පිටමං කරන ලදී. අවසානයේ ඔහු ගොර තර නිරයට තීන්දුවූ කෙනෙකු බවට පත්වී නිහීන තත්ත්වයට පත්කරන ලදී. නමුදු අල්ලාහ් විසින් නිහීන තත්ත්වයට පත් වූ ඉබ්ලීස් තමාට පරමාන්ත දිනය දක්වා සෑම තැනම සැරි සරමින් ජීවත්වන්න කල් දෙන ලෙස දෙවිඳුගෙන් ඉල්ලා සිටි යේය. ඒ ගැන අල්ලාහ් අල්කුර්ආනයේ මෙසේ විස්තර කරයි.

*'ඇත්තෙන්ම ඔබ කල් දෙන ලද්දවුන්ගෙන් ය'.* (7 : 15)

අල්ලාහ් දෙවිඳු විසින් ඔහුට පරමාන්ත දිනය දක්වා කල් දෙන පසු ඉබ්ලීස් මෙසේ පැවසුවේය.

*'ඔබගේ මහිමයෙන් දිවුරමි. ඔබගේ අවංක වහලුන් හැර ඔවුන්ගෙන් සියලු දෙනා මම නොමග යවන්නෙමි යනුවෙන් ඔහු (ඉබ්ලීස්) කීවේය.* (38 : 82-83)

තවද අල්කුර්ආනය මෙසේ පවසයි : *(එයට ඉබ්ලීස්) ඔබ මා නොමග ගියකෙනෙකු ලෙස පත් කළ හෙයින් (ආදම්ගේ පෙලපත වන) ඔවුන් ඔබගේ සුමග (නොයතු විලසින් ඒ හරහා) වාඩි වෙමි යි යනුවෙන් පැවසුවේය.* (7 : 16)

තවද මෙසේද දොඩ වන්නට විය. *'පසුව සැබැවින්ම ඔවුන් ඉදිරිපසෙහිද ඔවුන්ගේ පසුපසෙහිද ඔවුන්ගේ දකුණු පසෙහිද*

*වම් පසෙහිද (නොමග යවනු වස්) මවුන් වෙත එන්නෙමි. එවිට මවුන් ගෙන් බොහෝ දෙනෙකු ස්තුති කරන්නන් ලෙස ඔබ නොදකින්නේය (යි කීවේය).* (7 : 17)

ඉබ්ලීස්ගේ අභියෝගයට දෙවිඳුගේ පිළිවදන සහ ප්‍රතික්‍රියාව අති දරුණු එකක් විය.'*එයට දෙවිඳු 'නින්දාවට පත්ව පළවා හරින ලද කෙනෙකු ලෙස ඔබ මෙතැනින් පිටවව්. මවුන්ගෙන් ඔබ අනුගමණය කරන්නන්ගෙන්ද, ඔබ සියල්ලන්ගෙන්ද මම (ජ්වලිත) නිරය පුරවන්නෙමි' යනුවෙන් කීවේය.* (7 : 18)

අල්ලාහ් අකීකරු ඉබ්ලීස් ස්වර්ගයෙන් පිටමං කර මිනිසුන් අතර අවිශ්වාසය, කුහුල සහ සකලවිධ දුදන ක්‍රියා කෙරෙහි ප්‍රිය උපදවා මවුන් නොමග අරිනු වස් අවස්ථාවද සලසා දී පරමාන්තය දක්වා ජීවත්වීමටද වරමද ලබා දී, හැකි ලෙස මිනිසුන් අතර බෙදීම් සහ දුදන ක්‍රියා වපුරා මවුන් නොමග යවන්නට හැකි සෑම අවස්ථාවක්ම සළස්වා දුන්නේය.

පසුව අල්ලාහ් දෙවිඳු මුල්ම මිනිසා ආදම්ගෙන් මහුගේ බිරිඳ හව්වා නිර්මාණය කර, කිසිදු ඇසක් නොදුටු කිසිදු කණක් නොඇසූ කිසිදු මනසේ පැන නගින්නට නොහැකි, කිසිදු චින්තනයකට නොහඟින අති උසස් සුඛෝපභෝගි නිවහනක් වන ස්වර්ගයේ සැපසම්පත් භුක්ති විඳගෙන සතුටුවෙන් ඇය හා සිත්සේ ජීවත්වන්නටද සුභාශිංසනය කරමින් අද්විතීය වරම ලබාදුන්නේය. එසේම තමා ලබා ගත් වරප්‍රාසාධ අනුව ඉබ්ලීස් සෑම අවස්ථාවකම ඔබ නොමග යවන්න කුමන්ත්‍රණ කළ හැකිය. ඒ උදෙසා අති මහත් ප්‍රය ත්නයෙහි යෙදිය හැකිය. එහෙයින් මහුගේ චාටු බසට නොරැවටෙන අයුරු කරුණාබර අල්ලාහ් මවුන් දෙන්නාට මවදන් දුන්නේ ඉබ්ලීස්ට දී ඇති වදන සහ මහුගේ සතුරුකම ගැනද මැනවින් දන්නා හෙයිනි. තවද මවුන් පරීක්ෂණා කරනු පිණිස ස්වර්ගයේ ගස් වලින් එක් ගසකින් කැමද මුළුමනින්ම තහනම් කළේය. නමුදු

ෂයිතාන් මවුන් දෙන්නාගේ සිත්තුල කුකුසක් ඇති කර, තහනම් ගසේ ගෙඩි කෑම පිණිස මවුන් දෙන්නාගේ සිත් තුල ප්‍රියමනාපයක් ඇති කරන්නට තරම් සමත් විය. 'සැබැවින්ම ඔබ දෙන්නා මෙම ගසෙන් අනුභව කළේනම් ඔබලා සදා මෙහි පසුවනු ඇත' යනු වෙන් ආශාව උපද්දවා මවුන්ට තමා උපදෙස් දෙන්නෙකු ලෙස අඟවමින් බොරු පොරොන්දුවක් දුන්නේය.

තම දෙවියාට අකීකරු වී මවුන් දෙන්නා ඒ තහනම් ගසෙන් අනුභව කරන තුරු ඉබ්ලීස් මවුන් දෙන්නා පෙරංත්ත කළේ ඒ තහනම් ගසෙන් කෑම කෙරෙහි සම්පූර්ණයෙන්ම වශිකෘතවන ලෙසය. ඉබ්ලීස්ගේ චාටු බසට වශී වූ ආදම් සහ ඔහුගේ බිරිඳ තහනම් ගසෙන් අනුභව කර අල්ලාහ්ගේ ආඥාවට සම්පූර්ණයෙන්ම අකීකරු පුද්ගලයන් දෙන්නා බවට පත් වූහ. ඒ ගසෙන් අනුභව කළ වහාම තමන් තුල යම් වෙනසක් ඇතිවූ බව වටහාගත් කළ තමන් අල්ලාහ්ගේ ආඥාවට පිටුපා ඔහුට අකීකරුවූ බව තේරුම් ගත්හ. පසුව ආදම් සහ ඔහුගේ බිරිඳ තමන් කළ වරද ගැන පසුතැවිලි වී අල්ලාහ්ගෙන් පවිසමා අයැදින්නට පටන් ගත්හ. මවුන්ගේ අයැදුමට පිළිවදන් දුන් දයාන්විත අල්ලාහ් මවුන්ගේ පවිසමා කර මවුන් දෙන්නා කීකරු අතවැසියන් ලෙස තෝරා පත් කර ගත්තේය. නමුදු මවුන් දෙන්නා මිහිරි නිවහන වන ස්වර්ගයෙන් ඉවත් කර දුෂ්කරෙන් පිරුණු මහපොළොවට බස්වා එහි ජීවත් වන්නට සැළැස්වා පැතිරුණු විශාල පරම්පරාවක් ද ඔහුට ඇති කර දුන්නේය. පසුව අල්ලාහ් ඔහු මරණයට පත් කළ අතර ස්වර්ගයට පිවිසෙන්නටද සළස්වනු ඇත.

ආදම් සහ ඔහුගේ බිරිඳ මහපොළොවට පත් කළදා පටන් මහපොළොවේ එකිනෙකා පරයමින් මිනිසුන් අතර සතුරුකම නපුරුකම ප්‍රසාරණය වන්නට ආරම්භ විය. එක් පැත්තකින්

ආදම්ගේ පෙලපතේ ජනයන් අතරද, අනෙක් පැත්තෙන් ආදම්ගේ පෙලපතේ අය සහ ඉබ්ලීස් සහ ඔහුගේ හිතවතුන් අතරද නිමක් නැති සතුරුකම මහපොළොවේ ප්‍රසාරණය වන්නට විය. එදා පටන් ආදම්ගේ පුතුන් යහමගෙන් ඉවත් කර, පින් නොලැබෙන අයුරු අකුසල සහ අදැමිටුකම් අශ්ලීල කටයුතුද අලංකාර කර පෙන්වා අල්ලාහ් තෘප්තිමත් කරන කර්මයන්ගෙන් දුරස්ථ කර මිහිපිට නොමග යන්න ටත්, පරමාන්තයේ අවාසනාවන්ත අන්දමින් නිරයට පිවිසෙන්නටත් ඉබ්ලීස් සහ ඔහුගේ සගයන් ආදම්ගේ පෙලපත හා නිමක් නැති සටනක යෙදී සිටී.

මිනිස් නිර්මාණයේ පරමාර්ථය එසේ නොව. කරුණාන්විත අල්ලාහ් ඔවුන් නොමග ගොස් මංමුලාවී විනාශ වන්නට මඟ කර අත් හැරියේ නැත. වෙනුවට ඔවුන් පිරිසිදු අවංක චේතනාවෙන් අල්ලාහ් පමණක් වන්දනාමාන කිරීමේ වැදගත් කම සහ යුතුකම් ගැනද, ඒසේ කිරීමෙන් පමණක් මරණෙන් පසුව ඇති විය හැකි මතුලොව ජීවිතයේ අසහාය ජය ලබා ගත හැකි බවත්, ඒ අනුව කටයුතු කරනු වස් විටින්විට වක්තෘ වරුන්ද දැහැමි පුද්ලගලයන්ද පිටත් කරමින් නැවත නැවතත් ඔවුන් යහමග වනු වස් උනන්දු කරමින් පසුවිය. මිනිස් සහ ජින් සමූහය අමතා ඒ වක්තෘවරුන් පැමිණියා නම් ඔවුන්ට කීකරු වන ලෙසත් ඒ අනුව කටයුතු කරන ලෙසත් අල්ලාහ් ආඥා කළේය. අල්ලාහ් දෙව්දූ ඒවන් ශ්‍රද්ධාවන්ත පුද්ගලයන් මිහිපිට නියෝජිතයන් ලෙස පත්කරමින් මිනිසා දැනු වත් කළේ දෙලොවම තෘප්තිමත් සමෘද්ධිමත් ජීවිතයක් සාක්ෂාත් කරගන්නටය. නමුදු අතිඋතුම් අල්ලාහ් දෙව්දූගේ ආඥාවන්, අණපනත් සහ වක්තෘවරුන්ද පිළි ගෙන පිරිසිදු චේතනාවෙන් කටයුතු කරන්නේ කවරෙක්ද හෙතෙම මිහිපිට සතුටෙන් සන්සුනෙන් සමාදානයෙන් තම ජීවිතය ගත කරන

අතර කිසිදු බියක් නොවී තම ලොකෝත්තර ජීවිතයේද නොනිමි ජය සතුට ලබා ගන්නේද අති උසස් අන්දමිනි.

මෙසේ මිනිසාගේ සම්භවය ආදම්ගේ පෙළපතෙන් පටන්ගෙන මිහිපිට විසන්ධි නොවී කෙරී ගෙන යන්නේය. අල්ලාහ්ගේ ඒකීයත්වය පිළිගෙන ඔහුගේ අණපනත් පමණක් පිළිගනිමින් එයට අනුගතව ආදම් සහ ඔහුගේ පෙළපතේ අය සියවස් දහයක් පමණ යහමින් ශ්‍රධාවන්තව ජීවත් වූහ. පසුව ඔවුන් තම සිතට වහල් වී ව්‍යාජ දෙවිවරුන් වඳිමින් අල්ලාහ්ට ආදේශ කිරීමට පටන් ගත්හ. තවත් කොටසක් අල්ලාහ් දෙවිඳු සමග අල්ලාහ් නොවූ අන් දේද වන්දනාමාන කරන්නට පටන් ගත්හ. පසුව අල්ලාහ් දෙවිඳු ආදේශ කිරීමේ මහා පාපය ගැන අනතුරු අඟවමින් අල්ලාහ් ආදේශ කිරීමෙන් ඈත් වී ඔහු පමණක් වන්දනාමාන කිරීම පිණිස අනතුරු අඟවනු වස් මුල් වතාවට වක්තෘ නූහ් තුමා පත් කළේය.

මිනිස් සමාජට අල්ලාහ්ගේ සෘජුමග ගැන දැනුවත් කරනුවස් දයාබර අල්ලාහ් විසින්ම වක්තෘවරු සහ නබිවරු විවිධ සමයේ, විවිධ පලාත්වලට, විවිධ සමාජවලට ඒ ඒ කාලවලට සුදුසු ආඥාවන් සහිතව පත්කරන ලදී. අල්ලාහ්ගේ කීකරු අතවැසියන් වන ඒ සැම වක්තෘ වරුන්ගේ එකම පිවිතුරු පණිවුඩය වූයේ විවිධ පිළිම වන්දනාව සහ අව්‍යාජ බහු දේව වන්දනාමානයෙන් වළකී අල්ලාහ් පමණක් වන්දනාමාන කරන ලෙසය. ඒකේශ්වර වාදය ප්‍රචලිත කරන්නට, තවත් වක්තෘ වරයෙකු වන ඉබ්රාහීම් තුමා පැමිණෙන තුරු ඔවුන් අල්ලාහ් පමණක් වන්දනාමාන කිරීමෙන් ඉවත්වීම සහ අල්ලාහ් හැර බහු දේව වන්දනාමාන සහ පිළිම වන්දනාමාන කරන පිරිසක් යන ප්‍රතිපත්තිය තුල පියවරෙන් පියවර හැඩගැසී තම සිත්සේ වන්දනාමාන කරන පිරිසක් ලෙස හැඩගැසුනේ අල්ලාහ්ගේ ආඥාවන් සහමුලින්ම පිටුදැකීමෙනි. වක්තෘ ඉබ්රාහීම් තුමා

දක්වා ආදම්ගේ පෙල පතේ අය නොගිලිහුනු පුරුකක් ලෙස නොකඩවා වක්තෘ වරුන් ලෙස පැමිණි අතර ඉබ්රාහිම් තුමාට පසු වක්තෘ ත්වය ඔහුගේ දෙවු පුත් දෙන්නා වන ඉස්හාක්ගේ සහ ඉස්මාඊල්ගේ පෙළපත් වලට මාරුවිය.

ඉනික්බිති වක්තෘ ඉබ්රාහිම් තුමාගේ පෙලපතෙන් වක්තෘ ඉස්මායෙල් සහ ඉස්හාක් බිහිවූනු අතර වක්තෘ ඉස්හාක් තුමාගේ පෙලපතෙන් බොහෝ වක්තෘවරු වැල් නොකැඩී බිහිවන්නට වූහ. වක්තෘ ඉස්හාක්ගේ පෙල පතෙන් පැමිණි යාකුබ්, යූසුෆ්, මූසා, දාවූද්, සුලෙමාන් සහ ඊසා වැනි වක්තෘ වරුන් මහත් පරිශ්‍රමයක යෙදෙමින් ශ්‍රධාවන්ත ජීවිතයක් ගත කළ ඉහළ පෙළේ වක්තෘ වරුන් වූහ. මර්යම්ගේ පුත් වක්තෘ ඊසා තුමාට පසු ඉස්රායෙල් සමාජයෙන් පැමිණි වක්තෘ වරුන්ගේ පැමිණීමටද අවසානයක් ඇති විය. මර්යම්ගේ පුත්‍ර ඊසා තුමාට පසු ඉස්රායෙල් සමාජයෙන් කිසිදු වක්තෘ වරයෙකු බිහි වූයේ නැත.

ඉන්පසු වක්තෘත්වයේ පැවැත්ම ඉස්මායෙල්ගේ පෙල පතට මාරු විය. වක්තෘ වරුන්ගේ පැමිණීමට තිතක් තබනු ලෙසද, පරිශුද්ධ අල්කුර්ආනය මිනිසාගේ අවසාන තෙස්තමේන්තුව ලෙස පත්කරනු විලසින්ද දයාන්විත අතිඋත්තම අල්ලාහ් ඒ පෙල පතෙන් මුහම්මද් තුමා වක්තෘ වරුන්ගේ සහ නබි වරුන්ගේ අවසානයා ලෙස තෝරා ගත්තේය. එතුමාට පහළ කරන ලද දිව්‍යවදන වන පරිශුද්ධවූ අල්කුර්ආනයද මිනිස් සමාජයට පහළ කළ දේව හෙළිකිරීමේ අවසාන හෙළි කිරීම වේ.

සියල්ලන්ගෙන් සම්පූර්ණ සියලුම අරාබි සහ අරාබි නොවන මිනිස් සහ ජින් සමාජයන් හට, සියලුම කාලයට, අවස්ථාවට සහ තැනට ඔබින අපූරු අවසාන දේවපණිවිඩය පහළ වූයේ මේ දේවනියෝගවලින් පසු තවත් දෙව් වදනක් මිහිපිට නුවුවමනාය යන්න සනිටුහන් කරමිනි. තමාට ලැබුණු දේව

නියෝගය අනුව වක්තෘ මුහම්මද් නබි තුමා මේ අසහාය දහමේ සියලු යහකර්ම පැහැදිලි කර සියලු දුර්මාර්ග ගැන අනතුරු ඇඟ වූහ. අල්ලාහ් දෙවිඳු වක්තෘ මුහම්මද් තුමාට පහළ කළ ඒ දේව ග්‍රන්ථයට සමව අන් කිසිදු මගක් හෝ ප්‍රතිපත්තියක් හෝ ග්‍රන්ථයක් හෝ පිළිපදින්නන් අල්ලාහ් දෙවිඳු කිසිසේත් කිසිවිටෙක අනුමත නොකරන්නේය.

මුහම්මද් තුමාගේ වෘත්තාන්තය සහ වක්තෘත්වය

මුහම්මද් තුමාගේ යහපත් ජීවනමග සහ එතුමාගේ අසහාය වක්තෘත්වය අළලා ප්‍රසාරණය වී පවතින විස්තර අති විශාලය. ඉතිහාසය එක්වූ එතුමා ගැන පමණක් විද්වතුන් විසින් විවිධ බසෙන් ලියන ලද පොත්පත් බොහෝය. මිහිපිට නියෝජනය කළ වක්තෘ වරුන්ගෙන් මුහම්මද් (සල්) තුමාගේ වක්තෘත්වය අවසන් පණිවුඩය බවත්, එතුමාට පහළ කළ දහම දහම්හී අවසාන දහම බවත් අප පෙර තැනක සඳහන් කළෙමු. එහෙයින් එතුමාගේ උතුම් ජීවන මගේ සමහර වැදගත් සන්සිද්ධීන් ගැන පවසන්නට බලාපොරොත්තු වෙමු.

1. වක්තෘත්වයට වූ පූර්ණ සළකුණු : සර්වඥාන අල්ලාහ් වක්තෘ මුහම්මද් තුමාගේ වක්තෘත්වයේ සහ එතුමා වක්තෘ වරයෙකු ලෙස තෝරා පත්කිරීම ගැනවූ පූර්ව දැනුම් දීම් මතු සඳහන් ආකාරයට ලුහුඬින් විස්තර කළ හැකිය.

1. වක්තෘ ඉබ්රාහීම් තුමාගේ ඇමතුම සහ මරියම් තුමියගේ පුත් වක්තෘ ඊසා තුමාගේ සුභාශිංසනය සහ මුහම්මද් නබි (සල්) තුමාගේ මවගේ සිහිනය :

මුහම්මද් තුමා තමා ගැන පවසන කළ මෙසේ දෙසූහ : මා වෙනුවෙන් වක්තෘ ඉබ්රාහීම් තුමා ප්‍රාර්ථනා කර ඇත. තවද මාගේ පැමිණීම උදෙසා වක්තෘ ඊසා තුමා වෙත පහළවූ දේව වැකි තුලින් කරන ලද සුභාශිංසනද වේ. මා මගේ මවගේ කුස තුල පිළිසිඳ ගෙන සිටි කළ ඇගේ දේහයෙන් කාන්ති

යක්, ජ්වලිත ආලෝක යක් පිටවී සිරියානු දේශයේ බස්රා නුවර දක්වා ප්‍රසාරණය වනු ඇය සිහිනයකින් දැක ඇත.

එතුමාගේ මවගේ සිහිනය හා සම්බන්ධවූ සම්භවයේ තේරුම මුහම්මද් නබි (සල්) තුමා වරෙක මෙසේ විස්තර කළහ :වක්තෘ ඉබ්රාහීම් තුමා තම පුත් ඉස්මායීල් තුමා හා එක්ව අල්ලාහ්ගේ නිවහන වන මක්කාහී කඃබා දේවස්ථානයේ බිත්ති ප්‍රතිසංස්කරණය කරන කළ පැතූ පැතුම අති විශේෂ එකකි. මගේ වක්තෘත්වයද සහ ඒ පැතුම අතරද ඇත්තේ අති කිට්ටු සම්බන්ධයකි. ඒ ගැන අල්කුර්ආනය මෙසේ විස්තර කරයි :

*'අපගේ ස්වාමිනි, අපගෙන් මේ (යහකම) පිළිගනු මැනවි. ඇත් තෙන්ම ඔබම (සියල්ල මනාව) අසන්නේය දන්නේය. අපගේ ස්වාමිනි, අප දෙදෙනා ඔබට කීකරු (මුස්ලිම්) ලෙස කරනු මැන. තවද අපගෙන් පැවත එන්නවුන් ඔබට කීකරු වූ සමූහයක් ලෙස කරනු මැනවි. අපට අප (ඔබ) අදහන විධි පෙන්වනු මැනව. අපට සමාවනු මැනව. ඇත්තෙන්ම ඔබ සමාව දෙන් නේය. දයාන්විතයාය. අපගේ ස්වාමිනි, ඔබගේ (ආයාවන්) දැනුම්දීම් ඔවුනට ප්‍රකාශ කර, ඔවුන්ගේ පුස්තකයද ඥානයද හදාරන්නාවූද ඔවුන් පිරිසිදු කරන්නාවූද වක්තෘ වරයෙකු ඔවුනතරින්ම පහළ කරනු මැනව. ඇත්තෙන්ම ඔබ බල සම්පන්නය නුවණැත්තාය'.* (2 : 127-129)

අති දයාන්විත අල්ලාහ් දෙවිඳු වක්තෘ ඉබ්රාහීම් සහ ඉස්මාඊල්ගේ ප්‍රාර්ථනාව පිළිගෙන ඔවුන්ගේ පෙලපතෙන් අවසාන වක්තෘ මුහම්මද් තුමා තෝරා ගත්තේය.

අවසාන වක්තෘ මුහම්මද් නබි තුමාගේ පැමිණිම ගැන කිතුනු වන්ගේ ආගමික ග්‍රන්ථය වන බයිබලයද සාක්ෂාත්ව පවතී. වක්තෘ මුහම්මද් නබි තුමාගේ පැමිණිම ගැන වක්තෘ ඊසා තුමාගේ සුභාශිංසනය ගැන අල්කුර්ආනය සාක්ෂි දරයි.

*'ඉස්රායෙල් දරුවෙනි, මම මට පෙර (පහළ) වූ තව්රාතය සත්‍ය කරමින්ද, මට පසුව අහ්මද් නමැති වක්තෘවරයෙක් පැමිණෙන්නේයැයි සුභාරංචි දෙමින්ද ඔබ වෙත අල්ලාහ්ගෙන් (පහළවූ) වක්තෘ වරයෙක්මි' යි මර්යම්ගේ පුත් ඊසා කීවනමද (සිටී) අයුරු සිහිකරව.'* (61 : 6)

වක්තෘ ඊසා තුමා ඉස්රායෙල් වරුන්ගේ අවසාන වක්තෘ වරයා වේ. එතුමා සහ මුහම්මද් නබි (සල්) තුමා අතර කාලය තුල කිසිදු වක්තෘ වරයෙක් පහළ නොවිය. තමාට පසු අහ්මද් යනුවෙන් වක්තෘවරයෙකු පැමිණෙන බව එතුමා සුභාරංචි පැවසූ බව බයිබලයම සාක්ෂි දරමින් සිටියි. ඒ වදන වාස්තවිකය වූ බව මුහම්මද් තුමාගේ පැමිණීම සාධකව පවතී. අහ්මද් යනු මුහම්මද් තුමාගේ නම්වලින් එකක් වේ.

මුහම්මද් තුමාගේ මවගේ සිහිනය : ඇය වරෙක සිහිනයක් දුටුවාය. ඇය පුසූතියේදී ළමයෙකු බිහි කළ විට ආලෝකයක් පිටත්වී ඒ ආලෝකය සිරියාවේ බස්රා නම් නගරය දක්වා ආලෝකමත් වී පැතිරෙනු ඇගේ ඇස් ඉදිරියේ දිස් විය.

2. අරාබි සමාජයෙන් පැමිණීම : වක්තෘ මුහම්මද් තුමා යම් තත්ත්වයක් ඉසිලූ ප්‍රකට පිටිසර අරාබි සමාජයෙන් බිහිවූ කෙනෙකි. එසේම කරුණාන්විත අල්ලාහ් දෙවිඳු ඒ සමාජ වැසියන් යතා කාලයේදී සත්‍ය ඉස්ලාම් දහම පිළිගැනීමට අති උසස් අන්දමින් අනෙක් සමාජ වැසියන්ට වඩා සම්භාවණයට පත්වන අයුරු සූදානම් කරන්නට විය. මෙම අරාබි සමාජය අධ්‍යාපනය සහ ලේඛන කෘතයෙහි තරමක නොදියුණුව අඥාන සමාජයක් ලෙස තිබුණු අතර, විවිධ මාදිළියේ පිළිම වන්දනාවන්, සහ අනෙකුත් බහු දේව වන්දනාමානයන් ඒ සමාජ වැසියන් තුල යෙහෙන් පිහිටා තිබුණි. එසේම මවුන් අතර බදවි හෙවත් ග්‍රාම්‍ය වාදය සම්පූර්ණව පිහිටා තිබුණද

ඒ ඇතට විහිදී තිබුණු අරාබි අර්ධද්වීපයේ අරාබි ජන සමාජය අතර වැදගත් ස්ථානයක් හෙබවමින් තිබුණේය.

තවද ඒ අරාබි ජනසමාජය ස්වාධීනව සිතා කටයුතු කිරීමේ හැකියාව සහ තනිපුද්ගල නිදහසෙහි උසස් ස්ථානයක වැජඹුනේය. නමුදු ඒ සමයේ අනෙකුත් සමාජයන් ලෞකික සහ අධ්‍යාත්මික දෙකෙ හිම අව්‍යාජ ප්‍රතිපත්ති විදහාපාමින් කටයුතු කළ ආගමික නායකයින් සහ පූජකයින් අතේ මවුන්ගේ පාලනය යටතෙහි පත්ව තිබුණේය. මේ නායකත් වය කුමක් හෝ අණකළ විට එයින් ස්වාදීනව කටයුතු කිරීමේ කිසිදු අවස්ථාවක් හෝ නිදහසක් හෝ මවුන්ට නොවූ අතර, තමාට උවමනා දෙයක් මත තම සිතට එකඟ වන ස්වෛරීව කටයුතු කිරීමට පවා මවුන්ට නිදහසක් නොවිය.

එසේම ජීවනමග සරුකරනු වස් උවමනා ලෞකික කටයුත් තන්හී හෝ චින්තනයෙහි හෝ මේවා ඒ අනුමතයැයි පැවසෙන නායකයන්ගේ සහ පූජකයින්ගේ අදහසට විරුද්ධව යමක් කීම හෝ වරද පෙන්වා දීම හෝ එයට විරුද්ධ හඬ නැඟීම හෝ ක්‍රියා කිරීම හෝ සමාජ සහ වෙළඳ කටයුත්තන් හී ස්වාධීනව ක්‍රියාකර සේසත් රැස්කිරීම හෝ තහනම් දෙයකි.

එදා විසූ සමාජ ජනයන් වහලුන් ලෙස, කිසිදු ශික්ෂාවක් නැතිව තිරිසනුන් ලෙස, සමාජ ආර්ථික නිදහසක් නැතිව වහල් ජීවිතයක් හා සමාන ජීවිතයක් ගත කළ අතර ඒ සමාජයේම උසස් විද්වතුන් යැයි තමන් හඳුනා ගත් පුද්ගලයන් ජීවත්වූයේ ඉහළ මට්ටමකිනි. මවුන් මවුන්ගේ ජනයන් සමග කිසිදු සහායත්වයක්, සාරධර්මයක් නැතිව තිරිසනුන් හා සමානව කටයුතු කළහ. මවුන්ට සටනෙහි හෝ සමාදානයෙහි හෝ ස්වාධීනව රැකියා කිරීමට හෝ ස්වකැමැත්තක් සේසත් රැස්කිරීමට අවස්ථාවක්, නිදහසක් හෝ නැති තරම් විය. නමුදු ඒ කාලය තුල අරාබි අර්ධද්වීපය තුල ජීවත්වූ එක්

ප්‍රවීන උසස් අරාබි සමාජයක් සියලු ක්ෂේත්‍රයේ උසස් ස්ථානයක වැජඹුණු අතර ස්වාධීනව ක්‍රියා කරමින් සිටියේය. එසේම කියන්නට තරම් විශාල සටනක් නොවූවද ඔවුන් සිතෙන් සහ කයෙන් එඩිතරව සටන්වලට මුහුණ දෙන අය ලෙසද, ශක්තිමත් සහ පෞරුෂත්වයෙන් යුත් අය ලෙසද වූහ.

එදා විසූ අනෙකුත් සමාජයේ භුදුජනයන් දිළිඳු කමෙන් සහ නැතිබැරි කමෙන් පීඩිතව පහළ තත්වයේ පසුවෙද්දී ඒ සමාජයේ බොහෝ නායකයින්ද, තමන් වංශවතුන් යැයි පවසා ගත් අයද පූජකයන්ද, සුඛෝපභෝගී සුකුමාර ජීවිතයක් ගත කළහ. ඔවුන් තම සමාජයේ ජනයන් තලා පෙලා පාලනය කළ අතර මක්කා පුරයේ ජීවත්වූ එක් අරාබි සමාජක් උසස් තැනක් උසුලමින් ඒ සියලු දුදන ක්‍රියාවෙන් අක්‍රමික තාවයන්ගෙන් නිදහස් ව ජීවත් වන්නට විය.

එදා විසූ ඒ අරාබි සමාජය බොහෝසෙයින් දිව සහ භාෂණයේ ප්‍රමුඛත්වය හෙබවමින් උසස් අන්දමින් විය. බුද්ධිමතුන් ලෙස කටයුතු කිරීමෙන්ද, ඕනෑම කරුණක් උදෙසා වචන හසුරුවීමේ වාග් හරඹයේ, කවීත්වයේ, තමා කෙරෙහිද, බාහිර සමාජය කෙරෙහිද බලපෑමක් ඇති කරන්නට තරම් සමත්වූ සමාජයක් බවට පත්ව සිටියේය. දේව ප්‍රතිපත්තිය වැනි අධ්‍යාත්මික සාරධර්ම ඥානයේද, එහි නීතිරීති ගැනද, ලෞකික කරුණු හා සම්බන්ධ වාග් හරඹෙහි යෙදෙන්නද ඔවුන් සාක්ෂාත් කරගෙන තිබුණු පාරසාරික සහ පාරම්පරික භාෂාමය දියුණුව සමාජය තුල කැපී පෙනෙන්නට ඔවුන්ට විශාල වරමක් බවටපත්ව තිබුණේය. නමුදු එවකට අරාබි කරයේ විසිරී ජීවත් වූ අනෙකුත් සමාජ වැසියන් ආගමික අධ්‍යාත්මික ප්‍රතිපදාවන් සහ සංකල්පය ආශ්‍රිතව සංස්ථාපනය කරගෙන තිබුණු මුරණ්ඩුකම, තීව්‍රත්වය, සහ ගෝත්‍ර වාදීව පරස්පර මත නිසා සාමූහික එකඟවීමෙන් තොරව බෙදී වෙන්වී පසු වන්නට විය.

එවන් පසුබිමක ඔවුන් හාෂිත වාග් හැකියාවෙන් අන් ගෝත්‍රයන්ටත් වඩා උසස් තත්ත්වයකට පත්වී තිබුණේය.

තවද ඒ අරාබි සමාජය ලබා තිබුණු අති උසස් තත්ත්වය ගැන ගණනය කරන විට ඔවුන්ගේ සමාජීය කටයුතු තිබුණු ස්වභාවයකින් එය සමාජ මට්ටමින් කා අතරත් අනුමත වූ එකක් බවට පත්ව තිබුණේය. අනෙකුත් සමාජය තුල කලා රසයෙන්, පාරම්පරික හස්ත කර්මාන්තයේ සැළකිය හැකි සංස්කෘතික සහ පාරිසාරික දියුණුවක්, ලබා තිබුණද ඒ අරාබි සමාජයේ පැවැත්ම සෘජු සමාදාන තත්ත්වයක් තුල ක්‍රියාවෙමින් තිබුණේ අනෙක් සමාජ වැසියන් විශ්මයට පත් කරවන අන්දමිනි.

ඥානය, සිහිබුද්ධිය සහ හැකියාව එක්තැන් කර ස්වෛරීව හසුරුවා එය සෘජු ජීවන මංපෙත්තක් වෙනුවෙන් හැඩ ගස්වා විශ්වය තුල ප්‍රසාරණය වී ඇති තමා විසින් පහසුවෙන් ලබා ගත හැකි ඛණිජ, ශාක සම්පත් සහ සත්ත්ව සම්පත් වැන්න එක් තැන් කර මිනිස් සම්භවයේ සමෘධිය උදෙසා කටයුතු කරන්නට වෙනසක් පෙරලියක් ඇති කරන්නට ප්‍රමුඛ වූයේ ඒ අරාබි සමාජය දිවි වදනින් ලද ඉස්ලාමීය ශෝධනය වේ.

එහෙයින් සර්වබල අල්ලාහ් දෙවිඳු වක්තෘ මුහම්මද් තුමා මගින් ගෙන හැර පෑමට සැළැස්වූ ශෝධන ක්‍රියා කාරීත්වයට සුදුසුම සමාජය ලෙස ඒ අරාබි සමාජය පත් කළේය.

3. එකඟවීම සහ මගපෙන්වීම : වක්තෘ මුහම්මද් තුමාගේ පාරම්පරික පැවැත්ම එතුමාගේ වංශය තුල අති උසස් ස්ථාවරයක් ඇති කරන්නට තරම් සමත්විය. ඒ ගැන අල්කුර්ආනය මෙසේ කරුණ විස්තර කරයි : *'ඇත්තෙන්ම අල්ලාහ් ආදම් ද, නූහුද, ඉබ්රාහීම්ගේ පෙලපතද, ඉම්රාන්ගේ පෙළපතද මිහිපිට අයගෙන් උසස් ලෙස තෝරා ගත්තේය'.* (3 : 33)

අල්ලාහ් දෙවිඳු විසින් අවසාන වක්තෘත්වය උදෙසා තෝරා ගත් මුහම්මද් තුමාගේ මීමුත්තා හාෂිම් ආදම්ගේ

පෙලපතෙන් පැවත එන කුරෙෂ් වංශයේ කිනානා වරුන්ගෙන් තෝරාගත් පුරවැසියෙකු වූ අතර, මැදකාලීන සමාජයේ වක්තෘ ඉස්හාක්ගේ පෙලපතේ අය උතුම් සමාජය ලෙස වැජඹුනු සේ, මුහම්මද් තුමා වක්තෘ ඉස්මාඊල්ගේ පෙලපතේ මුල් සහ අවසාන පෙලේ උතුම් පුද්ගලයා වේ.

අල්ලාහ් ඒ කුරෛෂ් වංශිකයන්ගෙන් උතුම් පුද්ගලයන් තෝරාගත් හේතුව ගැන බලන විට විශේෂිතව පුණ්‍ය භූමියක් වන මක්කා පුරවරය තුල මවුන් ජීවත්වී සිටීමද, එහි පිහිටි අල්ලාහ් වන්දනාමාන කරනු වස් බිහිවූ මුල්ම දේවස්ථානය සම්භාවණයට පත් වී තිබීමද, ඇත එපිට සිට පැමිණ එහි පදිංචියට පැමිණ ස්ථිර වූ ඉබ්රා හීම්ගේ පුත් ඉස්මාඊල්ගේ පැවැත්මද හේතුන් යන්න සක්සුදක්සේ පැහැදිලිය. එසේම ඒ ඉස්මාඊල්ගේ වංශි කයන් විනය, ආත්මීය අධ්‍යාත්මීය අතින් අති උසස් ස්ථානයක් සාක්ෂාත් කරගෙන සිටී අතර වාග්මාලා වෙහිද මවුන් ලබා තිබුණේ හසල නිපුණත්වයකි.

ඒ කුරෛෂ් වංශිකයන් ලද තවත් ප්‍රධාන ගෞරවයක් වූයේ එතුමාගේ පරම්පරාවේ මීමුත්තෙකු වන අම්රු බින් අබ්දුල් මනාෆ් නැමැත්තාට ලැබුණු හාෂිම් වංශිකයා යන විරුධා වලියද විශේෂයෙන් සඳහන් කළ හැකිය. මින් පෙර කිසිවෙකු විසින් සම්පාදනය නොකළ අන්දමින් ප්‍රණිත ආහාර සූදානම් කර මහ ජනයන් හට සැපයීමේ මහා වැදගත් කරුණකට ඔහු මුල පිරෙව්වේය. තද සාගත කාලයේදී පවා සමාජ වැසියන්ට ආහාරපානයෙන් සැළ කුවේ කිසිදු අඩුපාඩුවක් නොපෙනෙන විලසිනි. හාෂිම් යනුවෙන් අරාබි වදනකින් නියෝජනය වන පහසු ලෙස අනුභව කිරීම පිණිස යන අර්ථවත් වන අන්දමින් පහසු කර ආහාර සැපයූ හෙයින් ඔහුට ඒ නම වලංගු වන්නට වූ බව කියවේ. තවද මක්කා පුණ්‍ය ස්ථානයේ වාර්ෂිකව පැවැත්වෙන උත්සවයට පැමිණෙන

අයට පවා මහු කිසිදු අඩුවකින් තොරව ඒ ආහාර සලාකය සැපයුවේය. මිනැම සාගත අවස්ථාවක් එළඹුනද, ආහාර හිඟයක් පැන නැග්ගද හාෂිම් විසින් සූදානම් කර ප්‍රධානය කරන ලද ඒ ආහාර හෝ ඒ වෙනුවෙන් එළන ලද තට්ටුව හෝ කිසිදු අවස්ථාවක නතර නොවූයේ අපූරු විලසිනි.

තවද මුහම්මද් තුමාගේ මුත්තා හාෂිම්ගේ පුත් අබ්දුල් මුත් තලිබ් හාෂිම්ට නොදෙවැනි අත්දමින් පිණට දෙන කෙනෙකු ලෙස පුරුද්දක් කරගෙන සිටියේය. හෙතෙම මහපොළොවේ සතුන්ටද ඉහළ අඹරේ පක්ෂීන්ටද ආහාර සැපයුවේය. තමාට ඉඩ ලැබුණු සෑම අවස්ථාවකදීම තම ශ්‍රද්ධාවන්තකමට, නිදහස් අදහස්වලට, චින්තනයට සමාධිගතව හිරා කන්දට ගොස් භාවනාවෙහි යෙදීම කෙරෙහිද ප්‍රමුඛවූ මුල්ම කෙනා වූයේද මහුය. මිනිස් සිහිබුද්ධිය විකල්ප කළ හැකි සමජා සහජී වනය සෝදාපාළුවී විනාශ වී යා හැකි මත්පැනෙන්ද ඉවත් වී උදාර පුරුෂයෙකු ලෙස වැජඹෙන්නට විය.

කෙටියෙන් පවසතොත් එතුමාගේ වංශයේ අය අන් වංශයට වඩා හොඳ යහකම් පිරිසිදු චේතනාවෙන් උසස්ව සිටියහ. පසුව අල්ලාහ් දෙවිඳු හාෂිම් සමාජයෙන් මුහම්මද් තුමා බිහි කළ අතර එතුමා මිනිස් සමාජයේ උතුම් කෙනෙකු ලෙසද වූහ.

4. අල්ලාහ් සයථාර්ථයෙන්ම විනයගරුක සහ යහකම් කරන්නෙකු ලෙස පත් කළේය. වක්තෘත්වයට පෙරම තම සමාජයේ උසස් මානසික, විනයගරුක පිරිසිදු චේතනාවෙන් සහ චරිතයෙන් පිරුරණු කෙනෙකු ලෙස වූහ.

මුහම්මද් තුමා හෝ එතුමාගේ පියා හෝ කුරෛෂ්වරුන්ගෙන් ලෞකික හෝ ආගමික හෝ කිසිදු කටයුත්තක වගකීම් බාර ගෙන සිටියේ නැත. ඒ සමාජයේ අය කළ ඇදහිලි කළේ නැත. මවුන්ගේ රැස්වීම්වලට හෝ සහභාගි නොවූහ.

නායකත්වයට කැමැති හෝ එය බලාපොරොත්තු විය හැකි කිසිදු කතාවක් හෝ අදහසක් හෝ ඉදිරිපත් කළේ නැත.

වක්තෘත්වයට පෙරම කාගේත් ප්‍රසාධය දිනාගෙන සිටි එතුමා සත්‍යවන්තයෙකු ලෙසද, විශ්වාසවන්තයෙකු ලෙසද කිසිදු අවස්ථාවක නිකමට හෝ බොරුවක් නොකියන කෙනෙකු ලෙසද උසස් ගතිගුණවලින් හෙබි කෙනෙකු ලෙස වක්තෘත්වයට පෙරම සමාජයේ ඉහළ තත්ත්වයෙහි වැජඹූහ. තවද එතුමා අල් අමීන් හෙවත් සත්‍යවන්තයා ලෙසටද තම සමාජය තුල කිරුළු පැළඳූහ.

එතුමා සහ ශාරීරිකව වර්ධනය වී සුදුසු වයස වන තුරු මෙලෙසම පසුවූහ. එතුමාට මුදල් රැස්කිරීමේ තණ්හාවක් හෝ ප්‍රසිද්ධියට පත්විය යුතු බවට හෝ තනතුරු ලැබිය යුතුය යනුවෙන් හෝ අල්ලාහ් විසින් වහී හෙවත් දිව් වදන් පහළ වන තුරු නොවිය.

5. නුගත් කියවීමට හෝ පේලියක් ලිවීමට හෝ කවි කීමට හෝ චතුරව කතා කිරීමට හෝ නොදත් නුගත් සමාජයක බිහිවූ එතුමා සත්‍ය වක්තෘ වරයෙකු යන්නට එක් සාධකයකි. එතුමා තම ප්‍රචාරය තුලින්, යුක්තිගරුක නීතියක් ස්ථාපනය කිරීමටත්, සමාජ ප්‍රශ්නයන් සහමුලින්ම උපුටා තමා පිළි ගන්නන් හට නිරන්තර සෞභාග්‍යයට වගකිව යුතු සතුටක් ගෙන දෙන්නට වගකීම් බාර ගන්නටත්, දෙවිඳු හැර අන් අයට වහල් වීමෙන් ගැලවිය හැකි ඍජුමග පහදා දීමටත් විශාල ප්‍රචාරය ගෙන ආහ. එහෙයින් මේවා සියල්ල එතුමා සත්‍ය වක්තෘ වරයෙක් ලෙසටත්, ඒ වක්තෘත්වය සත්‍ය බවටත් ඇති සාදකයන් වේ.

## මුහම්මද් තුමාගේ වංශය සහ ජීවිතය

මුහම්මද් තුමා අරාබි සමාජයේ වක්තෘ ඉස්මාඊල් පෙලපතේ අද්නාන්ගේ පුත්‍රයාවූ නිසාර්ගේ පරම්පරාවෙන් පැවත එන

හාෂිම්ගේ පුත්‍රයා වන අබ්දුල් මුත්තලිබ්ගේ පුත් අබ්දුල්ලා ගේ පුත්‍රයා වේ. ඒ පරම්පරාව ගැන මදක් විමසා බලන කළ අද්නාන්ගේ පුත්‍රයා මඅද්ගේ පුත්‍රයා නිසාර්ගේ පුත් මුළර් වේ. මුළර්ගේ පුත් ඉල්යාස්ගේ පුත් මුද්රිකා වේ. මුද්රිකාගේ පුත් බින් හුසෛමා වේ. බින් හුසෛමා කිනානා යනුවෙන් ද ආමන්ත්‍රණය වේ. කිනානගේ පුත් නළර් වේ. නළර්ගේ පුත් මාලික් වේ. මාලික්ගේ පුත් ෆිහ්ර් වේ. ෆිහ්ර්ගේ පුත් ගාලිබ් වේ. ගාලිබ්ගේ පුත් ලුවයි වේ. ලුවයිගේ පුත් කඅබ්වේ. කඅබ්ගේ පුත් මුර්රා වේ. මුර් රාගේ පුත් හාකිම් වේ. හකීම්ගේ පුත් කුයසි වේ. කුසයි ගේ පුත් අබ්දුල් මනාෆ් වේ. අබ්දුල් මනාෆ්ගේ පුත් හාෂිම් වේ. හාෂිම්ගේ පුත් අබ්දුල් මුත්තලිබ් වේ. මුහම්මද් තුමා අබ්දුල් මුත්තලිබ්ගේ පුත් අබ්දුල්ලාහ්ගේ පුතා වේ.

එතුමාගේ මව අබ්දුල් මනාෆ්ගේ පුත් වන වහබ්ගේ දුව වේ. අබ්ල් මනාෆ් සහ්රාගේ පුත්‍රයා වේ. සහ්රා මුහම්මද් තුමා ගේ මීමුත්තෙකුගේ සහෝදරයෙකු වේ. ඇය විවාහ කරගත් අබ්දුල්ලාහ් චාරිත්‍රානුකූලව ඇය සමග තෙදිනක් ඇගේ නිවසේ රැඳුනු අතර ඉනික්බිති ආමිනා පිළිසිඳ ගත්තාය. පිළිසිඳගත් පසු අන් කාන්තාවක් පත්වන සේ ඇයට කිසිදු වේදනාවක් හෝ අමාරුවක් නොවිය. ඇය තම ජීවිත කාලය තුල පතිවත් කුල කාන්තාවක් ලෙසද අන් කාන්තාවන් සේ පමාජ කතාබස් වලට හවුල් නොවූ කාන්තාවක් ලෙසද පසු වූවාය. ඇය මුහම්මද් තුමා පිළිසිඳ ගත් අවස්ථාවේ එතරම් වේදනාවක් මහන්සියකින් තොරව මනා ශරීර සෞඛ්‍යයෙන් සිටියාය.

ඇය පන්සිය හැත්තෑ එක්වන ගජ වර්ෂය යනුවෙන් නම් වන වර්ෂයේ නිරෝගී, පරි සමාප්ත, ලස්සන තම බිළිඳා ප්‍රසූතිය කළාය. එතුමා ඉපදින්නටත් පෙර එතුමාගේ පියා වියොවූ හෙයින් එතුමා සීයාගේ භාරකාරත්වයට පත්වූහ.

තෝදිනක් පමණ එතුමා එතුමාගේ මවගේ කිරෙන් සප්පායම්වූ අතර පසුව කිරි දී ඇතිදැඩි කිරීමට එතුමාගේ සීයා විසින් හලීමා සඅදිය්යා නම් කාන්තාවකට බාර දෙන ලදී. එදා විසූ අරාබීන් මනා ශරීර සෞඛ්‍ය සහ නිහතමානී ලෙස තම ළමයින් වැඩීමට මෙසේ පිටිසර කාන්තාවන්ට බාර දීම සිරිතක් විය.

තම බිළිඳුන්ගේ කාය කටුක කාන්තාර භූමියට සරිලන මෙරොත්තු දෙන විලසින් ශක්තිය වඩවා ගැනීම පිණිසද සමාජයේ මනා වාග් ප්‍රවාහය සහ සුරුබුහුටි අන්දමින් ධෛර්යමත්ව අරාබි අර්ධද්වීපයේ විසිරී සිටින අනෙකුත් වංශිකයන් සහ ගෝත්‍රිකන් හට එඩිතරව මුහුණ දීමේ ස්වභාවයට සරිගනු වස්ද තම ළමුන් පිටිසර බදවින් අරාබි ගෝත්‍රයේ කාන්තාවන් හට පවරා ඇති දැඩි කිරීමේ පුරුද් දක් නාගරික අරාබීන් අතර වූ සාමාන්‍ය සිරිතක් විය. මක්කා වෙළඳ පොළට පැමිණි කාන්තාවන් අතර මක්කාවට මදක් ඔබ්බෙන් පිහිටි තායිෆ් සානුවට අසල ගම්මානයකින් පැමිණි අම්රුගේ වංශයේ හලීමා සඅදියියා නම් කාන්තාවක්ද වූවාය. මක්කා වෙළඳ පොළට පැමිණි කාන්තාවන් පෙරට පැමිණ ධනවත් පවුල්වල ළමයි ඇති දැඩි කිරීමට භාර ගත් අතර හලීමා අනාථ දරුවෙක්ව සිටි කුඩා මුහම්මද් තුමා භාර ගත්තාය.

ඇය මුහම්මද් තුමා ඇතිදැඩි කිරීමට බාරගත් පසු ඇගේ පවුලේ අපූරු සිදුවීම් කීපයක් දුටුවාය. ඇය මක්කාවට පැමිණි කොට්ටු ඔටුනාම්බියගේ බුරුලූ කිරි නැතිව වැහැරී තිබුණු නමුදු මක්කා සිට ආපසු තම ගමට හැරෙන කළ කිරෙන් බරවී තිබිණි. පෙර කුසීත කමක් පෙන්වමින් සෙමෙන්සෙමෙන් ගමන් කළ ඔවුන් ආ කොට්ටු බූරුවා ආපසු යන විට අනෙක් සතුන්ද පසුකරගෙන වේගයෙන් පෙරට යන්නට වූයේ අපූරු විලසිනි. සියලු දෙනා මවිතයට පත් කරමින් ඒ වැහැරුනු ඔටුවා අනෙක් ඒවා පරයා ගමන් කරන්නට විය. මෙසේ හලීමා

කුඩා මුහම්මද් තුමා රැගෙන තම ගමට යන අතර සිදුවූ තවත් සමහර කුතුහල දනවන අපූරු සිදුවීම් කීපයක්ම විය.

දිළිඳුකමේ එරුණු හලීමා කිරි නොඑරූ වැහැරුණු තන මඬලකින් යුත් කාන්තාවක් ලෙස පත්ව සිටියාය. කුඩා කිරි බොන ළමයෙකුගේ මවෙකු වූ ඇය කුසගින්න නිසා අඬන ළමයා කිරෙන් සතුටු කිරීමට තරම් මගක් නැතිව දුකට පත් වූවාය. නමුදු පුදුමයකි. මුහම්මද් තුමා ඇගෙන් කිරිබීමට පටන් ගත් පසු ඇගේ තන මඬල කිරිවලින් පිරෙන්නට විය. ඇය මුහම්මද් තුමාට සහ තමාගේ දරුවාටද සෑහීමට පත් වන අයුරු කිරි පොවා ඇයද සෑහීමකට පත් වූවාය.

දරුවාගේ ලැබීමෙන් පසු හලීමාගේ නිස්සාර කෙත්වතු සහ බෝග අපූරු අන්දමට සරුවන්නට වූ අතර ඇගේ කිරි සම්පත්ද යම් වර්ධනයක් ඇති වී පහසු සහ සතුටු වන අන්දමට ඇගේ දිළිඳුකමද ක්‍රමිකව වෙනස් වී ඈ තරමක සාරවත් ජීවිතයක් ගත කරන්නට වූවාය. ඒ ළමයා දෙඅවුරුද්දක් පමණ ඇතිදැඩි කිරීමෙන් පසු හලීමා ළමයා රැගෙන ආපසු භාර දෙනු වස් ඔහුගේ මව වෙත ගෙන ගියාය. ඒ ළමයා තමන් සමග පසුවන කල තමන්ට සමෘධිමත් කලක් ගෙවුනු නිසා, හලීමා ඒ ළමයා තවත් කලක් තමන් සමග රැඳී සිටින්නට අනුමත කරන ලෙස ඉල්ලා සිටියාය. ඉල්ලීමට ළමයාගේ මව ආමිනා එකඟ වූයෙන් හලීමා පස් වනක් ප්‍රීතියෙන් සිත පුරවා ගෙන ආපසු පැමිණියාය.

තවත් දෙඅවුරුද්දක් ගතවීමෙන් පසු ළමයාට අවුරුදු හතරක් පමණ වෙද්දී හලීමා ළමයා ආපසු ඔහුගේ මව වෙත ගොස් භාර දුන්නාය. එතුමාට අවුරුදු හයක් පමණ වෙද්දී ඔහුගේ මවද ජීවිතක්ෂයට පත් වූවාය. පසුව එතුමා දෙඅවුරුද්දක් පමණ එතුමාගේ සීයා අබ්දුල් මුත්තලිබ් භාරයේ පසුවූ අතර, ඔහුද මරණයට පත්වීමෙන් පසු එතුමාගේ මහප්පා වන

අබූ තාලිබ්ගේ භාරකාරත්වයට පත්විය. අබූතාලිබ් තම ළමයින්ට වඩා ආදරයෙන් සහ උසස් අන්දමින් එතුමාගේ භාරකාරත්වයේ පසු වූහ.

අබූතාලිබ් තරමක අඩුලුහුඩුකමෙන් යුත් ජීවිතයක් ගත කළේය. එතුමා සුඛෝපභෝගී ජීවිතයක් ගත කළ පුද්ගලයෙකු නොවේ. එසේ සුඛෝපභෝගී ජීවිතයක පසු නොවූයේ අල්ලාහ් විසින් එතුමාට කළ විශේෂ ලැදියාව නිසාය. එතුමා හලීමාගේ භාරකාරත්වය යටතෙහි පසුවන කළ තම කිරි සහෝදරයන් සමග එළුබැටළු පාලනය කිරීමෙහි නිරත වී සතුටුට පත්වූහ. එසේම මක්කාහීද එතුමා එළුබැටළු පාලනයෙහි නිරතවී තම උවමනාව උපයා ගත්හ. එතුමාට අවුරුදු දොළහකුත් දෙමසකුත් දින විස්සක් පමණ වෙද්දී අබූතාලිබ් සමග තවලමක් හා සිරියාව බලා පිටත්වූහ. සිරියාව බලා යන අතර මගදී බහීරා නම් කිතුනු පූජකයෙක් මුණගැසුණු අවස්ථාවක ඔහු මුහම්මද් තුමාගේ උරෙහි තිබුණු වක් නෘත්වයේ මුද්‍රාව දැක මේ ළමයා යුදෙව්වන්ගේ සතුරු උවදුරු වලට භාජනය විය හැකි බව අනුතුරු ඇඟවිය.

එසේම තවත් වරක් ධනවතෙතකු වන කුවයිලිද්ගේ දුව කදීජාගේ වෙළඳ භාණ්ඩ රැගෙන සිරියාවට ගොස් විකුණා අන් කිසිවෙකු නොදුන් තරමක ලාභයක් උපයා දුන්හ. එසේ විශාල ලාභයක් ලබාගත් ඇය එයට වඩා දෙගුණයක සේතක් කෙරෙහි උත්සාහ කළාය. එයින් ඇයට එලොව සහ මෙලොව සෞභාග්‍යද ලැබුණේය.

වයසින් හතළිහක්වූ කදීජා කුරෛෂ් ගෝත්‍රයේ සුරූපි බුද්ධිමත් පරිපූර්ණ කාන්තාවක් වූවාය. ඇය වෙත පිහිටා තිබුණු ඒසා හොඳ ගතිගුණ නිසා ඇය විසූ විවිධ දුශ්ශීල අසම්මත සමාජයේ පවා නොමනා වත්පිළිවෙතින් ඈත්වූ පිරිසිදු කාන්තාවක් ලෙස ප්‍රසිද්ධියට පත්ව සිටියාය. එසේම තවමලක්

හා සිරියාවට ගිය ඇගේ දාසයා මයිසරා මගින් මුල් අවස්ථාවේ සිරියාවේ කිතුනු පූජක තුමා අබූතාලිබ්ට දැනුම් දුන් සේ මුහම්මද් තුමා ගැන වූ බොහෝ තොරතුරු ලබා ගත්තාය. ඒවා දැනගැනීමෙන් එතුමා සමග විවාහවීම කෙරෙහි ඇගේ සිත ඇදී ගියේ අපූරු සහගත අන්දමින්ය. ඇය මෙයට පෙර දෙවතාවක් විවාහ ජීවිතයට ඇතුල්වී මවුන් කාලක්‍රියා වූයෙන් වෛදව්‍ය බවට පත්ව සිටි කාන්තාවකි. මුහම්මද් තුමා ඇය හා එතුමා විවාහ ජීවිතයකට එළඹෙන කළ වයස අවුරුදු විසිපහක් වූ අතර ඇයට අවුරුදු හතළිහක් පමණ විය.

අය ජීවතුන් අතර පසුවන කළ නබි තුමා අන් කිසිවෙකු විවාහ කර ගත්තේ නැත. ඇය සේ අන් කාන්තාවක් කෙරෙහි ආදරය දැක්වූයේද නැත. එතුමිය වක්තෘත්වයෙන් දස අවුරුද්දකට පසු කාලක්‍රියා කළාය. අගේ වියොවෙන් පසු මුහම්මද් තුමා එතුමිය ගැන බොහො සෙයින් මතක් කරමින් පසුවූහ. එතුමියගේ නාමයෙන් පින්දහම්ද කරමින්ද එතුමියගේ යෙහෙළියන්ට තෑගිබෝග දෙමින්ද මවුන් සතුටට පත කළහ. තවත් බොහෝ අවස්ථාවන්හී තමා වෙත පැමිණෙන දුගී දුප්පතුන්ට දානමානයෙන් සැළකුවේ පිරී ගිය ඉතාසිතින්ය. මාරියතුල් කිබ්තිය්යාට දාව උපන් ඉබ්රාහීම් හැර එතුමාගේ සියලු දරුවන් එතුමියට දාව උපන්නෝය.

මෙවා වහී නම් පරම දෙවිඳුගේ ගගන හෙළි කිරීම පහළ වීමට පෙරවූ මුහම්මද් තුමාගේ ජීවන මගේ සමහර ඉතිහාස සංසිද්ධීන් ගැන කරුණුය.

වහි ආරම්භය

ඥානයෙන් සහ ශරීර ශක්තියෙන් මුහුකුරා යද්දී මුහම්මද් තුමා තම හතළිස් වැනි කණුවද පසු කරමින් සිටියහ. එසේ හතළිස් විය එළ මෙනවාත් සමග එතුමාට සර්වබල දෙවිඳු අල්ලාහ්ගේ වහි හෙවත් පරමාධාපත්‍ය දිව් වදන් වන ඒ උසස්

පණිවුඩය ළඟා වන්නට විය. වහි පහළ වීමේ මූලාරම්භය හොඳ සිහිනයක් හා මනා සිහිබුද්ධියෙන් පටන් ගැනුණි. සමහරවිට පරමාධිපත්‍ය දැනුම් දීමෙන් හෙබී තොරතුරු වලින් මුසුවූ එතුමා දුටු සමහර සිහින අරුණෝදය සේ එතුමා නැගිට පසුද පැහැදිළිව එතුමාගේ සිත්තුල සනිටුහන් වී තිබුණි.

මුහම්මද් තුමා හුදෙකලාවේ තනිව සිටීමට බොහෝ සෙයින් ප්‍රිය කළහ. ඒ සඳහා එතුමා හිරා නම් ගුහාව තුල තනිව රෑ කීපයක් පරම පිවිතුරු දෙවිඳු සිහි කරමින් පසුවූහ. ඒ සමහර අවස්ථාවන්හී කදීජා වෙත පැමිණ තමන්ට උවමනා ආහාරපාන සූදානම් කරගෙන නැවතත් හිරාවෙහිම පසුවූහ. එතුමාගේ ඒ පිවිතුරු ශ්‍රධාවන්තකමට උත්සාහයට කදීජා තුමියගෙන් ලැබුණේ නොමද රුකුලකි. හිරාවේ පසුවන කළ කීපයකම එතුමාගේ නින්ද හා දැක ගන්නට හැකිවූ විවිධ ගුප්ත අරුත්බර සිහින වැළකි. ඒ සිහින වැළ එතුමාගේ වක්තෘත්වයේ පෙර සූදානම එතුමා මත පැටවෙන්නට යන මහා යුතුකම් සම්භාරය සහ එතුමා පත්වන්නට යන මහා වගකීම ගැන එතුමාටත් පෙර දැනුම් දීමක් වූවා විය හැකිය.

පූණ්‍ය රමළාන් මාසයේ ගුවන් මගෙන් වූ අසහාය සත්‍ය පණිවුඩය එනතුරු එතුමාගේ හැසිරීම එසේම විය. මෙවන් අවස්ථාවේ අග්‍රසුරදූත ජිබ්රීල් මුල්වතාවට තම දෙවියාගේ ආඥාව පරිදි දේව පණිවිඩය රැගෙන පැමිණියේය. 'ඉක්රඋ' යනුවෙන් පැවසීමට බලකරමින් රමළාන් මාසයේ එතුමාට වහි හෙවත් දේව පහළ වීම් පහළ වන්නටය විය. එයට මුහම්මද් තුමා 'මා කියවන් නට නොදනිම්'යි උත්තර දුන්හ. නැවතත් සුරදූත ජිබ්රීල් ඉක්රඋ යනුවෙන් පවසන්නට වූ කළ මුහම්මද් තුමාද 'මා කියවන්නට දන්නා කෙනෙක් නොව' යනුවෙන් තම ගැන කෙටි පිළිවදනකින් හෙළි කළහ. නැවත සුරදූත ජිබ්රීල් යනුවෙන් නැවතත් කියවන්නට බලකර සිටියද නැවත වරක්ද

එතුමගේ පිළිවදන පෙර සේම විය. මුහම්මද් තුමාගේ සියලු උත්තරයෙන් පසු තම බාහුව සමග තද කර වැළඳ ගත් සුරදූත ජිබ්රීල් පවසන ලෙස නැවතත් දැනුම් දුන්නේය.

තෙවන වර තද වනසේ වැළඳ ගෙන ලිහිල් ලෙස මුදවා හැර තමා ගෙන ආ පණිවුඩය පවසන ලෙස පවසන්නට විය. නමුදු මුහම්මද් තුමා කියවන්නට තරම් උගතෙක් නොවිය. නමුදු සර්වඥාන දෙවිඳුගේ ඒ ඓතිහාසික මුල් පහළ වීම අල්කුර්ආනයේ වැකි කීපයකින් මෙසේ විය :

*'නිර්මාණය කළාවූ ඔබ හිමිගේ නාමයෙන් කියව. ඔහු මිනිසා සණ ලේ කැටියෙන් නිර්මාණය කළේය. කියව. ඔබගේ හිමි අති උදාරය. ලියන්නයකින් උගැන්වූ ඔහු - ඔහු (මිනිසා) නොදන්නා දැය ඔහුට උගැන්විය.* (96 : 1-5)

මුළින්ම පහළවූ මේ උධාර සූර වැකිය ඥාන ගවේශය සහ අධ්‍යයනය ගැන අණ කරමින්, මිනිසාගේ නිර්මාණය ගැන පැහැදිළි කරමින් පහළ වන්නට විය. ඒ මුල් සුරවදන් පහළ වීමක් සමග ආරම්භ වූ සුරවදන් පහළ වීම එතුමාගේ ජීවිත කාලයේ අවපස දක්වාම නොකඩවාම පුරා විසිතුන් වසරක් සිදුවෙමින් පැවතුනි. ඒ අපූරු සහගත අත්දැකීමත් සමග මුහම්මද් තුමා තැති ගත්තෙකු විලසින් වහා නිවසට පැමිණ තමා සන රෙද්දකින් පොරවන ලෙස බිරිඳ කදීජාගෙන් ඉල්ලා සිටියහ. අල්ලාහ් දෙවිඳුගේ අනුග්‍රහයේ කෙසේ විස්තර කරන්නද? සුරදූතයා එතුමාට දුන් දේව වදන්පෙළ එතුමා ඒ ලෙසින්ම වනපොත් කළහ. එතුමාට හිරා ලෙනෙහි ඇති වුනු ඒ අපූරු අත්දැකීම නිසා තමා මරණයට පත්වේදෝ යන බියක්ද තමාට ඇති වූ බව එතුමා තම ආදරණීය බිරිඳ සමග පැවසූ කළ එතුමාගේ බිය තුරන්වන තුරු පොරවා පසුව තමාට වූ හදිය ගැන කදීජා තුමිටය දැනුම් දුන්හ.

එතුමිය එතුමා අස්වසාලතු වස් 'ඔබ තිකම් සිතේ බියක් ඇති කර ගෙන'යි පැවසූවාය. 'අල්ලාහ් කිසිදාක ඔබව තිකරුණේ අත් හරින්නේ නැත. මන්දයත් ඔබ පවුලේ හිතමිතුරන් සමග එක්ව කරුණාවෙන් ජීවත් වන්නෙක්. අනුන් වෙනුවෙන් කරදර ඔබ මත පටවා ගන්නෙක්. නැති බැරි අය වෙනුවෙන් මහන්සි වන්නෙක්. බෙලහීනයන්ට ශක්තිමත් කරන්නෙක්. කරදරයට පත්වූවන්ට යුක්තිය වෙනුවෙන් උදව් වන්නෙක්.

ඒ ඥානවන්ත කත 'මිනිසාට හොඳ කිරීමේ පුරුද්ද කා තමා සතු කර ගෙන ඇත්දෝ, අල්ලාහ් කිසිවිටෙක ඔහු අත් හරින්නේ නැත'යි වටහා ගෙන සිටියාය. සදා යහකම් කරන්නන් හට ඔවුන්ගේ ක්‍රියාවන් හට සුදුසු ඵලවිපාක ලබා දීම තත්ත්වය උසස් කිරීම කරුණාබර දෙවිඳුගේ පිළිවෙතකි. කදීජා තුමිය තම සෙනෙහබර වදන් තුලින් තම සැමියාගේ බියසැක තුරන් කරන්නට හැකි නැතක් දැරුවෙ ආදරණීය බිරිඳක් ඉටු කළ යුතු අති උසස් යුතුකම් සම්භාරය නොමදව ඉටු කරමිනි.

පසුව කදීජා තුමිය ඒ ගැන මනා ලෙස වටහා ගතු වස් තම සාසනික දැනුමක් ඇති නැකමෙන් සුළු පියෙකු වන වයෝ වෘධ ඇස් පෙනීම පවා දුර්වල වරකා බින් නව්ෆල් වෙත මුහම්මද් කැඳවා ගෙන ගියහ. ඔහු බයිබලය හීබ්රූ බසෙන් ලියන්නට හැකි දක්ෂ කිතුනු භක්තිකයෙකි. මනාව මුහම්මද් තුමා ඔහු වෙත කැඳවා ගෙන ගොස් කදීජා 'මුහම්මද් කියන්නේ කුමක්දැයි මදක් ඇහුම්කන් දෙන්නයි' පැවසූවාය. තමා දුටුවේ කුමක්දැයි වරකා බින් නව්ෆල් විමසූ කළ එතුමා තමා දුටු සියල්ල ඔහු හා පවසන්නට වූහ. සියල්ල සවිස්තරව ඇහුම් කන් දුන් වරකා 'පුතුනේ, ඔබ වෙත පැමිණියේ මූසා වෙත පැමිණි නාමූස් නම් සුරදූතයාය. මා තරුණයෙකු ලෙස පසුවිය

යුතු නොවේද? ඔබගේ ජනයන් ඔබ පිටමං කරන විට ජීවතුන් අතර සිටිය යුතු නොවේද'යි පැවසුවේය.

'ඔවුන් මා පිටකරනවාද' යි මුහම්මද් තුමා විමසූහ. 'ඇත්තෙන්ම ඔව්. ඔබ මෙවැනි පණිවුඩ ගෙන ආ අය තම ජනයන්ගේ මහත් නොමපයට පත් වූහ. එවිට මා ජීවතුන් අතර සිටියානම් මා ඔබට විශාල පිටිවහලක් ලෙස ඉන්නම්' යි වරකා පැවසුවේය. ඉන් සුළු දිනකට පසු වරකා ජීවිත ක්ෂයට පත් විය. මුහම්මද් තුමා තම අත්දැකීමක් මෙසේ විස්තර කළහ : 'දිනක් මම පැමිණෙන කළ ගුවනෙන් ශබ්දක් ඇසුනි. මගේ මගේ බැල්ම අහස දෙසට යොමු කළෙමි. මම හිරාහී දුටු පැමිණ සුරදූතයා දුටුවෙමි'.

පසුව අවුරුදු තුනක් පමණ දේව පහළවීම පහළ නොවී තිබුණි. ඒ දීර්ඝ නිහැඬියාව තවත් දේවහෙළිකිරීම් ලබාගැනීම පිණිස ධෛර්යය සහ එඩිතරව එතුමා සූදානම් කළේය. දේව හෙළි කිරීමෙන් තොරව ගෙවීගිය කාලය දේව පහළ කිරීම කෙරෙහි එතුමාගේ ආශාව, උනන්දුව වඩවඩාත් අධික කරන්නට විය. නැවතත් සුරදූතයා දුටු වහා එතුමා බියට පත්වූහ. නමුදු ඒ බිය පෙර දිනක වූ හො සමානය බියකරු එකක් ලෙස නොවිය. නමුදු තම අත්දකීමෙන් ලැබූ පැටලිලි සහිත අවස්ථා වෙන් සහනයක් ලබා ගතු වස් වහා කඩිසරව නිවසට ගිය එතුමා තමා පොරවන ලෙස තම බිරිඳට පැවසූහ.

ගතවූයේ මොහොතකි. ඒ අවස්ථාවේ මතු සඳහන් දිව්‍යවදන පහළ වන්නට විය. *'පොරවා ගෙන පසුවන තැනැත්තේ, පොරෝනයෙන් ඉවත්වී නැගිට මිනිසුනට අනුශාසනය කරව. ඔබ හිමි අති ශ්‍රේෂ්ඨයයි උත්කෘෂ්ට කරව. ඔබගේ වස්ත්‍ර පිරිසිදු කරව. (සියලු පිළිම වන්දනාමාන) පිළිකුලෙන් වෙන් වව්'.* (73 : 1-5)

එහි අර්ථය මෙසේ වේ : නිවසට වී පොරවා ගෙන සිටිනා මගේ කීකරු අනුවැසිය, ඔබගේ ඇඳුම් සහ අභ්‍යන්තරව සහ බාහිරව සම්පූර්නයෙන්ම පිරිසිදු කර ගනිව. ඔබගේ ක්‍රියාවන් වැනි සියල්ල ආදේශ කිරීම පිළිම වන්දනාව සහ නොමනා මිත්‍යා ඇදහිලි නම් අපිරිසිදුවෙන් ඉඳුරාම පිරිසිදු වව. ව්‍යාජ පිළිම වන්දනාවෙන් ඉවත්වී එකමදෙවිඳු පමණක් වන්දනාමාන කරන ලෙස මිනිසුනට අනුශාසනා කරනු. අල්ලාහ් දෙවිඳුගේ විවෘත සත්‍ය ඇමතුම ඔවුන් වෙත යොමු කරව. පිළිම වන්ද නාව පිළිකුල් කර පිළිම වන්දනාකරවන්ගෙන් ඉවත් වව.

ඒ විවෘත ඇමතුම සහ ආඥාව සමග පටන්ගත් දේව හෙළි කිරීම් එතුමාගේ වියෝව දක්වා එසේම අඛණ්ඩව පවතින්නට විය. මුහම්මද් තුමා තම දෙවිඳු ආඥා කළ අයුරු අල්ලාහ් පමණක් වන්දනාමාන කරන ලෙසත්, සියලු දහමන් අවසානයට පත්ව ඉස්ලාම් දහම පමණක් මිනිසාට තෝරා ගත් බවත්, අවස්ථාවෝචිත ප්‍රඥාවෙන්ද, ලක්‍ෂණ උපදේශන වලින්ද, තිවුණු ක්‍රියාකාරකම් වලින්ද මැනවින් ඔවුන් සමග විවාද කරද තම දෙවිඳුගේ මාර්ගයේ මිනිසුන් අමතන ලෙසත් ඒ දේව පහළ කිරීම් විධානය කරන්නට විය.

ඒ ඇමතුමට කාන්තාවන්ගෙන් මුලින්ම ඔහුගේ බිරිඳද, පිරිමි න්ගෙන් අබූබක්ර් සිද්දීක්ද, කුඩා ළමුන්ගෙන් අලි බින් අබී තාලිබ්ද ඇහුම් කන්දී ඉස්ලාම් දහම පිළිගත් අතර, පසුව ක්‍රමිකව ඉස්ලාම් දහමට ජනයන් ඇතුල් වන්නට වූහ. මුහම්මද් තුමා විසින් ප්‍රචාරය කරන ලද නව ප්‍රතිපත්තිට ඉඳුරාම විරුද්ධවූ සමහර ප්‍රබල ප්‍රභූන්ද අනෙකුත් මිසිදිටුවන්ද ඔවුන් කෙරෙහි භීෂණය මුදා හැරියහ. ඔවුන් තාඩනපීඩණවලට දුක් පීඩාවලට භාජණය කළහ. තවත් ප්‍රබල අය මක්කා වෙන් පලවා හැරියහ. එතුමාගේ කළණ මිතුරන්ට හිරිහැර කළ අතර, ප්‍රචාරය කිරීමේදීද හිංසාපීඩා කළහ. ඒ හිරි

හැරෙන් බේරෙන්න ඔවුන් දීර්ඝ කාලයකට පසුවූ ලැබුණු දේව නියෝගයක් මත මදීනාව කරා නික්ම ගියහ. එහිදීද එතුමාට සුර මගෙන් දෙව්වදන් නොනැවැතී පහළ වන්නට විය. ටික කලකට පසු විශාල ශ්‍රද්ධාවන්තයින් පිරිවරා ගෙන ආපසු පැමිණි එතුමාට මක්කා ජය අත් පත් කරගත්තේ විශාල සටනකින් හෝ ලේ හැළීමකින් තොරවූ සියළු අහිංසා වාදය මුල් කරගෙනය.

ඉන්පසු ඉස්ලාම් දහම පරිසමාප්තවූ අතර ඒයින් මුස්ලිම්වරු අති සම්භාණීය තත්ත්වයට පත් වූහ. උත්තම ඉස්ලාම් දහම් හී ව්‍යාප්තය සහ එහි ජනයන් දැක එතුමා ප්‍රීතියට පත්වූහ. පසුව ඉස්ලාම් දහම පහළ වීමේ පරිසමාප්ත සමග තම හැටතුන් වන වියේදී එතුමා සදහටම මෙලොවින් සමු ගත්හ. එතුමාගේ ජීවිතයේ හතලිස් වසරක් වක්තෘත්වයට පෙරද, අවුරුදු විසිතුනක් වක්තෘ වරයෙකු ලෙසද ගෙවී ගියේය.

එතුමා වක්තෘත්වයත් සමග දේවපණිවුඩ පැමිණීම අවසන් විය. ඒ අවසන් පණිවුඩය මිහිපිට වසන සියලු මිනිස් සහ ජින් වර්ගයා පිළිපැදීම කෙරෙහි වූ ආඥාවකි. ඒතුමාගේ ප්‍රචාරය පිළිගෙන ඒ අනුව කටයුතු කරන්නේ කවරෙක්ද ඔහුට මිහිපිට සෞභාග්‍යමත් ජීවිතයක් ලැබෙන අතර මතු ලොවේ අති ප්‍රමුදිත ස්වර්ගයට පිවිසීමටද අවස්ථාව ලැබෙනු ඇත. එතුමාට අකීකරු වී තම හද මනසට වහල්වී කටයුතු කරන්නේ කවරෙක්ද ඔහුට දුක් පීඩාවෙන් හෙබී දුඃඛිත ජීවිතයක් ගත කරන්නට සිදුවන අතර මතුලොවද දුර්භාග්‍ය අන්දමින් නිරයට ඇතුල් වීමට සිදුවනු ඇත.

අල්ලාහ්ගේ නියමය පරිදි එතුමාගේ වියොවෙන් පසු, එතුමාගේ කළණ මිතුරන් ඒ මග ඒ විලසින්ම පිළිපැදුහ. එතුමාගේ ඒ සත්‍ය දහම අනුන්ටද වෙහෙස නොබලා දිවා රෑ ප්‍රචාරය කර නවත් රටවල් කීපයක්ම තම සත්‍ය ප්‍රචාරය

තුලින් ජය ගත්හ. පරමාත්ථ දිනය දක්වා සජීවීව පසු වන්නේ මුහම්මද් තුමාගේ ප්‍රචාරය ඉස්ලාම් දහම පමණි.

එතුමාගේ දහම පරමාත්ථ දිනය දක්වා පවතිනු ඇත. නුගත් සමාජයක බිහිවුනු මුහම්මද් තුමා, මිනිස් ඉතිහාසයේ විශාල පෙරළියක් සහ වෙනස් වීමක් ඇති කළ ඒ භවතා ගැන කෙසේ පවසන්නද? නීතිරීතිහී, ප්‍රතිපත්තියෙහි සහ අනෙකුත් ලෞකික කටයුත්තන්හී අප්‍රමාණ වෙනස්කම් ඇති කළහ. එක් සියවස තුල එහි භාෂාව සමඟ බටහිර අප්‍රිකාව සහ යුරෝපයේ දේශ සීමා දක්වාද, නැගෙනහිර මහචීන දේශ සීමාව දක්වාද ව්‍යාප්ත විය. අසංඛ්‍යාත සමාජයන් සහ රට රාජ්‍යවල් එයට කීකරුවූ අතර අසංඛ්‍යාත මිනිසුන් එදෙසට ඇදී ආහ. එය සාක්ෂාත් කරගත් ජය අතර ශිෂ්ටාචාරය, යුක්තිය, දයාන්විත වැනි සියලු දේ සම්මිශ්‍රණය වී තිබුණි. ඒ දක්වා අඥානයේ පසුව සමාජ අල්කුර්ආනය කැලුම් දහරාවෙන් පහන්වූ දැණුමෙන් ලෞකික දැනුම සහ චින්තන වාදයද ඒ හා ඥාන වර්ධනය වැනි මිනිස් සමාජයේ සුවහසක් ප්‍රගතියෙන් මිහිපිට දිදුලන්නට විය. මෙවන් ජය සර්ව ඥාන, යුක්තිගරුග කෙනෙකුගේ දිවි වදනින් මිස, මහුගේ දයාබර, සර්වබල, බල සම්පන්න දෙවියෙකුගේ පිටිවහලෙන් මිස, අන් කෙනෙකුගෙන් සාක්ෂාත් කර ගත හැකිදැයි විමසා බලන්නට වටී.

## මුහම්මද් තුමාගේ උසස් චරිතය ලක්ෂණ

මුහම්මද් තුමා මිනිස් සමාජයේ අද්විතීය උසස් ගති ගුණ වලින් සහ විනයෙන් හෙබි කෙනෙකු ලෙස දිදුළන්නට වූහ. වක්තෘත්වයට පෙරද එතුමාගේ චරිතය මෙසේ උසස් බවෙන් පිරී තිබුණි. ඒ කරුණු සාක්ෂාත් කරනු වස් අල්ලාහ් දෙව්දුම අල්කුර්ආනය තුලින් එතුමා අමතා මෙසේ විස්තර කරයි : '*(නබිතුමනි) ඇත්තෙන්ම අති ශ්‍රේෂ්ඨ වූ යහගුණෙහිය*'.(68 : 4)

දයාන්විත දෙවිඳු එතුමා හොඳ ගතිගුණ කෙරෙහි යොමු කර සම්භාවණයට පත් කළේය. ඒ ගතිගුණ අල්ලාහ් දෙවිඳුගේ ආඥාවෙන් හෙබි අල්කුර්ආනය පවසන අයුරු හැඩ ගස්වන ලදී. එසේම සමාජ ශික්ෂාවේ සාධර්මයේ අති ඉහළ තැනක් නියෝජනය කළ එතුමා අනෙක් අයද ඒ අර්ථානුසාරයෙන්ම හැඩ ගස්සනට වූහ. එතුමාගේ ගුණදහමන් හුදෙක් මිනිසුන්ට වඩා ඥාන වන්තය. මිනිසුන් අතර යුක්ති ගරුකව උධාර ලෙස හැසිරුනහ. තම චරිතයෙහි නොකැළැල් අන්දමින් කටයුතු කළා මෙන්ම ඕනෑම අවස්ථාවක අනුන්ට උදව් උපකාර කරන්නෙකු ලෙසද පත්ව සිටියහ. ලද දෙයින් තෘප්තිමත් වීමේ මහා ගුණධර්මයක් තමා සතු කරගෙන සිටි එතුමා තම වත්කම හසුරුවමින් උඩඟු නොවී පොහොසතෙකු හා සමානව කටයුතු කළහ.

එතුමා තමා පළඳින සෙරෙප්පුව කැඩුණු කළ කිසිදු ආඩම්බරයකින් තොරව අළුත් වැඩියා කරගත්හ. එසේම බිරිඳන් කීප දෙනෙකුම වුවද තම ඉරුණු ඇඳුම එතුමාම මසා ගත්හ. ගේදොර වැඩකටයුතුවලදී තම බිරිඳන්ට පිටිවහල් වූහ. තම බිරිඳන්ට මස් වැනි දේ කපා දෙමින් මුළුතැන්ගේ කටයුතුවලදීද එතුමා තම උපරිම සහයෝගය ලබා දුන්හ. ලැජ්ජාශීලී වීමෙහි එතුමා අනුන්ට වඩා තම තත්ත්වය ආරක්ෂා කරන්නෙකු ලෙසද ඕනෑම අනුන් මුණ ගැසුණු කළ එතුමා උඩඟු ලෙස තම බැල්ම ඔවුන් ගෙන් අහක් කර ගත්තේ නැත.

ආගන්තුක සත්කාර පිණිස ඕනෑම කෙනෙකු ඇමතු කළ එයට සතුටෙන් පිළිවදන් දී ඒ වෙනුවෙන් පෙනී සිටියහ. සුලු එකක් වුවද අනුන් ප්‍රධානය කළ තෑග්ග සිත් සතුටෙන් පිළිගෙන තෘප්තිමත් වූහ. සමහර අවස්ථාවන්හී ඒ වෙනුවෙන් ප්‍රති උපකාරද කළහ. එතුමා තම දෙව කටයුතු අතපසු කරන්නන් සහ නොසැළකිල්ලෙන් පසුවන්නන්ට තරහ වන

කෙනෙකු ලෙස පත්ව සිටියහ. ඒ හැර අන් කිසිවිටෙක තුවුව මනාවෙන් කේන්ති ගත්තේ නැත. කුසගින්නට කෑම කිසිවක් නොවී නම් යටිබඩෙහි ගලක් බැඳ ගත්හ. ලැබුණු දෙයකින් කා තෘප්තිමත් වූහ. ලැබුණු ආහාරය කුමක් වුවද කිසිවිටෙක ඒවා විවේචනය කළේ නැත. ආහාරය පිණිස එක් රටඉදි ගෙඩියක් ලැබුණද එය කෑහ. රසකර බදින ලද එළු මස් වුවද, පිටියෙන් හෝ බාර්ලියෙන් හෝ තනන ලද දේ කෑහ. මිහිරි කෑම හෝ වේවා මීපැනි හෝ වේවා සිත්සතුටෙන් අනුභව කළහ. ආහාර කිසිවක් නැතිව මුදවාපු කිරි පමණක් ලැබුණද එයින් තෘප්තිමත් වූහ. පැණි කොමඩු ලැබුණද නොවන්නට නොපැසුනු රටඉදි ලැබුණද ඒවාද කෑහ.

ආරංචිවූ වහාම ලෙඩරෝගයට පත් අය බැහැදැක ගැනීමට ගියහ. මල ගමන්වලට සහභාගි වූහ. සතුරන් අතර කිසිදු බියෙන් තොරව ඇවිද ගෙන ගියහ. මිනිසුන් අතර කිසිදු උඩඟු ගතියක් නොපෙන්වා ගරුසරු නෙකෙකු වූහ. මවුන් හා හැසිරීමේදීද පිළිපැද්දේ එවැනිම පිළිවෙතකි. කතා කරන විට කෙටියෙන් පැහැදිළිව සිත් වසිකරවන ලෙස කතා කළහ. හැඩරුවෙන්ද එතුමා අනුන් වශිකරවන කඩවසම් පුද්ගලයෙකු ලෙස වූහ. ආගමික නීතිරීතිවලට පටහැනි නොවූ මෙලොව කටයුත්තන් හට පවා එතුමා එතරම් ලොල් වූයේ නැත. ලෞකික සැපසම්පත් වැනි කිසිවක් එතුමාගේ ලෝකොත්තර ජීවිතය සහ එහි කටයුතුඅඩපන කළේද නැත.

එතුමා සාමාන්‍ය හෝ අනෙක් ඒවා හෝ දහමට පටහැනි නොවූ ලැබුණු ඇඳුමක් ඇඳ ගත්හ. ඔටුදෙන, වෙළඹ, බූරුවා හෝ කොටළුවා හෝ මත එතුමාට ලැබුණු සත්ව වාහනයක නැග ගමන් කළහ. එවන් පහසුකමක් නොලද කළ ඇවිද පයින් තම ගමන් කටයුතු කරන අයෙකු ලෙසද වූහ. තවත් සමහර අවස්ථාවන්හී පාවහන් නොමැතිවද ගමන් කළහ.

දුප්පතුන් සමග සභාවල සමව වාඩිවූහ. හෝද බිත්තයකින් තොරව දිළිඳුන් හා එක්වී ආහාර අනුභව කර ඒ අය සම්භාවණයට පත් කළහ. සම්භාණිය පුද්ගලයන්ට ගරුකර සැළකූහ. ඔවුන්ට උදව් උපකාර කර සුහදව හැසිරෙනු ඇත. තම පවුලේ අය සමගද සුහදව කටයුතු කරන අතර සම්භාවණිය පුද්ගලයන්ව ඔවුන්ට වඩා උසස් කරන්නේද නැත.

නොහික්මුණු අන්දමින් කිසිවෙකුට සැළකුවේ නැත. කිසිවෙකු හා පරුෂව හැසිරුණේද නැත. සමාව අයදින් නාගේ සමාව අති ඉහළින් පිළිගත්හ. සත්‍යයක් සහ එය අසන්නා ප්‍රියම නාපශිලී නොවන්නට විනෝදය පිණිස කිසිවෙකුට විහිළු නොකළහ. අධික ශබ්ද නොකර අනුන් ප්‍රියවන අයුරු සිනාසුනහ. තම පවුලේ අය යම්යම් අවස්ථාවක තරගයට කෙලියෙහි යෙදෙමින් දිවීමේ තරගවලටද සහභාගි වූහ. සමහරවිට කාන්තාවන්ගේ ආවේණික චරිතය අනුව තම බිරිඳන්ගේ කතාව තම කතාවට වඩා අධික ශබ්දයෙන් වුවද එතුමා ඒවාට ඉවසුමෙන් ඇහුම්කන් දුන්හ.

අල්ලාහ් වෙනුවෙන්වූ යහකර්මයක නියැලී හෝ අත්හළ නොහැකි අවශ්‍ය උවමනාවක් නොවන්නට කාලය නිකරුණේ ගෙවන්නේ නැත. කිසිවිසෙත් දුප්පතෙකු මහුගේ දිළිඳුකම හේතුකොට ගෙන නින්දා කළේ නැත. කිසිම රජේකුට ඔහුගේ පාලනයට බිය වූයේ නැත. රජේකු සහ දිළිඳෙකුට එකම අයුරින් අමතන පුරුද්දක් එතුමාට විය.

කර්කශ රටක කාන්තාර ප්‍රදේශයක දිළිඳෙකු ලෙස ජීවත් වූහ. සත්ගුණ, ප්‍රසිද්ධ ආචාරශීලීත්වය, පෙර සහ පසු අයගේ තොරතුරු, මතු ලොවේ ජයගහණය සහ ලොවේ සෞභාග්‍ය, එහි විනාශය වැනි සියල්ල අනුනව අල්ලාහ් විසින් එතුමාට වටහා දෙන ලදී.

උවමනාවක් පිණිස එතුමා වෙත කවුරු පැමිණියද වහා මවුන් සමග ගොස් මවුන්ගේ උවමනාවන් හැකිඅයුරෙන් සපුරා දුන්හ. එතුමා මුහුණ ඇඹුල් කරන අයෙකු ලෙස හෝ රෞද්‍ර ලෙස හෝ කඩමණ්ඩිය අසල කැගැසන අතිවාර්යේ කාලය කා දමන අයෙකු ලෙස හෝ පසු නොවූහ. තමාට නපුරුකම් කළ අයට නපුරෙන් පිළි වදන් නොදී උදාරව සමාව දුන්හ.

ඕනෑම අවස්ථාවක මුණගැසෙන භවතාට මුලින්ම සලාම් කියා ප්‍රියශීලීව වැළඳගෙන සුභ පැතීම එතුමාගේ යහපත් ගතිගුණ දහම්වලින් එකකි. යමෙකු උවමනාවක් පිණිස එතුමා මුණ ගැසෙන්නට පැමිණි කළ මහු ආපසු හැරී යන තුරු ඉවසූ මෙන් පසුවනු ඇත. යමෙකු එතුමාගේ අත අල්ලාගත් කළ මහු අත්හරින තුරු මුහම්මද් තුමා මහුගේ අත තම ග්‍රහණ යෙන් මුදවා හරින්නේ නැත. එතුමාගේ කළණ මිතුරන්ගෙන් යමෙකු මුණ ගැසුණු කළ මහුගේ අත් ඇඟිලි ගෙන තම ඇඟලි හා අමුනා ගෙන සතුටෙන් වැළඳගෙන පිළිගත්හ. බොහෝසෙයින් එතුමාගේ වාඩිවීම දෙපා ඇහිටුවාගෙන දැනෙන් එය වටකර අල්ලා ගනිමින් විය. තම කලණ මිතුරන් අතර එතුමාට කියා විශේෂ අසුනක් නොවූ අතර සභාව අවසන් වන ස්ථානයේ අසුන් ගත්හ.

වාඩිවන ශාලාව හෝ සබය විශාල නොවන්නට එතුමා තම මිතුරන් අතරෙහි වාඩිවී මවුන්ට හිරිහැර වන අයුරු වාඩිවුනේ නැත. එතුමා තම කොට්ටය මත හාන්සිවී සිටින කළ යමෙකු පැමිණියා නම් ආගන්තුකයා ප්‍රතික්ෂේප කළද බලයෙන්ම තමා වාඩිවී සිටින කොට්ටය මහුට සතුටෙන් පුදන්නේය.

මෙසේ එතුමාගේ සබය විනීත ගරුසරු සබයක් වූ අතර විශ්වාසනීය අන්දමේ එකක් ලෙස ලෙලදෙන්නට විය. එතුමා තම මිතුරන්ට ගෞරව කරනු පිණිසද, මවුන් සිත් සතුටු වන අයුරු මවුන්ගේ පවුලේ නාමය අමතා හඳමනස පොබයන

විලසින් අමතන්නට පුරුදුව සිටියහ. එතුමාගේ මිතුරන් දැන දැන හෝ උවමානවෙන් හෝ එසේ පවුලේ නාමය අමතන්නට අමතක කළද එතුමා එසේ අමතන්නට පුරුදුව සිටියහ. එසේම කාන්තාවන්ටද ඔවුන් සතුටුවන ලෙස ඔවුන්ගේ ළමයින්ගේ නම ආමන්ත්‍රණය කරමින් අසවලාගේ මැණිය යනු වෙන් සම්භාවණීය අන්දමින් අමතන පුරුද්දක් එතුමාට විය. කුඩා ළමුන්ගේ සිත සතුටු වන අන්දමන් ඔවුන්ටද එසේ සම්භාවණීය අන්දමින් අමතන පුරුද්දක් එතුමා සතු විය.

එතුමා මිනිසුන් විටින්විට කෝපවීමෙන් ඉවත් කළහ. සෑම දේ කෙරෙහිම හදමනස පිරෙන් අන්දමින් තෘප්තිමත් වීමට උනන්දු කළහ. එතුමා මිනිසුන් අතර උසස් පුද්ගලයෙක් ලෙස වැජඹූහ. තා අතරත් පරිත්‍යාගශීලී පුද්ගලයෙකි. ප්‍රයෝජ නවත්න පුද්ගලයෙකි. එතුමා උදක්ම සෑම දෙයක්ම පහසු කර ගන්නට වෙර දරූ අතර, දුෂ්කර කරගන්නට අකැමැති වූහ. තමාට වඩා උසස් යැයි සැළකෙන කෙනෙකු දුටු කළ ඔහුට ගරූ කළහ. ඔහු සමග නිතර පසු වන්නන්ට එතුමා දැක්වූයේ මහත් හිතවත් කමකි. මේවා එතුමා වෙත පිහිටී තිබුණු උසස් ගතිපැවතුම්වලින් සමහරකි.

**ඉංග්‍රීසි ගත්කරු තෝමස් කරලයිල්**

මධ්‍යස්තව කරුණු තෝරාබේරා ගෙන වටහා ගන්නන් මුහම්මද් තුමා විසින් ප්‍රචාරය කරන ලද දහම සත්‍ය එකක් බව අවිවාදිතව පිළි ගනු ඇතැයි යන්නට දෙවැනි මතයක් හෝ නැත. මන්දයත් ඉස්ලාම් දහම මිහිපිට ඇති දහම් වලින් සත්‍ය දහම යන්නට ඇති හේතුපාදක අනන්ත අප්‍රමාණය. ඉස්ලාම් දහම පිළිගැනීමට මැලිවන කෙනෙකු හෝ වැඩි ඇල්මක් නැති කෙනෙකු හෝ පවා ඉස්ලාම් දහම සහ එහි වක්තෘ වරයාගේ ජීවන වෘත්තාන්තය විවෘත හදමනසින් කියවන කළ ඒ සංකල්පනා අව්‍යාජ යමක් ගැන පැවසේ

යන්න මනාව වටහා ගනු ඇත. මන්දයත් යම් කරුණක් ගැන විරුද්ධ මතයක් දරණ කෙනෙකු පවා එහි යථාර්ථය සහ ගැන විවෘත සිතෙන් කරුණු සෙවීම තුලින් ඒ තුල අන්තර්ගත වී ඇති යථාර්ථ තත්ත්වය ගැන වටහා ගනු ඇත.

ඒ මැයෙන් ඉස්ලාම් දහම ගැන මධ්‍යස්ථව තම අදහස් උද හස් විවෘතව ඉදිරිපත් කිරීමට ඉදිරිපත්වූ නොමුස්ලිම් විද්වත්තු අති මහත්ය. ඉංග්‍රීසි ජාතික නොබල් සම්මාන ලාභී තොමස් කරලයිල් අග්‍ර සණයේ මාධ්‍ය වේදියෙක් මෙන්ම ඉතිහාස ගැන නොපැකිලිව කරුණු ඉදිරිපත් කළ කතෘ වරයෙකි. ඔහු තම ඉතිහාසේ වීරයන් යන කෘතියේ වක්තෘ මුහම්මද් තුමා සහ එතුමා විසින් ප්‍රචාරය කරන ලද ඉස්ලාම් දහම ගැන තම කිතුනු සහෝදරවරුන්ට විස්තර කරයි. ඒ විස්තර මුහම්මද් තුමා සහ එතුමාගේ ප්‍රචාරය තුලින් ප්‍රචාරය කරන ලද ඉස්ලාම් දහම සත්‍ය දහමක් යන්නට විශාල සාධකයකි.

ඉස්ලාම් දහමේ පරම සතුරන්, ඒ දහම ව්‍යාජ දහමක් යැයි බවසන්නන් සහ ඒ ගැන නොමනාපශීලී අදහස් දරන්නන් ඒ දහම ප්‍රචාරකයා වූ මුහම්මද් තුමා ද්‍රෝහියෙක්, කපටියෙක්, බොරු කාරයෙක්, බොරු ගොතා පවසන මනෝමය අදහස් ඉදිරිපත් කරන්නෙක්, නාන්නමාන්න සහ මහජන ප්‍රසිද්ධිය බලාපොරොත්තු වන කෙනෙක් යනුවෙන් එතුමා ගැන අමූලික අදහස් ඉදිරි පත් කරමින් ඔහු විසින් ප්‍රචාරය කරන ලද ඉස්ලාම් දහම නිහීන කොට විවේචනය කරන්නට වූහ. එතුමාගේ චරිතය ඝාතනය අරභයා කරන ලද එවන් අපවාද සහ මනෝමූලික කතා සහ ඉස්ලාම් දහම ගැන කරන විවේචන ඇසීමට පවා අප්‍රිල දනවන කතා බව ඒවාට සවන් යොමු කිරීමෙන් වැටහෙනු ඇත. එවන් අමූලික තකා මුදවා හරින්නන්ගේ අදහස් දුර්මත බව කරුණු පහදාදීම අපගේ පරම යුතුකමකි.

ඒ කාන්තාරයේ වක්තෘ වරයා විසින් විවෘතව ප්‍රචාරය කරන ලද පණිවිඩය සියවස දොළොසකට අධිකව මිහිපිට අට්දික් භාගයේ මිලියන දෙසියයක් පමණ දෙනා පිළිපදිමින් නවතවත් දියුණුව කරා පිය නගනු අප ඉදිරියෙහි විරාජමානව පවතී. ඉස්ලාම් දහම කෙරේ ඇති නොමනාපශීලී මාත්සර අදහසින් පසු වන්නන් විස්තර කරන ලෙස ඒ දහම පිළිගෙන එහිම මියගිය අසංඛ්‍යාත ජනකාය පසුවන්නේ බොරුව තුල, කුහක කම තුල, අව්‍යාජය තුල යනුවෙන් විවෘත චින්තනයෙන් හදමනස පුරවාගත් ඔබගෙන් කිසිවෙකු හෝ සිතනවාද?

බොරුව, වංචාව සහ වෙනත් දුස්සාධ්‍ය අමූලික කරුණු පිළි ගන්නන් වත්මන් සමාජය තුල අස්සක් මුල්ලක් නැර පැතිරී සිටියද ඒ අදහස පිළිගැනීමට මගේ විවෘත හදමනස කිසිසේත් සූදානම් නැත. මන්දයත් වත්මන් සමාජ වැසියන්ගෙන් බහු තරයන් යමෙකු කියන දේ කරුණු නොවිමසා බලා එසේම පිළිගන්නට සූදානමින් සිටිති. අසහාය දිව්‍යමය පණිවුඩයක් ලොවට ඉදිරිපත් කළ එවැනි පුද්ගලයෙකු ගැන තිහීන අන්දමින් කතා කිරීම කිසිසේත් අනුමත කළ නොහැකි අශිෂ්ඨ සම්පන්න කරුණකි. එසේ මුග්ධ අන්දමින් කරුණු ඉදිරිපත් කරන්නන් අවිඥානයේ මස්තකයෙහිම පසුවනවා යනුවෙන් පවසනවා මිස අන් කුමක් ලෙස පැවසීමට වටීද?

මනා ලෞකික දැනුමක් ලබා ගතයුතු යැයි බලාපොරොත්තු වන්නන් ඒ අදැමිටුවන්ගේ කරුණු අදහස් ගැන ප්‍රවේශම් විය යුතුය. මන්දයත් ඒ අදහස් සහ කරුණු විස්තර කිරීම් මිනිසා මිසිදිටු නම් අඳුරු ආගාධයේ ගෙන ගොස් ඇර ලිය හැකි අතර කිසිදු වාස්තවික අදහස් නොපිළි ගන්නා සමාජය තුල මඩු දුවන අඥානශීලී පිළිවතකි. ඔවුන්ගේ ඒ අත්තනෝමතික අදහස් සහ කරුණු මගින් සක්සු දක්සේ පැහැදිලි වන්නේ නැගී එන සත්‍ය දහමක් කෙරෙහිවූ ඔවුන්ගේ පහත් තිහීන

අභිප්‍රාය සහ මනාවබෝධයකින් තොරව අකමතීය ක්‍රියා පිළිවෙ තක් පිළි පදින්නන් යනුවෙන් විස්තර කළ හැකිය.

ලොවේ කුමණ තැනක ජීවත් වූවද ඔවුන් පවසන ඒ පහත් අඥාන අදහස්වලට වඩා පහත් අදහසක් අසා නැතැයි කිව හැකිය. එහෙයින් සහෝදරවරුනි, කිසිදු සාධකයක් නැති බොරු වදන් පෙලක් ගොතා දහමක් නිර්මාණයක් කර එය සදාතනිකව මිහිපිට පැතිරෙමින් ව්‍යාප්ත කරවන්නට කිසිදු පහසුකමක් නැති තනි පුද්ගලයෙකුට ශක්තියක් වේද යන්න මදක් සිතා බැලිය යුතු කරුණකි. එවැනි ප්‍රයත්නයක කිසිවිටෙක ජය නොලබන බව ඔබ මනාව දනී.

දැනීමකින් තොරව තමා ගෙවල් නිර්මාණය කිරීමට දක්ෂ යයි, පවසමින් ඉදිරිපත් වන කෙනෙකු ගඩොල්, සිමෙන්ති වැලි සහ හුණු වැනි දේ සහ එහි මිශ්‍රණය ගැන දැනුමක් නැතිව නිවසක් තැනීමට වැඩ පටන් ගන්නේ නම් ඔහුගෙන් ඒ වැඩ කටයුත්ත කිසිසේත් බලාපොරොත්තු විය නොහැකිය. කෙසේ හෝ එසේ මෙසේ නිවස තනා අවසන් කළද ඔහු මනා නිවසක් තැනූ බවට පිළිගත නොහැකි අතර ඔහුට ලබාදුන් ගොඩනැගිලි ද්‍රව්‍යයන් නාස්ති කළා යැයි මිස අන් කෙසේ පවසන්නද? කරුණු මෙසේ නම් සියවස් දෙළොහක් තිස්සේ මිලයන දෙසියයක් පමණ දෙනා විසින් පිළිගෙන පිළිපැද ගෙන එන අයුරු ඒ දහම ප්‍රසාරණ වී තිබීම නොසළකා හැරීමට නොහැකිය. කිසිදු සාධකයකින් තොරව ඔවුන් පවසන අන්දමින් ඒ දහම ව්‍යාජ අස්ථිර මනෝමය දහමක් වේ නම් මුහම්මද් තුමා විසින් ඉදිරි පත් කරන ලද සංකල්ප සහ අදහස් පිටුදැක නොඅනුමත වී කවදාදෝ මෙලොවින් තුරන්වී නැතිවී යන්නට තිබුණි.

එහෙයින් වක්තෘ මුහම්මද් තුමා බොරුකාරයෙකු ලෙස හෝ මනෝමය අදහස් ඉදිරිපත් කරන කෙනෙකු ලෙස හෝ ඔහු

තමා විසින් ඉදිරිපත් කරන ව්‍යාජ කරුණු සත්‍ය කරනු වස් වෙනත් ත්‍රාන්ත්‍රික, කුට්ල උපායයන් කරන්නෙක් ලෙස හෝ නොවන්නට නානාන්තර සහ නාන්නමාන්න ලබා ගන්නා අටියෙන් හෝ මහු තම ප්‍රචාරය දියත් කළේය යනුවෙන් හෝ කිසිසේත් කීමට නොහැකි අතර එතුමා ප්‍රචාරය කළේ සත්‍ය දහමකි. එතුමා විසින් ඉදිරිපත් කරන ලද සියළු කරුණු පිළිගත හැකි වාස්තවික ඒවා බව සක්සුදක්සේ පැහැදිලිය. එහෙයින් කිසිදු සාධකයකින් තොරව එතුමා සහ එතුමා ප්‍රචාරය කරන ලද දහම කෙරෙහි වක්‍ර දෘෂ්ටියෙන් මාත්සර්ය සිතෙන් බලන අය පවසන අයුරු එතුමා කුහකයෙකු හෝ බොරු කාරයෙකු හෝ නානාන්තර ලබා ගන්නා අටියෙන් ක්‍රියා කරන්නෙක් හෝ නොවන බව අප වටහා ගනු වටී.

එදා සමාජය තුල පාෂාණිභූත වී තිබුණු ව්‍යාජ අදහස්, මිත්‍යාන්ත සහ දෙවත්වය ගැන වූ වැදගම්මකට නැති දුර්මත ඉවත්කර මිනිසා සෘජු සමාජ පැවැත්මක් කෙරෙහි යොමු කරන්නට ඉදිරිපත් කළ සංකල්පය ඉස්ලාම් දහම පමණක් වේ. කිසිදු අධ්‍යයපනයක් නොලබා මෙවන් අසහාය සංකල්ප යක් ඉදිරිපත් කර තිබෙනවා නම් එතුමා විසින් ප්‍රචාරය කරන ලද සංකල්පය අව්‍යාජ සත්‍ය දහමක් යන්න සුපැහැදිලිය. එසේම එතුමා විසින් ඉදිරිපත් කරන ලද ඒ ප්‍රතිපදාව අන් කිසිදු මිනිසෙකු වෙතින් හෝ එතුමා ලබා ගත්තේ නැත. නමුදු පෙර මිහිපිට නියෝජනය කර අපවත්වී ගිය අනෙකුත් වක්තෘ වරුන්ගේ චරිත සහ උසස් ගුණාංගද එතුමා තමා සතු කර ගෙන සිටියහ. මා මවුන් ගැන ලෞකික දෙයකට උපමා කරන්නේ නම් මවුන් මිහිපිට ආලෝකය විහිදු වමින් පසුවන ප්‍රදීපාලෝකය යනුවෙන් උපමා කරමි. ඒ සමාජ වැසියන් ආදර්ශමත් ජීවිතයක් ගත කරමින් අනුන්ට යහමග ප්‍රචාරය කරමින් තම දිවි පෙවෙත ගෙවන්නට වූහ.

මිහිපිට විසූ වක්තෘ වරුන්ගේ සමහර චරිතය ගැන විස්තර කරනවා නම් මවුන් සමාජය වෙත ඉදිරිපත් කළ ප්‍රතිපත්ති යෙහි නොසැලී ස්ථිරසාරව පසුවූහයි කිව හැකිය. එසේම මුහම්මද් තුමාද සත්‍ය වන්තයෙකු ලෙසද ඕනෑම කටයුත්තක් ගැන ගැඹුරු අන්දමින් කල්පනා කර කටයුතු කරන්නෙකු ලෙසද, සුදන ක්‍රියාවන්හී කඩිසරව නියලී ඒ උදෙසා කටයුතු කරන්නෙකු ලෙසද, කරුණාන්විත දයාන්වත කෙනෙකු ලෙසද, සෑමවිටම අල්ලාහ් දෙවිඳුට බියවූ ශ්‍රධාවන්තයෙකු ලෙසද නිදහස් චින්තන වාදියෙකු ලෙසද, මනා පුරුෂත්වයෙන් හෙබී කෙනෙකු ලෙසද, තීව්‍ර උත්සාහයෙන් උද්යෝගයෙන් කටයුතු කරන්නෙකු ලෙසද, අවංකව අල්ලාහ්ගේ ආඥාවන් සහ අනපනත්වලට වහා කීකරු වන කෙනෙකු ලෙසද, තම බිරිඳන් හා සම්භාවණීය අන්දමින් හැසිරෙන කෙනෙකු ලෙසද අනෙක් අය හා සිනිඳු ස්වභාවයෙන් ආශ්‍රය කරන්නෙකු ලෙසද, මිනිසුන් අතර මිහිරි කෙනෙකු ලෙසද පසුවූහ. එසේම සත්‍ය පවසා අනෙක් අය හා මවුන්ගේ සිත් නොපෑරෙන විලසින් උසුලුවිසුලු කරමින් සතුටෙන්ද, එතුමා විසින් ප්‍රචාරය කරන ලද සත්‍ය පණිවිඩය තවත් ස්ථිර කරනු වස් සෑම මොහොතකම සිනාමුසුව කටයුතු කරන්නෙකු ලෙසද, උසස් සමාගමක් පවත්වන්නෙකු ලෙසද,, ලෙසද පසු වූහ.

එතුමා සෑම මිනිසෙකු සමගම යුක්තිගරුක අන්දමින් කට යුතු කරන්නෙකු ලෙස වූහ. කිසිදු අවස්ථාවක කිසිවෙකු අතර භේදබින්නව කටයුතු කළේ නැත. එතුමාගේ අධිෂ්ටානයද සෑම මොහොතකම යුක්තිගරුක ලෙස කටයුතු කිරීමයි. එතුමා මනා නුවණැත්තෙකු ලෙසද වැජඹූහ. එතුමාගේ හද මනස අවංක අදහස්වලින් පිරී ඉතිරී තිබුණු අතර කිසිවිටෙක ප්‍රයෝගකාර හෝ වංචනික අදහස් හෝ එතුමාගේ චින්තනය තුල අරක් ගෙන තිබුණේ නැත. සියල්ලන්ගේ හදහමනස

පොබවන විලසින් සම්භාවණයට පත්වන අයුරු කටයුතු කරන් නෙකු ලෙස වූහ. එතුමා මෙසේ සියළු ක්ෂේත්‍රයේ දිදුලන අයුරු කටයුතු කළද අල්ලාහ් දෙවිඳු වෙතින් පැමිණෙන ආඥාවන් ඉවසිලිවන්තව ක්‍රියාවෙහි යෙදෙන්නෙක් ලෙස වූහ. එතුමා මේසා විශාල ගුණදහමන් තමා සතු කර ගෙන සිටියේ කිසිදු අධ්‍යාපනයකින් තොරවයි. එසේ ගොස් අධ්‍යාපනය ලබා ගත යුතුය යන උවමනාවක්ද එතුමාට උවමනා නොවිය. මන්ද යත් එතුමාගේ ආඥාදායී දෙවිඳු වන අල්ලාහ් දෙවිඳුම එවන් අසහාය ගුණාංගයන් එතුමා තුල ස්ථිර කර ඒවා අනුන්ටද ආදර්ශයක ලෙස ලබා ගන්නට සැළසුම් කළේය.

මෙවන් අසහාය චරිත සම්භාරයක් තමා සතු කරගෙන ලොවට ආදර්ශයක් වන අයුරෙන් තම දිවි පෙවෙත සකස් කර ගත් මුහම්මද් තුමා අහංකාරකමෙන් සහ උඩඟු කමෙන් පිරුණු මමත්වය කෙරෙහි ගිජුවූ රාජකීය නාත්නමාන්න සහ මහජන ප්‍රසිද්ධිය උදෙසා නූතන සංකල්පයක් සහ ප්‍රතිපදාවක් සකස් කර ඉදිරිපත් කළ බවත්, අනෙක් දහම් ලාභීන්ද, බහු දේව-නාස්තික වාදීන්ද එතුමාගේ චරිත ඝාතනය උදෙසා කටයුතු කරන්නේ කිසිදු සාදකයෙන් තොරවයි. නමුදු එතුමාගේ චරිතය සහ ගුණ වගාවන් එසේ හැල්ලට භාජනය වූ එකක් නොවන බව එතුමාගේ ජීවන චරිතය ගැන උනන්දුවෙන් අධ්‍යයනය කරන්නේ නම් මනාව වැටහා ගත හැකිය.

මුහම්මද් තුමා සෑම මොහොතකම තමා ගැන හඳුන්වා ගත්තේ තමා දුප්පතෙකුගේ පුතෙකු ලෙසය. එසේ තමා ගැන කිසිදු සාඩම්බරයකින් උඩඟුකමකින් තොරව ආමන්ත්‍රයණය කර ගන්නා මවුන් විසින් පවසන ලද ඒසා විශාල අවලාදවලට භාජනය වන්නේ කෙසේද? මවුන්ගේ වදන් වැදගැම්මකට නැති අනිවාර්ථ අවලාද මිස කිසිසේත් සත්‍ය කරුණක් විය නොහැකිය. එතුමා සෑම මොහොතකම තමා දුප්පතෙකු ලෙස

නාමධාරී කර ගත් හෙයින් මිනිසුන් අතර උදාර අන්දමින් කටයුතු කළ අතර දුප්පතුන්ගේ ආවේණික ගතිපැවැතුම් වන සිත් උණුවීම, අනුන් කෙරෙහි කරුණාව දයාව දැක්වීම, සෑම මොහොතකදීම අනුන්ට ප්‍රයෝජනවත් අන්දමින් කටයුතු කිරීම ලෞකික සැපසුවය කෙරෙහි අධික ආශාවන් නොදැක්වීම, තාන්මාන්න කෙරෙහි ලොල් නොවීම වැනි අති උදාර ගුණ එතුමා තමා සතු කර ගෙන සිටියහ.

මෙවන් අද්විතීය ගුණ දහමන් එතුමා සතුව වීම හුදෙක් සාදාරණ දෙයකැයි කිව හැකිය. මන්දයත් එතුමාගේ ප්‍රචාරක සමයේ ඉහළ පෙළේ සිටි වංශිකයන් සහ අනෙකුත් හිස උදම්මා ගෙන සිටි අය අස්ථිර, අශ්ලීල, ව්‍යාජ ගුණදහමන් තමන්ගේ සාර්ථකත්වයට හේතුයැයි මනෝමය ලොවක සක් මන් කරමින් සිටි සමයක එතුමා එවන් අස්ථිර ව්‍යාජ බොල් උඩඟුකම දෙස හැරී බැලුවේවත් නැතිව කටයුතු කිරීමට තම සිත මුළුමනින්ම යොමු කළේ එතුමා සර්ව අල්ලාහ්ගේ අසහාය දිව්‍යමය ආඥාවක් තමා වෙත පැවැරී ඇති නිසා මිස අන් කිසිදු හේතුවක් නිසා නොවේ.

එසේම එතුමා තමා ලබාගත් වක්තෘත්වයේ පණිවිඩය ස්ථිරව පවසතු වස් අල්ලාහ් විසින් පවසා දෙන ලද දේ සාමාන්‍ය මිනිසුගේ තත්ත්වයේ පසුවෙමින් ප්‍රචාරය කළේ ආදර්ශමත් අන්දමින්ය. යමෙකු මරණෙන් මතු සේන් වන ස්ථානයක් වන රුදුරු ඛේදවාචකයන් ගැනද එහි පමුණුවිය හැකි අඩු වම් සහ වේදනා ගැනද දැන ගෙන සිටියේ නම් තමා මිහිපිට උපන්නේ කුමන හේතුවක් උදෙසාද යන්න මනාව අවබෝධ කර ගතු ඇත. එතුමාගේ තුලවූ ඒ ස්ථිරසාර අදහස මිහිපිට ව්‍යාප්ත කිසිදු මායාවකින් වෙනස් කළ නොහැකි අන්දමින් විය. එවැනි ස්ථිරසාර අධිෂ්ඨානයකින් පසුවූ හෙයින් මිනැම විධියේ දිවි වදනක් හෝ දිවි ආඥාවක් හෝ පැමිණි යද

ඒවාට ඉඳුරාම යටත්වන බව තීරණය කර ගනිමින් ප්‍රියශීලී තුඹුරුවකින් එවා ක්‍රියාවෙහි යොදනු වස් කටයුතු කළහ. එහා ක්‍රියාවීමේ මෙවැනි ගුණ වගාවක් ඇති කෙනෙකු සර්ව බල දෙවිඳුගේ වක්තෘ වරයෙකු මිස අන් කෙනෙකු නොවන බව කිසිඳු සැකයක් නැත.

කොපමණ සුප්‍රසිද්ධ කෙනෙකු අදහසක් ඉදිරිපත් කළද ඒවා ඇසූ සුළු මොහොතකින් සිතෙහි නොරැඳී ඉවත් වී යන්නේ සැහැල්ලු පුළුන් රොදක් විලසිනි. නමුදු මුහම්මද් තුමා කතා කරන්නට පටන් ගත්තා නම් සියළු දෙනා ඔහු වෙත තම අවධානය යොමු කරන්නේ අපූරු අන්දමකිනි. එතුමාගේ මුවින් පිටවන එක්එක් වදන් පෙල එසේම කටපාඩම් කර ගැනීමට සුහදයන් තුල ඇති උනන්දුවද සර්ව ඥාන දෙවිඳු විසින් ලබාදී ඇති අපූරු සහගතය විශේෂත්වයකි.

මුහම්මද් තුමා බොරුකාරයෙක්, නාන්නමාන්න බලාපොරො ත්තු වන්නෙක් එතුමාගේ ක්‍රියාවන් මිනිස් පැවැත්මට පටහැනි ඒවා යනුවෙන් අවලාද කිරීම කිසිසෙත් පිළිගත නොහැකිය. එතුමා ගෙන ආ පණිවුඩය ඒ අරාබි සමාජය වෙත ඉදිරිපත් කළ විට ඔවුන් එතුමාට මුළුමනින්ම විරුද්ධ වූහ. පසුව ඒ තද සිත් සත්‍ය වටහා ගෙන එතුමාගේ ප්‍රචාරය වෙත නැඹුරු වූයේ අපූරු අන්දමින්ය. එතුමා විසින් ප්‍රචාරය කරන ලද ඒක දේවවාද ධර්මයේ මුල්ම වගන්තිය සියළු දනන් ඒ පණිවිඩය ඉතාසිතින් පිළිගත යුතු යන්නයි. මිහිපිට ඇති අනෙකුත් දහම්ද ඒ සංකල්පයම පවසයි. ඒ පිළිගෙන ඒ අනුව කටයුතු කරන්නා මිහිපිට සියළු සෞභාග්‍යයන් ලබා ගන්නේය.

එතුමාගේ ප්‍රචාරයට පෙර අරාබි සමාජය පිළිම වන්දනාවේ නිරත වෙමින් සූන්‍ය යන්ත්‍රමන්ත්‍රයන්හි තම සිත උකස් තබා සිටි අය වූහ. ඒ සියල්ල අවසානයට පත්කරනු වස් අල්ලාහ් දෙවිඳු විසින් ඉස්ලාම් දහම පහළ කරන ලදී. මෙවන් අසහාය

ධර්මයක් ප්‍රචාරය කළ අයෙකු කෙසේ බොරු කාරයෙකු ලෙස පවසන්නද? මෙවන් අසහාය සංකල්පයක් ලෝකයා ඉදිරිපිට තැබූ භවතා ආදරය කරුණාවෙන් පිරී මිනිස් භාවේ උතුම් පුද්ගලයෙක් නොවන්නේද? මා ඔහුට අවංකව ප්‍රේම කරමි යි කිවේ නම් ඒ මක්නිසාදැයි ඔබ විමසිය හැක. එයට හේතු කීපයක් ඉදිපත් කළ හැකිය. ප්‍රසිද්ධියට පත්වන්න එතුමා කිසිවක් කළේ නැත. සැම දෙනාම පවසනවා යනුවෙන් කිසිවක් පිරිසිදු චේථනාවෙන් මිස කළේද, අනුන් සමග නිකරුනේ කාලය කා දැමුවේ නැත. තමා වෙත නැති දෙයක් ඇතැයි කියා කුතර්ක කළේද කිසිවිටෙක උඩඟු වූයේද නිහීන ජීවිතයක් ගත කළේද නැත. මතුලොව ජීවිතය වෙනුවෙන් මිහිපිට කෙසේ කටයුතු කළ යුතුද යන්න සාමාන්‍ය මිනිසාට පමණක් නොව රෝමයේ පර්සියාවේ නිරිඳුන්ට පවා කීමට පසුබට වූයේද නැත.

තම ප්‍රචාර කටයුතු කාලයේදි මිසදිටුවන් දියත් කළ විශාල සේනාවන් දැක බිය වී පසුබට වූයේ නැත. කුඩා ළමුන් සමග ආදරයෙන් හසිරුනහ. තම බිරිඳන්ගෙන් පළමු කෙනා නොසළකා නව බිරිඳ සමග සතුටු වූයේ නැත. සියළු බිරිඳන් හා එක්සිත්ව එක්සත්ව කටයුතු කරන්නට කිසිවිටෙක අමතක කළේද නැත. මිනිසා මිහිපිට කෙසේ ජීවත් වූවා නම් ජය ලබාගත හැකිද, කෙසේ ජීවත්වූවා නම් අපරාජිතයෙක විය හැකිද යන්න පැහිදිලිව විස්තර කළහ. එතුමා තම සෙරෙප් පුව පළඳින විටද දහම අණදා කළ ලෙසම කළා මිස තම සිතට හැගෙන පරිදි කළේ නැත. සැම කටයුත්තක්ම උත්සාහයෙන්ද පිරිසිදු චේථනාවෙන්ද කරන්නට වග බලා ගත්හ. බොරු, රැවටීම, කුහක ලෙස කතා කිරීම එතුමාගේ ජීවිතය කාලය තුල කිසිසෙත් දැක ගත නොහැකිය. එවන්

අසහාය ගති පැවතුම් ඇති කෙනෙකුට ආදරය කිරීම සාධාරණය නොවන්නේද?

මිනිස් සමාජය භේද බින්නයෙන් තොර එකක් යැයි පැවසීම අන් සියළු නීතිවලට වඩා උසස් එකකි. එය දහමේ නීතියක් ලෙස කිරීම ඉස්ලාම් දහම මිනිසා දෙස යුක්තියුක්තව බලන සත්‍ය දහමක් යන්න සාක්ෂාත් වේ. එහෙයින් සත්‍ය විශ්වාස වන්තයෙකු මිහිපිට අන් සෑම මිනිසා සමගම සම්බන්ධකම් පවත්වමින් මුළු මිනිස් සමාජයම එකම සමාජයක් යන්න පැහැදිලි කරයි.

මහු විසින් ප්‍රචාරය කරන ලද අසහාය දහම දිනෙන්දින වර්ධනය වී මිහිපිට අටදික් භාගයේම ප්‍රසාරණය වී එහි ආලෝකය විහිදු වන්නට විය. ඒ ව්‍යාප්තවීම සහ ප්‍රසාරණය කෙතෙක් වේගයෙන් වී නම් සියවසක් වැනි සුළු කලක් තුල පෙරදිග අපරදිග දෙදික් භාගයේම වචනයකින් කිව නොහැකි අයුරු ව්‍යාප්ත වී ගියේය. එසේම ඉස්ලාමීය රාජ්‍ය බලප්‍රදේශය කොපමණ දුරට විහිදී ගියා යැයි පවසනවා නම් ඉන්දියාවට පාලකයෙක්, ස්පාඤ්ඤයට පාලකයෙක් යන තත්ත්වයක් ඇති කරන්නට තරම් සමත් විය. එසේ අති විශාල අන්දමින් ව්‍යාප්තව පැවැතුනු ඉස්ලාමීය රාජ්‍යය අද්විතීය ගුණාංගයෙන් සහ නීති ධර්මයෙන් හෙබි පාලනය ව්‍යුහයකින්ද ව්‍යක්ත ප්‍රතිපදාවන්ගෙන්ද තම බලය තහවුරු කරගෙන සිටියේ අන් කිසිදු පාලනයක් නොවූ අන්දමින්ය.

ඉස්ලාමිහි සමහර විශේෂ කරුණු

ඉස්ලාම් ස්වභාවික, ශාන්තිමත්, ආරක්‍ෂා සහිත දහමකි. ඒ දහම පිළිනොගන්නට ජීවිතයේ කිසිදු සන්සුනක් සෞභාග්‍යයක් ලැබිය නොහැකිය. තවද එය සියලු දෑ කෙරෙහි නියෝජනය කරන්නේය. අනෙක් දහම්වල නැති අති උතුම් කරුණු සහ ප්‍රතිපදාවන් ඉස්ලාම් දහම තමා සතුව ඇත.

අභිමානවත්ව විශේෂත්වයෙන් හෙබි ඉස්ලාම් දහම මිනිසාගේ ලෞකික සහ ලෝකෝත්තර ජීවිතයේ උවමනාවන්ද මනා ලෙස සපුරා දී යෙහෙන් පෙරටු වේ. ඒවා :

1. සර්වබල දෙවිඳුගෙන් ආ ඉස්ලාම් දහම ඔහු ගැන පරිපූර්ණ අන්දමින්ම විස්තර කරයි. ඒ ගැන අල්ලාහ් දෙවිඳු අල්කුර්ආනයේ මෙසේ පවසයි : *'(විශ්වය සහ එහි සියල්ල) නිර්මාණය කළ භවතා කවරෙකු දැයි නොදන්නේද? ඔහු සාවධානව නිරීක්ෂණය කරන්නා සහ සුවිඥානය'.* (67 : 14)

2. එය මිනිසාගේ ආරම්භය සහ මිනිසාගේ නිර්මාණයේ හේතුව ගැන මෙසේ පැහැදිලි කරයි : *'මිනිසුනේ, ඔබ ඔබගේ දෙවිඳුට බිය වව්. ඔහු ඔබ සියල්ල එකම ආත්මයකින් නිර්මාණය කළේය. එයින් ඔහුගේ බිරිඳද නිර්මාණය කළේය. ඉන්පසු ඒ දෙදෙනාගෙන් අපමණ පුරුෂයින්ද ස්ත්‍රීන්ද නිර්මාණය කර (මිහිපිට) පැතිර විය'.* (4 : 1)

තවද මෙසේ පවසයි : *ඒ පොළොවෙන් අප ඔබ නිර්මාණය කළෙමු. අප ඔබ නැවත හරවන්නේද ඒ තුලටය. ඔබ නැවත වරක් පිට කරන්නේද ඒ තුල සිටය.* (20 : 55)

මිනිස් නිර්මාණයේ ඉලක්කය ගැන මෙසේ පවසයි : 'තවද, ජින් (සමූහය) සහ මිනිස් (වර්ගයා)මා හට වන්දනාමාන කිරීමට විනා මා නිර්මාණය නොකළෙමි'. (51 : 56)

3. ඉස්ලාම් සහජ ස්වභාවික ධර්මයකි. අල්ලාහ් දෙවිඳු අල්කුර්ආනයේ මෙසේ පවසයි : *'කුමණ ස්වභාවයෙහි අල්ලාහ් මිනිසා (නිර්මාණය) කළේද එය ඔහුගේ (ස්ථිර) සහජ ධර්මය වේ'.* (30 : 30)

4. එය ඥානාන්විත සහ චින්තනය කෙරෙහි අන කරන දහමකි. අල්කුර්ආනය මෙසේ පවසයි : *'දන්නා අයද නොදන්නා අයද සම වන්නේද? සැබැවින්ම (මෙම කුර්ආනය මගින්) මෙනෙහි කරන්නන් නුවණැත්තන්ය'.* (39 : 9)

අල්ලාහු අල්කුර්ආනයේ මෙසේ පවසයි : *ඇත්තෙන්ම අහස් සහ පොලොව නිර්මාණයෙහිද, දිවා රෑ මාරුවී පැමිණීමෙහිද නුවණැත්තන්ට සාධකයන් වේ. මවුන් නැගිටවන මද, හිඳි වනමද, මවුන්ගේ ඇළෙන් හිඳගෙනද මවුහු අල්ලාහ් සිහි කරන්නෝය. අහස් සහ මහ පොළොවේ නිර්මාණය ගැනද මවුන් මෙනෙහි කරන්නෝය'.* (3 : 190)

5. එය ෂරීආ හෙවත් දෙවියන්ගේ පරිමාධිපත්‍ය නීති පදාවෙන් හෙබී ප්‍රතිපදාවකි : එය සර්වඥාන දෙවිඳුගේ ෂරීආ හෙවත් පරමාධිපත්‍ය ආඥාවෙන් හෙබී දහමකි. එය චින්තනයෙන් පමණක් තෝරාබෙරා ගත හැකි හෝ හුදෙක් චින්තනය මත පිහිටි දහමක්ද නොවේ. එය තනි පුද්ගල සහ සමාජයට ඔබින යථාර්ථ ප්‍රතිපත්තිවලින්, යුක්තිගරුක ක්‍රියාකාරකම් වලින් හෙබී, උසස් විනයෙන් සහ සැලැසුම් සහිත පැවැත් මෙන් සම්පූර්ණවූ මිහිපිට මුල්ම සහ අවසාන දහමකි.

6. එය මිනිස් ආත්මය සුමග කිරීමට පැමිණි දහමකි. එය මිනිසාට සෘජු මවදන් දෙමින් ඔහු යහමග සහ දීර්ඝායුෂ කෙරෙහි හැරෙන විලසින් අමතයි.

7. යුක්තිගරුක දහමකි : සතුරා සහ මිතුරා සමගද, ළඟ පාත සහ දුරස්ථ අය වැනි සියල්ලන් හා සමව වෙසෙන දහමකි. ඒ ගැන අල්ලාහ් දෙවිඳු පරිශුද්ධවූ අල්කුර්ආනයේ මෙසේ පවසයි : *'ඇත්තෙන්ම අල්ලාහ් යුක්තිය ගැන අණ කරයි'.* (16 : 90)

තවත් තැනක අල්කුර්ආනය මෙසේ පවසයි : *'ඔබ යමක් කිවහොත් නෑයන්ට හෝ වේවා යුක්තියම පිළිපදිව්'.* (6 : 152)

තවද, අල්ලාහ් අල්කුර්ආනයේ මෙසේ පවසයි : *'සමූහයක් කෙරෙහිවූ ඔබගේ ක්‍රෝධය මවුන්ට අසාධාරණකම් කරන්නට නොපෙලඹේවා. යුක්තිය ඉටු කරව්. එය බියබැති බවට ඉතා සමීපය'.* (5 : 8)

8. ඉස්ලාම් දහම විශ්වාසවන්ත සහෝදරත්වයක් මතු කරන දහමකි : ඉස්ලාම් දහමේ මුස්ලිම්වරු සහෝදරයන්ය. එය රට, ජාති, වර්ණ හෝ උස්පහත් භේදයක් නොසළකයි. ගෝත්‍ර වාදයට හෝ වංශ වාදයට හෝ බෙදුම් වාදයට හෝ කිසිදු තැනක් නැති බියබැතියට පමණක් මුල් තැන දෙන දහමකි.

9. ඥානාන්විත දහමකි : එහි දැනුම ලබා ගැනීම සියලු පිරිමි සහ ස්ත්‍රීන් කෙරෙහිම අනිවාර්යය වේ. ඒ දැනුම මිනිසා උසස් තත්වයට පත්කරයි. ඒ ගැන අල්ලාහ් අල්කුර්ආනයේ මෙසේ පවසයි : *'සැබැවින්ම ඔබගෙන් විශ්වාස වන්තයින්ගේද ඥානය ප්‍රධානය කරන ලද්දන්ගේද තත්වය උසස් කරන්නේය'.* (58 : 11)

10. ඉස්ලාම් දහම තම දහම ලෙස පිළිගන්නා තනි පුද්ගලයෙකු වුවද සමාජයක් වුවද සම්භාවනීය සෞභාග්‍යමත් තැනකට උස් කරන බව පොරොන්දු වෙයි.

*'ඔබගෙන් කවරෙකු විශ්වාස කර යහපත් කර්මයන්හි යෙදෙන්නේද ඔවුන් ඔවුන්ට පෙර සිටියවුන් (මිහපිට) පාලක යින් කළා සේ නියත වශයෙන්ම ඔවුන්ද පාලක යින් ලෙස පත්කරන බවද, ඔහු ඔවුන්ට තෝරා දුන් දහමෙහිම නියත වශයෙන්ම ඔවුන් ස්ථිර කරන බවද සැබැවින්ම ඔවුන්ගේ බිය සැනසීමෙන් වෙනස් කරන බවද අල්ලාහ් පොරොන්දු වෙයි. ඔවුන් මට (කිසිවක්) ආදේශ නොකර මා (පමණක්) වඳිනු ඇත'.* (24 : 55)

තවද, අල්කුර්ආනය මෙසේ පවසයි : *'පිරිමියෙක් හෝ වේවා ස්ත්‍රියක් හෝ වේවා විශ්වාස වන්තව (සන්මාර්ග පවසන අන්දම) කුසල් කර්මයන් කවරෙකු කළේද සැබැවින්ම අප ඔවුන්ට (මිහිපිට) සුවද (සෞභාග්‍යමත්) දිවි පෙවෙතක් දෙන්නෙමු. තවද (එලොව) ඔවුන් කළ හොඳ දෙයින් ඔවුන්ට ලස්සන සුවිපාක ලබා දෙන්නෙමු'.* (16 : 97)

11. මිහිපිට මිනිසා මුහුණ දිය යුතු සියළු මාදිලියේ ප්‍රශ්නයන් හට ඉස්ලාම් දහම තුල මනා විසඳුම් වේ. සැකෙවින් පවස නවා නම් මිනිසාගේ මිහිපිට ජීවිතය තුල කෙරෙන කටයුතු සහ ක්‍රියාවන් සියල්ල වෙනුවෙන් ඉස්ලාම් දහම මනා ආදර් ශමත් ආඥා සහ නීතිරීති යටතෙහි විශාල වගකීමක් දරයි.

12. එහි ෂරීආ නීති පද්ධතිය උසස් මිනිස් සමාජයක් සංස් ථාපනය කරයි. මිනිස් සමාජය තුල පැන නගින විවිධාකාර වික්ෂිප්ත ගැටළු පහසු සහ ඍජු අන්දමින් සමනයට පත් කරයි. නොවන්නට පරමාධිපත්‍ය විධායක නීති මගින් එයට සරිලන විසඳුම් ලබා දෙන්නේය.

13. ඉස්ලාම් දහම සැම දෙනෙකුටම සියලු කාලයටද සියලු තැනටද සියලු අවස්ථාවන් හටද සුදුසු දහමකි. මේ දහම විනා අන් දහමක් කිසිසේත් පරිසමාප්ත විසඳුමක් ගෙන නොදේ. එසේම එදා ජීවත්වූ සමාජයට සේම වත්මන්, අනාගත සමාජයටද ඒ පරම පිවිතුරු දහමේ නීතිරීති සුදුසු බව සාක්ෂාත් වෙමින් පවතී.

14. ඉස්ලාම්, සමාජීය ජනයන් අතර නොගිලිහෙන සිත් බැඳී මක් ඇති කරවන අතර අන්‍යෝන්‍ය සබධතාවයක් ගොඩ නගමින් ඔවුන් අතර අසහාය ප්‍රීතියක් ඇති කරවන දයාන් විත දහමකි. ඒ ගැන වක්තෘ මුහම්මද් නබි තුමා පවසන විට 'සත්‍ය විශ්වාස වන්තයින් ආදරයෙන්ද කරුණාවෙන්ද එකට බැඳී සිටීමට නිදසුනක් මිනිසාගේ කය වේ. කයේ එක් අවයවයක් රෝගයට පත්වූ කළ එයින් නැගෙන වේදනාව ඒ නිසා ඇතිවන උණ වැනි පීඩණ මුළු දේහයටම විපාක ගෙන දෙයි. ඒ කරුණ ගැන සවිස්තරව පවසන කළ මිහිපිට අයට කරුණාව දක්වන්න. එවිට ඉහළ සිටින කරුණා වන්ත දෙවිඳු ඔබට කරුණාව දක්වන්නේය යනුවෙන් දෙසූහ.

15. ඉස්ලාම් ජයග්‍රාහී ක්‍රියාකාරකමෙන් හෙබි කිසිසේත් වෙනස් විය නොහැකිස්ථිර දහමකි. ඒ කරුණ අළලා මුහම්මද් නබි තුමා වරෙක මෙසේ දෙසූහ : 'බෙලහීන නිහීන විශ්වාස වන්තයාට වඩා ධෛර්යවන්ත ශක්තිවන්ත විශ්වාස වන්තයා කෙරෙහි අල්ලාහ් බොහෝසෙයින් ප්‍රිය වෙයි. ඔබට කුසල් ඇති කරවන දේහි සිත යොමු කරනු මැනව. ඒවා දුෂ්කර ක්‍රියාවන් යැයි උදාසීනෙන් පසු නොවනු. ඔබට දුකක් ඇතිවූ කළ මා මෙසේ මේ විලසින් කළා නම් මට මෙසේ වන්නට තිබුණා නොවේද යනුවෙන් කියා දුක් නොවන්න. ඒ වෙනුවට අල්ලාහ් මට කුමක් ගැන මනාප වීදෝ එය සිදු වීයැයි පවසන්න'.

16. ඉස්ලාම් පරස්පර විපරීත මතවලින් ඈත්වුනු අව්‍යාජ දහමකි. ඒ ගැන අල්කුර්ආනය මෙසේ බවසයි : '*මෙය (අල්කුර්ආනය) අල්ලාහු හැර වෙනත් කෙනෙකු ගෙන් (පැමිණි) නම් එහි නොයෙක් අසමානකම් ඔවුහු දකිනු ඇත*'. (4 : 82)

17. ඉස්ලාම් දහම මිනිසා තුල අවුල් ඇති කරන, පරස්පර විරෝධ මත ගැන කුකුසක් ඇති කරවන අදහස් සම්පූර්ණ යෙන්ම හෙළා දැක සැම දෙනාටම පහසුවෙන් වටහා ගත හැකි පැහැදිළි දහමකි.

18. සැම කටයුත්තක් වෙනුවෙන්ම ඉස්ලාම් දහම තුල ඇත්තේ ස්ථිරසාර විසඳුමකි. එය පිළිගෙන එහි ඇතුල් වන අය වළකා විලංගු දමන්නට කිසිදු සමාජීය, ගෝත්‍ර, කුල වාදය වැනි කිසිදු බාධකයක් එහි නැත.

19. ඉස්ලාම් විවෘත දමහකි. දහමට ඇතුල් වීමට මග සොයන්නන් හට එහි දොර සදා විවෘතව ඇත.

20. ඉස්ලාම් දහම බුද්ධිය, දැනුම, ආත්මය සහ මිනිසාගේ පැහැපත් චරිත උසස් ලෙස ස්ථිරවත් කරයි.

21. ඉස්ලාම් දහම සැම කෙනෙක්ම යහපත් ගතිගුණ සහ දැමිටු ක්‍රියාවන් කෙරෙහි ඍජුව අමතයි: අල්ලාහු

අල්කුර්ආනයේ මෙසේ පවසයි : *'නමුදු (නබි තුමනි) සමාව සතු කරගනිව. යහකම පිළිපදින ලෙස (මිනිසුනට) අණ කරව. තවද අඥාන යින්ගෙන් ඉවත් වව'.*(7 : 199)

තවද අල්ලාහ් දෙව්දු අල්කුර්ආනයේ මෙසේ පවසයි : *'ඉතා ලස්සන දැයින් (නපුර) පලවා හැරව. එවිට ඔබ අතරත් හා අතරත් නොමනාපයක් වීදෝ ඔහු ඔබට හිතෛෂි වන්තයෙකු සේ වනු ඇත'.*(41 : 34)

22. ඉස්ලාම් මිනිස් මනස විකෘතියට පත් නොවන අයුරු සිහිබුද්ධිය ආරක්‍ෂා කර සුරාපානය, මත් ද්‍රව්‍යය සහ මිනිසාගේ සිහිය විකල්ප කරන සියලු දේ තහනම් කරයි.

23. ඉස්ලාම් දහම සේසත් ආරක්‍ෂා කරයි : එය විශ්වාස කඩ කිරීම නරයේ හෙලා දකී. විශ්වාස වන්තයින් ප්‍රශංසා කරයි. ස්වර්ගය ගැන සුභාශිංසනය කරමින් එහි පිවිසීමට සාරධර්ම ජීවිතයක් ගැන පොරොන්දු වෙයි. සොරකම් කිරීම මහා පාප යකැයි තරයේ හෙළා දැක, අනෙකාගේ සේසත් සොරකම් කිරීමේ පුරුද්ද සමාජයෙන් තුරන් කිරීමට සොරකම් කළ පුද්ගලයාගේ අත්සිඳින ලෙස එහි නීති අණ කරයි. මෙලොව අත් සිඳලනු පමණක් නොව, එය මතුලොව දරුණු අඩුවමට භාජනය විය හැකි බිය නිසා සොරකම් කිරීමෙන් වළකී. එහෙයින් ඒ නීති පද්ධතිය නිසා මහජන සේසත් වර්ධන යද ඉහළ තත්වයකට පත් වෙයි. නමුදු එසේ සොර කම වෙනුවෙන් අත් සිඳිනු ලබන්නේ සීමිත ප්‍රමාණයක් පමණි.

සොරාගේ අත් සිඳින කළ සොරුන්ට එයින් දැනුමක් සහ අවවාදයක් ඇති වී නැවත සොරකමට නැඹුරුවීම වළකෙන් නේය. එහෙයින් ඉස්ලාමීය නීති ක්ෂෙත්‍රයට අනුව පාලනය වන රාජ්‍යයන්හී මහජනයන් සොරසතුරු බියෙන් තම සේසත් ආරක්‍ෂා කරගනිමින් නිදහසේ ජීවත් වන්නට ස්ථිරසාර වරමක් ලබා ඇත.

24. එය මිනිසාගේ ආත්මය ආරක්ෂා කරයි : ඉස්ලාම් දහම නිසි හේතුවක් නොවන්නට තවත් මිනිසෙකු ඝාතනය කිරීම තරයේ හෙළා දකී. යමෙකු අහේතුවකින් යමෙකු ඝාතනය කළේ නම් එයට දඬුවම ඝාතකයා ඝාතනය කිරීම වේ. ඉස්ලාම් දහමේ ෂරීආ නීති පද්ධතිය මෙසේ අණ කරන හෙයින් ඒ නීතිය අනුව කට යුතු කරන මුස්ලිම් රටවල ඝාතනය අඩු මට්ටමකින් පවතින්නේය. අහේතුකව කෙනෙකු ඝාතනය කළ හොත් තමා ඝාතනය කරනු ලබන බව යමෙකු දැන ගන්නේ නම් හෙතෙම අනෙකා ඝාතනය කිරීමෙන් වළකින්නේය. එසේම මිනිසුන් මරණ බියෙන්ද ඉවත්වී තෘප්තිමත් ජීවත් වන්නටද අවස්ථාවද එළඹෙනු ඇත.

25. ඉස්ලාම් දහම ශරීර සෞඛ්‍ය ආරක්ෂා කරයි : මෙම කරුණු සම්බන්ධව අල්කුර්ආනයේද මුහම්මද් තුමාගේ හදීස් සංකල් පයේද බොහෝ මගපෙන්වීම් වේ. අල්කුර්ආනය මෙසේ පවසයි: *'අනුභව කරව් පානය කරව් නාස්ති නොකරව්'.*(6 : 31)

ඉස්ලාම් දහමේ අද්විතීය නීතිපද්ධතිය එහි සූක්ෂම තාවය ගැන සමහර විද්වතුන්ගේ කියමන් සංක්ෂිප්තව මෙසේ විස්තර කළ හැකිය : මෙම අල්කුර්ආන් වැකිය සියලු සුදුසු පිරිසිදු ආහාරයන් ගැන මනා ලෙස විස්තර කරයි. සියලුම මද්‍යස්ථ ආහාර පාන සෞඛ්‍ය ජීවන පැවැත්මට විශේෂ හේතුවකි.

සෞඛ්‍යට අහිතකර මත්පැන තහනම් කිරීම එහි වැදගත් එකකි. එය මිනිසාගේ හෘදය බෙලහීන කරන්නේය. වකුගඩුව විනාශ කර කැවුත සිදුරු කර දුර්වල කරයි. තවද, මත් පැන විවිධ ලෙස මිනිස් දුස්සාධ්‍යය ඇති කරන්නේය.

ඉස්ලාම් දුරාචාරය සහ සමලිංක සේවනය වැනි දුර්ක්‍රියාතරයේ තහනම් කරයි. ඒවාට ඇබ්බැහි වන්නේ නම් බොහෝ කරදර විය හැකිය. තවද එයින් ඒඩ්ස් වැනි විශාල සමාජ රෝගවලට භාජනය විය හැකි බවද වත්මනයේ සුපැහැදිළි කරුණකි.

ශරීර සෞඛ්‍ය ආරක්ෂා කරනු වස් ඉස්ලාම් දහම ඌරු මස් තහනම් කර ඇත. ඌරාගේ දේහය තුල භයානක වර්ගයේ පණුවන් තිබේ. උගේ දේහය විවිධ ලෙඩරෝගවලින් ගහන බවද වත්මනයේ කළ සමීක්ෂණ වලින් පෙනී ගොස් ඇත. උගේ මයිල්හී වකුටු පණුවන් වර්ධනය වේ. ඔවුන්ගේ සංසර්ග ක්‍රියාව අති මුර්ග අන්දමින් කෙරෙන අතර සමහරවිට ඒ ක්‍රියාව අවසන් වන්නේ මරණයකින් පසුවය.

එසේම ඉස්ලාම් දහම දේව නැමදුමට පෙරවූ අනිවාර්යය වුළු දෝවනයේ පවා මිනිසාගේ ශරීර සෞඛ්‍ය ආරක්ෂාව සාක්ෂාත් කරන ප්‍රයෝජනවත් කටයුත්තකි. දෛනික දේවනැමදුම කරන්නෙකු දිනකට පස්වතාවක් වුළු දෝවනය කිරීමේදී මුහුණ, අත්පා, නාස්පුඩු සහ කන් වැනි අවයවයන් පිරිසිදු කරයි. එසේ කිරීමෙන් කන් කැක්කුම, දත්කැක්කුම වැනි ලෙඩ රෝගවලින් ආරක්ෂා වන්නේය. එසේම අඩුම වශයෙන් නාස් පුඩුද දිනකට පසළොස් වතාවක් පිරිසිදු වන කළ බඩ වැල් සම්බන්ධ සමහර රෝගවලින් වැළකෙන්නේය. එසේම එය මිනිසා නාසය හා සම්බන්ධ සමහර ලෙඩරෝග වලින් ඉවත් කරයි. මන්දයත් දිනකට ඒසා ප්‍රමාණ වතාවක් නාස්පුඩු සෝදෙන විට ආශ්වාස ප්‍රස්වාසයේදී එහි රැඳීමට හැකි විවිධ විෂබීජ ඉවත් වන්නේය. සැමදා වුළු දෝවනය කරන මුස්ලිම් වරුන් දිනකට කීප වරක් තම නාසයද පිරිසිදු කරන බැවින් එවැනි ලෙඩරෝග අඩු බව සක්සුදක්සේ පැහැදිලිය.

26. ඉස්ලාම් දහම සත්‍ය ඥානය හා එක්ව බැඳී පවති. එසේ සත්‍ය ඥානය සමග එක්ව බැඳී යැමෙන් පැහැදිලි වන්නේ ඉස්ලාම් නවීන යුගයේ විවිධාකාර තාක්ෂණ සොයාගැනීම් සහ නවීන ඥානයේ යථාර්ථයට පටහැනි නොවී එක්ව අත් වැල් බැඳගෙන ඉදිරියට යන බවය. යම් නූතන ඥානයක් කෙරහි විවෘතව බලන කළ මතුපිටින් දහමට පටහැනි

ප්‍රභේද ස්වභාවයක් පෙන්නුම් කළද එහි යථාර්ථය කිසිදු ප්‍රභේදකින් තොර එකකි. මන්දයත් ඍජු යථාර්ථය සහ වාස්තවික සාදක යන දෙක කිසිසෙත් සත්‍යයේ අභිමුඛයේ ප්‍රතිවිරුද්ධ විය නොහැකි නිසාය.

මෙම යථාර්ථ සාධනය විද්වත්තු මෙන්ම බටහිර චින්තනවාදීන් සහ විද්වතුන් පවා අනූනව පවසා ඇත යන්නට කිසිදු සැක යක් නැත. එවන් සුප්‍රසිද්ධ ප්‍රංශ විද්වතෙකු වන මොරිස් බුකයිල් නම 'විද්‍යාව බයිබලය සහ කුර්ආනය' යන ග්‍රන්ථයේ මෙසේ විස්තර කරයි : 'චිරාගත කාලයක් තිස්සේ තෝරා සහ බයිබලය මිනිස් දැනෙන් විකෘතියට පත්වෙමින් එහි යථාර්ථය ගිලිහෙමින් පවතී. එහි සමහර සංසිද්ධීන් වාස්ත වික ඥානය සමග පරස්පරව පවතී. මේවා කවදා ග්‍රන්ථා රූඪ වීදෝ එදාම සිටම එහි ප්‍රභේදමය අවස්ථා ඉස්මතු වී පෙනෙන්නට වූ අතර අල්කුර්ආනය පරයා යන්නට කිසිසේත් නොහැකි අන්දමින් ඒ අල්කර්ආනය අද වනතුරු වෙනසකට භාජනය නොවී පවතී. අල්කුර් ආනය කිසිදු හේතුවක් උදෙසා, අවස්ථාවේ හෝ ඥානයේ හෝ නූතන සොයා ගැනීම මත හෝ ප්‍රභේද නොවී ඒ සමග එක්ව අත්වැල් බැඳ ගෙන ඉදිරියට ඇදෙන්නේ අපූරු සහගත අන්දමිනි.

ඥාන ප්‍රගතියේ ළදරු අවධියක ලොව පසුවූ එක්තරා කාල වකවානුවක සහමුලින්ම ප්‍රතික්ෂේප කරන ලද, මිනිස් චින්තන යට පහසුවෙන් වටහාගත නොහැකි කරුණු හා සම්බන්ධ අදහස්වලට පවා ඉස්ලාම් දහම කිසිවිටෙක පටහැනිව කරුණු ඉදිරිපත් කළේ නැත. වෙනුවට ඒවා සම්බන්ධ ලුහුඬින් හෝ කරුණු ඉදිරිපත් කළ අතර, එහි සිහිබුද්ධියට හසුවන අත් දැකීම් ආශ්‍රිත කරුණුවලට අල්කුර්ආනයේ සාධක කිසිසේත් පටහැනි වූයේ නැත.

එහි වාස්තවික සත්‍යය වටහා ගැනීමට මෙහිදී දිවි හෙළි කිරීමක් ආශ්‍රිතව වක්තෘ මුහම්මද් තුමාගේ විශේෂ කියමනක් උපුටා දැක්වීම අවස්ථාවෝචිතය. 'බල්ලා ඔබගේ පාත්‍රයෙන් බී නම් සත්වරක් එය සොදන්න. මුල් වතාව වැලි එක්කර සෝදන්න'. සමහර අපිරිසිදු දේවල් ජලයෙන් පමණක් පිරි සිදු කළ නොහැකි අතර එයට වැලි වැනි තවත් සමහරදේ එකතු කර පිරිසිදු කළ යුතු බව නවීන සොයාගැනීම් සහ නාසෂණය සාක්ෂාත්ව පවතී. සුනඛයාගේ කෙලද එසේය. උගේ කෙල හා සම්බන්ධව සඹුදු බැක්ටීරියා වර්ග කීපය ක්ම පවතින බව නවීන සොයා ගැනීම් තහවුරු කරයි. එහෙයින් සුනඛයාගේ කෙල පිරිසිදු කරන විට වැලි මිශ්‍ර කර පිරිසිදු කළ යුතුව ඇත.

එසේම නිතර අප පාවිච්චි කරන භාජණය තුල බල්ලා කට දමා ජලය බීමේදී උගේ කෙලද භාජනය සමග මිශ්‍රණය වන්නේය. ඒ කෙල හා විවිධ සඹුදු බැක්ටීරියා වැනි විෂබීජ ඒ භාජනය තුලට ඇතුල්වන බව නවීන වෛද්‍ය විද්‍යාව තහවුරු කරයි. බල්ලා සමග සෙල්ලම් කිරීමෙන්ද, බල්ලාගේ දේහය පිරි මැදීමෙන්ද, බල්ලා කට දමා ජලය පානය කළ භාජනය පාවිච්චි කිරීමෙන්ද, බල්ලා නම ඇඳුමේ තැවරීමෙන්ද බල්ලාගේ කෙල සමග මිශ්‍රව පවතින ඒ විෂබීජ පහසුවෙන් මිනිසා වෙත ලගා වී, පසුව පහසුවෙන් මිනිසාගේ ආහාර මාර්ගය මස්සේ ඔහුගේ ශරීරය තුලට ඇතුල්විය හැකිය. එහි අතුරු විපාක ලෙස මුලින්ම මිනිසාගේ ආමාශය සහ බඩවැල් කැක්කුම වැනි විවිධ ලෙඩරෝගවලට භාජනය විය හැකිය. පසුව ඒ ව්‍යාධි ලේ ගමණය හා එක්වී හෘදය සහ මොලය වැනි අවයව වලට පහසුවෙන් ඇදී යා හැකිය. එහෙයින් වමනය, හෘදාබාදය සහ තද හිසේඇම්ම වැනි අතුරු

ආබාධවලට භාජනය වී අවසානයේ මිනිසාගේ ජීවිතයටද තර්ජන වන තත්ත්වයට පත් වන්නේය.

ස්වභාවික සෞන්දර්යාත්මක ඥානයද කිසිසේත් ඉස්ලාම් දහමට පටහැනි නොවී ඒහා සමග යාවී කටයුතු කරයි. මෑතක වන තෙක් මිනිසා උද්භිත විද්‍යා ගැන එතරම් දැන සිටියේ නැත. නමුදු පරිශුද්ධ අල්කුර්ආනය ඒ ගැන හාපුරා අවුරුදු හාර සියයකට පෙරම කිසිදු අකුරක් අධ්‍යාපන දැනුමක් නොලද මුහම්මද් තුමා මගින් පැහැදිලිව විස්තර කළේය. අහ සෙන් ඇද හැලෙනා වැස්ස ගැන අල්කුර්ආනය මෙසේ විස්තර කරයි. *'අප (වැහි උසුලන) සාරවත් සුළං එවන්නෙමු'*. (15 : 22)

ශසක පැවැත්ම සහ එහි ලක්ෂණ ගැන තැනක අල්කුර් ආනය මෙසේ විස්තර කරයි : *'අප එහි ලස්සන පත්‍ර වර්ග යන් යුගල වශයෙන් හට ගැන්වූයෙමු'*. (50 : 7) *'අප සියලු දැය යුගල වශයෙන් නිර්මාණය කළෙමු'*.(51 : 49) *'සෑම වර්ගයක්ම යුගල වශයෙන් නිර්මාණය (අල්ලාහ් දෙවිඳු වන) මහු සුවිශුද්ධය'*.(36 : 36)

මෙහි ඉහත විස්තර කරන ලද්දේ උත්භිත විද්‍යාව සහ ජීව විද්‍යා දැනුම් සොයා ගන්නට සියවස් කීපයකට පෙරම සෑම දෙයක්ම යුගල වශයෙන් නිර්මාණය වූ බව අති ඥානාන් විත අල්ලාහ් දෙවිඳු අල්කුර්ආනය තුලින් හෙළි කළ සමහර විද්‍යාත්මක කරුණු යන්න නිසැකය.

සමහර විද්‍යාංගයන් සාගරය සහ එහි සූක්ෂම නිමවුම ගැන ඉස්ලාම් දහම සියවස් කීපයකට පෙර ප්‍රකාශ කළ කරුණු එසේම පිළිගනියි. එවැනි සමහර විශේෂ කරුණක් අළලා අල්කුර්ආනය මෙසේ පවසයි : *'(ඔවුන්ගේ ක්‍රියාවන්) ගැඹුරු මුහුදෙහි අඳුරු වැනිය. එය රැල්ලක් වසා ගන්නේය. ඒ මත තවත් රැල්ලකි. ඒ මත වළාකුළුය. (මෙසේ) අඳුරු*

*මත අඳුරු කීපයකි. (එහිවූ) කෙනෙකු තම අත දිග හැර බැලීනම් තෙමෙද තම එය (අත) නොදකී.* (24 : 40)

**27. ඉස්ලාම් ස්වාධීනත්වය සහ නිදහස තහවුරු කර එය සීමාසහිත කරයි :** සැබැවින්ම අල්ලාහ් දෙව්දූ ඉස්ලාම් දහම තුලින් මිනිසාගේ ස්වචින්තනයට සහ අදහස් වෙනුවෙන් දී ඇත්තේ විවෘත නිදහසකි. අල්ලාහ් දෙව්දූ මිනිසාට සවන, දර්ශණය සහ හැඟීම්, චින්තනය සහ ස්වශ්‍රද්ධානය බොහෝ සෙයින් අනුමත කරන්නේය. එසේ තමා ලබා ඇති නිදහස් සහ අවස්ථාව මහු විසින් විනාශ කර ගනී නම් එයට වගකීම බාර ගත යුත්තේ මහුමය.

මිනිසා වෙළඳාම් කිරීම, මිලයට, ගැනීම අලෙවි කිරීම, වැනි සෑම කටයුත්තකදීම තම සිතට වහල්වී සුළු ලෞකික ආදායම පතා අවිශ්වාසය, රැවටීම, විශ්වාස භංගව කට යුතු කිරීම වැනි විවිධ මාදිලියේ අකයුතුවල නිරත නොවී කටයුතු කරන තාක් කල් අල්ලාහ්ගේ ආඥාවන්, සීමා වන් කඩ නොකර යුක්තිගරුකව කටයුතු කරන්නෙක් ලෙස ගණන් ගනු ලැබේ. එසේම මහු අන්නපානය සහ අනෙකුත් උවමනාවන් පරිහරනය කරනවිට තමාට හෝ අනුන්ට හෝ කරදරයක් නොවන අයුරු කටයුතු කරන තාක් කල් හෙතෙම නිදහස මනා ලෙස තහවුරු කරන කෙනෙකු ලෙස පිළිගත හැකිය.

ඉස්ලාම් දහම නිදහස සීමා කරමින් කටයුතු කරන්නේය. භීෂණය ඇති කරමින්, කරදර ප්‍රචණ්ඩත්වයට අනුමත දෙමින් ඔවුන්ගේ සාහසිකත්වයට ආවඩමින් අසරණ අහිංසකයන් හට අකටයුතු කිරීමට ඉස්ලාම් දහම කිසිසේත් අනුමත නොකරයි. උදාහරණයක් වශයෙන් මිනිසාගේ යථාර්ථ සබැඳියාවෙන් හෙබි කායික උවමනාවන් අනුමත කරනවා මිස තම සිතට වහල්වී ඒහා බැඳුණු අශ්ලීල ආශාවන් පිරිමහ ගැනීමට අනුමත කිරීම, මිනිසා යෙහෙන් විනාශ මුඛයට ඇද දමන්

නේය. සංස්කෘතිය, සමාජ සාරධර්ම ව්‍යූහය යනුයෙන් නාම ධාරී කරමින් එවන් කටයුතුවලට සමාජීය මට්ටමින් හෝ අනෙකුත් අන්දමින් හෝ අනුමත කිරීම මිනිසා එයටම බිලි වී විනාශයටම ඇද වැටෙන්නට හැකිය. මන්දයත් මිනිසාගේ අනේක විධ නිදහසක්ම සීමාසහිත සීමාවක් තුලම විය යුතුය. ඔහු ඒ සීමාවන් කඩකරන විට ඔහුගෙන් ඇති වන්නේ විනාශයක් මිස සුගතියක් නොවේ. එසේම නුවුවමනා කෙලිලොලෙහි සහ මිනිසාට කිසිදු ඵලප්‍රයෝජනයක් නැති දැහී තම නිදහස සහ කාලය මිඩංගු කරන විට එය ඔහු සෘජුමාවතෙන් ඉවත්කර අඳුරු ආගාධයක් වෙත ඇද ගෙන යා හැකි වන අතර ඔහුගේ යහමගටද විශාල වශයෙන් බාධා ඇති කරන්නට තරම් සමත් වන්නේය. එහෙයින් තම සිතට වහල් වී කටයුතු අත්තනෝමතික අන්දමින් කටයුතු කිරීම කිසිසේත් නිදහසක් ලෙස අර්ථ කථණය කළ නොහැකිය. එසේම අත්තනෝමතික ලෙස හලාල් - හරාම් යන්නද අවධානය නොකර, සුදන - දුදන යන්නෙහි වටහා ගන්නට අවස්ථාවක් නොදී ඒ නිසා ඇතිවිය හැකි අඩුවමද කෙරෙහි නොසැළකිල්ලෙන් කටයුතු කිරීමට පොළඹ වයි. කිසිදු ඵලවිපාකයක් නීතිරීතියක් ගැන නොසළකා එසේ තම සිතට වහල්වී කටයුතු කිරීම ඔහු නවතවත් එ මනොමූලිකය මතම කටයුතු කර ආපසු පහසුවෙන් හැරිය නොහැකි දුර්මාර්ගයට ඔහු යොමු වන්නේ පහසු අන්දමින්ය. එහි ඵලවිපාකයද ඔහුගේ වාරය කාලය එළඹෙන්නට පෙරම ඔහු වෙත ළඟා විය හැකිය.

එසේ මිනිසා හිතට වහල් වී කටයුතු කිරීමෙන් ශාරීරික කායික ජීවය අතින්ද අන්ත දුර්වල තත්ත්වයකට පත්විය හැකිවන අතර අවසානයේ ඔහුට ඔහුගේ ඒදිනෙදා කටයුතු පවා කර ගැනීමට වාරුවක් නැති තරමට පත් වන්නේය. තම සිතට වහල්වී ක්‍රියා කරන කෙනෙකු සම්පූර්ණ ශරීර

සෞඛ්‍යයෙන් ජීවත් විය හැකිද යන විමසූ විට පිළිවදන වන්නේ ඉඳුරාම නැත යනුවෙනි. මන්දයත් එයට අප ජීවත් වන නූතන කාලයම සාධකයක් ලෙස විදහා දැක්විය හැකිය.

සිතට වහල්වී කෙලිලොලෙහි තියැළීමේ නිදහස සීමා නොකරන විට දුක, වේදනාව, සිත් සන්තාපය, සිත් චංචලය, මන්දබුද්ධිය, මනෝමය සහ කායික ව්‍යාධි වැනි අනේකවිධ කරදරවලට පත් විය හැකිය. ඒ නිදහස තවත් පුළුල් වීමෙන් සමහර අවස්ථාවන්හී එයටද ඉහළ තත්ත්වයක පවතින ඝාතනය, මංකොල්ලය සහ භීතිය වැනි කටයුත්තත් කෙරෙහිද, භයානක ලෙඩරෝග වලටද භාජණය විය හැකිය.

පොදු නීතිරීති තුල නිදහස තහවුරු කිරීම : මිනිසා සිතට වහල්වී අනුන්ගේ නිදහස සහ වරප්‍රසාධ තුලට ඇතුල්වී ඔහුගේ නිදහසට බාධා කොට කට යුතු කිරීම ඉස්ලාම් දහම තරයේ හෙළා දකී. වත්මනයෙ බොහෝ දියුණු රටවල මානව අයිතිවාසිකම් සම්පත් ආරක්ෂා කිරීම යනුවෙන් පවසමින් සිදුවන දුබලයන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනනය කිරීම, මවුන්ගේ ජීවිත සහ ජේසත් සුළු කොට තැකීම, මවුන්ගේ චින්තන නිදහසට තහංචි පණවා බාධා කිරීම රට තුල භීෂණය කුමන්ත්‍රණබිහි වීමට කටයුතු කිරීම වැනි සියල්ල නිදහස්ද? කිසිවිටෙක එය නිදහසක් නොවෙ. නියම නිදහස කුමක්ද යනුවෙන් ඉස්ලාම් දහම මනා ලෙස කරුණු පදහා දී ඇත.

නියම නිදහස යනු මිනිස් ක්‍රියාකාරීත්වය, චින්තනය කළ මනා කරණය කරන සීමාසහිත එකකි. එහි මූලික ප්‍රතිපත්තිය වන්නේ මිනිසා තම දෙවිඳුට, ඔහුගේ ආඥා වලට සම්පූර්ණයෙන්ම කීකරු වීම වේ. එහි ව්‍යාංගර්ථය වන්නේ මිනිසා සර්බල අල්ලාහ්ගේ අනවැසියෙකු ලෙස කටයුතු කිරීම වේ. අප භුක්ති විඳිය යුතු නිදහසද එය විය යුතුය. මිනිසා තම ආශාව, ආදරය, බිය, කැමැත්ත, යටත්වීම සහ කීකරු

වීම වැනි විවිධ ගතිගුණ මගින් අල්ලාහ් දෙවිඳු සමග සම් බන්ධයක් ඇති කර ගන්නා විට අනෙකුත් සියළු නිර්මා ණයන්ගෙන් නිදහස් වී මුළු නිදහසක් භුක්ති විඳින්නෙකු ලෙස පත් වන්නේය.

මිනිසා ඒ ආකාරයෙන් කටයුතු කරන විට ඔහු තම දෙවිඳු හැර අන් කිසිවෙකුට බිය නොවෙයි. අන් කෙනෙකුගේ පිහිට කෙරෙහි වහලෙක් ලෙසට පත් වන්නේද නැත. ඔහුගේ සම්භාවණයට සහ ඔහුගේ ජය ග්‍රහණයටද එකම මූලික කරුණ වන්නේද එය යන්නෙහි කිසිදු සැකයක් නැත.

මෙසේ බලන කළ ඉස්ලාම් දහම උසස් විශිෂ්ට සර්ව සම්පූර්ණ, උසස් මගපෙන්වීමක දහමකි. එහෙයින් බොහෝ ඉස්ලාමිකයන් තමන් ඉස්ලාමීය භක්තිකයන් යනුවෙන් පවසා ගනිමින් ඒ දහමට පටහැනිව හෝ එය අනුමත නොකරන බොහෝ කටයුත්තන්හී නිරත වනු සාමාන්‍ය සංසිද්ධියක් බවට පත්ව ඇත. එසේ ඔවුන් ආගම් මුඅාවෙන් කරන සමහර කටයුතු හෝ වෙවා ආගමට පටහැනි හෝ වෙවා ඒවාහී ප්‍රතිවිපාක ඔවුන්ට අයත් මිස එය ඉස්ලාම් දහම අනුමත කළ එකක් ලෙස හංවඩු ගැසීම වැරැදිය. මන්දයත් සත්‍ය ඉස්ලාම් දහම සර්ව සම්පූර්ණ දහමක් වන අතර කාලයට උචිත අන්දමින් හෝ අවස්ථාවට උචිත අන්ද මින් හෝ එහි කිසිදු වෙනසක් හෝ අඩුවැඩි කිරීමක් හෝ කිරීමට කිසිදු අයිතියක් කිසිවෙකුට නැති නිසාය.

ඉස්ලාම් දහමේ සමහර වැදගත් කරුණු

පෙර පිටුවල ඉස්ලාම්හී විශේෂ සමහර කරුණු ගැන අපි කෙටියෙන් විස්තර කළෙමු. එසේම ඉස්ලාම් දහම හා සම් බන්ධ තවත් සමහර කරුණුද ඔබට ඉදිරිපත් කිරීමට බලාපො රොත්තු වෙමු. එවා මනා අන්දමින් එහි අර්ථානුසාරයෙන්ම වටහා ගන්නේ නම් ඉස්ලාම් දහම හුදෙක් පිළිගෙන කටයුතු

කරන දහමක් නොව, එය මිනිස් සමාජයේ අසහාය ජයග්‍රහණය සහ එහි පැවැත්ම ගැන සම්පූර්ණ වගකීම සංස්ථාපනය කරන අසහාය දහමක් ලෙස වටහා ගනු ඇත. එය තනි පුද්ගල සාරධර්මය, ශිකෂාව හැඩගස්වන, ඔප නංවන දහමක් නොව මුළු මිනිස් සංහතියම ජයග්‍රහණයන් සහ සමෘධියක් වෙත ගෙන යන උසස් විනය පද්ධතීන් වලින් සමන්විත දහමකි. එය මිනිසාට තම පවුල් ජීවිතය පමණක් හෝ තම දහම්ක වත්පිළිවෙත් පමණක් හෝ සමාජය තුල ශීලාචාර අන්දමින් ජීවත් විය යුතුය යනුවෙන් පමණක් හෝ අනු දැනුමන් දී තම හස්තය හකුලා ගත්තේ නැත. මුළු මානව සංහතියේම ගැලවීම, සන්සුනෙන් වූ සතුටෙන් හෙබි මෙලොව ජීවිතය තුලින් ලොකෝත්තර ජීවතය වෙත ලඟා වන්නේ කෙසේද යන්න පැහැදිලි කරයි.

නූතන මුස්ලිම්වරුන්ගේ හැසිරීම් තුලින් ඉස්ලාම් දහම ගැන තක්සේරු කිරීම නුසුදුසු කරුණකි. ඔවුන් තම සිතට වහල්වී එසේ කටයුතු කරනවා මිස ඉස්ලාම් දහම එසේ කරන ලෙස අණපනවනවා යැයි නොසිතන්න. මන්දයත් ඉස්ලාම් දහමේ නීතිරීති ස්ව අදහස්වලට, තම කැමැත්තට අංශු මාත්‍රයක්වත් වෙනස් කිරීමට කිසිවෙකුට කිසිදු අවස්ථාවක් උදා කර දී නැත යන්න මනාව වටහා ගත යුතුව ඇත. එහෙයින් ඒවා යෙන් සමහරක් ගැන ඔබද දැන ගැනීම පිණිස සංක්ෂිප්ත විස්තරයක් දිග හැර පෑමට බලාපොරොත්තු වෙමි.

ඉස්ලාම් දහම විජයග්‍රාහී සෞභාග්‍යමත් දහමකි. ඒ ගැන තතු ඉදිරිපත් කරනවිට මුලින් ඉස්ලාම්හී ආඥාවෙන් සමහරක් ඔහුගේ පාරිසාරික ක්‍රියා පද්ධතීන් ඍජුව හැඩ ගැසෙන්නද ඔහුගේ පුද්ගලික ජීවනමග මනා ලෙස පැවැත්මකට පත්වන ලෙසද අණ දෙයි. එයින් මිනිසාගේ දෛනික ජීවන රටාව විධිමත් කර දිවිමග පහන් කරයි. ඉස්ලාම්හී විනය

පද්ධතීන් සහ අණ ආඥා පනත ගැන සන්සන්දනය කර බලන කළ එය විශාල සයුරක් යැයි පැවසිය හැකිය. එහි විශාලත්වය අල්ලාහ් හැර අන් කිසිවෙකු දනී. පරමාධිපත්‍ය අල්ලාහ් දෙවිඳු විසින් පණවන ලද ඉස්ලාම් නීති ක්ෂේත්‍රයේ නිමාව සෙවිය නොහැක සාගරක් සේද, එහි අවසානය සෙවීමට කිසිවෙකුට උවමනාවක් නැති වන විලසින් එහි නීති සර්ව සම්පූර්ණ බවද සුපැහැදිලිය.

අනුමත කිරීම් සහ තහනම් සහිත මෙවන් ආඥාවන් සහ අණපනත් සම්පූර්ණයෙන්ම පිළිගෙන ඒ අනුව කටයුතු කරන ලෙස ඉස්ලාම් දහම සරල අන්දමින් පවසා සිටී. එසේම ඒ අණපනත් එහි අර්ථානුසාරයෙන්ම පිළිපැදීමෙන් වළකින්නේ කවරෙක්ද මවුන්ට නිරයේ දියුණු අඩුවමට සහ වේදනාවට පත්වන බවද අවවාද කරමින් පසුවෙයි. එසේම ඒ අණ පනත් සහ ආඥාවන් එහි පවසන අන්දමින්ම සුරකින අයට කිසිදු කණක් නොඇසූ කිසිඳු නයනක් නොදුටු ආකාරයේ ස්වර්ග සාක්ෂාත් කර ගත හැකි බව පැහැදිලි කරයි. එවන් සමහර කරුණු ගැන මතු විස්තර කෙරේ.

ඉස්ලාම් දහම තහනම් කරන සමහර දේවල් :

1. මිනිසුන් මාග ගතිපැවතුම්වලට සමාන නොවී සිතට වහල් නොවී, ලෞකික කම්සැප සුවයටද සහමුලින්ම ඇද නොවැටී උසස් චරිතයක් සාක්ෂාත් කරගනු වස් අල්ලාහ් දෙවිඳු හැර අනුන් අල්ලාහ් දෙවිඳුගේ තත්ත්වයට සම්භාවණයට පත් නොකර කටයුතු කරන ලෙස ඉස්ලාම් දහම අඥා කරයි.

2. ඔබ ප්‍රයෝජනවත් අන්දමින් කටයුතු කළ හැකි සාමාජිකයක් යනු මැයෙන් ඔබ අන් සමාජයන්හී සිරිත් විරිත්වලට වහල් නොවී කටයුතු කිරීමට උනන්දු කරන අතර අනුන්ට බරක් වන ලෙස කටයුතු කිරීමට සහ ජීවත් වීමටද ඔබ අකැමති වන අන්දමින් අඥා කරයි.

3. විශ්වය තුල නිර්මාණය කරන ලද දේ ගැන ඔබ ඥානය පුබුදු කර ඒ ගැන වටහා ගෙන ඔබගේ කය මහන්සිය යොදවා මරණෙන් මතු ජීවිතයේ ඵලවිපාක ලබා ගන්නට උත්සුක වන ලෙස අණ පනවයි.

4. ඉස්ලාම් දහම හුදෙක් ඒකීය දෙවත්වයෙන් හෙබි දහමකි. තම හදමනස හසුරුවා චින්තනය යොමු කර නියම සත්‍ය සංකල්පය වටහා ගෙන ඒ අනුව ඒක දේව වාදය පිළිගෙන කටයුතු කරන ලෙස අණපනවයි. ඒ අසහාය චින්තනය අල්ලාහ් දෙවිඳුගේ ඒකීය දේවත්වය ගැන මනා දැනුමක් ඇති කෙනෙකු කරන අතර ඔබ සම්භාවණීය කෙනෙකු යන්න හැඟෙන්නටද ඔබ ර්මාත් නම් ඒකේශ්වර විශ්වාස සංකල්පය තහවුරු කරන කෙනෙකු ලෙස කටයුතු කරන්නටද සකස් කරන්නේය.

5. මිනිසාගේ විලිබිය ආවරණය කරන ලෙසද සැකසංකා ඇති විය හැකි දේ වෙතින් ඉවත්වී ක්‍රියාවන ලෙසද අණපනවයි.

6. අනෙක් මුස්ලිම්වරුන්ගේ උවමනාවන් සපුරා ගැනීමට පිහිට වන ලෙසද තම නෑයන්ට අවශ්‍ය කටයුතු ඉෂ්ට කර දෙන ලෙසද අණපනවයි.

7. ඉස්ලාම් දහම සෑම මුස්ලිම්වරයෙකුම මුලින් සලාම් සුභ පතන ලෙස තම සහෝදර මුස්ලිම් වරයාගේ ඔපදූප, කේලාම් කීමෙන් වළකින ලෙසද අණ පනවයි.

8. ලොඩුන් දැක බලා ගැනීමටද, ඔවුන්ට ආදරය කරුණාව උපදවන විලසින් කතා කිරීමද, මල ගමන් වලට සහභාගි වීමද, සොහොන් වෙත ඒවා සියාරත් කිරීමටද, මොලොවෙන් ඉවත වී ගිය තම සහෝදයන් වෙනුවෙන් පව් සමා අයැද ප්‍රාර්ථනා කරන ලෙසද අණ කරයි.

9. ඔවුන් කෙරෙහි ඔබ ප්‍රිය වූවද නොවූවද මිනිසුන්ට උපරිම අන්දමින් යුක්තිය ඉටුකරන ලෙස ආඥා කරයි.

10. තමාට පහසු අන්දමින් යුක්තිගරුකව විනීතව තම ජීදිනෙදා ජීවනොපාය සොයා ගන්නා කළ එයින් මාන භංගත්වයට පත් නොවන අයුරු කටයුතු කිරීමට සම්පූර්ණ නිදහස ලබා දී ඇත.

11. අනෙක් නිර්මාණයන් කෙරෙහි අනුකම්පාව දයාව දක්වන ලෙසද, ඔවුන් හා විනීතව කටයුතු කරන ලෙසද, ප්‍රයෝජන වත් දේහී උත්සාහ කරන ලෙසද, ඔවුන්ට යහපත් යැයි හැඟෙන දේ සපයන ලෙසත් ආඥා කරන අතර ඔවුන්ට විපත් ආපදා ඇති විය කරුණුවලින් ඉවත් වන ලෙසද ආඥා කරයි.

12. දෙමාපියන්ට කීකරු වී දයාවෙන් කරුණාවෙන් සළකණ ලෙසද, ලේ නෑයන්ට ඔවුන්ගේ යුතුකම් ඉටු කරන ලෙසද, අසල් වැසියන්ට ගෞරව දක්වන ලෙසද, හැකි අයුරෙන් සතුන්ටද කවන ලෙසද අණ කරයි.

13. පිළිවදන්වූ වදන් ඒ විළසින්ම ඉටුකරන ලෙසද, බිරිඳට සහ තම ළමයින්ට ඔවුන්ගේ සේවය සම්පූර්ණව ඉටුකර ඔවුන් හා මනා ලෙස හැසිරෙන ලෙස අණ කරයි.

14. ඉස්ලාම් සත්‍ය දැය කර නරක දේ කිරීමේදී ලැජ්ජා ශීලී වන ලෙසද, කාරුණික වන ලෙසද, ගෞරව දක්වන ලෙසද, නිර්භීත වන ලෙසද සත්‍ය කරුණු වෙනුවෙන් පිටිවහල් වන ලෙසද අණ පනවයි.

15. මිනිස්කම ආරක්ෂා කරන ලෙසද, ආචාරශීලීත් වයෙන් හැසිරෙන ලෙසද, අනුන්ගේ යුතුකම් සුරකීම කෙරෙහි ස්පිරසාරව කටයුතු කරන ලෙසද, අන් අය හා සුපරීක්ෂා කාරීව කටයුතු කරන ලෙසද අනපනවයි.

16. අමානා හෙවත් ආරක්ෂා කර ආපසු දෙන දේ කෙරෙහි එහි විශ්වාසවන්ත අන්දමින් කටයුතු කරන ලෙසද, දුන් පොරොන්දු ඉටුකරන ලෙසද, නැණවත්ව අදහස්උදහස් ඉදිරි

පත් කරන ලෙසද, ක්‍රමිකව සන්සුනෙන් අනපනත් පිළිපදි මින් සියලු යහකම් කිරීමෙහි කඩිනම් වන ලෙසද අන කරයි.
17. ඉස්ලාම්හී නීතිරීතිවලට අනුගතව ස්වව නිදහසේ ශිෂ්ඨසම්පන්න ලෙස ක්‍රියා කරන ලෙසද, කටයුතු කරන විට මෘදු ලෙස කටයුතු කරන ලෙසද අණ පනවයි.
18. සෑම අවස්ථාවකදීම අල්ලාහ් දෙවිඳුට ස්තුති වන්ත වන ලෙසද, ඔහු කෙරෙහි ප්‍රියවී ඔහුට පමණක් බිය වන ලෙසද, උවමනාවන් වෙනුවෙන් ඔහු වෙත පමණක් හැරී ඔහුගෙන් පමණක් අභය පතන ලෙසද, ආචාර සම්පන්නව ඔහු ප්‍රියශීලී වන ලෙසද අණ කරයි.

ඉහත පෙන්වා දුන් ඔවදන් සහ තව බොහෝ කරුණු ගැන පවසන්නේ එලොව සහ මෙලොව මිනිස් ජීවිතය ඍජු ලෙස වන්නට හැකි වන ලෙස කටයුතු කරගෙන යනු පිණිසයි.

ඉස්ලාම්හී තවත් පැහැපත් කරුණක් වන්නේ, එය ඉවත් වන ලෙස අණපනවන දෙයින් ඉවත් වන කළ දුදන ක්‍රියාවන්හී සම්බන්ධවීමෙන් වළකී අන් සියළු අකුසල්, අදැමිටු ක්‍රියාවන් ගෙන් ආරක්ෂා වී කටයුතු කරන විට සත්‍ය විශ්වාස වන්ත මුස්ලිම්වරයෙකු ලෙස වන්නේය. එසේ මිනිසා මුළුමනින්ම වැළකී කටයුතු කළ යුතු සමහර කරුණු ගැන මෙසේ ලැයිස්තු කළ හැකිය.

ඉස්ලාම් දහම තහනම් කරණ කරුණු

1. අල්ලාහ් දෙවිඳු ප්‍රතික්ෂේප කිරීම, පාප කර්මයන්හී නියැ ලීම, අකීකරු වීම සහ හිතුමතේ කටයුතු කිරීම.
2. වැරදි චින්තන, කලකිරීම්, සෑම දෙයෙහිම සුභාසුභ සහ නැකත බැලීම, ලෝභකම, මසුරුකම, නාස්තිය සහ තුවූවමනා අයුරින් ප්‍රමාණයට වැඩි නාස්තිය වැන්න.
3. උඩගුකම, බද්ධවෛරය, අහංකාරකම, ඊර්ෂ්‍යාව සහ කළ පොරොන්දු කඩකිරීම වැනි සියළු ගුණයන්.

4. කුසීතකම, යමක් කිරීමේදී අදිමදි පෑම සහ එය නොම නාපයෙන් කිරීම, නිවටකම, අලසකම, බියසුලු කම, බෙල හීනය, කරන කටයුතු අපරීක්ෂාකාරීව කඩිමුඩියේ කරන්නට පෙළඹීම, නොහික්මුණු අන්දමින් කටයුතු කිරීම, චිත්ත විලි බිය කමෙන් තොර හැසිරීම, නොඉවසිල්ලෙන් කටයුතු කිරීම, අණුවනකම, නුවුවමනා අන්දමෙන් වූ කෝපය, නිරර්ථක විහිළු තහළු සහ පෙර සිදුවුණු සිද්ධිය නැවත නැවතත් සිහි කරමින් උරණ වී කටයුතු කිරීම වැනි නොමනා ගතිපැවතුම්.

5. මුරණ්ඩුකමෙන් ඉවත් වීම, නැතිබැරි අයට, දුක් කරදර වලට භාජණය වුවන්ට සහ අනාථයන්ට අවස්ථාවක් ඇත වූවද සිත උනු නොවන අයුරු පරුෂ ලෙස කටයුතු කිරීම.

6. කේලාම කීම, තම සහෝදරයා ගැන අහිතව සිතීම, ඔහුට කරදරවන අයුරු යමක් අනෙකාට කීම වැනි දේ.

7. වැඩකට නැති හිස්බස් තෙපලීම සහ නුවුමනා දේ ගැන තර්ක කරමින් පසුවීම, දුදන කෙනෙකුගේ වූවද රහසක් පතුරුවා හැරීම, කෙනෙකුට සමච්චල් වන ලෙස සිනාසීම සහ කටුයුතු කිරීම, අනුන්ට සමච්චල් කිරීම වැනි ක්‍රියාවන්.

8. නින්දා අවලාද කිරීම, ශාප කිරීම, නුසුදු අන්දමින් වචන පරිහරණය කරමින් සිත් පෑරෙන අයුරු කතා කිරීම, නින්දා වන අයුරින් හෝ හදමනස කකියවන අන්දමින් කවටකම් කිරීමේ අදහසින් උච්චාරනය කරන නම්වලින් ඇමතීම.

9. අනුන් තුල වැරදි සහගත මත රෝපණය කළ හැකි සහ දුදන ගෙන දෙන හැකි විවාද සහ තර්ක කිරීම, නුරුස්නා විහිළුතහළු සහ සරදම් සමච්චල් කිරීම.

10. තමාට අප්‍රයෝජන කතාබහෙහි නියලීම සහ අනුන්ගේ කතාවකට නුවුවමනාවෙන් ඇතුල් වීම සහ හරස් වීම.

11. බොරු සාක් කි කීම, සුළුප්‍රයෝජන උදෙසා සාක්කි හැං ගීම, ගොතා කීම, නිහතමානි කාන්තාවන්ට අවලාද කිරීම, මලගිය ඇත්තන්ට ඇනුම් බැනුම් කිරීම, තමා ලබා ඇති යම් දැණුමක් ඇත්නම් උඩඟු ලෙස එය ප්‍රචාරය නොකර සීමා කර ගන්නට උත්සාහ කිරීම.

12. මොඩ තකතිරු අන්දමින් ක්‍රියා කිරීම, අශිෂ්ට අසාහාය අන්දමින් හැසිරීම, තම දන්දීම අනුන්ට කියා ප්‍රසිද්ධ කිරීම, තමාට දැණුම ඥානය ලබා දුන්නාට ස්තුති වන්ත වීමෙන් වළකීම.

13. අනුන්ගේ නොබැලිය යුතු ඇඟපසඟ දෙස උවමනාවෙන් බැලීම, තම පියා නොවන තවත් කෙනෙකුට තම පියා යැයි කීම, යහපත් උපදෙස් දීමෙන් වළකීම, හොඳ දේ කරන ලෙස කියා නරක දෙයින් ඉවත්වන ලෙස දැනුම් දීමෙන් වළකිම.

14. විශ්වාස භංකත්වය, අනුන්ට උගුල් ඇටවීම, දුන් පොරොන්දු කඩකිරීම, කරදර වන අයුරු මිතිසුන් අතර භීෂණ ඇති කිරීම වැන්න.

15. දෙමාපියන්ට නොසළකා හැරීම සහ හිංසා පීඩා කිරීම, ලේ නෑයන්ගේ සබඩා බිඳසිඳ ලමින් කටයුතු කිරීම, තම ළමයින්ගේ වැඩ කටයුත්තන්හී නොසැළකිල්ලෙන් පසුවීම.

16. අනුන්ගේ දේ සහ කටයුතු ගැන නුවමනා ලෙස චර පුරුෂ සේවයේ යෙදීම, අනුන්ගේ වැරදි ගැන නුවුවමනා ලෙස සොයා බැලීමට වැයම් කිරීම වැන්න.

17. ගැහැණියෙකු පිරිමියෙකු ලෙස වෙස්ගැන්වීම හෝ පිරිමි යෙකු ගැහැණියෙකු විලසින් වෙස්ගැන්වීම හෝ එලෙස ක්‍රියා කිරීම හෝ තම සහකරුවාගේ හෝ සහ කාරියගේ හෝ රහස් එළිකිරීම.

18. මත්පැන සහ මත්ද්‍රව්‍යයන් භාවිතා කිරීම සහ මුදල් විනාශ විය හැකි තහනම්වූ දේහී මුදල් යොද වීම.

19. තම නොවටිනා භාණ්ඩයේ තරම ගැන බොරුවට දිවුර මින් අලෙවි කිරීම, මිලයට ගැනීමේදී අනුන්ට නොදැනෙන සේ කිරුම වැඩි කිරීම, මැනුම් කිරුමෙහි අඩුවෙන් කිරීම, දහම අනුමත නොකළ දේහි මුදල් යෙදීම, ඒවායින් අසල් වැසියා කරදරයට පත් කිරීම.

20. සොරකම, ක්ෂණික කෝපය, තම සහෝදරයෙකුට විවාහ පොරොන්දුවක් වූ විට එයට පටහැනිව ඔහුට තවත් විවාහයක් ගැන කතා කිරීම, තම සහෝදරයාගේ වෙළඳ කටයුතු හංකවන අයුරු විරුද්ධව වෙළඳාම් කිරීම.

21. වෙළහෙළඳාම් සහ අනෙකුත් කටයුතුවල තමා හා එක්වී සමාගම්ව කටයුතු කරනවිට ඔවුන්ට හතුරුකම් කර විශ්වාස හංග අයුරෙන් කටයුතු කිරීම, තමාට යම් භාරකා රත්වයක් පවරා දී ඇත්නම් එහි අයිතිකරුවාගේ දැනුමෙන් තොර එහි කිසිවක් තම පුද්ගලික ප්‍රයෝජනයට ගැනීම, එසේම එහි අයිතිකරුවා එයින් කිසිවක් ස්ව උවමනාව පිණිස නොගන ලෙස පැවසූවද එහි කිසිවක් ඔහුට නොදැනී ගැනීම.

22. උවදුරු වන අන්දමින් වැඩි වශයෙන් කෑම ගැනීම.

23. තම සහෝදරයෙකු මුහුණ ගැසෙන කළ ගස්සා ගෙන ඉවත් වී යෑම, ඔහු ගැන නුවුමනා අදහස් තම සිත්තුල පොදි බැද ගෙන සිනාමුසුව තකා නොකර ඉවත්වී සිටීම, තම සහෝදර යාගෙන් වාදවිවාධ වී තරහ වී ඉවත්වී තෙදිනකට වැඩි කාලයක් නොමනාපයෙන් පසු වීම.

24. කිසිදු වරදකින් තීරණ වී හැර හේතුවකින් තොරව කෙනෙකුට තඩි බැමද, ආයුධ පෙන්වා බිය වැද්දීම.

25. දුරාචාරයෙන් සහ විශාල සමලිංග සේවනයේ යෙදීම සහ විචාත තීරණයකින් පසු නොවන්නට කිසිදු සහේතුවක් නැතිව කෙනෙකු ඝාතනය කිරීම.

26. විනිශ්චය කරුවෙකු ඔහුට සාධකව විනිශ්චය කිරීම පිණිස චූදිතයාගෙන් යම් පගාවක් තෑග්ගක් ලැබීම ඒ පිණිස ඔහුගේ පාර්ශවයේ අයගේ සාධයකට සහභාගි වීම.

27. සේවයට සරිලන මුදලක් නොවන්නට හොඳ දෙයක් වෙනුවෙන් හෝ නරක දෙයක් වෙනුවෙන් හෝ පගා වැනි අත්පිට මුදල් දීම සහ එසේ ගැනීම.

28. හැකි අයුරෙන් විපතට පත්වූ අය හට උදව් කිරීමට හැකිව තිබියදී උවමනාවෙන්ම එයින් වළකී සිටීම.

29. කිසිඳු පෙර දැනුම් දීමකින් තොරව අනුන්ගේ නිවෙස් වල සිදුවන දේ වංකව ඒ නිවසේ බිත්තියේ සිදුරුවලින් බැලීම, තමන් කතා වන දේ අනුන් ඇසීමට අකැමැතිව සිටින කළ ඒ කතාවට උනන්දුවෙන් ඇහුම්කණ් දීම.

30. මිනිස් සමාජයේ සන්තෘෂ්ටියට, මිනිස්කමට, ඥානයට, යහමගට සහ දේපලවලට සහ එහි සම්භාවණයට අහිත කර සියලු දුදන ක්‍රියාවන්.

අප පෙර සඳහන් කළේ ඉස්ලාම් දහම අණපනවන සමහර කරුණු සහ ඉවත්වන ලෙස තරයේ හෙළා දකින සමහර කරුණු සම්බන්ධවයි. එසේ ඉස්ලාම් දහම අණපනවන කරුණු ගැන මනාව පැහැදිලිවන විලසින් සවිස්තරව පවසනවා නම් එයට මෙවන් කුඩා පොත් පිංචක් කිසිසේත් ප්‍රමාණවත් නැත.

## ඉස්ලාම්හී කුළුණු

ඉස්ලාම්හී කුළුණු යනුවෙන් පවසන කළ එය ඉස්ලාම් දහම පිළිගත් කෙනෙකු නොපිරිහෙළා ඉටු කළ යුතු පංච කර්මයන් යන්න වටහා ගත යුතුය. ඒවා මෙසේය :

1. අෂුහදු අල්ලාඉලාහ ඉල්ලල්ලාහ් අවෂ්හදු අන්න මුහම්මදුර් රසූලුල්ලාහ් යනුවෙන් සාක්ෂි දීම.

2. දෛනික වන්දනාව. 3. සකාත් බද්ද.

4. රමළාන් මාසයේ උපවාස ශීලය. 5. හජ් මෙහෙයුම.

1. ෂහාදත් නම් සාක්ෂි දැරීම : අරාබි පදයක් වන අෂ්හදු අල්ලා ඉලාහ ඉල්ලල්ලාහ් වඅෂ්හදු අන්න මුහම්මදුර් රසූලුල්ලාහ් යනුවෙන් ශාක්ෂි දැරීම. මෙම සාක්ෂි දැරීම තුලින් වැඳීමට සුදුසු එකම සත්‍ය දෙවියා අල්ලාහ්, ඔහුට කිසිදු සමාන යක් නැත, පිටිවහලක් උවමනා නැත, තවද මුහම්මද් තුමා ඔහු විසින් මිහිපිට තෝරාගත් වක්තෘ වරයා ලෙසද, අල්ලාහ් විසින් ආඥා කරන ලද දේ එතුමා ඒ ආකාරයෙන්ම ප්‍රචාරය කළ බවද එහි ප්‍රතිපත්තීන් අවංක ලෙස තිරසාරව පිළිගෙන එහි වචනයේ අර්ථයද මනා ලෙස වටහා ගෙන පැවසීම වේ.

යමෙකුගේ ක්‍රියාවන් ස්ථිර වීමට මෙම සාක්ෂි දෙක අති වැදගත්ය. පිරිසිදු චේථනාවන් සහ මුහම්මද් තුමාගේ අනුශා සනාවන් අනුව කටයුතු නොකරන්නට කිසිදු ක්‍රියාවක් ඉස්ලාම් අනුමත නොවේ.

අල්ලාහ් දෙවිඳු හැර අන් කිසිවෙකු වන්දනාමානය කටයුතු වලට මුල් කරගත නොහැකිය. එසේම මුහම්මද් තුමා පවසා දුන් ආකාරයට මිස සිත්සේ ඇදහිලි කළ නොහැකිය. එසේම යහකම් කිරීමෙහි පිරිසිදු චේථනාවද වැඳීමට සුදුසු දෙවියා අල්ලාහ් හැර අන් කිසිවෙකු නැත යන්නට සාදකයකි. මුහම්මද් රසූලුල්ලාහ් යන්නෙන් නියෝජනය වන්නේ සියලු ක්‍රියා උදෙසා මුහම්මද් තුමාගේ අනුශාසනය උවමනා බවය.

වැඳීමට සුදුසු දෙවියා අල්ලාහ් දෙවිඳු හැර අන් කිසිවෙකු නැත යන්න පැහැදිළි කිරීමේදී, අල්ලාහ් පමණක් වන්දනාමානයට සුදුසු එකම සත්‍ය දෙවියාවේ යනුවෙන් ස්ථිර අධිෂ්ඨානයෙන් ප්‍රකාශ කිරීම මගින් සාක්ෂි දෙක ස්ථිරසාර කිරීමට හැකි වනු ඇත. හුදෙක් එය වචනයෙන් පමණක් තෙපලීමෙන් කිසිදු ප්‍රයෝජනයක් නැත. නමුදු සත්‍ය ලෙස පිරිසිදු සිතෙන්

ප්‍රියව පිළිගනිමින්, ඒහි තේරුම පැහැදිළි වන අයුරු වන්දනා මාන සහ අනෙකුත් කටයුත්තන්හී ඒ විලසින්ම තියැළිය යුතුය.

එහි අනෙක් කොටස වන මුහම්මද් රසූලුල්ලාහ් යනුවෙන් පැහැදිළිව තෙපලන කළ එයින් පැහැදිලි වන්නේ එතුමා අල්ලාහ් දෙවිඳුගේ ආඥානුසාර අනුව එතුමාගේ මග පිළිපැදිය යුතුය යන්න වේ. එතුමා දැනුම් දුන් ඒවා සත්‍ය කර එවා ස්ථිරසාරව අල්ලාහ් දෙවිඳුගෙන් පැමිණුනු ඒවා බව ඒ ආකාරයෙන්ම විශ්වාස කර පිළිගත යුතුය. එතුමා ඉවත්විය යුතුය යනුවෙන් වළක්වාලූ දෙයින් ඉවත් විය යුතුය. එතුමා ආගම ලෙස පහදා දුන් විලසින් නොවන්නට අන් කිසිදු විලසින් අල්ලාහ් දෙවිඳු වන්දනා මාන කිරීමෙන්, ජීවිතය ගත කිරීමෙන් වළකිය යුතුය.

සාක්ෂි දෙකේ සමහර ප්‍රතිඵල මෙසේය : යමෙකු ඒ සාක්ෂි දෙක නිහතමානීව පිළිගෙන තෙපලන කළ මිහිපිට ඇති අනෙකුත් නිර්මාණයන් හට තම සිත්සේ වන්දනාමාන කිරීමෙන් සෘජුව ඉවත් වන්නේය. මුහම්මද් තුමා හැර අන් වක්තෘවරුන්ගේ යැයි පැවසෙන මග පිළිගැනීමෙන් ඉවත් වීම.

2. දෛනික සලාත් : මෙය දෛනික පස්වතා සලාත් කිරීමේ මෙහෙවර පිරිසිදු චේථනාවෙන් නියමා කාරයෙන් ඒ ඒ වේලාවට වහා තිම කරන වන්දනාමානයකි. ඉස්ලාම් දහම දිනපතා පස්වතා නැමදුමක් අනිවාර්යය කර ඇත. ඒවා අළුයම ෆජ්ර්, දිවා ලුහර්, පෙර සැඳෑවේ අස්ර්, ඉර බැස වහා වූ මග්රිබ් සහ ඇඳිරි වැටීමෙන් පසුවූ ඉෂා යනුවෙන් වේ.

සලාත් කිරීමෙන් ඇතිවන සමහර ප්‍රතිඵල මෙසේය : යමෙකු දෛනික පස්වතා සලාත් වන්දනය අඛණ්ඩව ඉටුකරන කළ හදමනසට සන්සුනක්, සැනසීමක්, දෙනුවන් පිනවීමක්, චින්තනය තරවී ස්ථිරවීමක්, කුසීත කමෙන් ඉවත්වී සිත සහ කය උද්යෝගිමත් වීමක්, නොඅනුමත දේ සහ ප්‍රතිෂේප

කිරීමෙන් ඉවත් වීමක් සහ ලැජ්ජා සහගත සහ අශීලාචාර ගතිවලින් මිදීමක් ඇතිවන අතර මුස්ලිම්වරු අතර සාමයෙන් සමාදාන යෙන් හෙබි ස්ථිර බැඳීමක්ද ඇති කරන්නේය.

3. සකාත් බද්ද : මෙය අල්ලාහ් වෙනුවෙන් කෙරන වත් පිළි වෙතක් ලෙස පිළිගෙන කෙනෙකු නිසාබ් හෙවත් සීමිත කාලය සම්පූර්ණවූ තමා සතු ධේසතෙන් නියමිත කොටස වෙන්කර එය ලැබීමට සුදුසු දිළිඳුන්, දුප්පතුන් සහ අනෙ කුත් සුදුසු අය හට බෙදා දීම වේ. එය දීමේදී කිසිදු ලෞකික බලාපොරොත්තුවකින් තොර මුළුමනින්ම අල්ලාහ් දෙවිඳු උදෙසා විය යුතුය.

සකාත්දීමෙන් ඇතිවන සමහර ප්‍රයෝජන : ආත්මිකව මසුරු කමෙන් පිරිසිදු කිරීම, ධේසත් වර්ධනය වීම සහ වැඩිවීම. තම නෑතිබෑරි සහෝදර මුස්ලිම්වරුන්ගේ සමහර සහේතුක උවමනාවන් සපිරීම, ඔවුන් අතර ප්‍රියමනාප වර්ධනය වීම, තම සහෝදර ජනතාව හිඟා කෑම හෝ යාචකයේ යෙදීමෙන් වළකන්නට තමාට හැකි අන්දමින් පිටිවහල් වීම, ඊර්ෂාවෙන් මිනිස් සිත පිරිසිදු වීම, මිනිසුන් අතර කාරුණ්‍යාව වැඩීම සහ එකා අනෙකා අඳුර ගෙන වටහා ගැනීම වැන්නන් වේ.

4. රමළාන් මාසයේ උපවාස ශීලය : මෙය අල්ලාහ් වෙනුවෙන් රමළාන් මාසයේ දිවා කාලයේ කෑමබීමෙන් වැළකී සිටීම වේ. එනම් රමළාන් මාසයේ අල්ලාහ්ගේ ආඥාවට කීකරු වී දිවා කාලයේ එනම් ෆජ්ර් අවස්ථාවේ සිට ඉරබැස ගිය මග්රිබ් වේලාව දක්වා කෑම්බීම සහ කායික සංසර්ගයෙන් ඉවත්වී සිටීම වේ.

එහි සමහර ප්‍රයෝජන : මිනිසා පව් කිරීමට පෙළඹවීමෙන් තම සිත සහ කය ආරක්ෂා කර ගැනීමට හැකි වන්නේය. එසේම ඉඳුරාම අල්ලාහ් දෙවිඳුගේ ආඥාවට කීකරු වන නිසා හෙතෙම තම දෙවිඳුගේ සම්පූර්ණ ප්‍රියශිලීත්වය සහ සුවිපාක

ලබාගැනීමට හැකි වන්නේය. තමාට භුක්ති විඳිය හැකි තම උවමනාවන් දවසේ පැය කීපයකට මර්ධනය කරමින් තම සිත සහ කය පිරිසිදු වනු වස් අල්ලාහ් දෙවිඳුගේ තෘප්තිය ලබනු වස් කටයුතු කිරීමෙන් ඒ ඉලක්කය ලබා ගන්නේය. උපවාස ශීලය රකිමින් පසුවන කාලය තුල තම කුසගින්න සහ පිපාසය මර්දනය කරගෙන පසුවන අතර තම යුතුක මද වටහාගෙන කටයුතු කිරීමෙන් එහි විශේෂ තත්ත්වයක් වන මමත්වය සහ අනෙක් සහෝදරයන්ගේද අපහසු තාවයන් මනාව වටහා ගන්නටද මග සැළසෙන්නේය.

5. හජ් මෙහෙයුම : මුදල් සහ කායික ශක්තිය මෙන්ම ගමන් මගේ පහසුව වැනි ශක්තිය ලබන්නන් අල්ලාහ්ගේ නිවහන වන මක්කාහී කඃබා දේවස්ථානයට ගොස් එහි කළ යුතු කටයුත්තන් අවසන් කිරීම වේ.

කෙනෙකු පිරිසිදු චේථනාවෙන් හජ් කටයුත්ත සම්පූර්ණ යෙන්ම ඉටු කරන විට බොහෝ ඵලප්‍රයෝජන සහ පින් දහමන් ලබන්නේය. මතු සඳහන් කරුණු එහි ප්‍රධාන ඒවායැයි කිව හැකිය. තමා කවදා හෝ මුණ ගැසිය හැකි මතුලොව සහ එහි විපාකය ගැන මතක් කිරීම, මසුරුකමෙන් සහ කුසීත කමෙන් තොරව තම සේසත් සහ කාය ශක්තිය වියදම් කිරීම කෙරහි හදමනස සූදානම් කර ගැනීම, සෑම මොහොතකම අල්ලාහ්ගේ සමීපත්වය ලබාගනු වස් උනන්දු වෙන් පසුවීම, මිහිපිට ප්‍රසාරණ වී වසන අනෙකුත් ඉස්ලාමීය සහෝදරයන් අතර සාමුහික හඳුන්වා ගැනීමක් සහ සම්බන්ධයක් කෙරෙහි ඇදී යෑම වැන්නන්ය.

පහත සඳහන් කළේ ඉස්ලාම් දහමේ ප්‍රධාන කුළුණු පහ ඒයින් ඇතිවන විපාකයන් සහ ප්‍රයෝජනයන්ය. ඒවා පැහැ දිලිව පවසනවා නම් මෙ පොතේ අරමුණද වෙනස් විය හැකිය. මේ ප්‍රතිපත්තිය තුලින් මිහිපිට අව්‍යාජ පරමාධිපත්‍ය ආඥා

වෙත් සාරධර්මයෙන් හෙබි මිනිස් සමාජයක් සංස්ථාපිත කර හැකි වන අතර අනෙක් මැවීම්වල යථාර්ථය වටහා ගෙන යුක්තිගරුක කටයුතු කරන්නටද අවස්ථාවක් ලබන්නේය.

## ඉස්ලාමීය මූලික විශ්වාස පද්ධතිය

ඉස්ලාමීය විශ්වාස පද්ධතියේ කරුණු ගැන පවසන විට එය මුස්ලිම්වරයෙකු අනිවාර්යයෙන්ම විශ්වාස කළ යුතු කරුණු හයක් ලෙස විස්තර කළ හැකිය. මේවා අල්ලාහ් දෙවිඳු විසින් නිකුත් කරන ලද ආඥාවේ කරුණු බව සම් පූර්ණයෙන්ම වටහා ගත යුතුව ඇත. මුහම්මද් තුමාගේ මුදුවදන් තුලින් එහි වැදගත්කම අපට මනා ලෙස වටහා ගත හැකිය. එසේම මුහම්මද් තුමා විසින් පවසන ලද ඒ කරුණු අල්ලාහ් වෙතින් පැමිණි ගුප්ත ඥානයෙන් හෙබි ඒවා යැයි ඉඳුරාම පිළි ගත යුතුය. ඉස්ලාම් ප්‍රතිපදාව ආශ්‍රිතව එසේ විශවාස කළ යුතු ප්‍රධාන කරුණු හයකි. ඒ කරුණු හය මෙසේ වේ.

- අල්ලාහ් දෙවිඳු කෙරෙහි විශ්වාස කිරීම.
- සුරදූතයන් කෙරෙහි විශ්වාස කිරීම.
- ග්‍රන්ථ කෙරෙහි විශ්වාස කිරීම.
- වක්තෘවරු කෙරෙහි විශ්වාස කිරීම.
- පරමාන්ථ දිනය කෙරෙහි විශ්වාස කිරීම.
- සෑම දෙය්කම අල්ලාහ් දෙවිඳුගේ පෙරම්නුම මත වන බව විශ්වාස කිරීම.

### අල්ලාහ් කෙරෙහි විශ්වාසය

ඉස්ලාමීය විශ්වාස සංකල්පයේ මුඛ්‍ය කොටස අල්ලාහ් දෙවිඳු ගැන සම්පූර්ණව විශ්වාස කිරීම වේ. දැනුමන්හි ප්‍රධාන දැනුමද මෙය යැයි ස්ථිරසාරව කිව හැකිය.

සර්වබල අල්ලාහ් දෙවිඳු වන ඔහු සියල්ලෙහි මැවුම් කරුවාද, මහරජද, හිමිද ඔහුවේ. ඔහු විශ්වයේ ඇති සියළු දෑ නිර්මාණය කර තම සූක්ෂම ඥානයෙන් ඒවා පාලනය කරමින් පසුවෙයි. කීකරු වීමටද යටත් වීමටද වන්දමානායටද එකම සුදුස්සාද ඔහුය. ඔහු කේවලය. ඔහුට සමව කිසිවෙක් නැත, ඔහුට පිටිවහලක්ද උවමනා නැත. සියළු ඌනතාවයන්ගෙන් තොරවූ අති පාරිශුද්ධ ඔහු නිර්මාණයන් හට සමාන නොවන්නේය. මෙසේ අල්ලාහ් දෙවිඳු විශ්වාස කිරීම මුස්ලිම් වරුන් වන සියළු කෙරෙහි වූ අනිවාර්යය යුතුකමකි.

මේ ස්ථිරසාර විශ්වාස මිහිපිට උපන් සියළු දනන් හා උත් පත්තියෙන්ම පිහිටා ඇත යන්න නොකිව මනාය. කිසිදු මනසකට හෝ චින්තනයකට හෝ ඥානයට හෝ පහසුවෙන් වටහා ගත නොහැකිවන පරිදි අති උසස් අන්දමින් උපදින මිනිසා ඒ ස්ථිරසාර විශ්වාසය මත උපදින්නේය. ඒසේ උප දින මිනිසා ඒ ස්ථිර විශ්වාසයෙන් දැනුවත්ව ඉවත් කරන විට ඒය ගැන මනා ලෙස වටහා ගන්නට නොහැකිව ඔහු ඒ විශ්වාසයෙන් සමපූර්ණයෙන්ම ඉවත්කර වන්නේය. ඒ ගැන අල්ලාහ් දෙවිඳුම අල්කුර්ආනය මෙසේ පවසයි : *'කුමණ ස්වභාවයෙහි අල්ලාහ් මිනිසා (නිර්මාණය) කළේ ද එය ඔහුගේ (ස්ථිර ෆිත්රා නම්) සහජ ධර්මය වේ'* (30 : 30)

ඉහත සඳහන් අල්කුර්ආන් වාක්‍යයේ ස්වභාවය යන වචනයට අල්ලාහ් දෙවිඳු ෆිත්රා යන අරාබි වදන භාවිතා කර ඇත.

ෆිත්රතල්ලාහ් යන්නෙහි තේරුම : මිනිසා කුමණ ප්‍රතිපත් තිය මත උපත ලබා ඇත්දෝ ඒ සහජ උපත, සහජමග නම් ඉස්ලාම් වේ. මිනිසා තමා මුහුණ දෙන විශාල දුක්දොම්නස් සහ කරදර අවස්ථාවන්හී එයින් වළකිනු වස් දෙවියනි යනු වෙන් අමතනු සාමාන්‍ය සංසිද්ධියකි. ඒ ඇමතුමෙහි මුස්ලිම් වරු, නොමුස්ලිමුන් ආගම් කෙරෙහි කිසිදු ප්‍රියමනාපයක්

නැති කියා වෙනසක් නැත. කුමන අවස්ථාවක හෝ වේවා ඒ අවස්ථාවේ මහුගේ චින්තනය, මනස ඒ උසස් පිටිවහල කෙරෙහි විනිවිද යන්නේය. ඒය වෙත හැරෙන ලෙස උනන්දු කරන්නේය, බල කරන්නේය. ඒ අල්ලාහ් දෙවිඳුගේ සමීපත්වය ලබා ගනු වස් මහු බල කරන්නේය.

ෆිත්රා හෙවත් මිනිසා එහි යථාර්ථයේ ඉපදෙන්නේය යන් නෙහි තේරුම, තමා යටත්විය යුතු කීකරු විය යුතු දෙවියෙකු වේ, වන්දනාමාන කළ යුත්තේ ප්‍රිමනාප විය යුත්තේ මහුට පමණකි යන දැනුම හෙතෙම සහජ යෙන්ම ලබා මෙලොව එළිය දකින්නේය. අන්නපානය ගැනීම කෙරෙහි වූ හැදියා වකින් සමන්විතව දේහයක් හා මිනිසා නිර්මාණය වී ඇති සේ ඒ සහජයෙන්ම මහු පසු වන්නේ නම් කිසිසෙත් මහු ඒ සහජ ප්‍රතිපත්තයෙන් නොහැරෙන්නේය, මන්දයත් සෑම මිනිසාම නිර්මාණයවී ඇත්තේ ඒ සහජ හැදියාව මත නිසාය.

එහෙයින් ඒ කරුණ මනාව වටහාගනු වස් වක්තෘ මුහම්මද් නබි තුමාගේ දෙසුමක් ගැන අප අවධානය යොමු කරමු : ඉපදෙන්නාවූ සියලු බිළිඳුන් දෙවිඳු විශ්වාස කරන්නා වූ සහජ ලක්ෂණය මත ඉපදෙන්නේය. නමුදු ඒ බිළිඳාගේ දෙමාපියන් හේ යුදෙව්වෙකු ලෙස හෝ ක්‍රිස්තියානියෙකු ලෙස හෝ අග්නි පූජකයෙකු ලෙස හෝ පත් කරන්නේය. (මූලාශ්‍රය : බුහාරී)

ඒ මුහම්මද් තුමාගේ කියමනේ සහජ දහම යන්නට ෆිත්රා නම් වචනය භාවිතා කර ඇත. සියලු ඉපදීම් දෙවියෙකු ඇති බව වූ ස්වභාවයෙන්ම ඉපදෙන්නේය. එනම් එය ස්වව තමා විසින් පිළිගෙන විශ්වාස කර කීකරු වී පිළිපැදිය යුතු දෙවිඳු කෙනෙකු පිළිගන්නා වූ යථාර්ථය වන ඉස්ලාම් දහම වේ. මුහම්මද් තුමාගේ මුදුවදනෙහි එතුමා විසින් ‘ළමයාගේ දෙමාපියන් මහු ඉස්ලාම්කයෙකු ලෙස කරන්නේය’ යන වදන ඇතුල් නොකළේ ඇත්තෙන්ම ළමයෙකු එහි ස්වභාවය වන

දෙවි කෙනෙකු ඇති බව පිළිගන්නා වූ මතයක් මත ඉපදෙන අතර ඒ ළමයාගේ දෙමාපියන් ඔහු ඒ යථාර්ථයෙන් පිට වන්නට කටයුතු කරන්නේය යන අදහස පැහැදිලි කිරීමටය. මන්දයත් ළමයාගේ දෙමාපියන් ඒ ඉපදෙන ළමයා එහි ෆිත්රා හෙවත් යථාර්ථයෙන් එපිට වූ කිතුනු වෙකු ලෙස හෝ යුදෙව්වවෙකු ලෙස හෝ නොවන්නට අග්නි පූජක යෙකු ලෙස හෝ වෙනත් පැත්තකට යොමු කරන්නෝය. මෙසේ දෙවියෙකු ඇති බව වූ යථාර්ථය මත ඉපදෙන ළමයින් නොමග යැවීම සිදුවන්නේය.

පිරිසිදු සිහිබුද්ධිය ඥානය මිනිසාගේ චින්තනය සහජ ෆිත්රා වෙත හැරෙන්නට මග සළසා වන්නේය. තමාට කියා කීකරු විය යුතු තම නිර්මාතෘ වරයා වන දෙවි කෙනෙකු කෙරෙහි විශ්වාස කිරීම කෙරෙහි මිනිසාගේ ඥානය ප්‍රමුඛව කටයුතු කරන්නේය. ඇත්තෙන්ම කෙනෙකුගේ සහජ පිරිසිදු බුද්ධිය තම මාපකයා වන අල්ලාහ් පිළිගැනීමටවූ ප්‍රධාන සාධකයකි. විශ්වයේ විශ්මිත නිර්මාණයල එහි ඇති මහපොළොව, අහස, කඳු, සාගරය, මිනිසුන්, සත්වයින්, ඛනිජ ලවන සහ ගස් වර්ග වැනි අප්‍රමාණ නිර්මාණයන් ගැන සිතා බලන්නේ කවරෙක්ද හෙතෙම ඒවා නිර්මාණය කළ අති උත්කෘෂ්ඨ නිර්මාතෘ වරයෙකු සිටින බව යෙහෙන් වටහා ගතු ඇත. ඒ යථාර්ථය වටහා ගන්නට නම් අප කරුණු තුනක් ගැන මඳක් සිතා බැලීම වටින්නේය.

1. මේ නිර්මාණයන් නිර්මාතෘ වරයෙකු නැතිව නිර්මාණය වන්නට හැකිය යන්න පහසුවෙන් සිහිබුද්ධියට ඥානය ලගා විය නොහැකි ව්‍යාජ කියමනකි. නිර්මාණයක් ගැන අපගේ ඥානයම අපට මනා අන්දමින් වැටහීමක් ඇති කරන්නේය. කෙසේදයත් මාපකයෙකු නැතිව කිසිදු නිර්මාණයක්මක් ඇති විය නොහැකිය. එසේම ඒවා විවිධ අවස්ථාවන් සහ

විවිධ හේතුපාදක, පාලනය, ප්‍රමිතිය, ඉලක්කය, මැද්දේ නිර්මාණය වී ඇත යන යථාර්ථ මතය එය ස්වච නිර්මාණය විය, ඉබේම නිර්මාණය වී ඇත යන තර්කය සහමුලින්ම හෙළා දකින්නේය.

2. තමා තමාම නිර්මාණය කරගැනීම: මෙම තර්කයද බුද්ධි ගෝචරයෙකු විසින් හෝ සාමාන්‍ය කෙනෙකු විසින් හෝ පිළිගැනීමට නොහැකි මතයකි. මන්දයත් ඕනෑම දෙයක් එය නිමවන්නට පෙර හෝ නිෂ්පාදනය කරන්නට පෙර හෝ එවැන්නක් නොවී තිබුණු හෙයින් තමා තමාම නිර්මාණය කරගැනීම පිළිගත හැකි තර්කයක් බව සෑම කෙනෙකුම වටහා ගැනීම එතරම් අසීරු කාරණයක් නොවේ. අප පෙර විස්තර කරන ලද කොටස් දෙකේ සඳහන් කරුණු අනුව යමෙකු ඉබේ බිහිවන්නට නොහැකිය යන මතය පැහැදිලි කරනවිට බුද්ධිමතුන් ඒ ගැන මනාව වටහා ගත යුතුව ඇත.

3. විශ්වයේ ඇති සියළු දෑහී නිර්මාතෘ වරයෙකු සිටින බව මුළුමනින්ම පිළිගත යුතුය. පිළියෙල කළ සෑම දෙයකටම එය පිළියෙල කළ කෙනෙකු සිටිය යුතුය. සෑම නිෂ්පාදනයකටම නිෂ්පාදකයෙකු වන්නේය. ඒ නිර්මාතෘ වරයා, කරන්නා සර්ව බල දෙවිඳු හැර අන් කිසිවෙකු නොවේ. ආරම්භකයා සහ අවසානයාද, මුල්ම කෙනාද අවසානයාද ඔහු වේ. එහෙයින් මෙම කරුණ ගැන මනාව කල්පනා කරන බලනවිට විශ්වයේ ඇති සියල්ලෙහි නිර්මාතෘ වරයා ඒ අල්ලාහ් දෙවිඳු හැර අන් කිසිවෙක් නැත යන්න සක්සුදක්සේ පැහැදිලිය. අල්කුර්ආනයේ මෙසේ පවසයි : *'ඔවුහු නිර්මාපකයෙක් නැතිව (ස්වච) නිර්මාණය කරනු ලැබුවාහුද? නොවන්නට ඔවුන්ම නිර්මාපකයෝද?'* (52 : 35)

පෙර සඳහන් අල්කුර්ආනයේ වදන අර්ථකථනය කරන අන්දම සිතා බලන කළ ඔවුන් නිර්මාණයන් මිස අන් කිසි

වක් නිර්මාණය කිරීමට ශක්තියක් හෝ හැදියාවක් හෝ ඇති අය වේ. එසේම ඔවුන් තමාම නිර්මාණය කර ගත්තේද නැත. නිර්මාණයන් ඇති නිසා ඒකාන්තයෙන්ම එහි නිර්මාතෘ වර යෙකු විය යුතුය. එහෙයින් සියළු දෙනාගේ නිර්මාතෘ වරයෙකු ඇති බව සහසුද්දෙන්ම පැහැදිලි වන්නේය. බලවත් දේ තිබේ නම් එහි බල වන්තයෙකු ඇති බව වටහා ගැනීම එතරම් දුෂ්කර කරුණක් නොවේ. එසේම යම් නිෂ්පාදනයක් වේ එහි නිෂ්පාදකයෙකු විය යුතුය. යම් ක්‍රියාවක් වී ඇත්නම් එහි ක්‍රියාකල කෙනා විය යුතුය. ඒ ක්‍රියා කරුවා නිර්මාතෘ වරයා, නිෂ්පාදකයා, අල්ලාහ් දෙවිඳු වේ.

මේ කරුණ සත්‍යයක් බව පවසමින් විද්වතුන්ද එක් මතයක මත තම මත ගොඩ නගමින් පසුවෙයි. ඒ අදහස කෙරෙහි සැකයෙන් පසුවන්නේ කවරෙකද ඔහු ඒ කරුණු ගැන මනා අවබෝධයක් නැති මුග්ධයක් මිස අන් කවරෙක්ද? හෙතෙම චින්තනය විකල්ප වී අඥානයේ පසුවනවාය යන්න මිස අන් කිසිදු අන්දමින් ඔහු ගැන කීමට නොහැකිය.

මුස්ලිම් නොවන බොහෝ විද්වතුන් පවා මේ අදහස් මත කටයුතු කරනවා අපට දැක ගත හැකිය. 'ඥානාන්විත යුගයේ දෙවියන් වහන්සේගේ විද්‍යාමානය' යන අරුථයෙන් හෙබී ග්‍රන්ථයක විශද විද්‍යාංගයන් තිස් දෙනෙකු දෙවියෙකුගේ පැවැත්ම ගැන තම අදහස් මනා අන්දමින් විස්තර කර ඇත. ඒ මැයෙන් කරුණු වටහා ගන්නට පෙළඹෙන විට බුද්ධිගෝචරයෙකු ඥානාන්විත යෙකු සත්‍ය විශ්වාස වන්තයෙකු මිස නොවන්නේය යනුවෙන් මනාව වටහා ගත හැකිය. එසේම හුදි ජනයාද ඔහුගේ ඥානය අනුව විශ්වාස වන්තයෙකු ලෙස වන්නේය. නමුදු බොහෝ විද්වත්තු තමා විසින් පටන් ගන්නා ගවේශණය අඩකින් නවතා හෝ එහි අවසානයක් දැක ගත නොහැකිය අතරමං වනු අප බොහෝ

දැක ඇත්තෙමු, අසා ඇත්තෙමු. එහෙයින් එවැනි බොහෝ විද්වතුන් ලබා ඇත්තේ මන්ද ඥානයක් යනුවෙන් කීම වටී. ඔවුන් එසේ කටයුතු කිරීමෙන් යථාර්ථ ෆිත්රාව හෙවත් සහජත්වය විකෘතියට පත් වන්නේය. එසේම නියම විශ්වාසය කුමක් ගැන අමතන්නේද, කුමක් ගැන වටහා ගැනීමට අණපනවන්නේද ඒ වෙත යැමටද අවස්ථාව නොදී වළකයි.

එසේම ප්‍රබල අමෙරිකානු චින්තන වාදියෙක් සහ මානව සම්පත් ගැන පරීක්ෂනයක යෙදුනු විද්‍යාංගකයෙකු වන ක්‍රේසි මොරිසන් තුමා විසින් රචිත 'මිනිසා ස්වව නිර්මාණය නොවේ' යන ග්‍රන්ථය අරාබි බසෙන් 'බුද්ධිය ඊමානයට කැඳවයි' යනුවෙන් පරිවර්ථනය කර ඇත. අමෙරිකාවෙ තනතුරු රාශියක් උසුළන ක්‍රේසි මොරිසන් මහතා තම ග්‍රන්ථයක මෙසේ පවසයි : මිනිස් නිර්මාණය ගැන වැටහීමක් ඇති කර ගැනීම සහ එහි යථාර්ථය ගැන හැඟීමක් ලබා ගැනීම අල්ලාහ් දෙවිඳු කෙරෙහි විශ්වාස කිරීමේ සාධකය මත පවතින්නේය.

නිර්මාණය අතින් මිනිසාගේ වර්ධනය සහ ඔහු තම යුතු කම් වටහා ගෙන ඒ අනුව කටයුතු කිරීම හෙතෙම තම හිමි වටහා ගැනීම හා ඇත්තේ කිට්ටු සම්බන්ධයකි. දහම කෙරෙහි විශ්වාසය තැබීම එහි කටයුතුවල නියැළී තමාගේ තත්ත්වය ගැන වටහා ගැනීම ඔහුගේ ශ්‍රද්ධාවන්තකම ක්‍රමිකව උසස් තත්ත්වයකට පත් කරයි. ඥානාන්විත මැවුම්කරුවා තමාට උදව් උපකාර කළ යුතුය යන අදහසින් ඔහුගෙන් ප්‍රාර්ථනා කිරීම මිනිසා තුල ස්වභාවිකව හටගත් පිළිවෙතකි.

සලාත් හෙවත් දේවනැමදුම ගැන විස්තර කරන වචනය, ඒ වදන අනාවැසියා තම හිමි වෙත සමීප කරවන ප්‍රාර්ථනා වක් ලෙස අර්ථවත් වෙයි. ගෞරවය, උසස්කම සහ පිරිසිදු චේථනාව වැනි ගුණදහමන් දේවත්වය ප්‍රතික්ෂේප කිරීමෙන් කිසිසේත් ලබාගත නොහැකිය. ස්ථීර දේව ප්‍රතිපත්තියක් නැති නීති

සියල්ල කිසිදු ප්‍රයෝජනයක් නැති ඒවා වේ. එවන් නීති මගින් කෙරෙන පාලනය ඇත හිටින්නට හැකිය. එහි පාලනික සංවරය අක්‍රිය වී දුදන ක්‍රියාවන් සමාජය අඳුරු කළ හැකිය. එහෙයින් අපට කියා හිමි කෙනෙකු ඇති බව විශ්වාස කර ඔහු වෙත ඉතසිතින් හැරී ඔහුට ප්‍රේම කිරීම සියළු දෙනා මත වැටී ඇති අනිවාර්යය කටයුත්තක් වන්නේය.

මිනිස් ඥානය එක්තරා සීමාවක් තුල ක්‍රියා වන්නේය. එහෙයින් ඒ ඥාන සීමාවට ඉක්මවා සමහර දැහි දැනුම ලබා ගැනීමට නොහැකි දෙයකි. මිනිසා ලබා ඇති ඒ අල්ප ඥානය තුලින් ඉර, සඳ සහ තාරකා වැනි විශාල නිර්මාණයන් නිර්මාණය කළ නිර්මාතෘ වරයෙකු සිටින බව පිළිගන්නවා මිස එයින් ඔබ්බට කිසිදු ඥානයක් සාක්ෂාත් කර වටහා ගන්නට තරම් අපගේ ඥානය මුහුකුරා ගොස් නැත. මිහි පිට විසිරී ජීවත්වන මිනිසා තමාට කියා නිර්මාතෘ වරයෙකු සිටින බව ආදි යුගයේ සිටම වටහා ගෙන සිටී. තමා පාලනය කර ආරක්ෂා කරන්නේ ඔහු බව මනාව වටහා ගෙන ඇත.

එහි සිහිබුද්ධිය හඳුරුවා ඒ අල්ලාහ් දෙවිඳු ගැන වටහා ගැනීම එහි එක් අංකයකි. අමතන්නාගේ ඇමතීම්වලට සවන් දුන් බව පවසන සිද්ධීන් අල්කුර් ආනයේ අපමණය. අල්කුර්ආනය මෙසේ පවසයි : *'මා අමතව්. මම ඔබට පිළිවදන් දෙන්නමෙයි (ඔබගේ දෙවියා) පැවසුවේය'*. (40 : 60) තවද අල්කුර්ආනය මෙසේ පවසයි : *'දුෂ්කරයට පත්වූ කළ ඔහු ඇමතුවානම් ඔහුට පිළිවදන් දී දුෂ්කරයන් ඉවත් කරන්නේ කවරෙක්ද?'* (27 : 62)

එසේම සමහර වක්තෘවරුන් තම දෙවිඳුගෙන් පිහිට ඉල්ලා උදව් පැතූ කළ ඒවාට පිළිවදන් දුන් බව අල්කුර්ආනයේම සාධක අපමණය. *'(මෙම දයාව) නූහ්ටද කළෙමු. පෙර ඔහු*

*අපගෙන් ප්‍රාර්ථනා කළ අයුරු මදක් සිහි කරව. අපි ඔහුගේ ඇමතුම (අනුමත කර) පිළිවදන් දුනිමු.* (21 : 76)
*'ඔබ ඔබගේ ස්වාමියාගෙන් උදව් පැතූ කළ අප ඔබට පිළිතුරු දුනිමු'.* (8 : 9)

මුහම්මද් තුමාගේ සමයේ සිදුවූ සිදුවීමක් හසන් බින් මාලික් තුමා මෙසේ පවසයි : මුහම්මද් තුමා ජුම්ආ දිනයක කුත්බා දේශනයක් පවත්වා ගෙන සිටින කළ ග්‍රාම්‍ය අරාබියෙකු පැමිණ මෙසේ පැවසුවේ. 'අල්ලාහ්ගේ වක්තෘ තුමනි, තද නියඟය නිසා සේසත් සියල්ල පාලුවී ගොස්ය. පවුලේ සියලු දෙනා සාගින්නෙන් පෙළෙති. අප වෙනුවෙන් ප්‍රාර්ථනා කරනු මැනව'. එවිට එතුමා දෑත් ඔසවා ප්‍රාර්ථනා කළහ.

වහා අහසෙහි වළාකුළු කඳුමෙන් පෙළ ගැසුණි. නබි තුමා දේශන මණ්ඩපයෙන් බැසීමට පෙර වැසි ජලය එතුමාගේ රැවුල අතරින් බෙරෙන්නට විය. එසේම ඊළඟ ජුම්ආ දිනයේ ඒ ගැමි අරාබියා නොඑසේ නම් වෙනත් කෙනෙකු පැමිණ 'අල්ලාහ්ගේ වක්තෘ තුමනි, තද වැස්ස නිසා ගොඩනැගිලි සියල්ල කඩා වැටී සේසත් සියල්ල ජලයෙන් යටවී විනාශ වී ඇත. අප වෙනුවෙන් අල්ලාහ් ගෙන් ප්‍රාර්ථනා කරනු මැනව' යි පැවසූ කළ වහා නබි තුමා දෑත් ඔසවා ප්‍රාර්ථනා කළහ. 'දෙවියනි, අප මත නොව. අප අවට වැසි වස්නට සැළැස්වනු මැනව'යනු වෙන් ප්‍රාර්ථනා කර නබි තුමා ඇඟිල්ල දික්කර පෙන්වූ (අහස්) කොණ්වල වළාකුළු වහා ඉවත්වී ගියේය.

අල්ලාහ් විද්‍යාමාන බව හැඟීමද සාක්ෂි දරයි. එවැනි සාධක මුඃජිසා හෙවත් වක්තෘවරුන්ට අල්ලාහ් ලබාදුන් හාස්කම්ද වේ. ඒවා අසාමාන්‍ය සිදුවීම්ය. මිනිසාගේ පැහැදිළි ආඥා සහ වදන්වලින් සිදුවිය. වක්තෘ වරුන් මොලොව බිහිවීම සහ මවුන්ගේ අපූරු ක්‍රියාකාරකම් දෙවිඳු කෙනෙකු සිටින බවට මනා සාධක යන්න සක්සුදක්සේ පැහැදිලිය.

වක්තෘ මූසා තුමාගේ සිදුවීම මෙසේය : එතුමා සත්‍ය මත ක්‍රියාකරමින් ෆිර්අවුන් සහ ඔහුගේ සෙනාවෙන් මුස්ලිම්වරු බේරා ගැනීමට ගියේය. මූසා තුමා සහ පිරිස ගිය කළ මුහුද ඔවුන්ට හරස් විය. එවිට පිරිස කී අයුරු අල්කුර්ආනය මෙසේ පවසයි : *'ඇත්තෙන්ම අපි හසු වූවෙමු'යි කීහ.* (26 : 61)

අප සියලු දෙනා ෆිර්අවුන්ට කොටුවී ඇත්තෙමුයි කී කළ මූසා තුමා මෙසේ කී බව අල්කුර්ආනය පවසයි : *'නොඑසේ ය. මගේ සත්‍ය දෙවියා මා සමගය. ඔහු මට මග පෙන්වන්නේය (යි ඔහු පැවසුවේය)'.* (26 : 62) එවිට දයාබර දෙවිඳුගෙන් ආඥාවක් විය. *'ඔබේ සැරයටියෙන් මුහුදට ගසව්'.* (26 : 63)

මූසා තුමා තම සැයටියෙන් මුහුද ගැසූ කළ එහි විශාල බෙදීම් දොළොහක් ඇති විය. එයින් මූසා තුමා සහ එතුමාගේ පිරිස පහසුවෙන් එගොඩ වන්නට පටන්ගත් විට ෆිර්අවුන් සහ පිරිස ඒ මගෙන්ම ඔවුන් ලුහුබඳින්නට විය. මූසා තුමා සහ පිරිස පහසුවෙන් එගොඩ වී ෆිර්අවුන් සහ ඔහුගේ පිරිසේ උවදු රෙන් බේරුණු අතර ෆිර්අවුන් සහ පිරිස මුහුදට බිලි විය.

ඊසා තුමාගේ මුඃජිසාද වැදගත් එකකි. දෙවිඳුගේ පිටිවහ ලෙන් මැරුණු අය නැවත ජීවත් කළ අතර මිනිවලේ අය ආපසු පනපොවා පිට කරවීමට හැකියාවක්ද එතුමාට ලැබුණි.

එසේම මුහම්මද් තුම සහ එතුමාගේ සමූහයේ අයට ජලය උවමනාවූ අවස්ථාවක ඒ ගැන එතුමාට දන්වන ලදී. ඒ අවස්ථාවේ එතුමා දෙවියන්ගේ පිටිවහළ පැතු කළ එතුමාගේ ඇඟිලි අතරින් ජලය වැගිරීම තවත් විශේෂ සිද්ධියකි. තවද මක්කාවේ මිසදිටුවන් එතුමාට අභියෝගයක් කළ විට එතුමා අහසෙහි පායා තිබුණු පුන්සඳ වෙත අත දික්කර සංඥා කළහ. සඳ දෙබැවුනු අතර එය සියල්ලෝම සියැසෙන් දුටුහ. තම කීකරු අනුගාමිකයන් වන වක්තෘවරු උදව් ඉල්ලා පැතු කළ විස්කම් කර පෙන්වීම පිණිස මෙවන් බොහෝ සාධක

අල්ලාහ් දෙවිඳු විසින් සළසා දුන් සිදුවීම් දෙවියන් කෙනෙකුගේ පැවැත්ම ගැන සහසුද්දෙන්ම හඟවයි.

දෙවිඳුගේ ඒකේශ්වර වාද සංකල්පය ගැන විස්තර කරන වැද ගත්ම සාධකයක් ලෙස සර්වබල දෙවිඳුගේ අසහාය පණිවිඩය රැගත් වක්තෘ වරුන් පැමිණියහ. ඒ වක්තෘත්වයේ පණිවිඩය හා තර්ක සහ සාධක ඉදිරිපත් කර මින් පැමිණෙන්නන් සමාජයේ අති උසස් සත්‍යවන්තයන් නොවන්නට විශාල බොරු ගොතා පවසන්නන් විය හැක. තමාට වක්තෘත්වය ලැබී ඇතැයි තර්ක කරන්නා මහා බොරුකාරයෙකි. මන්දයත් ඒ සත්‍ය වක්තෘ වරුන් පැමිණියේ දෙවිඳුගේ අනුදැනුම පිට ඒ දෙවිඳුගේ වහී හෙවත් දිව් පණිවිඩය සමග යන්න අති පැහැදිලිය. අල්ලාහ් දෙවිඳු ඔවුන් තර කර ස්ථිරව පසුවන අයුරු ස්ථිරසාරව පසුවන ලෙස සිත්තර කර ඔවුන්ට ලබා දුන්නේ අසහාය පිටිවහලකි.

ඔවුන් තම කාර්යයන්හී සම්පූර්ණ අවධානයෙන් පසුවෙමින් පිටිවහලක් ඉල්ලා අමතන සෑම මොහොතකම උදව් ලබන විලසින් ඔවුන්ගේ උවමනාවන් හට පිළිවදන් දෙන කෙනෙකු ලෙස පසු වන්නේය. එසේම අවශ්‍ය වූ විට ඒ වක්තෘ වරුන් ගේ සතුරන්, බොරු කර ප්‍රතික්ෂේප කරන්නන්, විනාශ කර පිටිවහලක් ලබා දෙන්නටද ඒ අල්ලාහ් දෙවිඳුගේ පිටිවහල ඔවුන් මත පවතින්නේය. එසේම ප්‍රතික්ෂේප කළ බොහෝ සමාජ වැසියන් දරුණු අඩුවම් මගින් අල්ලා ගන්නා ලදී. වක්තෘ වරුන්ගේ ප්‍රචාර සමයේ ඒ පරම පිවිතුරු අල්ලාහ් දෙවිඳුගේ නිරීක්ෂණය සහ අවධානය ඔවුන් වටා සදා රැඳී තිබුණේය. මන්දයත් ඒ වක්තෘවරුන් අල්ලාහ් විසින් පත් කරන ලද අය බවත්, ඔවුන් ඇමතූ ජනයන් ඒ සත්‍ය දිව් පණිවුඩය සර්වබල අල්ලාහ් දෙවිඳුගෙන් පැමිණි බවත්,

වන්දනා මානයන් සියල්ල අයත් විය යුත්තේ ඒ අල්ලාහ්ට පමණක් බවත් ස්ථිරසාරව විශ්වාස කළහ.

අල්ලාහ් දෙවිඳුගේ ඒකදේව වාදය ගැන විස්තර කරන වැද ගත්ම සාධකයක් ලෙස ඔහුගේ අසහාය නිර්මාණ උකහා දැක්විය හැකිය. උසස් නිර්මාණයක් වන මිනිසා, සිව්පාවුන්, ගෘහස්ථ සත්ත්වයන්, පක්ෂීන්, උරගයන් සහ අනෙකුත් ජීව මැවීම් ආරක්ෂා කරමින් ජීවත් වීමට මගපෙන්වූයේ අල්ලාහ්ය. උපන් බිළිඳාට කිසි පෙර අත්දැකීමක් හෝ මනා ඥානයක් හෝ නැතිව තම මවගේ තන පුඩුවලින් කිරි උරා ගෙන බී තම කුසගින්න නිවාගැනීමට සැළසුම් කළේ කවරෙක්ද? තම කුසගින්න සන්සිඳු වනු වස් වූ දේ ඇත්තේ තම මවගේ තන පුඩුවලින් උරා බොන කිරිවලින් බව වූ චින්තනයක් ඒ ළදරුවේ හදසමනසේ උද්දීපනය කළේ කවරෙක්ද? එසේ සිත කය පිරී සතුටෙන් කිරි උරා බොන විට එහි ක්‍රියාකා රීත්වයට සරිලන විලසින් නාස්පුඩුවලින් ආශ්වාස කරන්නටද, යට හක්කේ ක්‍රමික පැවැත්මටද, කිරි උරන්නට තරම් මනා ශක්තියක් ලබා ගනු වස් උගුර, දිව සහ මුහුණේ මාංශ පේශීන්ගේ විවිධාකාර චලන වැනි සියල්ලටද අල්ලාහ්ගේ විශ් මිත අනුග්‍රහයක් මිස අන් කිමෙක්ද? ඒයට බුද්ධිගෝචර පිළි වදන අල්ලාහ් දෙවිඳුම මෙසේ විස්තර කරයි. *'සියලු දේ නිර් මාණය කළ ඔහු පසුව ඒවාට මග පෙන්වූයේය'.* (20 : 50)

මිනිසාට සිය බාධක මැඩගෙන මිහිපිට ජීවත් වන්නට තරම් ශක්තිය සහ ඥානය මෙන්ම නොදන්නා සියලු දේ මනා ලෙස දන්වන ලද දුෂ්කර කටයුතු සහ අපූරු සහගත කට යුතු කිරීමටද සූක්ෂම දැනුමක් ලබා දුන් සියළු දේ ප්‍රධානය කළ ඒ නිර්මාතෘ වරයා වැඳීමට සුදුස්සා එකම දෙවියා වේ.

එසේම ඉහළ අඹරේ පියාපත් සලා පියාසර කරන පක්ෂීන්, වන මෘගයන් සහ අනෙකුත් අනේකවිධ සත්ත්වයන් කිසිදු පරිශ්‍රම

යෙන් තොරව තම කටයුතු නිම කර ගැනීමට සළසන ලද්දේ කා විසින්ද? සැබැවින්ම ඥානාන්විත මිනිසාට පවා පහසුවෙන් කළ නොහැකි කටයුත්තන් නිමකරනු වස් ඔවුන්ට අසහාය මගපෙන් වීමක් ලබා දුන්නේ කරුණාබර අල්ලාහ් දෙවිඳුය.

අල්ලාහ් දෙවිඳු පැවැත්ම සහ ඔහුගේ සූක්ෂම භාවය ගැන තවත් පැහැදිලිව වටහා ගන්නට නම් මිහිපිට ඇති විශේෂ නිර්මාණයක් වන මීමැස්සා ගැන මදක් සිතා බලන්න. කුහුඹුවා, පරෙවියා, අන් පක්ෂියෙක්, සතෙක්, උරගයෙක්, මත්සයෙන් ගැන මදක් මෙනෙහි කර බලන්න. බුද්ධි ගෝචරව සිතා බලන්නෙකුට ඒවායේ සූක්ෂම නිමවීම සහ නිර්මාණයට හේතු ලෙස පවතින විශ්වාස කළ යුතු නිර් මාතෘවරයෙකු සිටී යන්න සක්සුදක්සේ පැහැදිලි කරයි.

සුරදූතයන් ගැන විශ්වාස

මෙය ඉස්ලාමීය විශ්වාස පද්ධතියේ දෙවන කුළුණ වේ. මලාඉකාවරුන් හෙවත් සුරදූතයන් මිනිස් දෘෂ්ටියට නොපෙනෙන අල්ලාහ්ගේ නිර්මාණයන්හී එක් මැවීමකි. ඔවුන් සදා අල්ලාහ් දෙවිඳුට වන්දනාමාන කරමින් පසු වන අල්ලාහ්ගේ කීකරු අතවැසියන්ය. දේවත්වයේ හෝ වන්දනාමානයට හෝ කිසිදු අයිතියක් හෝ අල්ලාහ්ගේ ගුණාංගයන් හෝ ඔවුන්ට නැත. ඔවුන්ට මැවීමේ හෝ පොෂණ කිරීමේ හෝ ශක්තිය නැත. අල්ලාහ් සමග ඔවුන් වන්දනාමාන කිරීමටද තෝරා ගැනීමට නොහැකිය.

අල්ලාහ්ගේ ආඥාවන්ට සම්පූර්ණව කීකරු වීමේ හැකියා වක් සහ ඒවා යුහුසුලුව ඉටුකිරීමේ ශක්තියක්ද මොවුන්ට ලබාදී ඇත. ඔවුන්ගේ සංඛ්‍යාව අප්‍රමාණය. අල්ලාහ් දෙවිඳු හැර අන් කිසිවෙකුට ඔවුන්ගේ ප්‍රමාණය නොදනී. ඔවුන් විශ්වාස කිරීම පහත සඳහන් ලෙස වේ :

1. ඔවුන් විද්‍යාමාන බව පිළිගත යුතුයි.

2. ජිබ්රීල් වැනි නම් දන්නා අය සහ නොදන්නා අය කෙරෙහිද ඔවුන් අප්‍රමාණ බවත් විශ්වාස කළ යුතුය. විශේෂයෙන්ම ඔවුන් සියල්ලන්ගේ නම් දැනගැනීමටද උවමනාවක් හෝ අනිවාර්යයක් හෝ උවමනා නැත.

3. අල්කුර්ආනය තුලින් හෝ මුහම්මද් තුමාගේ සුන්නාහ් සංකල්පය තුලින් ඔවුන්ගේ නම් සහ ගුණාංග දැන ගත්තේ නම් ඒවා ඒ විලසින්ම පිළිගත යුතුය. උදාහරණයක් වශයෙන් මුහම්මද් තුමා, අග්‍රසුරදූත ජිබ්රීල් පියාපත් හයසියයකින් සමන්විතව ඉහළ අහසේ පසුවනු දුටු බව පවසා ඇත. එසේම සුරදූතයන් අල්ලාහ් දෙවිඳුගේ මනාපය මත උවමනා වූ කළ මිනිස් ස්වරූපයෙන්ද තම හුරුව වෙනස් කළ හැකි අයුරෙන් ද අවස්ථා ලබා දී ඇත.

එසේම සුරදූතයන් අල්ලාහ්ගේ ආඥාවන් රැගෙන මිනිස් වෙසින්ද පැමිණ ඇත. වරෙක අල්ලාහ් සුරදූත ජිබ්රීල් මිනිස් වෙසින් මර්යම් තුමිය වෙත පිටත් කළේය. ඒ සිදුවීම අල්කුර්ආනය මෙසේ විස්තර කරයි : *'ඔහු සම්පූර්ණ මනුෂ්‍යයෙකු විලසින් ඇය ඉදිරියට පැමිණියේය'.* (19 : 17)

තවත් වරෙක මුහම්මද් තුමා තම මිතුරන් අතර වාඩිවී සිටිද්දී සුරදූත ජිබ්රීල් සුදෝසුදු හැඳිවතින් හා තද කළු පැහැති හිසකෙසින් යුතුව මිනිස් ස්වරූපය ගෙන පැමිණියේය. ගමණෙහි වීඩාවක් හෝ මහන්සියක් හෝ ඔහු කෙරෙහි දකින්නට නොවිය. නබි තුමාගේ මිතුරන් ආගන්තුකයා ගැන දැන සිටියේ නැත. පැමිණි ආගන්තුකයා තම දණහිස නබි තුමාගේ දණහිසට ගැටෙන නොගැටෙන තරමින් එතුමාට සමීපව වාඩිවිය. පසුව ඊමාන්, ඉස්ලාම් ඉහ්සාන් සහ පරමාන්ථ දිනයේ අවස්ථා වැනි දේ ගැන එතුමාගෙන් විමසුවේය. නබි තුමා ඒවාට නිසි පිළිතුරු දීමෙන් පසු ආගන්තුකයා පිටවී

ගියේය. පසුව තම මිතුරන් වෙත හැරී 'ඒ සුරදූත ජිබ්රීල්. ඔබ දහම ඔබට ඉගැන්වීමට පැමිණියේය'යි පැවසූහ.

එසේම අල්ලාහ් වක්තෘ ඉබ්රාහීම් සහ ලූත් වැන්නන් වෙතද මිනිස් වෙසින් පිටත්කර ඇත යනුවෙන් දිව් වදන වන අල්කුර්ආනය ස්ථිරසාරව විස්තර කරයි.

4. මවුන්ගෙන් සමහරෙකුට සමහර වගකීම් පවරා ඇති බව දන්නා ඒවා ඒ ආකාරයෙන්ම විශ්වාස කිරීම : මවුන් කිසිදු වීඩාවකින් තොරව දිවා රෑ දෙවියන් වැඳ පුදා ගනිමින්ද ස්තෝත්‍රයෙහිද පසුවන්නෝය.

මවුන්ගෙන් සමහරෙකුට විශේෂ කටයුතු පවරා ඇත. උදාහ රණයක් වශයෙන් සුරදූත ජිබ්රීල් වක්තෘවරුන් හට වහි නම් දේ පණිවුඩ රැගෙන යැමේ කටයු ත්තෙහි නිරත වෙයි. එසේම මීකාඊල් වර්ෂාව සහ රෝපණය කෙරෙහි පවරා ඇත. මාලික් නිරයේ අධිපතියා ලෙසද, තවත් සමහර සුර දූතයන් මිනිසාගේ ආරක්ෂාව උදෙසාද කටයුතු කරයි.

මලාඉකාවරුන් විශ්වාස කිරීමෙන් ප්‍රයෝජන :

1. එය මහානුභාව අල්ලාහ් දෙවිඳුගේ අති විශාල ශක්තිය සහ බලමහිමය ගැන වටහා ගන්නට අවස්ථාව ලැබේ. මිනිසා කවදා මිනිසත්වයේ බලමහිමය වටහා ගන්නට උත්සුක වන්නේද එවිට අල්ලාහ් දෙවිඳුගේ බලමහිමය සහ සූක්ෂම භාවය වටහා ගන්නේය.

2. ඒ මලාඉකාවරු මිනිසාගේ දෛනික කටයුතු ගැන සට හන් කරගන්නද, මවුන් දිවාරෑ නොකඩවා ආරක්ෂා කිරීමට ද, එවැනි තවත් බොහෝ කටයුතු වෙනුවෙන්ද ර්මාණ කර ඇත යන්න වටහා ගැනීමේදී කරුණාබර අල්ලාහ් දෙවිඳු තම නිර්මාණය වන මිනිසා කෙරෙහි කොපමණ ආදරය කරුණාව දක්වනවාද යන්න නොකියාම වටහා ගත හැකිය.

3. ඒ සුරදූතයන් අල්ලාහ්ගේ ආඥාවන් හට මුළුමනින්ම කීකරුවී කටයුතු කරන බව මිනිසා වටහාගෙන ඔවුන් කෙරෙහි ස්ථිරසාරව විශ්වාස කරන විට මිනිසා අල්ලාහ්ගේ සමීපයට ලඟා වන්නට තරම් අල්ලාහ් ඔහු කෙරෙහි තුටු වන්නේය.

ග්‍රන්ථ ගැන විශ්වාස කිරීම

මෙය ඉස්ලාමීය විශ්වාස පද්ධතියේ තෙවන කුළුණ වේ. ග්‍රන්ථ යන්නෙහි තේරුම, එය අල්ලාහ් විසින්, නිර්මාණයන් හට දයාලු වන්නාවූ, ඔවුන්ට යහමග දක්වනු විලසින්, ඔවුන්ගේ එලොව මෙලොව ජීවිතය සෞභාග්‍ය කරනු වස් ඔහුගේ කීකරු වක්තෘවරුන් වෙත පහළ වූ ආඥා සහ අනපනත් වලින් සමන්විත පරිමාධිපත්‍ය දිව් වදන්වලින් හෙබි එකකි. මෙම දේව ග්‍රන්ථ කුමණ හේතුවක් උදෙසා පහළ වීද යන්න ගැන මදක් සිතා බලද්දී මිහිපිට වසන ජනයන් අල්ලාහ් දෙවිඳුට කිසිදු ආදේශකයක් නොකර, ව්‍යාජ දෙවිවරුන් වන් දනාමාන නොකර අල්ලාහ් දෙවිඳු පමණක් වන්දනාමාන කිරීම ටද සෑම අවස්ථාවකදීම සුදන ක්‍රියාවන් සහ දැමිටු ක්‍රියාවන් පමණක් කර තම ජීවිතය පහන් කර ගන්නා විලසින්ද දේව ග්‍රන්ථ පහළ විය යන්න සක්සුදක්සේ පැහැදිලිය.

ග්‍රන්ථයන් පහළවූ ප්‍රධාන තේමාව වූයේ ආදේශ නොකර අල්ලාහ්ට පමණක් වන්දනාමාන කිරීම වේ. මිනිසාගේ ජීවනමග මස්සේ සෑම යහපත් දේ කෙරෙහිම මගපෙන් වීමටද, ජීවන මග ප්‍රශංසනීය ලෙස වර්ධනය වීමටදය.

ග්‍රන්ථ කෙරෙහි විශ්වාස කිරීමේදී මතු සඳහන් අයුරුද කරුණු ඇතුලත් විය යුතුය.

1. ග්‍රන්ථයන් සත්‍ය ලෙස අල්ලාහ් වෙතින් පහළ වූ ඒවා බව පිළිගත යුතුය.

2. මුහම්මද් තුමාට අල්කුර්ආනය පහළ වූ බවත්, මූසා තුමාට තව්රාතය පහළ වූ බවත්, දාවූද් තුමාට සබූර් පහළ වූ

බවත්, ඊසා තුමාට ඉන්ජීලය පහළ වූ බවත් අනෙක් නම් වශයෙන් නොදන්නා පහළ වීම්ද සමහර වක්තෘ වරුන් හට පහළ වූ බවත් මූළමනින්ම පිළිගත යුතුය.

3. ඒ දේව ග්‍රන්ථයන්හි සඳහන්වූ කරුණු අතර පැහැදිලි අව්‍යාජ කරුණු ඒ ප්‍රකාරයෙන්ම සත්‍ය කරන අතර එහි අවසාන දේව ග්‍රන්ථය වන අල්කුර්ආනය නීතිරීති සහ ආඥාවන් ඒ විලසින්ම ස්ථාපනය කළ යුතුය. මන්දයත් අල්කුර්ආනයට පෙර පහළ වූ දේව ග්‍රන්ථ සියල්ල අල්කුර්ආනය පහළ වනවාත් සමග සන්ශෝදනය කර අවලංගු කළ බව අල්කුර්ආනයම සාක්කි දරයි.

තවද දිව් වදන්වලින් සමන්විත දේවග්‍රන්ථ සියල්ල අල්ලාහ් දෙවිඳු වෙතින් පැමිණියේය යන මැයෙන් එක් හා සමානව පිළිගත යුතුය. තවද එහි අරමුණ ගැන සිතා බලද්දී එහි එකම අරමුණ එකම අල්ලාහ් දෙවිඳුට පමණක් කීකරුවී කට යුතු කිරීම යන්නද පැහැදිලි කරයි. අල්ලාහ්ගෙන් පහළවූ ඒවා එකම අරමුණක් කරා යොමුවූ ඒවා නීතිය, සාදාරණත්වය උසස් සම්භාව ණිය විනය කෙරෙහි අමතයි. තවද ඒ දේව ග්‍රන්ථයන් යහමග, යුක්තිය, ශිකෂා පැවැතුම් සහ ගුණ වගාවන්, අයුක්තිය භීෂණය සහ දුදන ක්‍රියාවන්ට විරුද්ධව නැගී සිටීම වැන්නෙහි එක් සමාන වන්නේය. තවත් සමහර නීතිරීතින් පැහැදිලි තර නීතිරීතින් ලෙස වෙනස් වන්නේය. මෙමැයෙන් බලන කළ අල්ලාහ් දෙවිඳු සෑම සමාජයටම ඒ සමාජයට උචිත අන්දමින් නීති රීතීන් පණවා ඇති බව අප වටහා ගත යුතුය.

පරිශුද්ධ අල්කුර්ආනය

දේව ග්‍රන්ථයන්හි අවසාන ග්‍රන්ථය වන කුර්ආනය අල්ලාහ් දෙවිඳු වෙතින් පහළ වූ අති පාරිශුද්ධ තෙස්තමේන්තුව වේ. සියළු ආගම්හි අවසාන මුද්‍රාව යනුවෙන්ද පවසිය හැකිය.

මිහිපිට ජීවත්වන මිනිසාට ඔහුගේ ජීවිතය යහා අන්දමින් පවත්වාගෙන යෑමට හැකි වන පරිදි ඉතා පැහැදිළි සරල නීති පද්ධති යෙන් හෙබි පහළ වීමකි. සත්‍ය දේවත්වයේ මූර්තිය, මිනිසාගේ පැහැදිළි චරිත ධර්මය ගැනද නියොජ නය කරයි. මෙයට පෙර පහළවූ සියළු ග්‍රන්ථයන්හී අඩංගු සියළු නීතිරීතීන් එහි අන්තර්ගතව ඇත යන්නෙහි කිසිදු සැකයක් නැත. එහි සඳහන් සමහර සෘජු වන්දනාමානයන් ගැන අල්කුර්ආනය සූක්ෂම අන්දමින් විස්තර කරනු ඒ දෙස විවෘතව බලන කළ වටහාගත හැකිය.

අල්කුර්ආනයේ පෙර සමාජයේ වෘතාන්තද, අනාගතය ගැන ද, එහි සමාජය ගැනද බොහෝ අනාවැකි විස්තර කර ඇත. එයට පෙර පහළවූ දේව ග්‍රන්ථයන්හී සඳහන් වන කරුණු අල්කුර්ආනය තුලින් පවසා ඒවා සත්‍ය බව සාක්ෂ්‍යවී ඇත්නම් ඒවාද පිළිගත හැකි ඒවා යන්නට දෙවැනි අර්ථයක් නැත. එසේම පෙර පහළ වූ දේව ග්‍රන්යන්හී සඳහන් වූ නීතිරීති, අඬුවම් සහ ප්‍රඥාඥාන වැනි ඒවා වෙනසකට විකෘතියකට භාජනය වී ඇති බව අල්කුර්ආනයේ සඳහන් වේ නම් අප ඒවායෙන්ද ඒ විලසින්ම ඉවත් විය යුතුය.

තවද අල්කුර්ආනය මනානන්දනීම පද ගැලපුමෙන්ද, උසස් වාග් මාලාවෙන්ද, සූක්ෂම ඥානයෙන්ද ඥානාන් විතය. එහි උච්චාරන විධිය, එහි ව්‍යක්ත අදහස්උදහස් සහ උපමා කියා පෑමෙන්ද විශ්ව සාහිත්‍යයේ මස්තක යෙහිම සිටී. පෙර විසූ සමාජීයයන්ගේ තොරතුරු ඉදිරිපත් කිරීම, සහ ඔවුන් ගැනවූ තොරතුරු අර්ථකථනය කිරීම අපූරු සහගතය. එය ඉදිරි පත් කරන නීතිරීති, ප්‍රඥා නුවණ සහ අනෙකුත් සියලු දැනම් සම්භාරයන් සඳහන් වී ඇත්තේ විශ්මිත අන්දමිනි.

එහෙයින් සත්‍ය දිව්‍යදත අල්කුර්ආනය පවසන අන්දමට කටයුතු කිරීම අප සියළු දෙනා කෙරෙහි වූ ඉමහත් යුතු

කමකි. එසේම අල්කුර්ආනය නොපවසන කරුණු සහ ව්‍යාජ ප්‍රතිපත්තීන් විශ්වාස කරමින් ඒවා පිළිපදිමින් ජීවත් වන්නන්ගේ ඒ ක්‍රියාවන් අල්ලාහ් දෙවිඳු විසින් කිසිසේත් අනුමත නොකරනු ඇත. පරම පිවිතුරු අල්ලාහ් දෙවිඳු මනු ජින් දෙපිරිසටම සෘජුව පිළිපැදිය හැකි අවසාන දිව්‍යවදනක් පිරිනමා ඇත යන්නට කිසිදු සැකයක් නැත. නමුදු පෙර සමහර දහම් එක්තරා සමාජයට සහ කොටසකට පමණක් යනුවෙන් වූ ප්‍රමිතිය මත පහළ විය. එමතු නොව, අල්කුර්ආනය අනෙකුත් දේව ග්‍රන්ථයන් සේ නොව, ඇත්තෙන්ම එය අඩුවැඩි නොවී, වෙනස්වීමකට භාජනය නොවී අද වන තුරු ආරක්ෂිතව පවතී. අත්‍යුධාර දෙවිඳුම එහි ආරක්ෂාවේ වගකීම් තමා මත පටවාගෙන ඇත යන්න මතු සඳහන් අල්කුර්ආන් වැකිය මෙසේ සාධකව පවතියි :

‘*ඇත්තෙන්ම සිහිකිරීම (වන මෙම කුර්ආනය) පහළ කළේ අපය. එය ආරක්ෂා කරන්නන්ද අපය*’. (15 : 9)

මෙහි ඉහත සඳහන් අල්කුර්ආන් වැකියේ දික්ර් යන වචනය භාවිතා වී ඇත. ඒ මගින් අර්ථවත් වන්නේ පිරිසිදු අල්කුර්ආනය සහ මුහම්මද් තුමා සුන්නා සංකල්පයද වේ. අල්කුර්ආනය මිනිස් සිත්සතන තුල ඇති කරන්නේ විශාල වෙනසකි, උසස් අදහසකි. අල්කුර් ආනය පාරානය කරනු සවන් දෙන සියල්ල වාගේ එහි යථාර්ත අර්ථය හෝ එහි කරුණු හෝ ඒ තුලින් පාරායනය වන අරාබි බස හෝ වටහා ගන්නට අපොහොසත් වූවද ඔවුන්ගේ සිත්සතන හැඟීම්බරව ඒ වෙත හැරී වෙනසක් ඇති කරන්නේ පුදුම සහගතවයි.

මේවා අල්කර්ආනයේ විශ්මිත වාතාවරනය සහ ස්ථාවරය පැහිදිලිව විස්තර සමහර කරුණු වේ.

ජනසමාජයන් සංස්කෘතියෙන්ද සාරධර්මයෙන්ද මස්තකයට පත්වන්නට, එහි ජයග්‍රහනය අත්පත් කරගන්නට අල්කුර්ආ

නයට ඇත්තේ අති වැදගත් තැනකි. ඒ අල්කුරආනය යහමග සහ පැහැපත් පරමාධිපත්‍ය නීතිමාලවන් සහ විචාර විනිශ් චයන්ගෙන් සමන්විතව අරාබි සමාජය වෙත මුලින් පහළ විය. ඒ අසහාය දිව් වදන් හෙළි වීම සමග ඒ අප්‍රසිද්ධ අරාබි සමාජ වැසියන් උසස් සමාජ වැසියන් ලෙස පත්වූහ. ඒ අල්කුර්ආනයේ කැළුම තුලින් ඔවුන් සතුව තිබුණු අශ්ලීල අඥාන සහ අනෙකුත් දුදන ක්‍රියාන් සහමුලින්ම විනාශ කර ඒ වෙතින් ඉඳුරාම පිරිසිදු වූ මිනිසුන් අතර අති උදාර සමාජයක් ලෙස කළේය. පසුව ඔවුන් නුගත් නොදියුණු සමාජය අතරින් ශ්‍රේෂ්ඨ පුද්ගලයන් බවට පත්වූහ.

අල්කුර්ආනයේ විශ්මිත උසස්භාවය කිසිසේත් පහත් නොවී නිත්‍යව පවතින අයුරෙන් නිම වූවකි. ඒ අල්කුර් ආනය නැවත නැවත කියවන්නත් කියවනවිට ලබන්නේ අති මිහිරි හඟීමකි. එය කොපමණ වතාවක් පාරායනය කළද පාරායනය කරන්නාන්ට පැරණි හෝ පුරාණ එකක් යන මතයක් ඔහු තුල කිසිවිටෙක ඇති වන්නේ නැත.

අල්කුර්ආනය සෑම කෙනෙකුම පහසුවෙන් වනපොත් කර ගන්නට හැකි වන විලසින් එය ලිහිල් අන්දමින් සකස් වී ඇත. ඒ මැයෙන් වත්මනයේ මිහිපිට ඇති බොහෝ ඉස්ලාම් භක්තිකයන් ධනවත්, නිර්ධන, ලොකු, කුඩා, භාෂා, රාජ්‍ය භේදයකින් තොරව පහසුවෙන්ම අල්කුර්ආනය වනපොත් කරගෙන කියවනු සාධාරන සත්සිද්ධියක් බවට පත්වී ඇත.

අල්කුර්ආනය පවසන නීතිරීතීන් සහ ආඥාවන් සරල ඒවා ලෙසද, පහසුවෙන් වටහා ගත හැකි සර්ව සම්පූර්ණ වූ එකක් ලෙසද ඇත්තේ ඒ ගැන දකින අධ්‍යයනය කරන අය විශ්මයට පත්වන විලසිනි. ඒහි නීතිරීති විශාල එකක් වූවද සාමාන්‍ය එකක් වූවද ඒවා සියල්ල පහසු අසංකීර්ණ ඒවා වේ. මනා චින්තනයෙන් තම සිත පුරවා ගෙන ඒ දෙස

බලන්නන් ඔහු නොමුස්ලිමෙකු වුවද එහි ඇති උසස් සුසම භාවය මනාව වටහා ගනු ඇත.

සර් විලියම් මූර් මුහම්මද් තුමාගේ වෘතාන්තය ගැන පවස ද්දී මෙසේ පවසයි : හුදෙක් අල්ලාහ් දෙවිඳු විද්‍යාමාන බව චින්තනාත්මක සහ ශ්‍රද්ධාශ්‍රද්ධානව වටහා ගත හැකි සාධක මෙන්ම සම්මුඛව දැක වටහා ගත හැකි සාධකද අල්කුර් ආනය පුරා අනන්ත අප්‍රමාණව ඇත. කීර්තිධර මහා හිමි ඔහුය. මිහිපිට මිනිසා කරන සුදන ක්‍රියාවන් පිණිස සුවිපාක ලබා දෙන්නටද ඔහුන් කරන දුදන ක්‍රියාවන් පිණිස ඝොරතර කර්කශ දඬුවම් ලබා දෙන්නටද පරමාන්ථ දිනයෙන් පසුව එළඹෙන අවස්ථාව වෙනුවෙන් සූදානමින් සිටී. එහෙයින් සුදන සහ දැමිටු ක්‍රියාවන්හී වැඩිවැඩියෙන් නියළීමද දුදන සහ අදැමිටු ක්‍රියාවන්ගෙන් ඉඳුරාම වළකී සිටීමද සියළු දෙනාගේ අසහාය වගකීම වේ. ඔහුගේ අසහාය දේවත්වය වටහා ගෙන පිරිසිදු චේථනාවෙන් ඔහු පමණක් වන්දනාමන කිරීම පරිනත වූ සැම කෙනෙකු මතම පැටවී ඇති මහ මේරුවන් වගකීම බව නොකිව මනාය. එසේ පිරිසිදු චේථනාවෙන් වන්දනාමාන කිරීම විනා එලොව මෙලොව කිසිදු ප්‍රගතියන් නොවනු ඇත.

තවත් ඉතිහාසඥයෙකු වන ජෝන් පවසයි : අල්ලාහ් දෙවිඳු ගේ වදනෙන් හෙබි අල්කුර්ආනය හුදෙක් ආගමික නීතිරීතින් සමග හා එහි විනය පද්ධතීන් සමග තම ආඥාවන් අත පතන් හකුලා ගත්තේ නැත. වෙනුවට පරමාන්ථ දිනය හා සම්බන්ධ මහානුභාව සම්පන්න,ප්‍රතිපත්ති සම්බන්ධ, මිනිස් අයිතිවාසිකම් සහ මානව වර්ගයාගේ ගැලවීම සඳහාවූ, මරණ කටයතු සම්බන්ධ සහ මිහිපිට මිනිස් ප්‍රජාව සාරධර්ම හීලාචාර අන්දමින් ක්‍රියා වන්නට අවශ්‍ය වූ නීතිරීතින්ද මිනිස් සමාජය පිලලයක් බවට පත්කළ හැකි සාපරාධී

ක්‍රියාවන්, වද බන්ධන සහ භීෂණ වැනි නොමනා කටයුතු ගැන විමසා පිළියම් යොදන්නට උචිත නීතිරීතින්ද මිනිස් අයිතිවාසිකම් සුරකින නීති පද්ධතීන්ද තමා සතුකර ගනිමින් අසහාය ලෙස පවතී. මෙසේ අල්කුර්ආනය මිනිස් සමාජය අතර ප්‍රමුඛව පවතින්නට එකම හේතුව වන්නේ එය සර්වබල දෙවිඳුගෙන් පහළ වීමයි.

තවත් තැනක මෙසේ විස්තර කරයි : මෙසේ අති උසස් ස්ථානයක පසුවන අලකුර්ආනය ඉස්ලාමීය ලොව තුල සංස්ශෝධිත පරමාධිපත්‍ය නීතිමාලාව ලෙස සක්මන් කරමින් පවතිනවා පමණක් නොව ඉස්ලාමීය සමාජයේද නීති මාලාව ලෙස පවතී. එහෙයින් අල්කුර්ආනය දෙලොවම ජය ගත හැකි උසස් නීති මාලාවන් තමා සතු කරගත් නීති ක්ෂේත්‍රය ලෙස පවසනවා නම් එහි කිසිදු වැරැද්දක් නැත.

සැකෙවින් පවසනවා නම් මෙසේ විවිධත්වයෙන් සමන් විත විවිධ ක්ෂේත්‍රයන් නියෝජනය කරන අසහාය දිවි වදන වන අල්කුර්ආනය සාධකව පවතින්නේ අති සම්භාව්‍ය අන්දමිනි. ප්‍රසිද්ධ විත්වත්තු අල්කුර්ආනය සහ එහි මහිමය ගැන තම පොත්පත්වල කොපමණ ලීවද එය අවසන් නොවන අත්විතීය වෘත්තාන්තයක් යන්න කිසිදු සැකයක් නැත.

නබි තුමාගේ සුන්නා සංකල්පය

හදීස් යනුවෙන් ප්‍රසිද්ධ සුන්නා සංකල්පය ගැන පවසනවා නම් එය මුහම්මද් තුමා සම්බන්ධ එතුමාගේ වදන්, ක්‍රියා, වර්ණනා සහ අනුමත කිරීම් යනුවෙන් විවිධ කොටස් වලින් සංකලනයවූ එකක් යැයි අර්ථකථනය කළ හැකිය. ඒ සුන්නා සංකල්පය අල්කුර්ආනය වටහා ගන්නට වූ පහසු මගක් ලෙස කිව හැකිය. අල්කුර්ආනය පවසන පරමාධිපත්‍ය නීතිරීති ලිහිල්ව පහසු ලෙස විස්තර කරන විවරණයක් ලෙසද, අල්කුර්ආනය වෙනුවෙන් අර්ථකථනය කරන්නක් ලෙසද වේ. එහි

සවිස්තරව, ලුහුඬින් පවසන සියළු නීතිරීතින් මනා ලෙස අවබොධ කර ගනු වස්ද, අල්කුර්ආනය තුලින් නොපවසන ලද සමහර ඉස්ලාමීය නීති සහ ආඥා ගැන අවබෝධ කර වන ප්‍රභවයක් ලෙසද, ඉස්ලාම් දහමේ දෙවැනි නීති පද්ධති යක් ලෙසද වන්නේය. අල්කුර්ආනය සහ මුහම්මද් තුමාගේ කියුම්, ක්‍රියාවන්, අනුමත කිරීම් සහ ගුණදහමන් සම්බන්ධ සුන්නා සංකල්පයද කිසිදු අකාමකා දැමීමෙන් තොරව ආරක්‍ෂා කරන බව අල්ලාහ් දෙවිඳුම එහි මුළු වගකීම් තමා වෙත භාර ගෙන තිබෙන බව අල්කුර්ආනයම සාක්‍ෂි දරයි.

තමා වක්තෘත්වයට පත් වීමෙන් පසු මුහම්මද් තුමා විසින් පවසන ලද හදීස් සංකල්පයට අයත්වන කොටස් අප්‍රමාණයි. ඉස්ලාමීය ඥාන සෙෂ්ත්‍රයේ නිහතමානී විද්වතුන් මුහම්මද් තුමාගේ ඒ හදීස් සංකල්පය තුලින් ක්‍රියාකිරීමට සුදුසු ඒවා කුමක්ද, නුසුදුසු ඒවා කුමක්ද, මතු කාලයේදී එතුමාගේ නම භාවිතා කරමින් සිත්සේ සූදානම් කළ හදීස් මොනවාද යනුවෙන් තෝරාබේරා මතු පරම්පරාවට ලබා දීමට කළ උත්සාහ මෙතෙකැයි කිව නොහැකි විශාල ක්‍රියාවකි.

ග්‍රන්ථ විශ්වාස කිරීමෙන් ඇති වන සමහර ප්‍රතිඵල :

1. අල්ලාහ් දෙවිඳු සෑම සමාජයටම ඒ ඒ සමාජයන් යහමග වනු වස් දේව ග්‍රන්ථ පහළ කරමින් ඒ සමාජය වැසියන් හා කොපමණ උනන්දුවෙන් කරුණාවෙන් පසුවනවාද යන්න පහසුවෙන් වටහා ගත හැකිය.

2. සියලු සමාජයන් හට ඒඒ සමාජයේ අවස්ථාවට සහ කාලයට උචිත දෙවග්‍රන්ථ පහළ කිරීම තුලින් අල්ලාහ් දෙවිඳුගේ සූක්‍ෂම ඥානය ගැන වටහා ගත හැකිය.

3. ඌනතාවයන් විදහා දක්වන මිනිස් හදමනස තුල පාෂාණී භූතව පවතින ආශාවන් මගින් ඇති විය හැකි පහත් ගණයේ අදහස් උදහස්වලින් සිත නිදහස් කරන්නේය.

### වක්තෘවරු කෙරෙහි විශ්වාසය

මෙය ඉස්ලාමීය විශ්වාස පද්ධතියේ සිව්වන කුළුණ වේ. දෙවිඳුගේ පරමාධිපත්‍ය නීතිරීති වන ෂරීආව පහළ කර සමාජයට ප්‍රචාරය කරනු වස් ආඥාව ලැබුවන් සියලු දෙනා වක්තෘවරුන් ලෙස පිළිගත හැකිය. ඔවුන් මිහිපිට වාසය කළ මිනිස් වර්ගයට අයත් අය වූහ. වක්තෘත්වය නම් දැම්වැලේ මුල්ම පුරුක ලෙස හැඳින්විය හැක්කේ වක්තෘ නූහ් තුමා වන අතර මුහම්මද් නබිතුමා එහි අවසාන වක්තෘ වරයා වේ.

මිහිපිට වසන සියළු දනන් වෙනුවෙන් ඔවුන්ට අයත් නීති පද්ධති සහ ආඥාවන් ලබා දී ඔවුන් සුමග යවනු වස් ප්‍රචාරය කරන පිණිස වක්තෘවරු පත් වූහ. එසේත් නොවන්නට සමහරවිට පෙර පැමිණ ගිය වක්තෘ වරයෙකු විසින් ප්‍රචාරය කර ගිය නීතිරීතින් සහ ආඥා වන් නැවතත් පවසනු විලසින් හෝ මතක් කරනු වස් හෝ අල්ලාහ් දෙවිඳු නවත් වක්තෘවරු පත් කළේය.

වක්තෘවරුන් සාමාන්‍ය මිනිස් සම්භවයට අයත් අය වේ. ඔවුන්ට දේවත්වයේ හෝ දේවත්වයට අධාල ගුණාංගවල හෝ කිසිදු විශේෂ අයිතියක් හෝ සම්බන්ධයක් හෝ හවුලක් හෝ නැත. එහෙයින් මිනිස් ගුණයට ආවේණික වූ ලෙඩරෝග, මරණය, ආශාවන් සහ කැමිතීම් වැනි සියලු ගුණාංගයන් ඔවුන්ටද වේ.

තවද වක්තෘත්වය යන තත්ත්වය සෙව්ත්සාහයෙන් හෝ අන් කිසිවෙකුගේ උත්සාහයකින් හෝ මුදල්හදල්වලින් හෝ ලැබෙන දෙයක් නොවේ. එය අල්ලාහ් තම මනාපය පරිදි තම අතවැසියන් අතරින් තෝරා ගෙන ඔවුන් සම්භාවණයට පත් කරමින් ලබා දෙන විශේෂ වරප්‍රසාධයකි. වක්තෘ වරුන් මිනිස් සමාජයේ අති සම්භාවණීය උසස් පුද්ගලයන්ය.

ඔවුන් කෙරෙහි විශ්වාස කිරීම මතු සඳහන් ලෙස වේ :

1. ඔවුන්ගේ දේව පණිවුඩය සත්‍ය බව පිළිගැනීම : එක් වක්තෘ වරයෙකුගේ හෝ වක්තෘත්වය ඔවුන් ගෙන ආ වක්තෘත්වය හෝ ප්‍රතික්ෂේප කරන්නේ කවරෙක්ද ඔහු සියළු වක්තෘවරු ප්‍රතික්ෂේප කළ අයෙකු ලෙස වන්නේය. මෙසේ ඔහු ඊසා, මූසා සහ මුහම්මද් වැනි එක් වක්තෘ වරයෙකුගේ හෝ පණිවුඩය ප්‍රතික්ෂේප කරන්නෙ නම් ඔහු සියලු වක්තෘවරුන් බොරු කළ අයෙකු වන්නේය.

එහෙයින් වක්තෘ ඊසා තුමා පිළිගෙන වක්තෘ මුහම්මද් (සල්) තුමාගේ වක්තෘත්වය ප්‍රතික්ෂේප කළ අයෙකු වක්තෘ ඊසා තුමා සහ එතුමා විසින් සර්වබල දෙවිඳු වෙතින් ලබාගත් පණිවුඩයද බොරු කර ප්‍රතික්ෂේප කළ අයෙකු ලෙස වන්නේය. මන්දයත් සර්වඥාන දෙවිඳු විසින් එතුමා වෙත පහළ කළ දේව පණිවුඩයෙහි ඔහුට පසු පැමිණෙන මුහම්මද් නම් වක්තෘ වරයෙකු ගැන පෙර නිමිති කියා ඇති අතර ඔහු පැමිණ, සමාජය අතර ප්‍රසාරණය වී ඇති අනාචාර සහ නොමග යැවීම් වැනි දුදන ක්‍රියාවන් ගැන පහදා දී ජනයන් ඒවායෙන් ඉවත් කරනු ඇත බව වක්තෘ ඊසා තුමා විසින්ම පවසන ලද කරුණුවල සටහන් වී ඇති හෙයිනි.

2. වක්තෘ ඉබ්රාහීම්, මූසා, ඊසා, මුහම්මද් යනුවෙන් අල්ලාහ් දෙවිඳු විසින් කවරෙකු හට නම් වශයෙන් ආමන්ත්‍රණය කර අමතා ඇත්දෝ ඒ අය එසේම නම් වශයෙන් පිළිගත යුතු අතර නම් සඳහන් නොකළ අයද එසේ වක්තෘත්වය පිරිනමා ඇත යනුවෙන් විශ්වාස කළ යුතුය. කෙසේදයත් අල්ලාහ් විසින් විශාල ප්‍රමාණයක වක්තෘවරු තෝරාගත් බවත් ඔවුන් සමහර ජනසමාජයන් වෙත වක්තෘ වරුන් ලෙස නියෝජනය වූ බවත් ඔවුන් සියල්ලන්ගේ නම් ස්ථිරව දැන ගත යුතු උවමනාවක් නැති බවත් අප විශ්වාස කළ යුතුය.

3. ඒ වක්තෘ වරුන් විසින් පවසා ගිය කරුණුවලින් විශ්වාස කළ හැකි ඒවා එසේම විශ්වාස කළ යුතුය.

4. ඒ වක්තෘ වරුන්ගේ සම්භවය අවසාන වශයෙන් පැමිණි මුහම්මද් තුමා සම්පූර්ණ විශ්වාස කළ යුතු අතර එතුමා විසින් ප්‍රචාරය කළ දහම පමණක් සම්පූර්ණව සත්‍ය කර පිළි ගත යුතුය.

වක්තෘවරුන් විශ්වාස කිරීමෙන් ඇතිවන ප්‍රතිඵලඃ

1.අල්ලාහ් දෙවිඳු තම අතවැසියන් හට කොපමණ දයාව කරුණාව දක්වා ඇති යන්නද ඔවුන් ආරක්ෂා කරතු වස් ඔවුන් කෙරෙහි කොපමණ උනන්දුවක් දක්වන්නේද යන්නද මනාව වටහා ගත හැකිය. මන්දයත් සෑම මිනිස් සමාජයම යහමග කරතු වස් ඒ ඒ සමාජයන් වෙත වක්තෘ වරුන් පත්කළේද ඒ කරුණාබර අල්ලාහ් දෙවිඳුය. ඒ වක්තෘ වරු තම හිමි වන අල්ලාහ්ට ගරු බුහුමන් කර ඔහුට වන්දනාමාන කළ යුතු ක්‍රමද ඒ වෙනුවෙන් ලබා ඇති මිනිසත්වයේ උන්නතිය උදෙසා කෙසේ කටයුතු කළ යුතුය යන්න ගැනද පැහැදිලි කළහ.

2. මේ අනුග්‍රහය නිසා අල්ලාහ්ට ස්තුති වන්ත වෙයි.

3. ඔවුන් අල්ලාහ්ගේ කීකරු වක්තෘ වරුන් වූවද ඔහුගේ කීකරු වහලුන් හෙයින් ඔවුන්ද අල්ලාහ් දෙවිඳු පමණක් වන්දනමාන කර තමා වෙත පවරා ඇති මහ මෙරුවන් යුතු කම වන ප්‍රචාරය වචනයේ පරිසමාප්ත අන්දමින්ම කිරීමටද වග බලා ගත්හ. ඒ වක්තෘ වරුන් මිනිස් සමාජයේ උසස් ගතිගුණවලින් හෙබි සම්භාවණීය පුද්ගලයන්ය. අල්ලාහ්ට සම්පූර්ණයෙන්ම කීකරුවී ඔහුට වන්දනාමන කිරීමද සම් පූර්ණයෙන්ම ඉටු කරන උසස් ඇදැහිලි වන්තයන් යන මැයෙන්ද ඔවුන් ප්‍රශංසා කර ඔවුන්ගේ තත්ත්වයට අසහාය චරිතයට සරිලන විලසින් සම්භාවණයට පත් කළ යුතුය.

## පරමාත්ථ දිනය

පරමාන්ත දිනය යනු මිහිපිට ජීවත් වී මරණයට පත් වී ගිය සියළු දනන් අල්ලාහ් විසින් නැවත පනපොවා නැගිට මවුන් මිහිපිට ගත කළ ජීවිතය වෙනුවෙන් විමසා එයට සරිලන ප්‍රතිවිපාක ලබාදෙන දිනය වේ. ඒ දිනය කවදා එළඹෙනවා දැයි යන්න අල්ලාහ් හැර අන් කිසිවෙකු නොදනී. ඒදින විවෘත විමසීමකින් පසු ස්වර්ගයට තීන්දු වන ශ්‍රධාවන්තයන් වහා එහි පිවිසෙන අතර තිරයට තීන්දු වන දනන් අප්‍රමාධව ගොරතර ජ්වලිත තිරයට ඇතුල් කරනු ලබනු ඇත. එහෙයින් යවුමුල් කියාම යනුවෙන් පැවසෙන ඒ අවසාන තීන්දු දිනය කවදාදෝ ඇතිවිය හැකි හෙයින් ඒ දරුණු දිනයේ බෙදවාව කයෙන් ගැලවීමට නම් අල්ලාහ්ට කිකරු අය ලෙස කටයුතු කිරීම අප සියළු දෙනාගේම පරම යුතුකම වේ.

1. අප නැවතත් පනපොවා මිනිවල්වලින් නැගිට වනු ඇතැයි විශ්වාස කිරීම : ඒ පරමාන්ත දිනයේ සූර් නම් කාහළය පිඹීමට භාරව සිටින මලාඉකා විසින් කාහළය පිඹිනු ලබනු ඇත. එවිට මිහිපිට මුල්දා පටන් අවසන් දා දක්වා ජීවත් වී අපවත් වී ගිය සියළු දනන් නැවත පනපොවා නැගිටවනු ඇත. එසේ නැගිටවනු ලබනු කළ මවුන් නිර්වස්ත්‍රවද කිසිදු පාවහනක් නොපැළඳු අය ලෙසද කත්නා නම් චර්මචේථනය නොකළ අය ලෙසද නැගිට වනු ලබනු ඇත.

මෙම නැවත නැගිටවීම සත්‍ය එකක් බව ඥානය පවා සාධකව පවතී. වක්තෘවරුන් තම අසහාය ප්‍රචාරය තුලින් තම ජනයන් හට කුමණ පණිවුඩයක් ප්‍රචාරය කළාදෝ ඒ වෙනුවෙන් ඵලවිපාක ලබා දෙනු ඇත.

2 ඒදින විවෘතව විමසා ඵලවිපාක ලබා දෙනු ඇතයි විශ්වාස කිරීම : මිහිපිට විසූ සෑම කෙනෙකුම මිහිපිට වසන කළ කළ ක්‍රියාවන් විමසා ඒ අනුව මවුන් හට

ඵලවිපාක ලබා දෙනු ඇත. කුසල් කර්මයන් සහ දැමිටු කම් කර ඇති අය හට ඒ හා සමාන දස ගුණයක ඵලවිපාක කුසල් ලෙස ලැබෙනු ඇත. එසේම කවරෙකු අකුසලෙන් අදැමිටු කමෙන් ක්‍රියාකර ඇත්දෝ ඔවුන්ට දයාබර අල්ලාහ් දෙවිඳු විසින් එයට සමාන හැර එයට වැඩි කිසිඳු අඩුවමක් ලබා දෙනු නොලබනු ඇත. මන්දයත් දයාන්විත අල්ලාහ් දෙවිඳු කිසිදු ආත්මයකට අයුක්තියක් නොකරන්නේය.

මෙසේ ඔවුන් ක්‍රියා අනුව විවෘතව විමසා ඵලවිපාක ලබා දීම කෙරෙහි හික්මා හෙවත් සූක්ෂමතාවයක් වේ. දයාන්විත අල්ලාහ් දහම් සහ වක්තෘ වරුන් පහළ කර ඒ දහම්හී පවසන නීතිරීතිවලට සහ ආඥාවන් හට කීකරු වී කටයුතු කරන ලෙස අණ පැනවීම එසේ විවෘත විමසීමක් වන සූක්ෂම ඥානයට මහත් හේතුවක් ලෙස විදහා දැක්විය හැකිය. එසේම ඒ වක්තෘ වරුන් විසින් ප්‍රචාරය කරන ලද ඒ අසහාය පණිවිඩය කීකරුවන ලෙසත් ඔවුන් අනපනවන ලදී.

මිනිසා මිහිපිට කළ ක්‍රියාවන් උදෙසා එවන් විවෘත විමසීමක් නොවන්නට මිනිස් නිර්මාණයේ ඉලක්කයද අනිවාර්ත දෙයක් ලෙස වන්නට හැකිය. නමුදු සර්ව ඥාන අල්ලාහ් දෙවිඳු වැරදීමෙන් අති පිරිසිදු වන්නායාය.

මිහිපිට යහපත් සහ අයහපත් අයගෙන් සමන්විතය. අල්ලාහ් සම්පූර්ණ විශ්වාස කරන අයද ප්‍රතික්ෂේප කරන කාෆිර්වරුන්ද මිනිසුන් අතර වේ. සත්‍ය විශ්වාස වන්ත යින්ද අල්ලාහ් ප්‍රතික්ෂේප කරන කාෆිර්වරුන්ද තත්ත්වයේ එක හා සමාන වීම යුක්ති ගරුක විය හැකිද? ඇත් නොන්ම නීතිගරුක අල්ලාහ් අභියස එසේ විය නොහැකිය. අල්ලාහ් දෙවිඳුම අල්කුර්ආනයේ මෙසේ විස්තර කරයි :

*'පව් කරන්නන්ට සළකණ අයුරු අප මුස්ලිම්වරුන්ට සළකමුද?' (සත්‍ය ප්‍රතික්ෂේප කරන්නනි) ඔබලාට කුමක් වීද? ඔබලා කෙසේ තීරණය කරන්නහුද?'* (68 : 35)

**3 ස්වර්ගය සහ නරකාදිය කෙරෙහි විශ්වාසය**

ස්වර්ගය සහ නකරතාදිය පරමාන්ත දිනයෙන් පසු මිනිසුන් යැමට සූදානම් කර ඇති නිත්‍ය ස්ථානයන් දෙකකි. ස්වර්ගය යනු සියළු සැපසම්පතෙන් ගහන අති ප්‍රමුදිත නිවහනකි. එය අල්ලාහ් දෙවිඳුගේ ආඥාවන් සහ ඔහුගේ වක්තෘ වරයාට මුළුමනින්ම කීකරු වී පිරිසිදු චේතනා වෙන් කටයුතු කරන ශ්‍රධාවන්තයින් වෙනුවෙන් සූදානම් කරන ලද උසස් නිවහනකි. ඒ ස්වර්ගයේ කිසිදු නයනක් නොදුටු කිසිදු සවනක් නොඇසූ කිසිදු සිතක් පහළවෙන් නොහඟින අනේකවිධ මිහිරි සැපසම්පත්වලින් ගහන වූ නිවහනකි. සත්‍ය විශ්වාස වන්තයින් මිහිපිට වසන කළ කුසල් සහ දැමිටුකම් අනුව එහි තත්ත් වයද විවිධ අන්දමින් වෙනස්වනු ඇත.

නරකාදිය යනු එය අති විශාල දුක්කම්කටොළු, පීඩා වන්ගෙන් සමන්විත දුක්ඛිත නිවහනකි. අල්ලාහ් ප්‍රතික්ෂේප කර ඔහුගේ වක්තෘවරන් හටද අකීකරු තම සිතට වහල්වී අත්තනෝමතික අන්දමින් කට යුතු කළ පාපීතරයන් සහ අනියාය කරුවන් වෙනුවෙන් එය සූදානම් කර ඇත. මිනිස් සිතට කිසිසේත් වටහා ගන්නට බැරි ගොරතර දුක් වේදනා කම්කටොළු එහි සූදානම් කර ඇත. නරකාදියේ ඔවුනොවුන් කළ අකුසලයන් අනුව විවිධ තත්ත්වයන්ගෙන් සමන්විතයි. අතවැසියන් තමනටම කරගත් අකුසල් කර්මයන් අනුව එහි අඩුවම් සහ ඵලවිපාක විඳිනු ඇත. ඒ පරමාන්ථ දිනයේ සිදු විය හැකි විවිධ බේදවාචක සහ සන්තාප කෙරෙහිද සම්පූර් ණයෙන්ම විශ්වාස කිරීම පරමාන්ථ දිනය ගැන විශ්වාස කිරී

මෙහි අන්තර්ගත වේ. තවද මරණෙන් මතුව අනිවාර්යයෙන්ම සිදුවිය හැකි මතු පවසන කරුණු කෙරෙහිද මුළුමනින්ම විශ්වාස කිරීම පරමාන්ථ දිනය කෙරෙහි වූ විශ්වාස කිරීමෙහි ඇතුලත් වේ.

### 1. මිනිවලේ සන්තාපය

මිනිසා ජීවිතක්ෂයට පත්ව මිහිදන් වූවාට පසු ඒදින ඔහුගේ පන ආපසු දී ඔහු පන පොවා හාපුරා ඔහුගේ හිමි, ඔහුගේ දහම, ඔහුගේ වක්තෘ වරයා ගැන විමසනු ලබනු ඇත. සැබැවින්ම මිහිපිට වසන කළ සත්‍ය විශ්වාස වන්තයෙකු ලෙස තම ජීවිතය ගත කළ තැනැත්තා ඒ ප්‍රශ්ණවලට මගේ හිමියා අල්ලාහ් දෙවිඳු, මගේ දහම සත්‍ය ඉස්ලාමේ දහම සහ මගේ වක්තෘ වරයා මුහම්මද් නබි (සල්) තුමා යනුවෙන් පහසුවෙන් උත්තර සපයනු ලබනු ඇත. නමුදු අල්ලාහ් දෙවිඳුගේ ආඥාවන් සහ මුහම්මද් තුමාගේ ආදර්ශයන් හට පිටුපා සිතට වහල් වී ජීවත්වූ පාපීතරයන් ඒ ප්‍රශ්ණවලට උත්තර සපයන්නට නොහැකිව හා හා මම දන්නේ නැහැ යනුවෙන් තතනනු ඇත. එසේම කුහකයන් සහ ආගම ගැන සැකයෙන් සහ කුකුසෙන් කල් ගත අය 'මිනිසුන් ආගම ගැන මොනමොනවාදෝ පවසමින් සිටිනු මම ඇසුවා ඒ විලසින් මමත් කීවා' යයි පවසනු ඇත.

### 2. මිනිවලේ සන්තාපය සහ සැනසුම

මිනිවලේ සන්තාපය ගැන කරුණු විස්තර කරන කළ මිනිවලේ මිහිදන් කරන්නන් කුහකයන්, අපරාධ කරුවන්, පව්කාරයන් ලෙස වේ නම් නිරයේ වේදනාව සහ එහි ගොරතර උෂ්ණය ගැන පෙන්වා වේදනාවට පත් කරනු ලබනු ඇත. එසේම ඔවුන්ගේ මිනිවල කෙට්වී ඇකිලී ඔවුන්ගේ දේහය තද වන විලසින් වේදනාවට පත් කරනු ලබනු ඇත. මිනිවලේ සැනසුම සහ එහි පහසුකම ගැන පවසනවිට මිනිවලේ

තැන්පත් කරන ලද අය මූඃමීන්වරුන් නම් ස්වර්ගයේ දොරක් විවර වී ඔවුන්ගේ මිනිවල පුළුල් කරනු ලබනු ඇත. පසුව ඔහු පිවිසීමට වරම ලබා ඇති ස්වර්ගයේ සියළු සැපසම්පත් ගැන ඔහුට අසල දෘෂ්ටියක් වලයින් පෙන්වනු ලබනු ඇත.

පරමාන්ත දිනය විශ්වාස කිරීමෙහි ඇති ප්‍රතිඵල :

1. ඒ දිනයේ ලැබිය හැකි අසහාය සැපසම්පත් ලබා ගනු වස් දැමිටු ක්‍රියාවන්හී නියැළීමට සිත යුහුසුලු වනු ඇත.

2. එදින ලැබිය හැකි ගොරතර අඬුවම සහ වේදනාව ගැන බිය වී අදැමිටු කමෙන් ඉවත් වන්නේය.

3. මරණෙන් මතු ජීවිතය උදෙසා කටයුතු කරන විට ලෞකිකව ලැබිය හැකි සමහර සම්පත් අහිමි විය හැක. ඒ ගැන ඔහු දුක් නොවී ඒවා වෙනුවෙන් පරමාන්ත දිනයේ තමාට අල්ලාහ් වෙතින් ලැබිය හැකි අසහාය සැප සම්පත් කෙරෙහි සිත යොමු කරන්නේය.

4. ඇති වියහැකි දුක් දොම්නස් අවස්ථාවන්හී ඉවසිලි වන්තව කටයුතු කර ඒ වෙනුවෙන් අල්ලාහ්ගෙන් පමණක් ප්‍රතිවිපාක බලාපොරොත්තු වීමට මග පැදෙන්නේය.

### නැවත නැගිටවීම නොපිළිගන්නන්ට පිළිවදනක්

මරණෙන් පසු තමන් නොනැගිවනු ඇත, විමසීමක් නැත, එවැන්නක් කිසිසේත් විය නොහැකිය යනුවෙන් සිතට වහල්වී තීරණය කිරීම විශාල වරදකි.

1. ආගම අනුසාරයෙන් එය වැරදි නිගමණයකි. ඒ ගැන අල්ලාහ් දෙව්දු අල්කුර්ආනයේ මෙසේ පවසයි :

*'(සැබැවින්ම මරණයෙන් පසු පනපොවා ආපසු) ඔවුන් නොනැගිට වනු ඇතැයි කාෆිර්වරු සිතන්නෝය. එසේ නොව. (නබි තුමනි) පවසනු මැනව. මගේ දෙවියාගේ නාමයෙන් සැබැවින්ම ඔබ නැවත නැගිටවනු ලබනු ඇත.*

*පසුව ඔබ (මෙලොව) කළ දේ ගැන (ඔබට) දැනුම් දෙනු ඇත. මෙසේ කිරීම අල්ලාහ්ට ඉතා පහසුය'.* (64 : 7)

2. නිර්මාණයන් නිර්මාණය කළේද අල්ලාහ් දෙවිඳුය. ඒ නිර්මාණය ජීවිතක්ෂයට පත් වූ පසු ආපසු පන පොවා නැවත ජීවම් කිරීමද ඔහුට පහසු කරුණකි.

3. හැඟීම් තුලින් මරණෙන් මතු ජීවිතය ගැන වටහා ගැනීම : නිදසුනක් වශයෙන් වක්තෘ මූසා හා සම්බන්ධ සිද්ධියක් උපුටා දැක්විය හැකිය. වක්තෘ මූසා තුමා ධර්මය ප්‍රචාරය කරමින් පසුවූ කළ එතුමාගේ සමාජයේ වැසියන් අල්ලාහ් දෙවිඳු පියවී ඇසින් තමාන් හට පෙන්වන තුරු ඔවුන් එතුමා විශ්වාස නොකරන බව අභියෝග කරන්නට වූහ. එවිට වහා අල්ලාහ් ඔවුන් ජීවිතක්ෂයට පත්කර නැවත පනපොවා නැගිටෙව්වේය. ඒ ගැන අල්කුර්ආනයේ තැනක මෙසේ විස්තර කරයි : *'අල්ලාහ් ප්‍රත්‍යක්ෂව දකින තුරු අප ඔබ විශ්වාස නොකරමු'.* (2 : 55)

වක්තෘ මූසා තුමාගේ සමයේ ඉස්රායෙල් සමාජයේ සමහ රෙක් නැවත නැගිට වීම ගැන තර්ක කරමින් පසුවන්නට වූහ. එවකට ඔවුනතර ඝාතනය කරන ලද කෙනෙකුගේ ඝාතනයට සම්බන්ධ පුද්ගලයා සොයා ගැනීමේදී එකා අනෙකාට චෝදනා කරමින් තර්ක කර මින් පසු වූහ. එවිට ගවයෙකු මරා එහි සමහර කොටස් ගෙන ඝාතනය වූ මිනියට ගසන ලෙසද එසේ ගැසුවා නම් මිනියට පනපෙවී කතා කරනු ඇතැයිද සර්වඥාන අල්ලාහ් දෙවිඳු ඔවුන්ට දැනුම් දුන්නේය. ඔවුන්ද එසේ කළහ. එවිට ඝාතනයවූ කෙනා පන පෙවී නැගිට මිනිමරුවා පෙන්වා දී නැවත ජීවිතක්ෂයට පත් විය. එසේම බොහෝ ජනයන් මරණයට බියවී තම නිවෙස් වලින් පිටවී ගිය කළ අල්ලාහ් ඔවුන් අමතා ඔබලා මරණයට පත්වනු යනුවෙන් පැවසූ කළ ඔවුන් මරණයට පත් වූ අතර

පසුව අල්ලාහ් දෙවිඳු නැවතත් ඔවුන් පනපොවා පෙන්විය. එසේම ජීවිතක්ෂයට පත් වූ අය නැවත පණ පෙවීමේ හැකියාව අල්ලාහ් වක්තෘ ඊසා තුමාටද දුන්නේය. ඒ විලසින් වක්තෘ ඊසා තුමා කීප දෙනෙකුම මරණෙන් ආපසු නැගිට වන ලද කරුණු කීපයක් ගැන ඉස්ලාමීය ඉගැන්වීම් තුලින් ස්ථිරසාරව වටහා ගත හැකිය.

**මිනිවලේ සැපත සහ වේදනාව හෙළා දකින්නන් හට වදනක් :** වත්මනයේ මිනිසුන්ගෙන් සමහරෙක් මෘත දේහය මිනිවලේ තැන්පත් කළ පසු එයට කිසිදු වේදනාවක් හෝ සැපක් හෝ නොලැබෙන බව පවසති. එසේම දහම පවසන විලසින් මිනිවල තුල පසුවන්නන්ගේ ක්‍රියාවන් අනුව මිනිවල පටුවී හෝ පළල්වී නැති බව තර්ක කරති. මෘත දේහය තැන්පත් කළ පසු මිනිවල ආපසු හාරා බලන්නේ නම් එය කිසිදු පටුවීම කින් හෝ විස්තාර වීමකින් හෝ තොරව එසේම පවතින බව පවසති. ඔවුන්ගේ මේ තර්කය වැරදිය.

1. ඉස්ලාම් ආගමික නීති පද්ධතිය අනුව එය වැරදි නිගම ණයකි. මන්දයත් අල්කුර්ආනය සහ මුහම්මද් නබි තුමාගේ සුන්නාහ් සංකල්පයද මිනිවලේ වේදනාවක් සහ සැපතක් ඇති බව ස්ථිරසාරව විස්තර කරයි. මෙසේ අල්කුර්ආනය සහ මුහම්මද් තුමාගේ සුන්නාහ් සංකල්පය අනුනව විස්තර කරන විට එය ප්‍රතික්ෂේප කිරීමට කිසිවෙකුට නොහැකිය.

2. මිනිසාගේ ඥානය සහ නුවණද එය වැරදි අදහසක් බව හඟවන්නේය. එය තවත් පැහැදිලිව පවසනවා නම් මරණය නින්දේ සහෝදරයෙකු ලෙස විස්තර කළ හැකිය. කෙනෙකු නින්දට වැටුනු කළ හෙතෙම යම් තැනක සතුටෙන් පසුවන විලසින් හෝ කටුක ස්ථානයක දුක්ක රව පසුවන විලසින් හෝ සිහින දකින්නේය. එසේ සිහින දකින කළ වහා

තිගැස්සී නැගිට බලන කළ තමා මෙතෙක් සිහිනයේ සිටි ස්ථානයට හාත්පසින්ම විරුද්ධ තම නිවස තුල හෝ තමා නිදාගත් ස්ථානයේ සිටින බව යථාර්ථව වටහා ගන්නේය. එසේම මිනිවලේ මෘතු දේහය විඳින වේදනාව හෝ සතුට හෝ පිටස්තරයෙකුට හෝ පරිභාහිරව පසුවන කෙනෙකුට වටහා ගන්නට එහි තත්ත්වය හැකිය නොහැකිය. එසේ ඒ ගැන වටහා ගන්නට හඟින්නට අවස්ථාවක් වේනම් ගුප්ත දෑ කෙරෙහි විශ්වාස කිරීම යන්නට කිසිදු අවස්ථාවක් නොවන්නේය. එසේ වී නම් ගුප්ත දෑ විශ්වාසය කරන්නන් සහ එය ප්‍රතිකෂේප කරන්නන් අතර කිසිදු වෙනසක් නොවී දෙපිලම එකම තත්ත්වයකට පත් වන්නේය. දකින සිහින සතුටෙන් පිරී එකක්ද කරදරයෙන් පිරී එකක්ද යන්නද දන්නේ ඒ සිහිනය දකින්නා මිස පිටතින් ඔහු දෙස අවධානය කරන්නන්ය. එසේම මිනිවලේ තමා ලබන්නේ වේදනාවක්ද නොවන්නට සැපතක්ද යන්න දන්නේද මිනිවලේ පසු වන්නා මිස පිටත සිටින්නන් නොවන බව වටහා ගැනීම එතරම් අපහසු කරුණක් නොවේ.

මිහිපිට සිදුවන සියළු දැයක්ම සියළු දෙනා විසින්ම මනාව වටහා ගත නොහැකි බව සාක්ෂාත් වන විට ගුප්ත දැහි ඥානය අල්ලාහ් දෙව්දු එක්තරා සීමාවක් තුල සීමා කර ඇත යන්න අප වටහා ගත යුතුය. මිනිසාගේ දසුනට සහ සවනට කෙසේ සීමාවක් වේදෝ එසේම ඔහුගේ චින්තනයටද හැඟීම්වලට සීමාවක් ඇත. මිනිවලේ සන්තාපයක් වූවද සතුටක් වූවද එය මරණයට පත්ව මිනිවලේ තැන්පතු වූවන්ට පම ණක් අයත් එකක් ලෙස නොසිතන්න. මෘතදේහය මිනිවලේ තැන්පතු වූවද, ශීත කරණයක් තුල තැබුවද, සතුන් කා විනාශ කළ දැම්මද, මුහුදක ගංගාවක විසිකළද, කාතරක කැලයකට විසි කළද, ගින්නට දමා විනාශ කළද කුමන

ස්ථානයක පත්වූවත් මරණයට පත්වූ සියල්ලටම ඒ වේදනාව හෝ සැපත පොදුවේ කාහටත් අයත් එකක් යන්න පැහැදිලිය.

### කද්ර් හෙවත් දෛවය කෙරෙහි විශ්වාසය

කද්ර් යනුවෙන් පැවසෙන පෙරමිනුම හෝ දෛවය යනු අල්ලාහ් දෙවිඳු විශ්වය තුල සිදුවිය හැකි දේ සියල්ල තම ඥානානුසාරයෙන් ලියා තැබීම යනුවෙන් සංක්ෂිප්ත තව විස්තර කළ හැකිය. අල්ලාහ් දෙවිඳු එවා ගැන ඥානානුකූලව සිතා, ලියා තබා, නිර්මාණය කරද ඇත.

කද්ර් කෙරෙහි විශ්වාස කිරීමේ හරය වන්නේ විශ්වය තුල සිදුවුනු සිදුවන අනාගතයේදී සිදුවිය හැකි සියල්ල සර්වඥාන අල්ලාහ් මනාම දැනගෙන සිටී යනුවෙන්ද, ඔහු ප්‍රියවන සියල්ල සිදුවන බවත් ඔහු ප්‍රිය නොවන දේ සිදුවිය නොහැකි බවත්, තම නිර්මාණයේ ඇති සියළු දේ පෙරම ලියා ඇති බවත්, ඔහු ඒවා නිර්මාණය කිරීමට සිතා ඔහුගේ ඥානානු සාරයෙන් ලියා තැබූ විලසින්ම ඒවා සියල්ල වන බවත් එහි අර්ථානු සාරයෙන්ම පිළිගැනීම සහ විශ්වාස කිරීම වේ. එසේම කෙනෙකුට සිදුවූ නරක දෙයක් ඔහුට කරදරයක් කිරීමට හෝ සිදුවුනු හොඳ දේ ඔහු හැඩ ගස්වන්නට හෝ සිදු විය යනුවෙන් විශ්වාස නොකළ යුතුය.

අල්ලාහ් දෙවිඳු ඔහුගේ අනපනත් පිළිගෙන කීකරු වී කටයුතු කරන ලෙසත් ඔහු විසින් තහනම් කරන ලද දේවලින් ඉවත්වී කටයුතු කරන ලෙසත් අණපනවා ඇත. එහෙයින් ඔහු වෙතින්ම සම්පූර්ණ කුසලක් අපේක්ෂා කරමින් ඔහුගේ ආඥාවන් හට කීකරු විය යුතු බවත් ඔහුගේ ගොරතර දඬුවමට බියවී ඔහු විසින් තහනම් කළ දේ වෙතින් ඉවත්වී සිටිය යුතු බවත් යහක් සිදු වූවා නම් ඒ වෙනුවට අල්ලාහ්ට ස්තුති කළ යුතු බවත් නරකක් සිදුවූවා නම් ඒ

වෙනුවෙන් අල්ලාහ්ගෙන් පව් සමාව අයැදිය යුතු බවත් මුළුමනින්ම විශ්වාස කළ යුතුය. කද්ර් කෙරෙහි විශ්වාස කිරීමේ සම්පූර්ණත්වය ගැන සළකා බලන කළ යමෙකු තම නියමය අනුව නීතිරීති වලට අනුගතව කටයුතු කර ලෞකික උවමනාවන් සපයා ගත යුතුය. එසේම ඒ උවමනාවන්, තම ආහාර පාන සහ අනෙකුත් සම්පත් ලබාගැනීම අරභයා එයට නියම මාර්ගයේ ඔස්සේ පරිශ්‍රමය වී ලබාගැනීමට වගබලා ගත යුතුය. තම මනාපය සේ යහමග තුලින් ඒවා ලැබුණා නම් ඒ වෙනුවෙන් අල්ලාහ්ට ස්තුති විය යුතු අතර, එයට පටහැනිව ඒ කරුණු සිදුවී තමාට කරදරයක් දුකක් වූවා නම් ඒවා සියල්ල අල්ලාහ් දෙවිඳුගේ පෙරමිනුම මත සිදු වන බව පිළිගනිමින් ඉවසිලිවන්තව කටයුතු කළ යුතුය. මේ විලසින් කද්ර් හෙවත් පෙරමිනුම විශ්වාස කර පිළිගත් කළ සිත සන්සුන් වී ආත්මයද ශාන්තිය ලබන්නේය. එසේම සිදුවී අවසන් වූ කටයුත්තත් ගැන නැවත නැවතත් සිතා කණස්සල්ලට පත් නොවී සිටීමටද මග පාදන්නේය. එසේම මිනිසාට සිත් ධෛර්යයද, ඍජු මග ඔස්සේ පෙරට යා යුතුය යන චින්තනයද, බලාපොරොත්තු රහිත කටයුතු කිරීමෙන් වළකීමද සියල්ල අවස්ථාවන් ඉවසිලිවන්තව සිත් සතුටෙන් පිළිගැනීමට ශක්තියක්ද ලබා දෙන්නේය.

එහෙයින් කද්ර් කෙරෙහි විශ්වාස නොකරන්නා ලබා ගත නොහැකි සිත්සතුට ශාන්තිය වැනි අවස්ථාවන් සහ හැඟීම් අල්ලාහ්ගේ කද්ර් කෙරෙහි විශ්වාස කරන්නා ලබා ගනියි. මුස්ලිම් නොවන රට රාජ්‍යවල අධික ලෙස පවතින සියදිවි නසා ගැනීම් සහ අනෙක් මාදිලිය් මරණ අධික වන්නට එක් හේතුවක් ලෙස අල්ලාහ්ගේ කද්ර් කෙරෙහි විශ්වාස නොකිරීම යන්නද උකහා දැක්විය හැකිය. මන්දයත් ඔවුන්ට ඇතිවන දුක්කරදර සුළු එකක් ඒවා වූවද එය විඳ දරාගන්නට බැරිව

සිත කලකිරී එවැනි තීරණයකට බසිනවා යයි කිව හැකිය. නමුදු කද්ර් කෙරෙහි විශ්වාස කරන කිසිදු විශ්වාස වන්තයෙකු කුමණ මාදිලියේ දුක්කරදරවලට මුහුණ දුන් නද ඒවා අල්ලාහ්ගේ පෙරමිනුම මත සිදුවනවා යන විශ්වාසයෙන් ඉවසිලිවන්තව කටයුතු කරනවා මිස කිසිදු අවස්ථාවක සියදිවි නසා ගන්නට පෙළඹෙන්නේ නැත. එසේම දයාබර අල්ලාහ් තම අතවැසියාට හොඳක් මිස නරකක් තීරණය කරන්නේද නැත යන ස්ථාවරයක පසු වන්නේය. ඔහු මුහුණ දෙන්නට සිදුවන අවස්ථාවන් දුකෙන් පිරුණු එකක් වූවද එහි අවසානය අල්ලාහ් දෙවිඳු තෘප්තිමත් වන අයුරෙන් සිදුවනු ඇතැයි යන අධිෂ්ඨානයකින් හෙතෙම ස්ථිරසාරව පසුවන්නේය.

වන්දනාමාන

අල්ලාහ් දෙවිඳු කරන ලෙස ආඥා කළ දේ ඒ ලෙසම කරද ඔහු විසින් තහනම් කළ දේ වෙතින් ඉවත්විද අල්ලාහ් දෙවිඳුට මුළුමනින්ම කීකරු වී කටයුතු කිරීම වන්දනාමාන යනුවෙන් අර්ථකථනය කළ හැකිය. එසේ වන්දනාමාන යනුවෙන් පවසන විට අල්ලාහ් ප්‍රිය වන අභ්‍යන්තර බාහිර කටයුතු සියල්ල එයට අයත් වේ. එසේම වන්දනාමානයේ මූලික සහ අති මුඛ්‍ය හරය වන්නේද අල්ලාහ් දෙවිඳුට මුළුමනින්ම කීකරු වීම වේ.

වන්දනාමාන පිණිස වූ ප්‍රධාන කොන්දේසි :

1. කරන සියළු කටයුතු අල්ලාහ් දෙවිඳු වෙනුවෙන් යන පිරිසිදු චේතනාවෙන් කිරීම.

2. කටයුතු කිරීමේදී මුහම්මද් තුමාගේ ආදර්ශය අනුගමනය කිරීම.

අප පෙර සඳහන් කළ කරුණු දෙක ගැන පැහැදිලි කරනවා නම් කරනා කටයුතු සියල්ල අල්ලාහ් දෙවිඳු වෙනුවෙන් කරන බවවූ පිරිසිදු චේතනාවෙන් කළයුතු අතර

එහිදී මුහම්මද් නබි (සල්) තුමාගේ ආදර්ශය අනුගමනය කළ යුතුය. නිදසුනක් වශයෙන් දෛනික වන්දනාමාන කරන විට එය අල්ලාහ් දෙවිඳු පමණක් යන චේතනාවෙන් කළ යුතුය අතර ඒ වන්දනාමානය කරන පිළිවෙත සහ නීතිරීති වක්තෘ මුහම්මද් තුමා (සල්) තුමා කෙසේ හඳුන්වා දී ඇත්දෝ ඒ විලසින්ම කළ යුතුය. එසේ ඒ පිළිවෙත් දෙක අනුගමනය නොකරන්නට එය අල්ලාහ් දෙවිඳුට සම්පූර්ණයෙන්ම කීකරු ව කළ වන්දනාමානයන් ලෙස කිසිසේත් අර්ථවත් කළ නොහැකිය.

වන්දනාමාන කටයුත්තන්හී නිරතවීමේදී අප පෙර සඳහන් කළ කොන්දේසි දෙක පනවා ඇත්තේ කුමණ හේතුවක් නිසාදැයි යමෙකු විමසිය හැකිය. එයට ඇති පිළිවදන් කීපයටක් බව කිව හැකිය.

1. අප කළ යුතු වන්දනාමානයන් සියල්ල පිරිසිදු චේතනාවෙන් අල්ලාහ් දෙවිඳු වෙනුවෙන් පමණක් කළ යුතු බව අණපනවා ඇත. ඒ ආඥාවට අනුව නොකර වන්දනාමානයන් අල්ලාහ් හැර ඔහුගේ නිර්මාණයන් හට කරන විට අප අල්ලාහ්ට ආදේශ කළ මහා පාපයට සහ වරදට හසු විය හැකිය. ඒ ගැන විස්තර කර අල්ලාහ් දෙවිඳු පරිශුද්ධවූ අල්කුර්ආනයේ මෙසේ පවසයි : *'බැති නැමදුම් (ඔහු වෙනුවෙන් පමණක් පිරිසිදුව) සෘජු කර ඔහු අමතව්'.* (7 : 29)

2. අගම්හී නීතිරීති පැණවීම අල්ලාහ් පමණක් අයත් බව ඒ අල්ලාහ් දෙවිඳුම එහි භාරකාරත්වය තමා සතු කර ගෙන ඇත. ඒ අයිතිය ඔහු හැර අන් කිසිවෙකුට නැත. අල්ලාහ් දහම්හී අනුමත කරන ලද වන්දනාමානයක් අල්ලාහ් හැර අන් කෙනෙකුට කරයිදෝ හෙතෙම අල්ලාහ් දෙවිඳුට ආදේශ කළ කෙනෙකු ලෙස වන්නේය.

3. අල්ලාහ් විසින් තම වදනින්ම ඉස්ලාම් දහම සම්පූර්ණ කර ඇත. ඉස්ලාම් දහමේ නැති දෙයක් අනුමත නොකළ දෙයක් දහම තුලට ඇතුල් කරන්නා අල්ලාහ් දෙවිඳු නොදන්නා දෙයක් තමා දැන ගෙන ඇත යනුවෙන් අල්ලාහ්ගේ ඥානය සුළු කොටය තකා අල්ලාහ්ට කලංකයක් ඇති කළ කෙනෙකු ලෙස වන්නේය.

4. තම කැමැත්ත ප්‍රකාර වන්දනාමාන කිරීමට වරමක් ලබා දුන්නේ නම් ඔවුන්ගේ වන්දනාමාන විවිධ විලම්භිත ලෙස වනු ඇත. කිසිදු පිළිවෙලක් නැති වනු ඇත. එවිට මිනිස් ජීවිත විවිධත්වයට පත්ව නියක් ලෙස වනු ඇත. වන්දනාමාන විවිධත්වයට පත්වන කළ මිනිස් සමාජය තුල ද්වේෂය සහ ඝාතනය හිස ඔසවනු ඇත. නමුදු ඉස්ලාම් දහම බලාපොරොත්තු වන්නේ කරුණාව සබැඳියාව සහ ප්‍රියශීලීත්වයයි.

වන්දානාමානයන්හී කොටස් : වන්දනාමාන විවිධ ලෙස වේ. දෛනික සලාතය, සකාත් බද්ද, රමළාන් මාසයේ උපවාස ශීලය, හජ් කර්තව්‍ය, දෙමාපියන්ට උවටැන් කිරීම, නෑයන් හා එක්සත්ව වීසීම, සත්‍ය කතා කිරීම, පොරොන්දු ඉටු කිරීම, අමානා හෙවත් භාරකාරත්වය නිසිලෙස සුරකීම, යහපත් දේ කෙරෙහි ඇමතීම, අදැමිටු දෙයින් ඉවත් වන ලෙස දැනමුතුකම් දීම, මහමග ආබාධ ඇති කළ හැකි දේ ඉවත් කිරීම, අනාථයන්, දුගීන්, යාචකයන්, සත්ත්වයන් හට සහ එවැනි අනෙක් අයට හැකි අයුරෙන් හොඳ දේ කිරීම යන්න වැදගත් යහකම් ලෙස විදහා දැක්විය හැකිය.

එසේම දික්ර් හෙවත් අල්ලාහ් ස්තෝත්‍ර කිරීම, ප්‍රාර්ථනා කිරීම, අල්ලාහ් වෙතින් ආරක්ෂා පැතීම, ඔහුගෙන් පමණක් උදව් උපකාර පැතීම, තම කටයුත්තන් සියල්ල ඔහු වෙත පමණක් පැවරීම, පවසමා අයැදීම සහ පශ්චාත්තාප වීම වන්දනාමාන ගණයට අයත් වේ. ඉවසීම, උදාවන සෑමවිටම

අල්ලාහ්ට ස්තුති වන්තවීම, තෘප්තිමත් වීම, අල්ලාහ්ට පම ණක් බිය වීම, අල්ලාහ්ට ප්‍රේම කිරීම, ඔහුගෙන් පමණක් රක්‍ෂා පැතීම, නුවවමනා දේ කිරීමේදී ලැජ්ජා වීම වැන්නද තවත් මාදිලියේ වන්දනාමාන සණයට අයත් ඒවා වේ.

### වන්දනාමානයේ විශේෂත්වය

ඉස්ලාම් දහමේ වන්දනාමානය යනු අල්ලාහ් දෙවිඳුට ඉතා ප්‍රිය ඔහු විසින් තෘප්තිමත් වී පිළිගත හැකි කටයුත්තකි. අල්ලාහ් මිහිපිට නිර්මාණය කර දහමත් පහළ කර වක්තෘ වරුන් සහ නබිවරුන් පත්කළේද ඒ එකම පිවිතුරු ඉලක්කය උදෙසාය. ඒ දහමත් පවසන නීතිරීති ඒ අයුරෙන්ම පිළිපදි න්නන් උසස් සේ ප්‍රශංසා කරද ඒ නීතිරීතින් උල්ලංඝනය කර තම හදමනසට වහල් වී කටයුතු කරන්නන් හෙළා දැකද පැවසීමද එහි ඇති විශේෂිත සංසිද්ධියකි.

දහමේ පවසන වන්දනාමාන පිළිවෙත් මිනිසා කරදරයට පත් කිරීමට හෝ ඔහුට දුක්දීමට හෝ නිම වූවක් නොවන අතර එක්තරා උසස් ඉලක්කයක් හේතුපාදක කර ගෙනය. එනම් එය ඒ ආකාරයෙන්ම පිළිපදින්නන් හට සීමා කළ නොහැකි පිණක් ලබා දෙනු උදෙසා දහමේ නීතිරීති නිර්මාණය කර ඇත. ඒ වන්දනාමාන මිනිසා පිරිසිදු ඍජු මගක් කෙරෙහි යොමු කරන්නේය. මිනිසාගේ අසහාය ඉලක්කය සහමුලින්ම සපුරා ගනු පිණිස කටයුතු කිරීමෙහි ඒ වන්දනාමානයන් හට ඇත්තේ වැදගත් ස්ථානයකි.

මිනිසා වන්දනාමානයන් කෙරෙහි උවමනා ඇත්තෙකු වූ මිනිසා සැබැවින්ම බෙලහීනව නිර්මාණය වූ කෙනෙකි. එහෙයින් ඒවා නිසිලෙස පිරිසිදු චේතනාවෙන් කරනු වස් අනිවාර්යය කර ඇත. මන්දයත් ඔහු සැමවිටම අල්ලාහ්ගේ උවමනාවෙහි රැඳී සිටියි. ඔහුගේ දේහය වර්ධනය වන්න අන්නපාන අවශ්‍ය සේ සිත සහ චින්තනය වර්ධනයට

වන්දනාමාන නම් ආහාරයද අල්ලාහ් වෙත හැරෙන ක්‍රියාදාමයන්ද අවශය බව නොකිව මනාය. කයට සහ ජීවයට ආහාරය අවශ්‍ය වන තරමට වඩා සිතට සහ චින්තන වර්ධනයට වන්දනාමානයේ අවශ්‍යතාවය කියා නිම කළ නොහැකිය. මන්දයත් මහුගේ යථාර්ථ ස්ථාවරය මන මහුගේ සිත සහ ආත්මය වේ. ඒ දෙක ක්‍රමිකව ක්‍රියා වන්නට නම් හෙතෙම පිරිසිදු වන්දනාමාන හා අල්ලාහ් දෙවිඳු වෙත හැරිය යුතුය. නියම සිත්සැනසුම සහ ආත්ම අභිවෘධිය සාක්ෂාත් කර ගත හැක්කේ අල්ලාහ් දෙවිඳු වන්දනාමාන කිරීම සහ දික්ර් කිරීම තුලින් පමණි.

මිනිසා අල්ලාහ් වෙතින් හැර අන් ක්‍රමයකින් ලබන සතුට සහ සැනසුම සදා ස්ථිරව පවතිය නොහැකිය. එයින් පිට ලැබෙන සතුටෙන් සහ සැනසුමෙන් මහු යම් ප්‍රමාණයක තෘප්තියක් ලැබුවද එය ස්ථිර එකක් නොවේ. අල්ලාහ් වෙතින් ලැබෙන සතුට සහ සැනසුම ස්ථිර එකකි. ඒ යථාර්ථ සතුට සහ සැනසුම කිසිසේත් නැතිවන්නට හෝ විසන්ධි වන්නට අවස්ථාවක් නැත. තමා හා සදා පැවතිය හැකි සතුටක් සහ සැනසුමක් අපේක්ෂා කරන්නේ කවරෙක්ද හෙතෙම පිරිසිදු චේථනාවෙන් අල්ලාහ් දෙවිඳු වන්දනාමාන කරපු දෙන්. අල්ලාහ් දෙවිඳු කෙරෙහි සම්පූර්ණ තෘප්තියක් ඇති කර ගනිමන් මහුට පමණක් වන්දනාමාන සෘජු අන්දමින් ඉටු කරන්නා ඉතසිත පිරී සතුටක් සාක්ෂාත් කරගෙන සිටී යන්න ඉඳුරාම කිව හැකි සත්‍යයකි.

තවද වන්දනාමාන මිනිසාට සහ සමාජයට යහකම් කිරීමටද තහනම් කළ දේ වෙතින් ඈත වීමටද දුක් කරදර අවස්ථාවන්හී ඉවසිලිවන්තව කටයුතු කිරීමටද අපුල ගතියකින් සහ පිළිකුල් ගතියෙන් තොරව කටයුතු කිරීමටද දුක්දොම්නස්සන් හැකි අයුරෙන් ඉවසා ලිහිල් කර ගනිමින්

ඒ අවස්ථාවන්හි නිදහස් සිත්සතනකින් කටයුතු කිරීමටද ඉවහල් වන්නේය.

මෙලෙස යමෙකු වන්දනාමනයන් පිරිසිදු චේථනාවෙන් කරන විට අල්ලාහ් හැර අනෙකුත් නිර්මාණයන් සහ මැවීම්වලට වන්දනාමාන කිරීමෙන් වළකින්නටද තම උවමනාවන් ගැන මවුන්ට පවරා මවුන්ගෙන් ඉල්ලීමෙන් වළකී සිටීමටද මවුන්ට බිය නොවී සිටීමටද මවුගෙන් පිටිවහල පැතීමෙන් ඉවත්වී සිටීමටද මං පැදේ. මෙසේ කෙනෙකු කටයුතු කරන්නේ නම් හෙතෙම අල්ලාහ් දෙවිඳු ඉදිරියේ සම්භාවණිය පුද්ගලයෙකු ලෙස වනු ඇත.

ඉස්ලාම්හී කාන්තාව

අනෙකුත් දහමන් සහ සංකල්පයන් සේ නොව ඉස්ලාම් දහම කාන්තාවට ලබා දී ඇත්තේ අති සම්භාවණිය ස්ථානයක් යන්නෙහි දෙවැනි අදහසක් නැත. ස්ත්‍රිය පිරිමියා හා එකට එක්වී නොගිලිහන සම්බන්ධතාවයක් පවත්වමින් එකම පවුලේ සාමාජිකයෙකු ලෙස හැසි රෙයි. 'මිනිසුන්ගේ යහපත් අය තම පවුලේද යහපත් අයෙකි' යන්න ඉස්ලාමීය දෘෂ්ඨියේ වැදගත්ම දෘෂ්ඨියකි.

කාන්තාව කුඩා අවධියේ තම මවගෙන් කිරි උරා බී සප්පා යම් වීමේ නිදහසක් ඇති දා පටන් ඇය වැඩිවියට පත්වන තෙක් ඇය රැකබලා ගැනීමට වගකිව යුත්තන් කෙරෙහි ඇත්තේ අතිමහත් යුතුකමකි. ඒ සමයේ ඇය තම දෙමාපිය න්ගේ සිත පිනවන්නියක් ලෙස ඇගේ සහෝදර සහෝදරී යන්ට සන්තෘෂ්ටියක් ලබා දෙමින් නොගිලිහෙන ස්ථානයක් තමා සතු කරගත් කෙනෙකු ලෙසද වන්නාය.

ඇය පරිනත වී කන්‍යාවියක් බවට පත් වූ කළ සමාජ් තුල ඇයට ඇත්තේ අති සම්භාවණිය තැනකි. ඇගේ යහ පත ඇගේ උවමනාවන් සපිරීම වෙනුවෙන් සහ ඇගේ ආරක්ෂා

වෙනුවෙන් ඇගේ දෙගුරුන් කෝපයට පත්වන අතර රළු ගතියකින් හැසිරෙන්නේය. ඇගේ ආරක්ෂාව උදෙසා විශාල වගකීමක් දරයි. ඇය වෙත නොමනා අතක් හෝ හිතක් හෝ ස්පර්ශ කිරීමට ඔවුන් කිසිසේත් කැමැති වන්නේ නැත. පරුෂ වචනයෙන් හෝ නොමනා අන්දමින් අමතා ඇගේ චරිත ඝාතනය කිරීමට පවා අකැමති වන අතර ඇ කෙරෙහි නොහොබිනා අන්ද මින් අන් බැල්මක් හෝ දෘෂ්ටියක් හෝ විදින්නට කිසිසෙත් ප්‍රිය වන්නේ නැත.

ඇය වයසට පත්ව ඇගේ අනාගත උදෙසා මංගල දිවියකට ඇතුල් කරවන විට ඇගේ එකම දෙවිඳු වන අල්ලාහ් නාමයෙන් විවාහ කර දෙන්නේය. ඒ මංගල සමයේ ඇය හා මනාලයා අතර කරන සම්මුතිය පවා ඉතා දැඩි නීති ගෙන්නකට ඇතුල් කරමින් ඇය ඔහු වෙත පවරා දෙනු ලබනු ඇත. ඇය තම මනාලයාගේ නිවසෙහි පදුවන විට ඇය ඒ පවුලේ ගෞරවය සුරකිමින් තම ජීවිතය ගත කරන්නේ අති සම්භාවණීය අන්දමිනි. ඇගේ ගෞරවයට පතිවතට සහ චරිතයට කැළැලක් ඇති නොවන අයුරෙන් ආරක්ෂා කිරීම ඇගේ මනාලයාගේ පරම යුතුකමකි. ඇය හා ආදරයෙන් සෙනෙහසින් කටයුතු කිරීමද ඇගේ මිනැ එපාකම් ගැන සොයා බැලීමද ඇයට නපුරක් විත්නැහියක් නොවන අයුරු රැක බලා ගැනීමද ස්වාමියාගේ පරම යුතුකමකි.

ඇය මව් ස්ථානයට පත්වූ කළ ඇය වෙනුවෙන් කටයුතු කිරීම අල්ලහ් දෙවිඳුට වන්දනාමන කිරීමක හා සමාන වග කීම සහිත වන්නේය. කරදර දුක් දොම්නස් සෙහි ගිල්වා ඇය තාඩනපීඩනවලට භාජණය කිරීම මහා පවක් හා සමාන දුදන ක්‍රියාවක් ලෙස සැළකෙන අතර මිහිපිට භීෂණය ඇති කරනවා හා සමාන විශාල අකටයුත්තක් සේ වන්නේය.

ඇය සහෝදරියක් ලෙස පත්වන විට ඇය හා මුස්ලිම් වරු එක්ව ජීවත් විය යුතු බවත් ඇය සම්භාවණයට පත්කර ඇයට ඇති විය හැකි දුදනෙන් ඇය මුදවා ගැනීම නොපිරිහෙළා ඉටු කළ යුතු යුතුකමක් බවත් ඇගේ කටයුත්තන්හී ඇය වෙනුවෙන් අනුන්ගෙන් ඇතිවන කරදර අවස්ථාවේ පරුෂ ලෙස කටයුතු කළ යුතු බවත් ඉස්ලාම් ඔවදන් දෙයි.

එසේම ඇය නැන්දනියක් ලෙස මවගේ සහෝදරියක් ලෙසට පත්වූ කළ ඇය වෙනුවෙන් කළ යුතු යුතුකම් ඉෂ්ට කිරීමේදී ඇය මවකගේ ස්ථානයට පත්වන්නේය. එසේම ඇය වයෝවෘද්‍යට පත්ව ආත්තා කෙනෙකුගේ අවස්ථාවට පත් වූ කළ ඇගේ දුපුතුන් අතරද ඇගේ මුනුබුරු මිනිබිරියන් අතර ඇගේ තත්ත්වය පහසුවෙන්ම ඉහළට පත් වනු අතර ඇ කෙරෙහි වූ සැළකිල්ල අති උසස් තත්ත්වයට පත් වන්නේය.

ඇය වෙනුවෙන් වූ යුතුකම් නිසිලෙස හැකිතාක් අයුරු ඉටුකර දෙන ලෙසද, ඇයට ආදරය කරුණාව දක්වන ලෙසද, ඇගේ අදහස් සහ දැනමුතුකම් උදාසීන නොකර ඒ ගැනද අවධානය යොමු කරමින් කටයුතු කරන ලෙසද ඉස්ලාම් දහම ඔවදන් දෙයි. ඇය තමා දන්නා හඳුනන තැනකට ගිය කලද තම නෑතිවසකට ගිය කලද මුස්ලිම් වරයෙකුට කළ යුතු යුතුකම් අනුව ඇයට සාදරානුග්‍රහය දක්වන ලෙසද, මහළුකම නිසා ඇගෙන් ඇතිවන සුළුසුළු වැරදි උකහා දක්වා ඇගේ සිත පෑරෙන අයුරු කටයුතු නොකරන ලෙසද, ඇය නොසැලිකෙල්ලන් අත් හැර නොමදන ලෙසද ඉස්ලාම් අණපනවන්නේ ස්ථිරසාර අන්දමිනි. අනෙකුත් දහම් වලට සහ සමාජ සංකල්පය තුල කාන් තාවට දී ඇති අයිතිවාසිකම්වලට වඩා වැඩි අයිතිවාසිකමක් සහ සුරකුමක් ලබා දී ඇත්තේ පිවිතුරු ඉස්ලාම් දහම තුල බව නොකිව මනාය.

තවද ඉස්ලාම් දහම කාන්තාවට තමාට උවමනා දේ තමා සතු කර ගැනීමේ පරම අයිතිය සම්පූර්ණයෙන්ම ලබා දී ඇත. ගනුදෙන කිරීම සහ තමාට අයත් දේ කුලියට දීම කුලියට ගැනීම, වෙළෙළහෙළඳාම් කටයුතු පිණස සම්මුති සහ පොරොන්දුවලට ඇතුල් වන්නටද ආගම අනුමත කරන අන්දමින් දැනුම සහ ඥානය ලබා ගනු වස් අධ්‍යයන කිරීමටද, උගත් වන්නටද අනුමත දී ඇත්තේ ඇයට සීමාසහිත වැදගත් ආරක්ෂාව ලබා දෙමිනි. එසෙම ඇයද පිරිමියාද දහම තුල ඉගෙන ගත යුතුද කරුණු අත්හරින්නේ නම් දූදනෙක් යන තත්ත්වයට පත්වන පව දැනගැනීමේ නිදහස ඇයට ලබා දී ඇත්තේ විවෘත අන්දමින්ය.

කාන්තාවට සුදුසු ආරක්ෂාව ලබාදෙන ලෙසද, ඇගේ චරිතය සහ පතිවත සුරකින ලෙසද ඉස්ලාම් දහම දැන මුතුකම් දෙන්නේ ස්ථිරසාර අන්දමිනි. එසේම නොමනා වදන් පාවිච්චි කිරීමෙන්ද, නොමනා බැල්මෙන් වළකින ලෙසද පවසන අතර නොමනා අන්දමින් අනුන්ගේ ස්පර්ශය සහ ඇඟිලි ගැසීමෙන් වළකිනු වස් විශේෂ යෙන්ම මවදන් දෙන්නේ, තම ලස්සන අනුන් දැකීමෙන් සහ විඳීමෙන් වළකිනු වස් ෆර්දා හෙවත් හිස්වැස්ම සහ මුහුණ ආවරණය පළඳීමෙන් බව ඉස්ලාම් දහම පැහැදිලිව පවසයි. එසේම ස්ත්‍රිය තම ඇඟ පසඟ විනිවිද පෙනෙන දුහුල් සිනිඳු ඇඳුම් පාවිච්චි කිරීමද, විවිධ මාදිලියේ මන නයන පොබවන ඇඳුම් ඇඳීමෙන්ද වළකිණ ලෙසද ආඥා දායීව පවසන අතර ගැහැණුපිරිමි නිදහසේ හුදෙකලාවේ සම්මිශ්‍ර වීමෙන්ද වළකින ලෙස විවෘතව පවසා සිටී. එසේ නොවන්නට පහසුවෙන්ම කාන්තාව තම පතිවතට හානි වන, චරිතයට කැළැලක් ඇතිවන අනුන්ගේ කෑන බැල්මන් හට භාජණයවී ඇගේ ආරක්ෂාවට ප්‍රශ්නයක් ඇති වීම වැළැක්විය නොහැකි කරුණක් වනු ඇත.

පිරිමියා තම භාර්යාවට වියදම් කළ යුතුව ඇත යන්න ඉස් ලාම් දහමේ වැදගත්ම යුතුකමකි. තම භාරයට පත්වන ඇයට ඇගේ උවමනාවන් උදෙසා වියදම් කිරීමද ඇය හා ආදරයෙන් කරුණාවෙන් කටයුතු කිරීමද, ඇයට නුවුවමනා ශාරීරික සහ මානසික වද දීමෙන් වළකීමද ස්වාමි පුරුෂයාගේ වැදගත්ම යුතුකමකි. තවද දම්පතීන් දෙපොල අතර එක්වී කටයුතු කිරීමට නොහැකි වන ලෙස සණ්ඩුදබර වී එය මුහුකුරා ගොස් ඔවුන් මතුවටත් සන්සුනේ එක්වී පවුල් ජීවිතය ගත කරන්නට බැරිවන තත්ත්වයක් උදා වන්නේ නම්, ඔවුන්ගේ ජීවිතය ආපදූ සතුටෙන් සමාදානයෙන් එක්වී ජීවත්විය නොහැකි මහා නරකාදියක් බවට පත් වනු ඇතැයි සිතනවා නම් ඔවුන් තම ප්‍රිමනාප ලෙස තලාක් වී නිත්‍යානුකූලව විවාහ ජීවිතයෙන් වෙන්වී ජීවත්විය හැකි බවද ඉස්ලාම් දහම අඹුසැමි දෙපිරිසටම ඉඳුරාම නිදහස් ලබා දී ඇත.

තවද තම ස්වාමියාගේ හැසිරීම්, නොමනාපයන් සහ අනෙ කුත් කරදර නිසා බිරිඳට ඔහු හා එක්වී ජීවත්විය නොහැකිය යන තත්ත්වයකට පත්වන කළ ඇය ඔහුගෙන් නිත්‍යානු කූලව වෙන්වී ජීවත්වීමට වරමද ඉස්ලාම් දහම පුද කරන්නේ ඇගේ නිදහස මුළුමනින්ම සුරකිණ ලෙසිනි. ඇය කතාබස් වී ඔහුට යම් ප්‍රමාණයක මුදලක් දීද, නොවන්නට ඔහුගෙන් ලබා ගත් සේසතක් ආපසු හරවා දීද ඇය ඔහුගෙන් විවාහ බන්ධ නයෙන් සම්පූර්ණයෙන්ම ඉවත් විය හැකි යනුවෙන් කාන්තාවට දී ඇත්තේ අසහාය නිදහසකි.

පිරිමියෙකු වත්පොහොසත් කමෙන් යමක්කමක් වෙනම් සරු නම්, තම මුල් බිරිඳට සේ අනෙක් බිරිඳටත් සමබරව සැළකිය හැකි නම් එකට වැඩි කාන්තාවන් දෙනෙක් හෝ තිදෙනෙක් හෝ සිව් දෙනෙක් හෝ තමාට විවාහ කර ගත හැකිය. ඒ අවසරයෙන් අසරණ දුගී කාන්තාවන් තම හදමනස පිනවන

අයුරෙන් විවාහ ජීවිතයක් ගත කිරීමට නිත්‍යානුකූලව මගක් විවර කර ඇත්තේ අන් සංකල්පයක නොවන අන්දමිනි. එසේම තමා සතුව කොපමණ සේසත් මුදල් තිබුණද තමාට එක් කාන්තාවක් පමණක් සෑහේ නම් එය මහුගේ අයිතිවාසිකමකි. සෑම මුස්ලිම් වරයෙකුම අනිවාර්යයෙන්ම බහු විවාහ බන්ධ නයට ඇතුල් විය යුතුය යනුවෙන් ඉස්ලාම් කිසිසේත් පවසා නැත. ඉස්ලාම් දහම බහු විවාහය අනුමත කර ඇති අවස්ථාව තුලින් සමාජය සාක්ෂාත් කර ගන්නා ඵලප්‍රයෝජන අපමණය. හුදෙක් ඉස්ලාම් දහමේ ස්ථිරසාර පරමාධිපත්‍ය සූක්ෂම නීතිරීතිවලට පිට සිට හෝ සෘජු ක්‍රියාවන් සහ පැවැත්ම ගැන තෝරාබේරා නොගෙන ඒ ගැන යම් මනෝමය අදහස් සහ චින්තනයන් පමණක් සාක්ෂාත් කරගෙන එහි ඇති ඵලප්‍රයෝජන වටහා ගැනීමට උත්සාහ කිරීම කිසිසේත් නොවන කරුණකි.

## බහු විවාහය

ඉස්ලාම් දහම බහු විවාහය අනුමත කිරීමෙන් ලැබිය හැකි යඵලප්‍රයෝජන සහ කරුණු කෙටියෙන් වටහා ගැනීමෙන් අපගේ දුරාවබෝධය අපෙන් ඉවත් කර ගත හැකිය.

1. සමාජ සාරධර්මය සහ සභ්‍යත්වය කෙලෙසිය හැකි, සමාජයේ භීෂණය සහ දුදන පැතිරිය හැකි දුරාචාරය සහ නොමනා ලිංගික සබධතා තහනම් කර ඒ වෙත සමීප නොවන ලෙස අවවාද කරන්නේ තදබල ලෙසිනි. කාන්තා, පිරිමි යනුවෙන් කිසිදු සභ්‍යත්වයෙන්, ආරක්ෂාවෙන් තොර එකට එක්වී සම්මිශ්‍රණයවීම සම්පූර්ණ යෙන්ම තහනම් කරයි. එසේම දුරාචාරය සම්පූර්ණයෙන්ම විලිබිය ගතිය සහ විනය විනාශ කරයි. කාන්තාවගේ සභ්‍යත්වය සහ සම්භාවණීය ස්ත්‍රීභාවය සහමුලින්ම විනාශ කරයි. එසේ දුරාචාරයේ හැසිරෙන ස්ත්‍රියට පමණක් නොව මුළු මහත්

පවුලේ අයට සහ හැදෑ හිතමිතුරන්ටත් නිහීනයක් අගෞරවයක් චරිතභංගයක් ඇති කරන්නේය.

දුරාචාරය නිසා ඉපදෙන ළමයි සමාජයේ නිහීනත්වයට පත්ව කොන්වන්නේ පත්වන්නේ ඒ ළමයා කළ වරදකින් නොවේ. දුරාචාරයේ හැසිරෙන අය නිසාය. එසේම දුරාචාරය මගින් ඉපදෙන පියෙක් නැති, පරම්පරාවක් නැති ළමයි තමාට යැයි කියා නෑදෑයෙක්, පවුලක් නැතිව සමාජයෙන් තුරන්වී නිහීන තත්ත්වයක මඳ බිඳුණු මාන සිකත්වයෙන් ජීවත් වන්නට සිදු වනු ඇත. සමහරවිට ඒ ළමයා මානසිකත්වයෙන් අන්ත පහළ තත්ත්වයකට පත්ව මානසික රෝගියෙක් ලෙස හෝ තමාට කිසිදු පිටිවහලක් නැත යනුවෙන්වූ ඌන මානසිකත්ව යෙන් හෙබි කෙනෙකු ලෙස හෝ පත්විය හැකිය.

එසේම දුරාචාරය මිනිසා විවිධ භයාණක මානසික කායික බිඳ වැටීමක් තුලට ඇතුල්කර පහසුවෙන් ප්‍රතිකාර කර සුව කළ නොහැකි අති විශාල ලෙඩරෝගවලට පත් කරයි. ඔහු පහසු වෙන් ඒඩ්ස්, උපදන්ත සහ තිපිලිත් වැනි භයානක රෝගවලට භාජනය වී සමාජයේ නීච තත්ත්වයට පත් වන්නෝය.

ඉස්ලාම් දහම දුරාචාරය තහනම් කළ අවස්ථාවේම මිනිසා එකිනෙකා හඳුනාගෙන හදමනස සන්සුනට, සන්තෘෂ්ඨියට පත්වන විලසින් විවාහය නීතිගත කර තම භාර්යාව නිත්‍යානු කූල කර බහු විවාහයද සංස් ථාපනය කර ඇත්තේ ප්‍රඥා ගෝචරවයි. එහෙයින් සමාජ පැවැත්ම සහ අනෙකුත් සාර ධර්මයන් ගැන සන්සන්දනය කර බලන කළ පිරිමින් හෝ වේවා කාන්තාවන් හෝ වේවා බහු විවාහය හෙළා දකින්නේ නම් එය ඔවුන් සමාජ සංවර්ධනයට සහ සංස්ථාපනයට කරන විශාල විත්තැහියක් ලෙස කීම වරදක් නැත. බහු විවාහ ගැන අඩු තක්සේරු කිරීම සහ එයට විරුද්ධව නැගී

සිටීම සමහරවිට දුරාචාරයට මිනිසා ඇඳගෙන යෑම වළකන්නට බැරි තත්ත්වයක් උදා කිරීම යන්න නොකිව මනාය.

මිහිපිට කුමන ස්ථානයක් ගැන, කුමන කාලයක ගණනය කර බැලුවද පිරිමින්ට වඩා කාන්තාවන් බහුලය. මෙම මතය විශාල යුද්ධ සමයෙන් පසු තවත් පැහැදිලිවනු ඇත. කරුණු මෙසේ වෙද්දී පහසුකම් සහ සරල ශරීර සෞඛ්‍යයකින් පසු වෙද්දී පිරිමියා එක් කාන්තාවක් සමග පමණක් තම විවාහ ජීවිතය සීමා කරගන්නේ නම් බොහෝ කාන්තාවක් දෙවිඳු විසින් උරුමයක් ලෙස ලබාදී ඇති විවාහ ජීවිතය භුක්ති නොවිඳ මියදෙන්නට හැකිය යන්නෙහි යම් සැකයක් වේද?

විවාහ ජීවිතයක් වෙනුවෙන් පෙරුම් පුරන කාන්තාවන් සහ ඔවුන්ට සහකරුවෙක් සොයනු වස් ප්‍රවෘත්ති පත්‍ර මංගල තීරුවල එළිදකින වයසට පත්වූ අයගේ නම් කොපමණ අප දසුනට හසුවන්නේද? සමහර අවස්ථා වන්හිදී ඔවුන් තම සීමාව ඉක්මවා දුරාචාරයේ හැසිරීමද නොවැළැක්විය හැකි හේතුවක් ලෙස පැවසීමටද ජනසන්නි වේදනයද නොපසුබට වෙයි. විවාහ ජීවිතයක් වෙනුවෙන් මගබලා ගෙන සිටින ලදක් මෙවන් තත්ත්වයකට පත්වන්නේ නම් එයින් සමාජයට සහ නෑහිතමිතුරන් හට ඇති විය හැකි මාන භංගය සහ අවලාද කුමට කියන්නද?

2. විවාහ ජීවිතය යනු හුදෙක් කායික තෘප්තිය උදෙසා පමණක් කරන කටයුත්තක් නොවේ. විවාහය කෙනෙකුගේ හදමනස සන්තෘෂ්ටිය, සැනසුම, සමාජයට සෙතක් විය හැකි ළමා පරපුරක් බිහිකිරීම, සහයත්වය සහ විනයාශ්‍රිත සමාජ සොදාපාළුව වළකීම වැනි බොහෝ සුවිපාක අන්තර්ගතව ඇත. ඉස්ලාමීය දෘෂ්ටි කෝණයෙන් ළමා පරපුර වැදගත් ස්ථානයක් හොබ වන්නේය. සමාජයට වැඩදායී ළමා පරපුරක් බිහි කරනු වස් තම ළමයින් මනාව හදාවඩා ගැනීම දෙමාපියන්

ගේ පරම යතුකමකි. කාන්තාව ළමයින් බිහිකර ඒ ළමයින් හොඳ පුරවැසියන් ලෙස බිහි කරන්නේ නම් ඇය තම නෙත්සිත් පිනවන අසුරු ප්‍රීතියට පත් වන්නාය.

3 බහු විවාහ ගැන සිතා බලන කළ එය සර්වසාදාරන එකක් සහ කිසිදු උස්පහත් භේදයක් නැති බව වටහා ගත හැකිය. ඉස්ලාම් දහම කාන්තාව යුක්තිතරුක දෘෂ්ටියෙන් දකින්නේය. එසේම සෑම කාන් තාවම ඒ අයුරෙන්ම බැලිය යුතුය සැළකිය යුතුය බව නීතිය සහ යුක්තිය බලාපොරොත්තු වෙයි. අපගේ සමහර බුද්ධිකයන් බහු විවාහය වකුව දකින්නට සහ විවේචනය කිරීමට පෙළඹෙති. එසේනම් විවාහයෙන් ඉවත් වූ කණ වැන්දුම්, වෛදව්‍ය සියන්ගේ ඉරණම කුමක්ද, මවුන් දෙස සමාජය කරුණා දෘෂ්ටියෙන් බැලීමට මැලිවන්නේ මක් නිසාද යනුවෙන්වූ ප්‍රශ්ණයක් පැන නගින්නේ නිතැතිනි. එසේම වයසට පත්වූවද විවාහය ජීවිතය දකින්නට බැරිව පෙරුම පුරන දුගී කන්‍යාවියන්ගේ තත්ත්වය කුමක්ද? කාන්තාවක් තවත් බිරිඳක් ඇති පිරිමියෙකු යටතෙහි පසු වීම අඩුවක්ද යන්න සිතා බැලීම මෙහිදී වැදගත්ය. පහසු කමක් ඇති ආදරයක් කරුණාවක් දක්වන පිරිමි යෙකු යටතේ සාන්තු සප්පායම් ලබාගෙන මහු වෙනුවෙන් ළමා ළපටින් වඩා ගෙන සතුටෙන් නිදහසෙන් සන්සුන්ව කාලය ගත කිරීම, විවාහ ජීවිතයක් නැතිව තනිව කණස්සල්ලෙන් නිවසටම නාකිවී කල් ගත කරනවාට වඩා කොපමණ වටිනවාද යන්න ඒ ගැන මනා ලෙස අධ්‍යයනය කරන්නේ නම් වටහා ගත හැකිය.

4 බහු විවාහයෙන් වැන්දඹු, කණවැන්දුම් කාන්තාවන් හට තවත් ජීවිතයක් ලබා සමාජයේ ඇති විය හැකි අනේකවිධ දුක්කරදරවලින් මිදී නිදහසේ ගත කරන්නට හැකි අවස්ථා අනන්ත අප්‍රමාණය. විවෘතව සිතා බලන්නේ නම් එවැනි

කාන්තාවන් සමාජයේ ගින්නක් සහ කරදරයක් මිස අන් කුමන විදියට පවසන්නද? එහෙයින් බහු විවාහයක් මගින් ඒ කාන්තාවන් පුණර් ජීවයක් ලබා තම ජීවිතයේ සතුටක් සන්සුනක් සාක්ෂාත් කර ගැනීම ඒ සමාජයට නිදහසේ ආස්වාස කරන්න්ට ලැබෙන අවස්ථාවක් නොවන්නේද?

එහෙයින් එක් පිරිමියෙකුට ඔහුගේ සැපසම්පත් සහ වත්කම පුළුවන්කම් අනුව අනුමත බිරිඳන් දෙකක්, තුනක්, හතරක් යතුවෙන් තිබීම හොඳද නොවන්නට, තමින් එක් නිත්‍යානුකූල බිරිඳක් තබා ගෙන තව පරස්ත්‍රීන් කීපයක් තබා ගැනීම ශීලාචාරය පැවැත්මක්ද?

5. අවස්ථාවෝචිත අනුමත කරනවා මිස බහු විවාහය ඉස්ලාම් දහම බල කරන්නේ නැත. බහුතර මුස්ලිමුන් එක් බිරිඳකින් තම විවාහ ජීවිතය සීමා කරයි. පිරිමියෙකු යුක්තිගරුකව කටයුතු කරන්නේ නම් ඔහුට පහසුකම් වේ නම් ශක්තිය ලබන්නේ නම් ඔහුට ස්ව කැමැත්තෙන් බහුවිවාහ රාමුව තුලට ඇතුල්විය හැකිය.

6. පිරිමියෙකුගේ ස්වභාවය මෙන් නොව කාන්තාවකගේ ස්වභාවය, කාය විපර්යාසය ඉඳුරාම වෙනස්ය. පිරිමියාගේ දේහ ලක්ෂණය සේ කාන්තාවගේ දේහ ලක්ෂණය මිනැම අවස්ථාවක දිනයක කායික සංසර්ගයට සූදානම් වූ එකක් නොවේ. ඇගේ ස්වභාවික මාසික මසපය සමහරවිට දින දහයක් පමණ දික්වන අතර සම්පූර්ණ පිරිසිදුවට මාසයේ සති දෙකක් පමණ කාලයක් ගත වන්නටද හැකිය. එසේම ප්‍රශව ලේ පිටවීමේ සමයද අඛණ්ඩව දින හතළිහක් පමණ පවතිය හැකිය. එවන් සමයක පිරිමියා තම උවමනාවක් පිණිස ඇගේ පිහිට බලාපොරොත්තු විය නොහැක. එයට පටහැනිව ඒ සමයේ කායික සංසර්ගයේ යෙදෙන්නේ නම් එය භයානක ලෙඩරෝගවලට භාජනය විය හැකි යන්න

සුපැහැදිලි කරුණක් හෙයින් ඒ කාලය තුල සංසර්ගයෙහි යෙදීම ඉස්ලාම් දහම සම්පූර්ණයෙන්ම තහනම් කර ඇත.

7 එසේම කාන්තාවකගේ ස්වභාවික දේහ ලක්ෂණය, ඇය ගැබ්බර වූ කළ හෝ ප්‍රසූතියෙන් පසු සුළු කලකින් හෝ කායික සංසර්ගයෙහි යෙදීම බොහෝසෙයින් අපහසු කරුණකි. නමුදු පිරිමියෙකුගේ දේහ ලක්ෂණය මිනැම අවස්ථාවක කායික සංසර්ගයට සුදුසු ලෙස පසුවන විලසින් පිහිටා ඇත. පිරිමියෙකු ස්ත්‍රියකගේ දේහ ලක්ෂණය හාත්පසින්ම විරුද්ධ අන්දමින් පිහිටා ඇති හෙයින් පිරිමියා තම උවමනාව පරස්ත්‍රී සේවනයට යොමු වී දුරාචාරය තුලින් ලබා ගන්නවාට වඩා බහු විවාහය එයට මනා පිළියමක් නොවන්නේද?

8. වඳබවට පත්වූ කාන්තාව : සමහරවිට ස්ත්‍රිය වඳ බවට පත්වී තිබීම අප සමාජය තුල දැකිය හැකි විරල දර්ශනයකි. එවන් ස්ත්‍රියක් හා විවාහ ජීවනයට ඇතුල් වූ පිරිමියෙකු සන්තාන අභිවෘධිය කර ගැනීමට නොහැකිව ළමා ළපටින් ලබා ගැනීමට නොහැකි වන කළ මහුට ඇති වන්නේ කළ කිරීමක් මෙන්ම සමහර විට මහු ඇය දික්කසාද කර දැමීමටද පෙළඹෙනු ඇත. එසේ දික්කසාද කළේ නම් ඇගේ විවාහ ජීවිතය මෙන්ම සතුට සැනසුමද එහා වැළලී යෑමට හැකිය. එහෙයින් ඇය දික්කසාද කර දමනවාට වඩා ඇයද තබාගෙන ඇය හා සතුටෙන් සමාදානයෙන් ජීවත් වෙමින් තවත් කසාදයක් කර ගැනීමෙන් මහුට තමාට කියා ළමයි පරපුරක් බිහි කළ හැකිය.

එසේනම් පිරිමියා වඳයෙක් නම් මහු විවාහ කරගත් කාන්තාවද එවන් තත්ත්වයකට පත් වනවා නොවේද? එවිට ඇය දරු සම්පතක් ලබා ගන්නට ඇයට තවත් විවාහයක් කර ගන්නට බැරිදැයි ප්‍රශ්ණයක් මබ අනිවා ර්යෙයෙන්ම අසනු ඇත. එසේ තමා වඳ පිරිමියෙක් බැඳ ගත් බව සාක්ෂි

පූර්වව මජ්පුවී නම්, කිසිදු පරිභාහිර බලකිරීමකින් තොරව ඇය කැමැති වන්නේ නම් ඇයට ඔහුගෙන් නිත්‍යානුකූලව වෙන්වී තවත් විවාහ ජීවිතයක් භුක්ති විඳීමට ඉස්ලාම දහම ඇයට සම්පූර්ණ අවස්ථාවක්, අයිතියක් ලබා දී ඇත.

9. සමහරවිට බිරිඳ නොකඩවා දීර්ඝ කාලීන ලෙඩෙක් බවට පත්ව සිටීම සහ පැතිරිය හැකි ලෙඩරෝගවලට භාජනය වීමද පිරිමියාට බහුවිවාහය කෙරෙහි අවස්ථාවක් උදා කර දෙන්නේය. බිරිඳ ලෙඩවීමෙන් ඇයට ක්‍රමිකව සැමියාගේ මිනැළපාකම් සපුරා දීම සහ ඔහුට උවමනා උවටැන් කිරීමට අපහසු වී ඇඳට පත් වන්නට හැකිය. එයට පිළියමක් වශයෙන් ඇය දික්කසාද කර සදහටම ලෙඩෙක් බවට පත් කරවාට වඩා ඇයද තබාගෙන තවත් විවාහයක් කර ගැනී මෙන් පිරිමියා තම කටයුතු පහසු අන්දමින් කර ගත හැකි වන අතර මුල් බිරිඳගේ ළමයින්ද හදාවඩා ගන්නට අවස්ථාවක් එළඹෙන්නේය.

10. බිරිඳගේ හැසිරීම එතරම් ප්‍රියමනාප නොවීම : එනම් බිරිඳ ස්වාමියාගේ මිනැළපාකම් ගැන සොයා නොබලා ඔහුගේ අයිතිවාසිකම් සුරකින අයුරු කටයුතු නොකර ඔහු වෙනුවෙන් ඔහුගේ උවමනා පරිදි ළමයින් වැදීමට අකැමැතිව වන්නේ නම් ඇගේ චරිතය සහ ඇගේ පවුලේ අයගේ මානභංගය ආරක්ෂා වනු විලසින් ඇය විවාහ බන්ධනයෙන් මුදවා ඉවත් කිරීම වෙනුවට ඇයත් පසුවෙද්දී තවත් විවාහ කරගත හැකිය.

11. සන්තාන අභිවෘද්ධියෙහි එනම් ළමයි ඇති කිරීමෙහි ස්ත්‍රියට වඩා පිරිමියා ශක්තිය ඉහළ තත්ත්වයක වේ : ළම යෙක් බිහි කරනු වස් වූ කායික ශක්තිය ගැන ගණනය කරද්දී සාමාන්‍යයෙන් පිරිමියෙකුගේ ශක්තිය අවුරුදු හැට වනතෙක් පවතින බව සාක්ෂාත් වී ඇත. නමුදු ස්ත්‍රිය තාරුණ්‍යයේ අවපසට පත්වන වයස අවුරු හතළිස් පහ

පතහ වන විට ඇගේ රජඃ ස්තම්භනය හෙවත් මාසික මසපය නැවතී සන්තාන අභිවෘද්ධියක් කළ නොහැකි තත්ත්ව යකට පත් වන්නාය. කාන්තාව තම වයස හතළිහ වන විටම ඒ ශක්තියෙන් ඉවත්වන අතර සමහර පිරිමින් තම සියවන මහළු වයසේ පවා එවන් ශක්තියකින් පසුවන සම්සෂණවලින් හෙළි වී ඇත.

12. දෙවැනි බිරිඳක් ලබා ගැනීමෙන් පළමුවන බිරිඳ යම් පහසුවක් සහ කාර්ය බහුලත්වයෙන් සැනසීමක් ලබන්නේය. පිරිමියාගේ දෙවැනි විවාහය පළමුවන බිරිඳ තම ස්වාමියාට දෛනිකව කළයුතු විවිධ මාදිලියේ වැඩ කටයුතුවලින් යම් නිදහසක් සහ පහසුවක් ලබන්නේය. විවාහයෙන් පසු දීර්ඝ කාලයක් ස්වාමියාට සේවය කර වයසට හෝ මහළු භාවයට එළඹී විඩාවට පත් වන කළ ඇයට භාර ස්වාමියාගේ යුතුකම් නිසිරිසි ලෙස කළ නොහැකිව දුක්කරදරවලට සහ විඩාවට පත් වන්නාය. එවැනි අවස්ථාවන්හී තම ස්වාමියාගේ දෙවැනි විවාහය ඇයට පහසුවක් නොලබා දුෂ්කරයක් ඇති කරන්නේදැයි මඳක් විමසා බැලීම වටී.

13. දුගී ලඳකට විවාහ ජීවිතයක් භුක්ති විඳීමට අවස්ථාව ලැබීම : එසේ දුප්පත් කන්‍යාවියට හෝ වැදවුය කාන්තාවකට හෝ විවාහ ජීවිතයක් භුක්ති විඳීමට සළස්වා ඇයට සැපවත් ජීවිතයක් භුක්ති විඳීමට සළස් වන කළ එයට පිණක් සහ විශාල සුවිපාකයක් අල්ලාහ්ගෙන් ලබන්නේය.

14. බහු විවාහය අනුමත කළේ ඥානාන්විත අල්ලාහ් දෙවිඳු විසිනි. දයාබර අල්ලාහ් දෙවිඳු තම කීකරු අත වැසියාගේ ඕනෑඑපාකම් ගැනද ඔහුට පින් ලබා දියයුතු යන්නත් මනාව දන්නා සර්වඥයකි. මෙ මැයෙන් බලන කළ ඉස්ලාම් දහම බහු විවාහය නිත්‍යානුකූල කර ඇති සූක්ෂමත්වය ඉතා පැහැදිලිය. සර්වඥාන අල්ලාහ් දෙවිඳු විසින් අනුමත කරන

ලද බහු විවාහය ගැන වක්‍රව දකින්නන් සහ එයට අකුල් හෙලන්නන් මවුන් බහු විවාහය සහ එහි යථාර්ථය ගැන මනා දැනුමක් නැති අයෙක් මිස අන් කවරෙක්ද?

කාන්තාවට සේසත් උරුමකම් පවරා දීම : ඉස්ලාම් බිරිඳ, මව, සහෝදරිය, දුව සහ අනෙකුත් ලෙස සේසත් ලැබීමට උරුමකම් ඇති කාන්තාවට ඇගේ පෙළපත් උරුමය තුලින් පාරම්පරික සේසත් අයිතිවාසිකම් පවරාදී සම්භාවණයට පත් කර ඇත්තේ අන් කිසිදු දහමක නැති අන්දමින්ය.

පරම්පරා සේසත් උරුමයෙන් පිරිමියෙකුට ලබන ප්‍රමාණ යෙන් අඩක් කාන්තාවක් උරුමයක් ලෙස ලැබීම ඉස්ලාම් දහම කාන්තාවට කර ලබාදී ඇති යුක්තිගරුක වරප්‍රසාදයකි. ඉස්ලාම් දහමේ පොල්මක්කාර උරුම බෙදීම ගැන එහි ඇති නිපුනත්වය ගැන මනා දැනුමක් නැති, ඒ ගැන අනූන අධ්‍යයනයක් නොකර බොහෝ දෙනෙකු තම මත ඉදිරිපත් කිරීම ඇත්තෙන්ම මවුන්ගේ අනුවන කමයැයි කිව හැකිය. පරම්පරා සේසත් ලැබීමේදී ස්ත්‍රියක් ලබන කොටසකට වඩා දෙගුණයක් පිරිමියෙකු ලැබීමට සැළැස්වීම තම අතවැසියන් කෙරෙහි අති කරුණා වන්ත ඥානාන්විත අල්ලාහ් දෙවිඳුගේ නියමයකි. මෙහි අයුත්කියක් අසාධාරනයක් තිබේද? ඉස්ලාම් දහමේ පරමාධිපත්‍ය නීතිරීති එකිනෙකට සබඳතාවයක් ඇති කරමින් මිනිසාගේ පැවැත්මට සෙතක් සළසන සම්පූර්ණ නීති පද්ධතියකි. එහි ඒ ගැන මනා අධ්‍යයනයකින් තොර ඒ නීතිරීති කාන්තාවට අයුක්තියක් ඇති කරනවා යැයි කියා හෙලා දැකීම අනුවණ ක්‍රියාවකි.

මෙය යථාර්ථය මනා ලෙස දන්නා තම අත වැසියන් ගේ සුභසිද්ධිය තකා අති ඥානවන්ත අල්ලාහ් දෙවිඳු විසින් මිනිස් සමාජයට දී ඇති විශාල වරප්‍රසාධයකි. එසේනම් ඉස්ලාම් දහම පිරිමියාට බහු විවාහය අනුමත කර දී කාන්තාවට

සළකන්නේ අති පහත් අන්දමින් යැයි කීම කෙසේ සාධාරණීය කරන්නද? ඉස්ලාම් දහම අසහාය නීති ගොන්න කින් බැඳී සම්මිශ්‍රව ක්‍රමවත් සර්ව සම්පූර්ණ දහමකි. මෙවන් විචක්ෂණ පරමාධිපත්‍ය නීති මාලාව මිනිස් සමාජය වෙතින් ඉවත් කිරීම කිසිසේත් සුදුසු නැත. එහෙයින් මෙවන් නීති දෙස විවේචණාත්මක බලන්නන් වක්‍ර දෘෂ්ටියකින් පමණක් තම දෘෂ්ටිය නොහැ සුරුවා ඒ දිනා පුළුල් ලෙස විවෘත සිතෙන් බලන්නේ නම් එහි ඇති විපුලත්වය, යථාර්ථය සහ ඒ නීති පද්ධතීන් විදහාපාන සූක්ෂම සාදාරණත්වය සහ සත්‍යය මනා ලෙස වටහා ගනු ඇත.

තමා විවාහ කරගන්නා ස්ත්‍රියට තීන්දු කළ මහර් හෙවත් මංගල දීමනාව මුළුමනින්ම ගෙවා දමන ලෙස යුතුකමක් ලෙස ඉස්ලාම් දමහ තදින්ම අවවාද කරයි. තමා විවාහ වන ස්ත්‍රියට තම කැමැත්ත ප්‍රකාර මහර් තොගයක් තීරණයක් කරන්නේ නම් එය ගෙවා දැමීම පුරුෂයාගේ යුතුකමකි.

පවුලක පියා ජීවිතක්ෂයට පත්වූ විට පවුලේ අය අතර ඔහුගේ සේසත් බෙදී යන අන්දම ගැන ඉස්ලාම් දහම මෙසේ කරුණු විස්තර කරයි. උදාහරණයක් වශයෙන් පවුලක ප්‍රධානියා පියා පුතෙක් සහ දුවෙක් උරුමක්කාරයන් ලෙස තබා ජීවිතක්ෂයට පත්වන කළ ඉස්ලාමීය ෂරීආ නම් පරමාධිපත්‍ය නීති පවසන අන්දමට පියාගෙන් දුව ලබන ප්‍රමාණයට වඩා දෙගුණයක් පුතා ලැබිය යුතුය. දුව සහ පුතා තමාට අයත් සේසත් ප්‍රමාණය ලබා ගත් පසු ඔවුන් විවාහ ජීවිතයකට ඇතුල් වනවා යැයි සිතමු. පිරිමියා විවාහ ජීවිතයට ඇතුල් වන කළ ඔහු තම විවාහ වන කාන්තාවට ඉල්ලන මහර් ප්‍රමාණය දිය යුතුය. ගේදොර සහ තම නිවසට උවමනා අනෙකුත් ගෘහ භාණ්ඩ ඔහු විසින්ම ගත යුතුය. තම

බිරිඳගේ, ළමයින්ගේ සහ පවුලේ අනෙකුත් වියදම් ඔහු විසින්ම දැරිය යුතු බව ඉස්ලාම දහම තරයේ කියා සිටී.

නමුදු කාන්තාව ඇය විවාහ වන විට තමා සැමියාගෙන් තමාට උවමනා පරිදි මහර් ප්‍රමාණය ඉල්ලා ගනී. ඇය තම ස්වාමියාට කිසිදු මංගල දීමනාවක් දීමට උවමනා නැත. ඔහු වෙනුවෙන් වියදම් කිරීමට ඇයට වගකීමක් නැත. ළමයින් ගේ වියදමට සැමියා භාරකාරයා ලෙස වෙද්දී ඔවුන්ට වියදම් කිරීමේ කිසිදු බලකිරීමක් ඇය මත නොපැවරේ. නමුදු ඇය තම පියාගෙන් සේසතක්ද තම සැමියාගෙන් මහරයටද උරුමක්කාරයෙකු ලෙසද වන්නීය. මෙසේ ඉස්ලාම් දහම විශාල යුතුකම් සම්භාරයක් පිරිමියා මත පටවද්දී පිරිමියා ලබනවාට වඩා අඩක් තම උරුමය ලෙස ලබා ගැනීම අසාධාරණයක් වන්නේදැයි කෙසේද?

ඉස්ලාම් දහම කාන්තාවට ඉතා අඩු ප්‍රමාණයක වග කීම් පවරා ඇය සම්භාවණයට පත් කර ඇත්තේ මේ විලසිනි. මිනිසා විසින් සංස්ථාපිත නීති ඇයට සාධාරණයක් ඉටු කරන්නේද, නොඑසේ නම් සර්වඥාන අල්ලාහ් විසින් පහළ කළ පරමාධිපත්‍ය නීති සම්භාවණයට පත් කරන්නේද? මිනිසා විසින් සම්පාධිත නීති කිසිසේත් කාන්තාව සම්භාවණ යට පත් නොකරන්නේය යන්න සක්සුදක්සේ පැහැදිළිය. තවත් අයුරකින් පවසතොත් භුදේක කාන්තාව ඇගේ වයස දහඅට පමණ වනවිට හෝ එයට පෙරම තම දෙමාපියන්ගේ භාරකාරත්වයෙන් ඉවත්වී විවාහ ජීවිතයකට ඇතුල් වන්නාය. තම ආහාර සහ අනෙකුත් උවමනාවන් පසුරාගනු වස් ඇය ඒ නව ජීවිතය වෙත හැරෙන්නේය. සමහරවිට එය ඇයට මනා ජීවිතයක් සහ හොඳ ගතිපැවතුම්වලින් හෙබි චරිතවත් ජීවිතයක් ලබා දෙන්නට හැකිය.

කාන්තාව පහත් මට්ටමේ වෙළඳ භාණ්ඩයක් ලෙස, ඇගේ දේහය වෙළඳ දැන්වීමකට නැතිවම බැරි අපුල දනවන දෙයක් බවට නවීන ලොව පත්කර ඇති අවස්ථාවක ඉස්ලාම් දහම ඇයට දී ඇති තත්ත්වය කෙතරම් ඉහළද? කාන්තාව අපුල දනවන අපිරිසිදු පහළ මට්ටමේ ජීවිතයක් ලෙස ගණනයවී ඇති, ඇගේ වගකීම් භාරගත නොහැකි ස්වව සේසත් තමා සතුකර ගන්නට අයිතියක් නැති ඇයට කියා අයිතිවාසිකම් උරුම කර ගන්නට ප්‍රතිසෙෂ්ප කරන, නිතර වැරදෙහි බැඳෙන වැරදේ උල්පත යනුවෙන් නාමධාරී කරමින් පහත් අන්දමින් අවමානයට පත් කරමින් තක්සේරු කරන ප්‍රතිපදාවන් අතර ඉස්ලාම් දහම ඇයට දී ඇත්තේ උසස් ස්ථානයකි. විවාහ බන්ධනයක් තුලින් ලබාගන්නා බිරිඳ තමා සේසතේ එක් වෙළඳ භාණ්ඩයක් බවට පත්වන අවස්ථාවක ඉස්ලාම් දහම කාන්තාවට දී ඇති ගෞරවය අති මහත්ය. තවත් සමහර ප්‍රතිපදාවන් නියෝජනය කරන සමාජයන් කාන්තාවට ආත් මයක් තිබේද ඇය මිනිස් ඝණයට අයත් ආත්මයක්ද යනුවෙන් වූ කුකුසෙහි පසුවෙමින් කාන්තාව පත්කරන්නේ අති පහල තත්ත්වයකට බව සක්සුදක්සේ පැහැදිලිය.

මෙසේ කාන්තාව ඉස්ලාම් දහම තුල අසහාය පවුල් ජීවිතයක් ගත කරන කෙනෙකු විලසින්ද දෙමාපියන්ගේ සෙවනේද, තම ළමයින්ගේ ආදරණීය සැළකිල්ලේද, ඇය ළමා වියේ, තාරුණ වියේ, මහළු වියේ හෝ වේවා ධනවතෙක්, දුගියෙක් ලෙස හෝ ලෙඩෙක් ලෙස හෝ හොඳ ශරීර ශක්තියක් ඇති කෙනෙකු ලෙස හෝ දුබල කෙනෙකු ලෙස හෝ තම කුඩුම්ප දිවිය තුල සමාධිමත් ජීවිතයක් ගතකරන්නෙය.

සමහර මුස්ලිම් රාජ්‍යයන්හීද තමා මුස්ලිම්වරයෙකු යැයි පව සන්නා තුලද කාන්තාවට ඉස්ලාම් දහම දී ඇති ඒ අසහාය වරප්‍රසාධ සහ සම්භාවණීයත්වය ගැන දැනුමෙන් තොරව ඒ

ගැන විවෙචණය කිරීම කණගාටු දායක සංසිද්ධියකි. මන්දයත් මවුන් ඉස්ලාමීය දහම කාන්තාවට ලබා දී ඇති ඒ නීතිරීති සහ එහි සූක්ෂමත්වය මනා අන්දමින් අධ්‍යයනය කර නැති හෙයින් විනා ඒ නීතිරීතිවල ඇති දුර්වලත්වයක් හෝ ඌනතාවයක් නිසා හෝ නොවෙ. ඒ ආගමික නීතිරීති නිසිරිසි ලෙස පිළිපදින්නන් ඒවා පිළිපදින විට කරන වැරැද්දක් නොවන්නට ඉස්ලාම් දහමේ නීතිරීතිලට කිසිදු අඩුලුහුඩුකමක් නැති බව වටහා ගනු වටී.

ඉස්ලාමීය යහමග සහ එහි යථාර්ථ නීතිරීති නිසිලෙස පිළිපැදීමෙන් පමණක් මුස්ලිම් වරයා මෙවන් වැරැදි අවබෝධවලින් තම වැරැදි නිරාකරණය කර ගත හැකිය. විවෘතව පවසනවානම් ඉස්ලාම් දහම කාන්තාවට දී ඇත ආරක්ෂාව, සැළකීම, සහ ආදරය, සහ දයාව වැනි සියළු ක්ෂේත්‍රයේම දී ඇත්තේ අති උසස් තැනකි.

බුද්ධිමත් යැයි සැළකෙන වත්මන් ලොව අප පෙර සඳහන් කළ කිසිදු කරුණක් ගැන විවෘත දෘෂ්ටියෙන් බැලුවේ දැයි විමසා බලන්නේ නම් නැත යැයි පැවසිය හැකිය. ස්ත්‍රිය යනු හුදෙක් කාමසුඛය සන්තර්පනය කරන කම්සැප සුවයේ එක් අංගයක් ලෙස සළකයි. තවද ඇගේ පතිවත සහ විතිවිද පෙනෙන ඇඟපසඟ වැසෙන අයුරු පළඳින ඇඳුම්පැළඳුම් වැනි කාන්තාව ආරක්ෂිත කටයුතු ගැන තක්සේරු කරන්නේද පසු ගාමී පිළිවෙතක් ලෙසය. එසේම කාන්තාවගේ පහස සහ සමීපත්වය ගැන ප්‍රියවන අය හුදෙක් අලංකාර හැඟීම්බර මස් පිණ්ඩයකින් සමන්විත භාණ්ඩයක් ලෙස ඇය දෙස බලයි. ඒ ස්ත්‍රිය මවුන්ගේ දෘෂ්ටි කෝණයෙන් හුදෙක් කාමසුඛය ලබාදෙන බලනවිට ඉස්ලාම් දහම ඇය දෙස තම දෘෂ්ටිය හරවන්නේ පවුල් ජීවිතයේ සමාධිය ලබාගත හැකි අති උසස් කෙනෙකකු ලෙසයි. ස්ත්‍රියගේ තත්ත්වය මෙසේ වෙද්දී ඇය

තම අලංකාරය සහ ස්ත්‍රීත්වය කිසිදු සභ්‍යත්වයකින් තොරව ප්‍රදර්ශනය කරමින් කටයුතු කිරීම දුක්ඛිත කරුණකි. එසේ ඇය හැසිරීම සමාජ සාරධර්මය විනාශවී එහි විත්තැහියට සහ දුසිරිත්වලට පත්ව සමාජ පැවැත්ම අන්ත ප්‍රපාතයකට ඇද වැටීම ගැන වටහා ගන්නේ ඉතා සුළු අන්දමිනි.

ඒ කරුණ දෙස තවත් ආරයකින් දෘෂ්ටිය යොමු කරන විට ඉගැන්වීමට, ඉගෙන ගැනීමට වැනි අධ්‍යයනය කටයුතු නිරත වනු වස්, සමාජය තුල අසාභ්‍යය වැපිරීමට මගක් වන තම කළව සහ ලැම විවෘත කර එහි අලංකාරය පෙන්වාගෙන ඇවිදීම අතර ඇත්තේ කුමණ සම්බන්ධයක්ද? දුහුල්, තද, අනුන්ට නොපෙන්විය යුතු තම කය විනිවිද පෙනෙන කොට ඇඳුම් ඇඳගෙන අධ්‍යාපන කටයුතුවල යෙදීම සහ එහි නිකේත නවලට යෑම අධ්‍යාපනයට සහ සංස්කෘතියට සේවයක් කරන්නටද නොවන්නට ඒවාට අයත් තිල ඇඳුම්ද?

වෙළඳ දැන්වීම්වලද අනෙක් සමහර වෙළෙඳ කටයුතු හා සම්බන්ධ මධ්‍යස්ථාවලද රූබර කාන්තාවන් සහ කාන්තාව න්ගේ අලංකාර රූප යොදා ගනිමින්ද කටයුතු කිරීම ඒ වෙළඳ කටයුතුවලට ලබා දෙන සම්භාවණීයත්වය කුමක්ද? අලංකාර කාන්තාවන් හැර අන් අය කෙරෙහි මවුන්ගේ බැල්ම නොහැරෙන්නේ ඇයි? එසේ මවුන් පාවිච්චි කළ ඒ ළඳුන්ගේ අලංකාරය සහ සැරසිල්ල මවුන්ගෙන් ඉවත්වී විරූපී තත්ත් වයට පත්ව වයසට පත්වූ විට කාලය ඉකුත්වූ භාණ්ඩයක් බවට පත් වන්නේය. මෙවන් කුහක සමාජය තුල රූවෙන් මඳක් අඩු කාන්තාවගේ තත්ත්වය කුමක්ද? මව්වරුන්ගේ, ගැබිණි මවකගේ, තරමක වයෝවෘධ කාන්තාවකගේ තත්ත්වය කුමක්ද යන්න මඳක් සිතා බැලීම වටී.

කෙටියෙන් පවසතොත් සමහරවිට එසේ තම අලංකාරය සහ ඇඟපසඟ දර්ශනය නොකරන කාන්තාවකගේ තත්ත්වය

හුදෙක් තිදි යහනේ කෙලි බඩුවක් ලෙස අවසන් වන්නේය. කාන්තාවගේ ඒ මැදිවිය සහ මහළු විය අසා බලන්න කෙනෙකු නැතිව හුදෙකලාව ගතවන අවස්ථා අපමණය. තවත් සමහර අවස්ථාවන්හී ඇගේ ජීවිත කාලයට උවමනා අන්නපාන, ඇඳුම්පැළඳුම් සහ බෙත්හේත් වැනි දේ සපුරා ගන්නට ඇයට මාසික විශ්‍රාම වැටුපක්, වෙනත් සුළු මාසික දීමනාවක් හෝ ලැබෙන අතර තවත් සුළුසුළු වරප්‍රසාධද ලැබිය හැකිය. නමුදු තාරුණ්‍යයේ තම ඇඟ විකුණා අලංකාරය පෙන්වා ප්‍රසිද්ධියේ මස්තකයක සිටි ඇයට එවන් සුළුසුළු මුදල් ආධාර විනා ඇයට ඇය ගැන ආදරයෙන් කරුණාවෙන් සළකන්නට ලේනැයන් හෝ පිටිවහල් කරුවන් හෝ ලබා ගැනීම ඇත්තටම අසීරු කරුණකි.

ඉස්ලාම් දහමේ කාන්තාවගේ වයස වැඩිවන්න වැඩිවන්න ඇගේ ගෞරවයද වැඩි වන්නේය. විශාල අන්දමින් ඇගේ අයිතිවාසිකම්ද සුරකින්නේය. ඇය මනාව ඇගේ ළමයින්ගේ වගකීම් ඉටුකරනවිට, ලේ නෑයන්ගේ සහ පවුලේ අනෙකුත් සාමාජිකයන්ගේ මිනැ එපාකම් සපුරා යුතුකම් කරන විට, පවුලේ අනෙකවිධ යුතුකම්ද හැකි අයුරෙන් සමාජයේ යුතුකම් ඉටුකරන විටද ඇයට හැකි අයුරෙන් උපකාර කර සම්භාණියත්වය සුරකීම කෙරෙහි ඉස්ලාම් දහම ඇයට දී ඇත්තේ අති උසස් ස්ථානයකි. එසේම පවුලේ වගකිව යුතු කාන්තා වක් නිසා ළමයි, නෑයන්, පවුලේ අය සහ සමාජ වැසියන් වෙතින්ද ඇයට සමහාවණීය ස්ථානයක් ලැබේ.

චරිතවත් කාන්තාවක් තම ඇඟපසගේ, අලංකාරයේ අනුන්ට නොපෙන්විය යුතු අවයවයන් ආවරණය කර ඇඳුම් ඇඳීම පසු ගාමී පිළිවෙතක් ලෙස නවීන සමාජ ව්‍යූහය වෙතින් නැගෙන මැසිවිලි අනන්ත අප්‍රමාණයි. මෙම මැසිවිල්ල කිසිදු සාධකයක් නැති එකක් බව ඒ ගැන අධ්‍යයනය කරන්නේ නම් වටහා

ගත හැකිය. ඇත්තෙන්ම කාන්තාව තමා ආවරණය කළයුතු අලංකාරය නිරාවරණය කර ඇඳුම් ඇඳීම පසුගාමීත්වය ලෙස විස්තර කළ හැකිය. මන්දයත් වනාන්තරයේ මිටියාවතේ සහ එවැනි අනෙකුත් අප්‍රසිද්ධ ස්ථානවල අඩ නිර්වස්ත්‍රව වෙසෙන අය ඇඳුම් නොඇඳින්නට සිදාදියේ මාර්ගවල ඇවිදිය නොහැකිය යන්න මා නොකියාම ඔබ වටහා ගනු ඇත.

තවද ඒ වනවාසීන් සිදාදිය දෙසට ඇදෙන මොහොතක් මොහොතක් පාසාම ඔවුන්ගේ ඇඟපසඟ අලංකාර කරන ඇඳුම් පැළඳුම්ද වැඩි වන්නේය යන්න නොකිව මනාය. එසේම ඒ ස්ත්‍රිය තම අලංකාරයන් පිටට නොපෙනෙන අයුරු පසුගාමී පිළිවෙතක් ලෙස කැකෝ ගසමින් තමන් උසස් සමාජ පැවැත්මක් ඇති අයයැයි පවසන සමාජය වසන නාගරයන් පළමුවන ලෝක යුද්ධයෙන් පසු නිර්වස් ත්‍රය වෙත ක්‍රමිකව ඇදෙනවිට ඒ වනවාසී සමාජය සභ්‍ය ඇඳුම් ඇඳීම අධික කරමින් පවතින්නේය. නමුදු මේ නිර්වස්ත්‍ර සංස්කෘතිය වත්මනයේ අති උසස් තත්ත් වයක පත්ව සිටීම ඉතා කණගාටු දායක සිදුවීමකි.

ඉස්ලාම් දහමේ කාන්තාවට දී ඇති සම්භාවණීය ස්ථානය ගැන අප පෙර දැක්වූ සමහර කරුණු ගැන අවධානය කරන විට ඉස්ලාම් දහම කාන්තාවට දී ඇති උසස් ස්ථානය සහ ගෞරවය ගැන කුමට කියන්නද? ඉස්ලාම් දහම කාන්තාවට දී ඇති අති උසස් අවස්ථාවෙන් ඇය ඉවත් වන කළ ඒ නීතිරීති උල්ලංඝනය කරන කළ ඇය ඉස්ලාමීය ව්‍යුහයෙන් බොහෝ දුරට ඇත්වී හීනයට පත්වීම නොකිව මනාය.

ප්‍රශ්ණ සහ එවාද පිළිවදන්

අප මෙතෙක් ඉස්ලාම් දහමේ උසස් ස්වභාවය ගැනද එහි පුළුල් දෘෂ්ටිය ගැනද එය පවසන අසහාය නීතිමාලාව ගැනද මිනිසාට ඉස්ලාම් දහම කෙරෙහි ඇති උවමනාවද ගැනද

විස්තර කරන ලද කරුණු තුලින් ඒ දහම මිනිසාගේ අභිවෘද්ධියට නැතිවම බැරි දහමක් යන්න සුපැහැදිලිය. නමුදු එහි අද්විතීය සංකල්පය සහ නීතිරීති ගැන යම් දැනුමක් ලබාගත්තද ඒ දහම ගැන තවමත් සමහර කුහල දනවන ප්‍රශ්න ඔබ සිත් තුල පැන නැගීම සර්ව සාදාරණයි.

ඉස්ලාම් දහම මෙසා යුක්තිගරුක උසස් විනය පද්ධතියක් තමා සතු කරගෙන ඇති අසහාය දහමක් වුවත් වත්මන් මුස්ලිම් සමාජය උසස් විනයගරුක සමාජයක් ලෙස වැජඹී මෙන් වැලකී ඇත්තේ මක්නිසාද? එසේම මුස්ලිම් සමාජය ඉස්ලාම් අණපනවන නීතිරීතිවලින් ඈත් වූ සමාජයක් ලෙස පත්ව ඇත්තේ මක් නිසාද? එසේම ඒ දහම මත පැටවෙන මුරණ්ඩුකම, ප්‍රචණ්ඩත්වය, මූලධර්ම වාදය යන්නෙහි තේරුම කුමක්ද? යනුවෙන් ඔබ පහදා ගන්නට ඔබ සිතට තුල පැන නගින ප්‍රශ්ණ කීපයකි. අල්ලාහ් දෙවිඳුගේ අනුග්‍රහයෙන් ඉස්ලාමය තුලින්ම ඒවාට පිළිවදන්දීම අති පහසු කරුණකි.

1 පසුකාලවලදී ජීවත්වන මුස්ලිම්වරුන්ගේ ජීවිතය ඉස්ලාමයේ යථාර්ථය පිළිබිඹු නොවූවා යැයි කිව හැකිය. මෙම කාල පරිච්ඡෙදය තුල ජීවත්වන ඒ මුස්ලිම්වරුන්ගේ ජීවනමග ඉස්ලාම් දහම පිළිබිඹු වන අවස්ථාවක් ලෙස පත් කිරීම කිසිසේත් යුක්ති සහගත නැත. මන්දයත් මේ හේතුවෙන් ඉස්ලාම් දහම මේ ජනයන් බෙදුම්වාදය කෙරෙන්ද, දුගී භාවයෙන්ද, නිහීන කමෙන්ද මුදවා ගත්තේ නැත යන මතයක් පවතී. ඉස්ලාම්හී යථාර්ථය ගැන මනාව වටහා ගන්නට බලාපොරොත්තු වන්නේ කවරෙක්ද ඉස්ලාම් දහමේ මූලාශ්‍රයන් දෙක වන අල්කුර්ආය සහ මුහම්මද් තුමාගේ සුන්නා සංකල්පය තුලින්ද, එසේම ඉස්ලාම් දහමේ මුල් සමාජ වැසියන්ගේ ශ්‍රධාවන්ත ජීවනමග තුලින්ද වටහා ගැනීම ඔවුන්ගේ වගකීම වේ. එසේම ඉස්ලාම් දහම ගැන අනූනව ලියන ලද පොත්පත්

වලින්ද ඒ දහමේ යථාර්ථය මනාව වටහා ගන්නට මවුන් උත්සාහ දරපුදෙන්. මවුන් විවෘත මනසින් ඉස්ලාම් දහම ලෙස බැලී නම් ඉස්ලාම් දහම සියළු යහමග වෙත මිනිසා අමතන බව කිසිදු කුකුසෙන් තොර වටහා ගනු ඇත. ඉස්ලාම් දහම සමාජයට වැඩදායී ශිල්ප හදාරා ඒ අනුව කටයුතු කරන ලෙස අනුශාසනා කරන අතර මිනිස් සමාජය අතර සමාජ බැඳීමක් කෙරෙහි සහ සාමූහික ඒකාග්‍රතාවය කෙරෙහි අමතන බව මවුන් වටහාගනු ඇත.

තමුන් මුස්ලිම්වරුන් යනුවෙන් පවසමින් ඉස්ලාම් දහමට සම්පූර්ණයෙන්ම පටහැනිව කුඩා හෝ වේවා විශාල හෝ වේවා කරන කටයුතු, එය ඉස්ලාම් දහමට අයත් ක්‍රියාවක් යනුවෙන් තීරණය කරමින් ඉස්ලාම් දහමට අවලාද කරන අවස්ථාවක් ඇති කර ගැනීමට උත්සාහ දැරීම වැරදි සහගත ක්‍රියාවකි. මන්දයත් ඉස්ලාම් දහම එවන් වැරදිවලින් එපිට වූ සාරධර්ම දහමකි. ආරාවුල් සහ කලබල ඇති කරන්නන් ගේ අඩුවම ආරා වුල් කලබල ඇති කරන්නන් හටම නියම විය යුතුය. මන්දයත් කලබල කරදර ඇති කරන ලෙස ඉස්ලාම් දහම කිසිසෙත් මවුන්ට අනුමත නොකරන අතර මවුන් එවැනි භීෂණවලට සහභාගි නොවන ලෙසද සම්පූර්ණයෙන්ම අවවාද කරයි.

තවද ඉස්ලාම් දහමේ යුක්තිය ඒ දහම යථා අන්දමින් සෘජුව පිළිපදින්නන්ගේ තත්ත්වය මතද එය ස්වකාර්යයන්හීද පිටස් තරයන්ගේ කාර්යයන්හීද ක්‍රියා කරන අන්දමද අවධානය කරන ලෙස මවදන් දෙයි. එසේ අවධානය කිරීම සිත්සතන් මේ දහම සහ එය පිළිපදින් නන් ගෞරවයෙන්ද සහ උසස් චින්තනයෙන්ද පිරෙන්නට සළස් වන්නේය. මන්දයත් ඉස්ලාම් දහම මවදන් දෙන කරුණු කුඩා හෝ වේවා විශාල හෝ වේවා ඒ කෙරෙහි උනන්දු කිරීමෙන් විනා ඉවත්වී සිටියේ

නැත. ආරාවුල් සහ නිහීන භාවය ඇති කළ හැකි සියළු මාර්ගයන්ද නොවළක්වා මුනිවත රැක්කේද නැත. එහෙයින් ඉස්ලාමිහී ඒ ප්‍රතිපදාවන් උසස් ඉලක්කය උදෙසා බිහි වූවක් යනුවෙන් සිතන්නන්, එහි යුතුකම් නිසිලෙස ඉටු කරන්නන්ද තම ආත්ම විනයෙහිද අනෙකුත් භාහිර විනයාශ්‍රිත කටයුත් තන්හීද උසස් ගතිපැවතුම්හීද එය උසස් අන්දමින් පුහුණු කිරීමේ කටයුත්තෙහි නිරත වීමටද පසුබට වූයේ නැත. ඔවුන්ගේ එවන් අසහාය චරිත ගැන ඔවුන්ට අසල සහ දුරස්ථව සිටින්නන්ද එකඟ වන්නන්ද, ප්‍රතිසෙප්ප කරන්නන්ද සාධකව සිටයි.

එහෙයින් ඉස්ලාම් දහම ගැන තක්සේරු කිරීමට තම දහමීය ක්‍රියාපරිපාටියෙහි සීමාව ඉක්මවා කටයුතු කරන්නන් ගේද, ඍජු මාර්ගයෙන් නොමග ගිය මුස්ලිම් වරුන්ගේ ක්‍රියාවන් දෙස බැලීම කිසිසෙත් යුත්කිසහගත නැත. එසේ ඔවුන්ගේ ක්‍රියා දෙස බලා ඉස්ලාමය ගැන තක්සේරු කිරීමට උත්සාහ කිරීම අයුක්තිසහගතය.

2. ඉස්ලාම් දහම ගැන මනා දැනුමක් නැතිව කටයුතු කිරීමද නූතන මුස්ලිම් සමාජය පසුගාමී තත්ත්වයකට පසු වන්නට තවත් හේතුවක්යැයි කිව හැකිය. දහම පවසන නීතිරීති සහ ඔවදන් ඉවත දමා තම සිතට වහල් වී දහමීය නීතිරීතිවලට පිටුපා, එහි සීමාව ඉක්මවා කටයුතු කළ අවස්ථාවන්හී වීනා ඔවුන් තමනතර වෙන්වූයේද, නිහීන තත්ත්වයට හෝ පිරිහීමකට පත් වූයේද නැත.

ඉස්ලාම් දහම උසස් සංකල්පයකින් හෙබි ප්‍රගතිසාමී දහමකි. යථාර්ථ හදමනසකින් ඒ දහම පිළිපැදු අවස් ථාවේ ලොක ජනතාව සියවස් කීපයක් ඔවුන් සමග සමීපව සිටියේය. එවිට නීතිය, යුක්තිය, ශීලාචාර සාර ධර්මය, අනේකවිධ කලා ශිල්පද අන් සියළු සමාජයන් ඔවුන් නිර්මා

ණය කළ විශ්මිතව නිර්මාණයන් දෙස බලන විලසින් මවුන් සාක්ෂාත් කරගෙන සිටියහ. කුරුස යුද්ධ යෙන් පසු ඒ මුස්ලිම්වරුන්ගේ ඥාන ප්‍රදීපාලෝකයෙන් මවුන්ගේ කලා ශිල්පයන් දිදුලන්නට පටන් ගත් පසු වීනා පිටස්තර ලෝක වාසීන් ඒ ක්ෂේත්‍රය තුල කිසිදු ප්‍රගතියක් ලබාසිටියේ නැත.

අඳුරු යුගය යනුවෙන් ඉතිහාසය සනිටුහන් කරන අඥානයේ අඳුරු අගාධයක කිමිදෙමින් සියවස් කීපයක් පසුවූ සමයක මවුන්ගේ පාලකයන්, නායකයන්, කලා ශිල්ප ඇදුරන් ලෙස මුස්ලිම් සමාජවැසියන්ය නියෝජනය නොකළේද? ඒ නායකත්වයේ නියෝජනයේ ආත්මීය අධ්‍යාත්මීය දහම ලෙසද, යුක්තිය ලෙසද, කරුණාව ලෙසද, දිදුලන්නට වූයේ ඒ අඳුරු යුගයේ බිහිවූ ඉස්ලාමීය ශිෂ්ටාචාරය වේ. සතුරන්ද, මිතුරන්ද, විකල්ප අදහස් දරන්නන්ද, හුදු සමාජ වැසියන්ද එයින් අසහාය උපකාර සහ පිටිවහලක් ලබන අයුරු ඒ ශිෂ්ටාචාරයේ සෙවනැල්ල ප්‍රසාරණව පැවතුනා යැයි කීවා නම් එය මුසාවාදයක් නොවේ.

මුස්ලිම්වරුන්ගේ සියළු ක්ෂේත්‍රයේ ප්‍රගතියට මවුන්ගේ දහම බාධාවක්ද? යථාර්ථ දියුණුවට බාධාවක්ද? සියවස් කීපයක් සත්‍ය දහම ප්‍රතික්ෂේප කිරීමේ පාරාසයක සිටි මවුන්ට මවුන්ගේ ප්‍රතික්ෂේප කිරීම දියුණුවක් ඇති කළේද?

ඉස්ලාමීය ලබ්ධිකයන් තම දහම නිසිලෙස පිළිපැදීමට අපොහොසත්වූ විට, ඌනව පිළිපැදු කළ, එලොව මෙලොව ප්‍රගතිය උදෙසා කළ යුතු යුතුකම් හරියාකාරව ඉටුකිරීමෙන් වළකී සිටි කළ, අල්ලාහ් දෙවිඳුගේ අඩුවමද, වෙන්වී කුලකැගැනීමද මවුන් මත පහළ විය. මිනිස් සමාජයේ ඉලක්කය ආර්ථික දියුණුව උදෙසා පමණක් ක්‍රියා නොවී ආත්ම පරිශුද්ධය කරන චරිතවත් ගුණ වගාවන් වර්ධනය වන සත්‍යය සත් මාර්ගයද ඒ සමග සම්මිශ්‍රණය විය යුතුය.

ආර්ථික සංවර්ධනයේ ශිකරයේම පසුවූ ප්‍රතිසෙෂ්ප කරන සමාජය ආත්මීය පරිශුද්ධ සන්මාර්ගයක් දෙස තම බැල්ම හෙළීමට අමතක කළේය. දුමග සහ අරාජකවාදයේ මඩ ගොහරක වැටී මංමුලා විය. ඒ සමාජ වැසියන් ලබාගත් ආර්ථික වර්ධනය ඔවුන්ගේ සමාජ සාර ධර්මය වර්ධනය කරන්නට තරම් ඉවහල් වීද? ඒ සමාජය අයුක්තිය මතද, තම පාලනික පාරාසය තුල වහලුන් බිහි කිරීමේ පදනම මතද, ගිජුකම මතද, දුෂ්ට පාලනය මතද, බෙලහීන සමාජ වැසියන් මත ප්‍රචණ්ඩත්වය සහ සාහසිකත්වය මුදා හැරීම මතද තම සම්පූර්ණ අවධානය යොමු කළේය.

ඒ සමාජ වැසියන් අතර වංචාව, සොරකම, බලවතා දුබලයා තලා පෙලා කටයුතු කිරීම, ඝාතනය, මානසික රෝග සහ අපුල දනවන කායික රෝගද සර්ව සාදාරණ සංසිද්ධියක් ලෙස නොතිබුණාද? එහෙයින් ආත්ම පාරි ශුද්ධතාවයක් ඇති කරවන ඥානයක් ප්‍රතිෂ්ඨාපනය කරන සත්‍ය සන්මාර් ගයෙන් සිත්සතන් ඉවත් වී හුදෙක් ආර්ථික වර්ධනය පමණක් සාක්ෂාත් කරගැනීමේ පරම අභිලාෂයේ නිතරවීම කෙරෙහි උනන්දු වන්නන් අවසානයේදී අකුසල සහ දුර් විපාක වෙත හැරීම නොවැළැක්විය හැකි කරුණක් වනු ඇත.

3 ඉස්ලාම් දහම ත්‍රස්තවාදී දැඩිමතධාරි දහමක් යයි පවසන්නන් වෙතම ඒ පාපොච්චාරනය හරවා යැවිය යුතුව ඇත. මෙම කියමන ගවයන් තණකොළ අගිසි උලාකන සේ ඉස්ලාම් දහම ගැන උඩින් පල්ලෙන් දැනුමක් ලබා එහි නීති සංකල්පය ගැන මනා දැනුමක් නැති අයගේ කියමනකි. කෙසේ වුවද ඒ නොක්කාඩුව ඔවුන් තමා මත එවන් වැරැද්දක් පැටවෙ න්නට පෙර තමා බේරා ගන්නට කරන උත්සාහයකි.

මිනිස් දේහයේ ඇතුලත සහ පිටත ඇති වන්නාවූ රෝග ඉවත් කරනු වස් ශෛල්‍ය වෛද්‍යවරයෙකු උපයෝගී කර

ගන්නා සැතක් මෙන් සමාජයේ සෘජු පැවැත්ම උදෙසා ජිහාද් නම් සැත උපයෝගී කර ගැනීම අවශ්‍ය වන්නේය. මිනිස් සමාජයට ජිහාද්, වෛද්‍ය වරයෙකු රෝගියෙකුට ඔහුගේ සිරුර කපා කොටා කරන්නට අනුමත කරන සැතක් ලෙස සමාන කළ හැකිය. නමුදු එය මිහිපිට අල්ලාහ් දෙවිඳුගේ යුක්තියුක්ත නියෝගයන් පහදා දී, මිනිසා මිනිසාගේ පාමුල වැඳ වැටී ඔහුට ආවතේව කිරීමෙන් වළකන, ඔහු ධර්මිෂ්ඨ ජීවන රටාවක් ගත කරනු වස් අල්ලාහ්ට පමණක් කීකරු වන අයුරෙන් හැඩ ගස්වන්නට මිස ත්‍රස්තවාදය වපුරා, මිහිපිට ලේ හැලීම උනන්දු කරවන්නට නොවේ. ඉස්ලාම් දහම සමාජය කෙරෙහි නොමනා තදබල බලපෑමක් නොකරන දයාව, කරුණාව, අනුකම්පා සහගත සමාව ලබා දෙන දහමකි.

අල්ලාහ් දෙවිඳුගේ ආඥාවක් වන ජිහාද්හි නිරත වන අල්ලාහ්ගේ පිටිවහල ලබා ඇති ඉස්ලාමීය සමාජය මිනිස් සමාජයේ උසස් සමාජය ලෙස උකහා දැක්විය හැකිය. ඒ සමාජය අන් රාජ්‍යයන් තම අනසකට පත් කළ විට ඔවුන් සමග කරුණාවෙන් කටයුතු කරමින් ඔවුන් පාලනය කළේ ඔවුන් විශ්මයට පත්වන ලෙසිනි. ඒ ඉස්ලාමීය සමාජයේ පැමිණීමෙන් පසු ඔවුන්ගේ දැනුම වැඩුමට නිදහස දුන් විට ඔවුන්ගේ ඥාන උල්පත් සමාජය තෙතමනය කරමින් නිදහසේ ගලා බසින්නට පටන් ගත්තේය යන්න ඉතිහාසයේ සනිටුහන් වූ ප්‍රතික්ෂේප කළ නොහැකි සත්‍යයකි. ඒ සමාජ වැසියන් අන්ධයා බැල්ම ලැබෙන විලසින් තම සාදක මිහිපිට සනිටුහන් කර ගොස් ඇත. ඉහළ අඳුරු අඹරේ තාරකාවන් දිදුලන විලසින් ඔවුන් මිහිපිට දිදුලන්නට වූහ.

ඒ මුස්ලිම් සමාජය අසල් වැසි රාජ්‍යයන් ජය ගත් කළ උදම්මානයෙන් උඩඟු කමෙන් ක්‍රියා කළාද? සීමාව ඉක්මවා කටයුතු කළාද? අරාජක වාදය මුදා හැරියාද? මහජනයන්

මානභංගයට භාජනය කළාද? කාන්තාවන් මහල්ලන් සහ කුඩා ළමුන් ඝාතනය කළාද? ඔවුන් තම සතුරන් ජය ගත් පසු හැසිරුණු ආකාරය කෙසේද?

තමාට අනන්ත කරදර වදහිංසා කළ සතුරන් ජයගත් කළ වක්තෘ මුහම්මද් තුමා ඔවුන් හා හැසිරුණේ කෙසේද? ඔවුන්ට සමාව දුන්නේ නැත්ද? ඔවුන්ගේ සේසත්වලට වංචා නොකර ජීවිතයට කරුණාව දැක්වූයේ නැත්ද? කාන්තාවන්ගේ විලිබිය ආරක්ෂා කළේ නැත්ද? කොවිල්වල සහ ආරාමවල සිටි පූජක යන් හට කිසිදු අකටයුත්තක් කළාද? මිහිපිට භීෂණය මුදවා හැරියාද? නිවාස විනාශ කර ඵලදායි ගස් කපා හෙලුවාද? එයට පෙර සතුරන් තමාට හැකි පමණින් ඝාතනය කර මුස් ලිම්වරුන්ගේ ජීවිතවලට හානි කළ අවස්ථාවක් වෙද්දී, කුරුස යුද්ධයේදී අල්ලාහ් දෙව්දු විසින් මුස්ලිම් වරුන් වෙත ජය අත්පත් කර දුන් මොහොතේ සලාහුද්දීන් අයියූබි නම් අග්‍ර සෙනෙවියා කටයුතු කළ ආකාරය ගැන ඔබ සිහියට නගා බලනු මැන. ඔහු ඔවුන්ගේ සේනාවට සහ සේනා නායකට අති උදාර අන්දමින් සමාව දී ඔවුන්ට අවශ්‍ය ප්‍රතිකාර ලබා දී ආවතේව කළේ ඉස්ලාම් දහම ඔහුට දුන් ආඥා එහි අර්ථයෙන්ම සක්ෂාත් කරන්නට බව සුපැහැදිලිය. මෙවන් අග්‍රඝණයේ සිදුවීම් ඉස්ලාමීය ඉතිහාස පොත පමණක් නොව ලෝක ඉතිහාසයද සරසා ඇත.

එවන් අවස්ථාවන්හී ජනයන් සතුටෙන්, ආශාවෙන්, තෘප්ති මත්ව ඉස්ලාම් දහමට ඇතල් වූ ප්‍රමාණය කියා නිම කළ නොහැකිය. අප ආඩම්බරයෙන් සිහිකරන බටහිරයන් මෙවන් ශිෂ්ඨ අන්දමින් හැසිරුණාද? එයට නියම පිළිතුර ඔබ දකින අසන පුවත්ම සාධකව පවතී. ස්ටැලින්, මුසොලිනි, ලෙනින්, හිට්ලර්ල සහ සර්බියානු ත්‍රස්තවාදීන් බිහිවුනේ කිනම් ප්‍රදේශයේ සිටද? ඔවුන් බටහිර යුරෝපානු සමාජයෙන් බිහිවූ

අයැයි කිසිවෙකුට ප්‍රතික්ෂේප කළ නොහැකිය. විවිධ හේතු උකහා දක් වමින් ඔවුන් විසින් විනාශ කරන ලද මිනිස් ජීවිත මිලියන් ගණන් යැය කිව හැකිය. මිනිස් සමාජයේ විනාශයට මංපෙත්ත කැපූ ඔවුන් මිනිස් චරිත බිහි වූයේ අප හිස මත තබාගෙන නටන යුරෝපායෙන් නොවේද? ඔවුන් විසින් මිනිස් සමාජයට අත්වුනු විනාශය දුක්කරදර කොපමණ යැයි කියා නිම කරන්නද? එසේ නම් අනුකම්පා විරහිත මෘග ත්‍රස්තවාදීන් කවරෙක්ද? මිනිස් සමූලඝාතනයේ ප්‍රමුඛ යන් කවරෙක්ද? පරමානු, පොකුරු, රසායනික බොම්බ, ආයුධ සහ ඇත සිටම මිනිස් ජීවිතවලට හානි කළ හැකි අනේකවිධ උපකරණ නිර්මාණය කළේ කවරෙක්ද? පරිසරය දූෂණය කරන්නේ දූෂණය කරන්නට උපකරන නිර්මාණය කරන්නේ කවරෙක්ද? මිනිස් පැවැත්මට අහිතකර වන විලසින් ජලය සහ ගංගාවෝ අනර්ථ ගෙන දෙන අයුරු අපිරිසිදු කළේ කවරෙක්ද? කාන්තාවන් වඳ ස්ත්‍රීන් ලෙස පත් කළේ කා විසින් නිර්මාණය කරන ලද උපකරන වලින්ද? අහිංසක අසරණයන්ගේ ජේසත් කුට අත්දමින් ගසා කෑමට උත්සාහ දරන්නේ කවරෙක්ද? විවිධ සමාජ රෝග පැතිරීමට ප්‍රමුඛ වූයේ කවරෙක්ද? මෙසේ සියළු දූදන ක්‍රියාවන් වපුරමින් මිහිපිට භීෂණය මුදා හරින්නේ කවරෙක්ද? ඔවුන් යුරෝපයෙන් සහ බටහිරෙන් බිහි වූ අය නොවෙත්ද?

ඒ අසරණයන්ගේ ජේසත් උදුරාගෙන ඒ මත තමන් නිරිඳුන් යැයි ආඩම්බර වෙමින් සුඛෝපභෝගී වාහනවල සක්මන් කරන්නේ කවරෙක්ද? ඔවුන් බටහිරයන් සහ එයට ගැති අය මිස අන් කවරෙක්ද? ත්‍රස්තවාදය, දැඩි මතධාරී පිළිවෙත, අරාජකවාදය, ප්‍රචණ්ඩත්වය, භීෂණය මෙය නොවන්නේද? ඔවුන් මෙසේ ඉස්ලාම් දහම සහ මුස්ලිම්වරු වෙත මඩ ගසන්නට සූදානම් වන්නේ තම වරද වසා ගන්නට මිස

අන් කුමණ හේතුවකටද? එහෙයින් මෙවන් ත්‍රස්තවාදීන් ගෙන් තම රට, සේසත, දහම සහ සමාජය ආරක්‍ෂා කර ගැනීමට ඔවුන් තම ශ්‍රමය සහ කාලය පෙරටු කරන්නේ නම් එය ත්‍රස්ත වාදයක්ද? ප්‍රචණ්ඩත්වයක්ද?

දැනදැනම වන සිදුවීම් ගැන ගණනය කරන විට මුස්ලිම් වරු අතින් සිදුවන අපරාධ අතලොස්සකි. එය කිසිසේත් අප පෙර සඳහන් කළ බටහිර වාදීන් විසින් මුදවා හරින වැරැද්දිවලට වඩා අධික නැත. මෙසේ මුස්ලිම් වරුන් විසින් කරන ලද වැරැද්දිවලට ඔවුන් වගකිව යුතු විනා එහි විපාකය ඉස්ලාම් මත හෝ මුස්ලිම් සමාජය මත හෝ පැට වීම කිසිසේත් සාධාරන නැත. ඔවුන්ගේ සමහර මෙවන් ක්‍රියාකාර කම්වලටද සාදක නැත්තා නොවේ. මන්දයත් සතුරන් සහ අනෙක් සමාජ වැසියන් ඔවුන් වෙත මුදවා හරින අසාධාරනය, අයුක්තිය සහ ප්‍රචණ්ඩත්වය ඔවුන් මෙසේ හැසිරෙන්නට උනන්දු කරවන්නේය.

එහෙයින් උගතුන් බුද්ධිමතුන් ඉස්ලාම් දහම දෙස බලන බැල්ම සාධාරණීය විය යුතුය. උවමනාවෙන්ම ඒවා පිටුදැකීමෙන් වැළකී, සත්‍ය තතු විකෘති කොට ලිවීමෙන්, පතුරුවා හැරී මෙන්, එසේම වසං කිරීමෙන්ද වැළකී යුක්තියුක්තව කටයුතු කරන්නට වගබලා ගත යුතුය.

බටහිර බුද්ධිමතුන් ඉස්ලාම් දහම ගැන අධ්‍යයනයක යෙදුනද ඔවුන් ඒ ගැනවූ සත්‍ය කරුණු තම ක්ෂේත්‍රය තුලින් ලොවට තිසිලෙස දීමෙන් වළකීම තවත් අවසානා වන්ත කරුණකි. ඔවුන් ඉස්ලාම් දහම ගැන කුමක් ලොවට හඳුන්වා දුන්නාදෝ එයට හාත්පසින්ම සම්භාවණීය අද්විතීය අන්දමින් ඉස්ලාම් දහම විවෘතව පවතී. ඉස්ලාම් දහමේ උසස් ඉලක්කයන් සහ අභිලාෂයන් රඳා පවති න්නේ ඔවුන් විසින් ප්‍රසිද්ධ නොකර සඟවා ගන්නට

උත්සාහ දරන ඒ උත්සාහ තුලය. එහෙයින් මවුන් ඉස්ලාම් දහමේ යථාර්ථය නොදන්නවායැයි තීරණය කළ නොහැක. එසේත් නොවන්නට අපට කියන්නට ඇත්තේ මවුන් මිනිස් සම්භවයේ ගැලවීම සහ යථා පැවැත්මේ එකම විලක්කුව වන අත්විතීය ඉස්ලාම් දහමේ සත්‍ය යථාර්ථය සංකල්පයන් සහ ප්‍රතිපදාවන් මානවායගෙන් තුරන් කිරීමට කරන උත්සාහයක් මිස අනෙකක් නොවන බවය.

අවසාන ඇමතුම

අල්ලාහ් ඉදිරිපිට සම්භාවණත්වයට පත් වීමට නම් ඉස්ලාම් දහමට ඇතුල් විය යුතු නිසා එයට ඇතුල් වන ලෙස මබ අමතමි. එහි ඇතුල්විය යුත්තේ කෙසේද යන්න කෙටියෙන් විස්තර කිරීමි. යමෙකු ඉස්ලාම් දහමෙන් පිට අන් දහමන් පිළිපදින දෙමාපියන්ට දාව උපන්නේ නම් හෙතෙම පරිනත වී දැනුම වඩා ගත් කළ නැවත වරක් තම යථාර්ථ දහමට හැරීම මහුගේ පරම යුතුකමකි. එවිට මහු අල්ලාහ් හැර වැඳීමට අන් දෙවියෙකු නැති බවත් මුහම්මද් තුමා අල්ලාහ් වක්තෘ වරයෙකු බවත් සාක්ෂි දැරිය යුතුය. පසුව දේව නැමදුම වැනි තම අනිවාර්යය ආගමික කටයුතු නිසිලෙස ඉටු කළ යුතුය.

وصلى الله على نبينا محمد وآله وصحبه أجمعين.

مطابع الحميضي
AL-HOMAIDHI PRESS - TEL.: 4581000 - FAX: 4592217

# الطريق إلى الإسلام

## باللغة السنهالية

تأليف

الشيخ / محمد ابراهيم الحمد

ترجمة

عبد الحكيم محي الدين

مراجعة

محمد ناصم

دار الورقات العلمية للنشر والتوزيع

الرياض ٣٢٦٥٩ ص.ب ١١٤٣٨ هاتف :٤٢٢٨٨٣٧ ناسوخ ٢٩٣٣٤٠٧




# الطريق إلى الإسلام

تأليف :
محمد إبراهيم الحمد

ترجمة :
عبدالحكيم محي الدين